321 වන කාණ්ඩය - 09 වන කලාපය
தொகுதி 321 - இல. 09
Volume 321 - No. 09

2025 ඔක්තෝබර් 07වන අඟහරුවාදා
2025 ஒக்ரோபர் 07, செவ்வாய்க்கிழமை
Tuesday, 07th October, 2025

# පාර්ලිමේන්තු විවාද

## (හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

## (ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

## (HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**විගණකාධිපතිවරයාගේ වාර්තාව** [තීරුව 1399]

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා** [තීරුව 1402]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 1404-1444]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
අනාගත සංවර්ධන ඉලක්ක සහ ණය තිරසරභාවය සාක්ෂාත් කරගැනීම සඳහා ගෙන ඇති පියවර [තීරුව 1444]

උතුරේ ධීවරයන් මුහුණ දෙන අභියෝග [තීරුව 1446]

**හිටපු ජනාධිපතිවරුන්ගේ ආරක්ෂාව:**
මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1452]

**වරප්‍රසාද:**
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කිරීම [ තීරුව 1453]

**ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත:**
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී [තීරු 1457-1554]

**පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම** [තීරුව 1555]

**සභාව කල් තැබීමේ ප්‍රශ්න** [තීරු 1556-1566]


# பிரதான உள்ளடக்கம்


**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை** [ப: 1399]

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்** [ப: 1402]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 1404-1444]

**தனி அறிவித்தல் மூல வினா:**
எதிர்கால அபிவிருத்தி இலக்குகள் மற்றும் கடன் நிலைத்தன்மையை அடைவதற்காக எடுக்கப்பட்ட நடவடிக்கைகள் [ப: 1444]

வட பகுதி மீனவர்கள் எதிர்கொள்ளும் சவால்கள் [ப: 1446]

**முன்னாள் சனாதிபதிகளின் பாதுகாப்பு:**
பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரினது கூற்று [ப: 1452]

**சிறப்புரிமை:**
அரசியலமைப்புப் பேரவைக்குத் தவறான தகவல்களைச் சமர்ப்பித்தல் [ப: 1453]

**விளையாட்டில் ஊக்கு பதார்த்தப் பயன்பாட்டிற்கெதிரான சமவாயம் (திருத்தம்) சட்டமூலம்:**
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது [ப: 1457-1554]

**பாராளுமன்ற நிலையியற் கட்டளைகளைத் திருத்துதல்** [ப: 1555]

**ஒத்திவைப்பு வினாக்கள்** [ப: 1556-1566]


# PRINCIPAL CONTENTS


AUDITOR-GENERAL'S REPORT [Col. 1399]

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 1402]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1404-1444]

QUESTION BY PRIVATE NOTICE:
Measures Taken to Achieve Future Development Goals and Debt Sustainability [Col. 1444]

Challenges Faced by Fishermen in the North [Col. 1446]

SECURITY OF FORMER PRESIDENTS:
Statement by Minister of Public Security and Parliamentary Affairs [Col. 1452]

PRIVILEGE:
Submission of False Information to Constitutional Council [Col. 1453]

CONVENTION AGAINST DOPING IN SPORT (AMENDMENT) BILL:
Read a Second, and the Third time and passed [Cols. 1457-1554]

AMENDMENTS TO THE STANDING ORDERS OF THE PARLIAMENT [Col. 1555]

ADJOURNMENT QUESTIONS [Cols. 1556-1566]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 ඔක්තෝබර් 07වන අඟහරුවාදා***
*2025 ஒக்ரோபர் 07, செவ்வாய்க்கிழமை*
*Tuesday, 07th October, 2025*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XI කොටස හා තෙවැනි කාණ්ඩයේ IX කොටස මම ඉදිරිපත් කරමි.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*



## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the Annual Report of the People's Bank for the year 2024.

I move that this Report be referred to the Sectoral Oversight Committee on Economic Development and International Relations.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද ජාතික ඖෂධ නියාමන අධිකාරියේ මිල නියම කිරීමේ කමිටුව, 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සහ සියලු පරදු දරන්නන් විමසා සහ 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ විධිවිධාන ඇතුළු වෙනත් සියලු අදාළ සාධක පිළිබඳ සැලකිල්ලට ගෙන 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118(4) වගන්තිය සමඟ කියවිය යුතු 142 වගන්තිය යටතේ සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 ජූලි 21 දිනැති අංක 2446/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මම ඉදිරිපත් කරමි.

මෙම නියෝග සෞඛ්‍ය සහ ජනමාධ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

ගරු කථානායකතුමනි, 2022/2023 වර්ෂය සඳහා සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා**
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

ගරු කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ වාරිමාර්ග අමාත්‍යාංශය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු අනුර කරුණාතිලක මහතා (නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Urban Development, Construction and Housing)

ගරු කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)

ගරු කථානායකතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය සහ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi)

ගරු කථානායකතුමනි, අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද-

(i) 2023 හා 2024 වර්ෂ සඳහා කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයෙහි වාර්ෂික කාර්ය සාධන වාර්තා;

(ii) 2021, 2022 හා 2023 වර්ෂ සඳහා ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තා;

(iii) 2022 හා 2023 වර්ෂ සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ වාර්ෂික වාර්තා;

(iv) 2023 වර්ෂය සඳහා මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ වාර්ෂික වාර්තාව;

(v) 2021/2022 සහ 2022/2023 වර්ෂ සඳහා බී සී සී ලංකා ලිමිටඩ් ආයතනයේ වාර්ෂික වාර්තා; සහ

(vi) 2021/2022 සහ 2022/2023 වර්ෂ සඳහා ජාතික ලුණු සමාගමේ වාර්ෂික වාර්තා සහ ගිණුම්

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)

Hon. Speaker, I present a petition from Mr. M.H.G. Perera and fourteen others of No. 04, Sisil Uyana, Atawila Road, Kalutara South.

**ගරු නිශාන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) ඇල්පිටිය, ඉගල යන ලිපිනයෙහි පදිංචි අයි.ඩී. සුමනාවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) ඇල්පිටිය, පැලැන්දගොඩ, අංක 617 යන ලිපිනයෙහි පදිංචි එම්.කේ. ජයසේන මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)

Hon. Speaker, I present a petition from Mr. G.K.N. Madhawa Wijesinghe of No.11/1/1, Sri Vajiragnana Mawatha, Colombo 10.

**ගරු රුවන් මාපලගම මහතා**
(மாண்புமிகு ருவன் மாபலகம)
(The Hon. Ruwan Mapalagama)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) කටාන, දකුණු කඩවල, කඩවල, අංක 133/බී/3 යන ලිපිනයෙහි පදිංචි අයි.ඩී. අරුණනාග මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කළුගෙඩිහේන, පිලංකඩ, අංක 252/1/ඒ යන ලිපිනයෙහි පදිංචි පී.ආර්. නිශාන්ත සුජීව මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) පොළොන්නරුව, නුවරගල, දමනේ වැව, අංක 322 යන ලිපිනයෙහි පදිංචි ඩී.ඩී. මනෝජ් හේමන්ත දේවපුර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) රුහුණුගම, කණ්ඩිවිගල යන ලිපිනයෙහි පදිංචි නන්දවීර වස්තු හේවා මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)

ගරු කථානායකතුමනි, කඩවත, ඉහළකරගහමුණ, රාජසිංහ මාවත, අංක 348/30 යන ලිපිනයෙහි පදිංචි ශූ.ජී. ගාමිණී රත්නසිරි මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

*ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.*
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### ප්ලාස්ටික් සහ පොලිතීන් භාවිතය: අවම කිරීම
### பிளாஸ்டிக் மற்றும் பொலித்தீன் பாவனை: குறைத்தல்
### USE OF PLASTIC AND POLYTHENE: MINIMIZATION

1024/2025

**1. ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ප්ලාස්ටික් නිෂ්පාදන කර්මාන්තශාලා සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ වාර්ෂිකව නිෂ්පාදනය කරනු ලබන ප්ලාස්ටික් හා පොලිතීන් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ප්ලාස්ටික් හා පොලිතීන් භාවිතය අවම කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) ප්ලාස්ටික් යොදා නිෂ්පාදනය කරනු ලබන කුඩා දරුවන්ගේ ආහාර අසුරනවල ප්‍රමිතිය සම්බන්ධයෙන් අවධානය යොමු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள பிளாஸ்டிக் உற்பத்தி கைத்தொழிற்சாலைகளின் எண்ணிக்கை யாது;

(ii) இலங்கையில் வருடாந்தம் உற்பத்தி செய்யப்படும் பிளாஸ்டிக் மற்றும் பொலித்தீன் அளவுகள் வெவ்வேறாக எவ்வளவு;

(iii) பிளாஸ்டிக் மற்றும் பொலித்தீன் பாவனையைக் குறைப்பதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை;

(iv) பிளாஸ்டிக்கைப் பயன்படுத்தி உற்பத்தி செய்யப்படும் சிறு பிள்ளைகளுக்கான உணவுப் பொதிகளின் தரம் பற்றி கவனம் செலுத்தப்பட்டுள்ளதா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

[ගරු සුනිල් රත්නසිරි මහතා]

asked the Minister of Industry and Entrepreneurship Development:

(a) Will he inform this House -

(i) the number of plastic manufacturing factories in Sri Lanka;

(ii) separately, the annual production volumes of plastic and polythene in Sri Lanka;

(iii) the measures that have been taken to minimize the use of plastic and polythene; and

(iv) whether attention has been paid regarding the quality of plastic food packaging intended for young children?

(b) If not, why?

**ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)

ගරු කථානායකතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) 1. 1990 අංක 46 දරන කර්මාන්ත ප්‍රවර්ධන පනතේ විධිවිධාන ප්‍රකාරව කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ දැනට ලියාපදිංචි වී ඇති පොලිතීන් හා ප්ලාස්ටික් නිෂ්පාදන කර්මාන්තශාලා සංඛ්‍යාව 158ක් වේ.

2. මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබා ගත් තොරතුරු අනුව පරිසර අධිකාරිය විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කර ඇති පොලිමර් බේස් නිෂ්පාදන කර්මාන්ත දත්තවලට අනුව, 2025 ජූනි මස 30වන දිනට පොලිමර් පාදක කරගත් ප්ලාස්ටික් නිෂ්පාදන කර්මාන්තශාලා - BoI කර්මාන්තශාලා හැර- සංඛ්‍යාව 780කි.

(ii) ශ්‍රී ලංකාවේ වාර්ෂිකව නිෂ්පාදනය කරනු ලබන පොලිතීන් හා ප්ලාස්ටික් ප්‍රමාණ වෙන් වෙන් වශයෙන් ගණනය කිරීමක් දැනට සිදු කර නැහැ.

මේ සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය JICA ව්‍යාපෘතියේ මූල්‍ය හා තාක්ෂණික සහාය ඇතිව ලංකාවට ආනයනය කරනු ලබන ප්ලාස්ටික් ප්‍රමාණයන්, කර්මාන්ත හරහා පරිසරයට නිකුත් කරන ප්ලාස්ටික් ප්‍රමාණයන් සහ ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාවලියට යොමු කරන ප්‍රමාණයන් පිළිබඳව දත්ත පද්ධතියක් සකස් කිරීමට කටයුතු කරමින් පවතිනවා. එය 2026 වසරේ සිට ක්‍රියාත්මක කිරීමට සූදානම් කර ඇත.

(iii) ප්ලාස්ටික් හා පොලිතීන් භාවිතය අවම කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් බොහොමයක් ක්‍රියාමාර්ග ගෙන ඇත.

| අ.අ | ගැසට් අංකය | උද්ධෘත |
|---|---|---|
| 1. | 2034/34 | 23 ද. වගන්තිය යටතේ වැඩි ඝනත්වයෙන් යුත් පොලිඑතිලීන්, අඩු ඝනත්වයෙන් යුත් පොලිඑතිලීන් සහ පොලිප්‍රොපිලීන්ද ඇතුළත් පොලිතීන් අමුද්‍රව්‍යයක් ලෙස යෙදූ ආහාර දවටන - lunch sheets - දේශීය භාවිතය සඳහා නිෂ්පාදනය කිරීම, විකිණීම, අර්පණය, ප්‍රදර්ශනය, නොමිලේ ලබා දීම හෝ භාවිත කිරීම තහනම් කරමින් පනවා ඇති නියෝගය. |
| 2. | 2034/35 | 23 ද. වගන්තිය යටතේ 900x600x260 මි.මී. හෝ ඊට ඉහළ පරිමාණයේ රෙදිපිළි බහලුම් මලු හැර දේශීය භාවිතය සඳහා වැඩි ඝනත්වයෙන් යුතු පොලිඑතිලීන් අමුද්‍රව්‍යයක් වන මලු නිෂ්පාදනය, විකිණීම, විකිණීම සඳහා අර්පණය, ප්‍රදර්ශනය, නොමිලේ ලබා දීම හෝ භාවිත කිරීම තහනම් කරමින් පනවා ඇති නියෝගය. |
| 3. | 2034/38 | 23 ද. වගන්තිය යටතේ දේශීය භාවිතය සඳහා ප්‍රසාරිත පොලිස්ටයරීන්වලින් ආහාර ඇසුරුම් පෙට්ටි - lunch boxes - පිඟන්, කෝප්ප හා හැඳි නිෂ්පාදනය, විකිණීම, විකිණීම සඳහා අර්පණය, නොමිලේ ලබා දීම, ප්‍රදර්ශනය හෝ භාවිතය තහනම් කිරීමේ නියෝගය. |
| 4. | 2211/51 | 23 ද.(1) (අ) වගන්තිය යටතේ යම් ක්‍රියාවලියක්/ කර්මාන්තයක් හෝ වෙළෙඳාමක් සඳහා පහත ද්‍රව්‍ය නිෂ්පාදනය හා වෙළෙඳාම් කිරීම 2021.01.21 දින සිට තහනම් කිරීමේ නියෝගය - කෘෂි රසායන ද්‍රව්‍ය ඇසුරුම් ලෙස පොලිඑතිලීන් ටෙරප්තලේට් - PET - හා පොලිවයිනයිල් ක්ලෝරයිඩ් - PVC - පාවිච්චි කිරීම, ආහාර සහ ඖෂධ ඇසුරුම් කිරීම. - ශුද්ධ පරිමාව මි.ලී. 20ට/ශුද්ධ බර ග්‍රෑම් 20ට සමාන හෝ ඊට අඩු ප්ලාස්ටික් සැෂේ - sachet - ඇසුරුම් ලෙස පාවිච්චි කිරීම. - ප්ලාස්ටික් බැලූන්, බෝල, දිය මත පා වෙන ජල ක්‍රීඩා සෙල්ලම් බඩු/උපකරණ හැර - සුළංවලින් පිරවිය හැකි ප්ලාස්ටික් සෙල්ලම් බඩු නිෂ්පාදනය හා වෙළෙඳාම. - වෛද්‍ය/සායනික ප්‍රතිකාර සඳහා භාවිත කරන ප්ලාස්ටික් කොටන් බඩ්ස් හැර ප්ලාස්ටික් කූර - stem - සහිත කොටන් බඩ්ස් |
| 5. | 2341/30 | පහතින් දක්වා ඇති ප්ලාස්ටික් අයිතම භාවිත කිරීම සහ රට තුළ භාවිතය සඳහා වන යම් ක්‍රියාවලියක්, වෙළෙඳාමක් හෝ කර්මාන්තයක් සඳහා එකී අයිතම භාවිත කිරීම තහනම් කිරීමේ නියෝගය - තනි භාවිත බීම බට සහ කලතන - single-use plastic -. - ගුවන් ගමන්වලදී හැර තනි භාවිත ආහාර බහලුම්, පිඟන්, කෝප්ප, හැඳි, පිහි හා ගෑරුප්පු. - මල් මාලා. - ඉදිආප්ප වට්ටි. |
| 6. | 2353/55 | - ජලය ගබඩා කිරීමේ කාර්යය සඳහා භාවිත කිරීම පිණිස වර්ණ ගැන්වූ පොලිඑතලීන් ටෙරප්තලේට් - PET - යොදා බෝතල් නිෂ්පාදනය කිරීම. - බෝතල් ලේබල් කිරීම සඳහා පොලිවයිනයිල් ක්ලෝරයිඩ් - PVC - භාවිතය - බෝතල් සඳහා අමතර මුද්‍රාවක් (මූඩි ආවරණයක්) වශයෙන් පොලිතීන් හෝ වෙනත් යම් දිරාපත් නොවන ද්‍රව්‍යයක් භාවිත කිරීම. |

(iv) මේක දැනට ඇත්තටම අපේ රටේ පවතින බරපතළ ගැටලුවක්. විශේෂයෙන්ම දේශීය කර්මාන්තවල නිෂ්පාදනය කරන ඒවාට වඩා ගුණාත්මකභාවයෙන් අඩු ආනයනික ප්ලාස්ටික් වෙළෙඳ පොළේ තිබෙනවා. ඒ අනුව, දේශීයව නිෂ්පාදනය කරන ඒවා නියාමනය කරන්න පුළුවන් වුණාට ආනයනික ඒවා සම්බන්ධයෙන් තමයි ගොඩක් ගැටලු මතු වෙලා තිබෙන්නේ.

මේ ප්‍රශ්නයට පිළිතුර, ඔව් කියන එකයි. මේ සම්බන්ධව වෙළෙඳ අමාත්‍යාංශයේ මැදිහත්වීමෙන් කර්මාන්ත අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය හා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වැනි රාජ්‍ය ආයතනවල සහභාගිත්වයෙන්

ප්ලාස්ටික් යොදා නිෂ්පාදනය කරනු ලබන කුඩා දරුවන්ගේ වතුර බෝතල්, ආහාර අසුරන සහ ළදරු කිරි බෝතල්වල ප්‍රමිතිය පිළිබඳව සාකච්ඡා වාර කීපයක් පවත්වා ඒවායේ අඩංගු විය හැකි අන්තරායකර රසායනික ද්‍රව්‍ය පාලනය කිරීම සඳහා රෙගුලාසි සකස් කිරීමට තීරණය කර තිබෙනවා. එසේම මේ පිළිබඳව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මඟින් තොරතුරු විමසන ලද අතර, එම තොරතුරුවලට අනුව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය කුඩා දරුවන්ගේ ප්ලාස්ටික් වතුර බෝතල්, කෑම පෙට්ටි සහ ළදරු කිරි බෝතල්වල ගුණාත්මකභාවය කෙරෙහි අවධානය යොමු කර ඇති අතර, ප්ලාස්ටික් ඇසුරුම්වල අඩංගු විය හැකි බිස්ෆෙනෝල් ඒ - Bisphenol A, BPA - සහ තැලේට් - phthalates - වැනි අන්තරායදායක රසායනික ද්‍රව්‍ය පාලනය කිරීම කෙරෙහි ද අවධානය යොමු කර තිබෙනවා.

ඒ සඳහා රසායනාගාර පරීක්ෂණ අන්තර් ආයතනික සහයෝගීතාව සහ විශේෂඥ උපදේශන මඟින් ලබා ගත් තොරතුරු ඵලදායී නියාමන ක්‍රමවේදයන් සංවර්ධනය කිරීම සඳහා යොදා ගනිමින් කටයුතු කරන අතර අඛණ්ඩ සාම්පල පරීක්ෂා කිරීම ද සිදු කරනු ලබයි.

තවද, 1980 අංක 26 දරන ආහාර උපදේශක කමිටුව විමසා සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලද 2010 ආහාර (ඇසිරීමේ ද්‍රව්‍ය සහ අයිතම) නියෝග මඟින්, දැනට ශ්‍රී ලංකාව තුළ ආහාර ඇසුරුම් කිරීම සඳහා භාවිත කරනු ලබන සියලු ප්ලාස්ටික් හා වෙනත් ඇසුරුම් ද්‍රව්‍ය සියල්ල නියාමනය කෙරෙනවා. මේ සඳහා දැඩි අවධානයක් යොමු වෙලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

(ආ) අදාළ නොවේ.

**ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

ගරු කථානායකතුමනි, ලෝකයේ සෑම රටකම යුද්ධ නැහැ. ලෝකයේ සෑම රටකම නායයෑම්, භූමි කම්පා, ගිනි කඳු පිපිරීම් නැහැ. නමුත් ගරු කථානායකතුමනි, ලෝකයේ සෑම රටක්ම ප්ලාස්ටික් සහ පොලිතීන් භාවිතයට විශාල වශයෙන් යොමු වෙලා තිබෙනවා. ශ්‍රී ලංකාව ලෝකයේ කුඩා රටක් වුණත් වාර්ෂිකව ටොන් මිලියන 1.6ක ප්‍රමාණයක් ප්ලාස්ටික් භාවිත කිරීම සිද්ධ කරනවා. මගේ පළමුවන අතුරු ප්‍රශ්නයෙන් අහන්නේ එක් වරක් පමණක් භාවිත කරන පොලිතීන් සහ ප්ලාස්ටික් ගැනයි, ගරු කථානායකතුමනි. අපේ සමස්ත භාවිතයෙන් සියයට 70ක්ම මෙන්න මේ එක් වරක් පමණක් භාවිත කරන ප්ලාස්ටික් සහ පොලිතීන්. විශේෂයෙන්ම මාසයකට yoghurt cups මිලියන 20ක්, lunch sheets මිලියන 15ක්, polythene bags මිලියන 20කට වැඩි ප්‍රමාණයක් භාවිත වෙනවා.

මේ එක් වරක් පමණක් භාවිත කරන පොලිතීන් භාවිතය අවම කිරීම සඳහා අමාත්‍යාංශයක් විධියට ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු චතුරංග අබේසිංහ මහතා**
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)

ගරු මන්ත්‍රීතුමා, විශේෂයෙන්ම කර්මාන්ත අමාත්‍යාංශය නිෂ්පාදන පැත්තෙන් තමයි බලන්නේ. පාරිභෝගික ආරක්ෂණය පිළිබඳව පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියත්, පරිසර අමාත්‍යාංශයත් තමයි නියාමනයන් සිද්ධ කරන්නේ. මේ සඳහා අවශ්‍ය කරන නියාමන ක්‍රියාවලිය හරියාකාරයෙන් සිද්ධ වෙලා තිබෙනවා ද කියන එක සම්බන්ධයෙන් අපට ගැටලුවක් තිබෙනවා. මොකද, නීති පනවලා තිබෙනවා. නමුත්, මේ පිළිබඳව දැඩි නීති ක්‍රියාත්මක කිරීමක් සිද්ධ වෙලා නැහැ. මේකේ කාරණා දෙකක් තිබෙනවා. එක කාරණයක් තමයි, විශේෂයෙන්ම මේ නිෂ්පාදනවලට අවශ්‍ය කරන නියාමනය අපි දැන් සිද්ධ කරමින්, ඒකෙන් අවශ්‍ය කරන වෙළෙඳ පොළ නියාමනය සිද්ධ කරනවා වාගේම නිෂ්පාදන ආයතන පිළිබඳවත් කර්මාන්ත අමාත්‍යාංශය දැඩි අවධානයක් යොමු කරනවා, මේ නිෂ්පාදන කොහොමද එළියට එන්නේ කියලා. මම ඒකයි කිව්වේ, වෙළෙඳ පොළේ ඔය කියපු සමස්ත ප්‍රමාණයෙන් එක කොටසක් නිෂ්පාදන හරහා එනවා, දැවැන්ත කොටසක් ආනයනය හරහා තමයි එන්නේ කියලා. ඇත්තටම ගැටලුව තිබෙන්නේ පරිභෝජනය ඇතුළේ. මේවා පරිභෝජනය කරන්නේ අවසාන නිෂ්පාදකයා. ඇසුරුම්කරණයට භාවිත කරන දේවල් අඩු කර ගැනීමට අවශ්‍ය කරන විකල්ප ක්‍රියාමාර්ග තමයි කර්මාන්ත අමාත්‍යාංශයෙන් මේ වෙනකොට යෝජනා කරන්නේ. විකල්ප ඇසුරුම් භාවිත කිරීමත්, සමහර ඇසුරුම් යම්කිසි ප්‍රමාණයක් තහනම් කිරීමත්, ඊළඟ කාරණය විධියට පාරිභෝගිකයාගේ වෙනස්කමකුත් අපි බලාපොරොත්තු වෙනවා, රටක් විධියට මේ පරිභෝජනය අඩු කර ගැනීම සඳහා. ඒ සමස්ත පිරිවැය, ප්‍රතිචක්‍රීකරණයට යන පිරිවැය නැවතත් නිෂ්පාදන ආයතන දරන්නේ කොහොමද කියන කාරණා සම්බන්ධයෙන් තමයි මේ වෙනකොට කටයුතු සිද්ධ කරමින් යන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නය ඉතා වැදගත් ප්‍රශ්නයක්. ඒ නිසා නියෝජ්‍ය අමාත්‍යතුමාගේ කාරණාවට අමතර දෙයක් එකතු කරන්න ඕනෑ. දැනට ලංකාවේ glass bottles හදන company තිබෙන්නේ එකයි. මම අද උදේත් ඒ මහත්වරුන්ට කථා කරලා කිව්වා, පුළුවන් නම් තව අමතර කොම්පැනියක් -තව කොටසක්- පටන් ගන්න, එහෙම නැත්නම් තවත් කවුරු හරි ඉන්නවා නම් glass bottles හදන්න ආයෝජනය කරන්න කියලා. මොකද, පොලිතීන්, ප්ලාස්ටික් වෙනුවට glass bottles පාවිච්චි කරන්න හුඟාක් අය අද පෙළඹිලා තිබෙනවා. වතුර බෝතල්වලට පවා glass bottles පාවිච්චි කරනවා, සමහර hotelsවල. නමුත් ඒවා නිෂ්පාදනය කරන ආයතන නැහැ. Glass bottles හදන්න තව කවුරු හරි ඉදිරිපත් වෙනවා නම් ණය පහසුකම් ඇතුළු තව බොහෝ පහසුකම් දෙන්න අපි ලැහැස්තියි.

ඒ වාගේම තමයි, ප්‍රතිචක්‍රීකරණය කිරීම සම්බන්ධයෙනුත් අපි වැඩි අවධානය යොමු කරලා තිබෙනවා. අපේ කර්මාන්තපුරවලත්, අනෙකුත් තැන්වලත් ප්‍රතිචක්‍රීකරණ කටයුතු කරන අයට විශේෂ පහසුකම් දෙන්න අපි කටයුතු කරමින් ඉන්නවා. මේ දෙක තමයි අපිට දැනට කර්මාන්ත අමාත්‍යාංශය පැත්තෙන් කරන්න පුළුවන්කම තිබෙන්නේ. විශේෂයෙන්ම අපි අපතේ යන - බැහැර කරන - glass bottles වැනි දේවල් ප්‍රතිචක්‍රීකරණය කරලා, නිෂ්පාදනය කරන්න පුළුවන් ආයතන, තව ආයෝජකයෝ හොයමින් ඉන්නවා.

**ගරු සුනිල් රත්නසිරි මහතා**
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. විෂ්කම්භය මිලිමීටර් 5ට අඩු ප්ලාස්ටික් ක්ෂුද්‍ර ප්ලාස්ටික් යටතට අයත් වෙනවා. මේ ක්ෂුද්‍ර ප්ලාස්ටික් තවත් කුඩා කොටස්වලට කැඩිලා ගියාම මයික්‍රොමීටර් දශමයකට වඩා අඩු නැනෝ

[ගරු සුනිල් රත්නසිරි මහතා]

ප්ලාස්ටික් බවට පත් වෙනවා. මේවා දන්තාලේප භාවිතයේදී, ඒ වාගේම රූපලාවණ්‍ය කටයුතුවලදී භාවිත වෙනවා. මේවා පරිසරයට විශාල වශයෙන් නිදහස් වෙනවා. මේවා නිසා විශේෂයෙන්ම උතුරු මැද පළාතේ, පොළොන්නරුව වැනි දිස්ත්‍රික්කවල වකුගඩු රෝගීන් වේගයෙන් වැඩිවෙමින් තිබෙනවා, පිළිකා රෝගීන් වැඩිවෙමින් තිබෙනවා. ඒ නිසා මේ ක්ෂුද්‍ර ප්ලාස්ටික්වලින් සෞඛ්‍යයට විශාල තර්ජනයක් සිද්ධ වෙනවා.

මේවා භාවිතය අවම කිරීම සඳහා අමාත්‍යාංශය විධියට යම් මැදිහත් වීමක් කර තිබෙනවාද කියලා මම දැන ගන්න කැමැතියි.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු මන්ත්‍රීතුමනි, මෙය අපි අමාත්‍යාංශයක් හැටියට තනිව නොවෙයි, මුළු සමාජයක් විධියට එකතු වෙලා කළ යුතු කාර්යභාරයක්. මම දන්නවා සමහර පෞද්ගලික ආයතන විශේෂ අනුග්‍රහයක් දක්වා තිබෙනවා, ප්‍රතිචක්‍රීකරණ කටයුතුවලට. ඒ වාගේම එකතු කිරීමේ මධ්‍යස්ථාන ආරම්භ කරලා තිබෙනවා. Clean Sri Lanka වැඩසටහන යටතේ අපි මේ ගැන විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා. අමාත්‍යාංශය විධියට විතරක් නොවෙයි, අපි අනෙකුත් ආයතනත් එක්ක ඒකාබද්ධව මේ කටයුත්ත සංවිධානය කරලා තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ යෝජනාව අපි උපදේශක කාරක සභාවේදී සලකා බලා, ඉදිරියේදී වැඩ පිළිවෙළක් හදන්න සූදානම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 2 -1083/2025- (2), ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## මාතර, තෙලිජ්ජවිල මධ්‍ය මහා විද්‍යාලයේ තෙමහල් ගොඩනැඟිල්ල: ප්‍රතිසංස්කරණය
### மாத்தறை, தெலிஜ்ஜவில மத்திய மகா வித்தியாலயத்தின் மூன்று மாடிக்கட்டிடம்: புனரமைப்பு
### THREE-STOREY BUILDING OF THELIJJAWILA CENTRAL COLLEGE, MATARA: RENOVATION

1090/2025

**3. ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මාතර, තෙලිජ්ජවිල මධ්‍ය මහා විද්‍යාලයේ, පන්ති කාමර 17ක් හා වෙනත් වැදගත් කාර්යාල පවත්වා ගෙන යන ලද තෙමහල් ගොඩනැඟිල්ලේ පහළ මාලයේ පැවති පන්ති කාමර දෙකකට හානි වනසේ පස් කන්දක් කඩා වැටීම හේතුවෙන් එම ගොඩනැඟිල්ල භාවිතයෙන් ඉවත් කර ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් එම පාසලේ අධ්‍යාපන කටයුතු අඩාළ වී ඇති බවත්;

එතුමිය දන්නේද?

(ආ) (i) ඉහත සඳහන් ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණය කිරීමට පසුගිය කාලය තුළ පියවර ගෙන තිබුණේද;

(ii) එම ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඊට අදාළ භූමිය සංරක්ෂණය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தறை, தெலிஜ்ஜவில மத்திய மகா வித்தியாலயத்தில் 17 வகுப்பறைகளும், வேறு முக்கியமான அலுவலகங்களும் இயங்கி வந்த மூன்று மாடிக் கட்டடத்தின் கீழ் தளத்தில் அமைந்துள்ள 2 வகுப்பறைகளுக்கு பாதிப்பு ஏற்படக்கூடிய வகையில் மண் மேடு சரிந்து விழுந்தமையால் அக்கட்டடம் பாவனையிலிருந்து அகற்றப்பட்டுள்ளது என்பதையும்;

(ii) அதன் காரணமாக மேற்படி பாடசாலையின் கல்விச் செயற்பாடுகள் பாதிக்கப்பட்டுள்ளன என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) கடந்த காலத்தில் மேற்படி கட்டடத்தை மறுசீரமைப்பதற்கான நடவடிக்கைகள் மேற் கொள்ளப்பட்டு இருந்ததா என்பதையும்;

(ii) அக்கட்டடத்தை மறுசீரமைப்பதற்காக மேற் கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) சம்பந்தப்பட்ட நிலப் பகுதியைப் பாதுகாப்பதற் காக மேற்கொள்ளப் படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Is she aware that -

(i) the three-storey building of Thelijjawila Central College, Matara, which housed 17 classrooms and other important offices, has been removed from use as a mound of earth has fallen on the said building damaging two classrooms on the ground floor; and

(ii) as a result, the educational activities of the said school have been disrupted?

(b) Will she inform this House -

(i) whether steps had been taken in the recent years to renovate the aforesaid building;

(ii) the measures that will be taken to renovate the building concerned; and

(iii) the measures that will be taken to conserve the land concerned ?

(c) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) එසේ වුවද, යම් බාධාකාරී තත්ත්වයන් මැද වුවද මේ වන විට අධ්‍යාපන කටයුතු අඛණ්ඩව සිදු වෙමින් පවතියි.

(ආ) (i) ඔව්.

(ii) එම ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණයට පෙර තවදුරටත් නාය යෑමේ අවදානම ඉවත් කර ගැනීම සඳහා සිදු කළ යුතු නිර්මිත ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය - NBRO - සම්බන්ධ කරගෙන ඉටු කරවා ගැනීමට මේ වන විට කටයුතු කරමින් පවතියි. එම කටයුතු නිම වූ පසුව 2026 වර්ෂය තුළ ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණය කර දීමට සැලසුම් කර ඇත.

(iii) ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය - NBRO එක - මඟින් අදාළ නිර්මිත ඉදිකිරීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතින අතර, මේ වනවිට මිල ගණන් කැඳවා තාක්ෂණික ඇගයීම් කටයුතු සිදුවෙමින් පවතියි. 2025 වසරේ ඔක්තෝබර් මාසය තුළ එම කොන්ත්‍රාත්තුව පැවරීමට කටයුතු කර මාස හයක් ඇතුළත එම කාර්යය නිම කිරීමට නියමිතව ඇත.

(ඇ) අදාළ නොවේ.

**ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)
ගරු කථානායකතුමනි, තෙලිජ්ජවිල මධ්‍ය මහා විද්‍යාලය මාතර දිස්ත්‍රික්කයේ තිබෙන ප්‍රමුඛතම විද්‍යාලයක්. ඇත්තවශයෙන් මේ සිදුවීම වෙන්නේ 2023 ඔක්තෝබර් මාසයේ 03වැනි දා. අද වෙනකොට අවුරුදු දෙකක් ගත වෙලා තිබෙනවා. මේ පස් කන්ද වැටෙද්දී පාසල පැවැත්වුණේ නැති නිසා ජීවිත ගණනක් බේරුණා. මේ පස් කන්ද වැටිලා දැන් අවුරුදු දෙකක කාලයක් වෙනවා. තවම එක පස් කුඩයක්වත් එතැනින් අස් කරලා නැහැ. ඒක ඒ විධියටම තිබෙනවා. ගරු අගමැතිතුමියනි, මේ ගොඩනැඟිල්ල මහල් තුනක, පන්ති කාමර 17ක් තිබුණු ගොඩනැඟිල්ලක්. නේවාසිකාගාරවල තමයි උසස් පෙළ පන්ති පවත්වන්නේ. අවුරුදු දෙකක් තිස්සේ ඉතාම අසීරුතාවෙන් තමයි පාසල පවත්වා ගෙන යන්නේ. අවුරුදු දෙකක් යනකම් මේ පස් ටික අයින් කරන්න තිබුණු බාධා මොනවාද කියන එක ගැන යම් අවබෝධයක් ලබාගන්න මම කැමැතියි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, ඒක NBRO එක සහ ඒකට අදාළ ආයතන විසින් කළ යුතු දෙයක්. අධ්‍යාපන අමාත්‍යාංශය උත්සාහ කරන්නේ පාසලට වෙන හානිය අවම කරගන්න. ඒ නිසා තමයි මේ වෙනකොට මුදල් වෙන් කරලා වැඩ පටන් අරගෙන තිබෙන්නේ, අලුත් පන්ති කාමර ගොඩ නඟලා දරුවන්ගේ අධ්‍යාපන කටයුතු කරගෙන යන්න. ගරු මන්ත්‍රීතුමා කිව්ව විධියට මේක අවුරුදු ගණනක් පරක්කු වෙච්ච කටයුත්තක්. ඒ සඳහා අපි මේ අවුරුද්දේ මැදිහත් වෙලා තිබෙනවා.

**ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)
ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -1102/2025- (2), ගරු සුරංග රත්නායක මහතා -*[සභා ගර්භය තුළ නැත.]*

## ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට අයත් ඉඩම්: ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
## இலங்கை சுற்றுலா அபிவிருத்தி அதிகாரசபைக்குச் சொந்தமான காணிகள்: திருகோணமலை மாவட்டம்
LANDS BELONGING TO SRI LANKA TOURISM DEVELOPMENT AUTHORITY: TRINCOMALEE DISTRICT

1114/2025

**5. ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට අයත් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් සම්බන්ධයෙන් ඉදිරි සැලසුම් කවරේද;

(iii) එම අධිකාරියට අයත් ඉඩමක් Sweat Bay ප්‍රදේශයේ තිබේද;

(iv) එම ඉඩමේ විශාලත්වය කොපමණද;

(v) එම ඉඩමේ අනවසරයෙන් වැටක් ඉදිකර බලහත්කාරයෙන් රැඳී සිටින සමාගම කවරේද;

(vi) එම ඉඩම සම්බන්ධයෙන් ඉහත සමාගමට අයිතියක් තිබේද;

(vii) නොඑසේ නම්, එම සමාගමට එරෙහිව ගනු ලබන නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரைக் கேட்ட வினா:

( அ) (i) இலங்கை சுற்றுலா அபிவிருத்தி அதிகாரசபைக்குச் சொந்தமான திருகோணமலை மாவட்டத்திலுள்ள காணிகளின் அளவு எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி காணிகள் தொடர்பான எதிர்காலத் திட்டங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி அதிகாரசபைக்குச் சொந்தமான காணியொன்று Sweat Bay பிரதேசத்தில் காணப்படுகின்றதா என்பதையும்;

(iv) அக்காணியின் பரப்பளவு யாது என்பதையும்;

(v) மேற்படி காணியில் அனுமதியின்றி வேலியொன்றை நிர்மாணித்து பலவந்தமாக நிலைகொண்டுள்ள கம்பனி யாது என்பதையும்;

(vi) மேற்படி காணி தொடர்பில் மேற்குறிப்பிட்ட கம்பனிக்கு உரிமை காணப்படுகின்றதா என்பதையும்;

[ගරු රොෂාන් අක්මීමන මහතා]

(vii) இன்றேல், குறித்த கம்பனிக்கெதிராக மேற்கொள்ளப்படும் சட்டரீதியான நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

( ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Will he inform this House -

(i) the extent of lands belonging to the Sri Lanka Tourism Development Authority located in the Trincomalee District;

(ii) the future plans regarding the lands concerned;

(iii) whether there is a land that belongs to the Authority in the Sweat Bay area;

(iv) the extent of the particular land;

(v) the name of the company which has illegally constructed a fence on the said land and is forcibly occupying it;

(vi) whether the company concerned has an entitlement to the said land; and

(vii) if not, the legal action that will be taken against the company?

(b) If not, why?

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා (සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ - சுற்றுலாப் பிரதி அமைச்சர்)

(The Hon. (Prof.) Ruwan Ranasinghe - Deputy Minister of Tourism)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i)

| | |
|---|---|
| කුච්චවේලි | අක්කර 510 |
| රසුල්තෝට්ටම් නිලාවේලි | අක්කර 60 |
| මිඩ්වේ ස්ටේට් | අක්කර 40 |
| ඇලස්වත්ත | අක්කර 10 |
| ස්විට් බේ | අක්කර 12 රූඩ් 03 පර්චස් 05 |
| **එකතුව** | අක්කර 632 රූඩ් 03 පර්චස් 05 |

(ii) සමස්තයක් ලෙස මෙම ඉඩම්වලට අනවසර පදිංචිකරුවන්ගේ තර්ජන බොහෝ ඇති අතර, දැනට ඔවුන් එම ඉඩම්වලින් ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගනිමින් සිටියි. ඒ අතර අනවසර පදිංචිකරුවන්ගේ ගැටලු නොමැති ඉඩම් යම් තේමාවක් යටතේ සංචාරක නිකේතන ලෙස සංවර්ධනය කිරීමට අවශ්‍ය සුදුසු සැලසුම් සකස් කර ඇත.

අක්කර 510කින් සමන්විත කුච්චවේලි ඉඩම් ප්‍රදේශය වෙනුවෙන් සකස් කර ඇති ප්‍රධාන සැලැස්මට අනුව, අක්කර 137ක භූමි ප්‍රමාණයක් අලි ඇතුන්ගේ ගමන් මාර්ග සඳහා සහ අක්කර 138ක භූමි ප්‍රමාණයක් පරිපාලන ගොඩනැඟිලි, පොදු ප්‍රදේශ, ජනතාව සඳහා වෙරළ තීර සහ අභ්‍යන්තර මාර්ග සඳහා වෙන් කර ඇත. දැනට අක්කර 79ක භූමි ප්‍රමාණයක් ආයෝජකයන්ට බදු පදනමින් ලබා දී ඇති අතර, ඔවුන්ගෙන් සමහරෙකු දැනටමත් එම ව්‍යාපෘතිවල කටයුතු කරමින් සිටින අතර, අනෙක් ආයෝජකයන් අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලිය තුළ ඇත.

තවත් අක්කර 82ක් බදු දීමට අනුමත කිරීම සඳහා සලකා බැලීමේ ක්‍රියාවලියේ පවතී. ඉතිරි අක්කර 74, රසුල්තෝට්ටම් සහ ඇලස්වත්ත ඉඩම් එළිපෙහෙළි කළ ප්‍රදේශ සමඟ ඉදිරියට ආයෝජනය කිරීමට කැමැති පුද්ගලයන් සඳහා දැන්වීම් මඟින් ප්‍රකාශයට පත් කර ඇති අතර, ඒ සඳහා කැමැත්තක් දක්වන අයට ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කිරීමට - EoIs- 2025 ඔක්තෝබර් 13 දක්වා කාලය දීර්ඝ කොට ආයෝජකයන්ට විවෘත කොට ඇත. මෙම ප්‍රදේශයේ ආයෝජකයන් මුහුණ දෙන ප්‍රධාන අභියෝග වන්නේ අනවසර ආක්‍රමණිකයන් සහ එම පළාතට ජල සැපයුම් පහසුකම් නොමැතිකමයි.

(iii) ඔව්.

(iv) අක්කර 12 රූඩ් 03 පර්චස් 05

(v) රෙඩ් රොක් බීච් / ඩිල්මා සමාගම

(vi) නැත

(vii) එම සමාගමට ඉඩමෙන් ඉවත් වන ලෙස ප්‍රාදේශීය ලේකම්තුමා දැනුම් දී තිබූ අතර, එම දැන්වීම ක්‍රියාත්මක නොකිරීමට එම සමාගම උසාවි නියෝගයක් ඉල්ලා රිට් පෙත්සමක් ඉදිරිපත් කර ඇත. එම නඩුව 2025 ඔක්තෝබර් 03වන දින නැවත කැඳවන ලදී.

(ආ) අදාළ නොවේ.

**ගරු රොෂාන් අක්මීමන මහතා**

(மாண்புமிகு ரொஷான் அக்மீமன)

(The Hon. Roshan Akmeemana)

ගරු සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය කියන්නේ, ලංකාවේ අනෙක් ප්‍රදේශවලට වඩා ටිකක් වෙනස් දිස්ත්‍රික්කයක්. මොකද, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සංචාරක කර්මාන්තය සංවර්ධනය වෙන්න පටන් ගත්තේ යුද්ධයෙන් පස්සේ; විශේෂයෙන් 2015න් පස්සේ. එම නිසා ගොඩක් වෙලාවට එම දිස්ත්‍රික්කයේ සංචාරක කර්මාන්තය වර්ධනය වුණේ නිලාවේලි, ඇලස්තෝට්ටම් වාගේ කාලයක් තිස්සේ සංචාරක කර්මාන්තය සම්බන්ධයෙන් යම් ප්‍රසිද්ධියක් අත්වෙලා තිබිච්ච ප්‍රදේශවල පමණයි. නමුත්, මම මේ ප්‍රශ්නයෙන් මතු කර තිබෙන Sweat Bay ප්‍රදේශය සහ ඒ ආශ්‍රිතව තිබෙන Marble Beach ප්‍රදේශය සංචාරකයන්ට වැඩි විභවතාවක්, යම් සුවිශේෂීතාවක් තිබෙන ප්‍රදේශයක් වුණත්, කාලයක් තිස්සේ පැවැති යුද්ධය නිසා සහ ඒ ඉඩම් යම් ආරක්ෂක අංශවලට යටත්ව පැවතීම නිසා සංචාරක කර්මාන්තයේ දියුණුවට යොදා ගැනීමේදී යම් බාධා ඇති වී තිබෙනවා.

නමුත්, දැන් ඒ බාධා යම් ලිහිල්භාවයකට පත් වෙලා, Sweat Bay, Marble Beach වාගේ ප්‍රදේශ ඒ දිස්ත්‍රික්කයේ සංචාරක කර්මාන්තය දියුණු කරන්නත්, මේ රටේ සංචාරක කර්මාන්තය

දියුණු කරන්නත් යොදා ගන්න පුළුවන් මට්ටමේ තිබෙනවා. නමුත්, මේ කියනවා වාගේ ඉඩම් ආරාවුල් ද තිබෙනවා. දැනට ශ්‍රී ලංකා ගුවන් හමුදාව තමයි, Marble Beach ප්‍රදේශයේ එම කටයුතු කරන්නේ. නමුත්, තවමත් ඒ ප්‍රදේශ යොදා ගන්න පුළුවන් උපරිම ආකාරයෙන් සංචාරක කර්මාන්තයට යොදා ගෙන නැහැ. අපි දකිනවා, long weekend එකක් ආවාම සංචාරකයන්ට ඇතුළු වෙන්න බැරි තරම් මාර්ග තදබදයක් ඇති වන මට්ටමට Marble Beach ප්‍රදේශයට ලොකු ආකර්ෂණයක් තිබෙන බව.

මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අතුරු ප්‍රශ්නය විධියට අහන්න කැමැතියි, ඒ Marble Beach සහ Sweat Bay කියන ප්‍රදේශ සම්බන්ධයෙන් ඉදිරි අය වැය වැඩසටහන්වල තිබෙන සැලසුම කුමක්ද සහ ලංකාවේ සංචාරක කර්මාන්තයට යොදා ගැනීම සම්බන්ධයෙනුත්, ප්‍රදේශයේ ජනතාවට ප්‍රතිලාභයක් ලැබෙන ආකාරයෙන් ඒ ඉඩම් සහ එම ප්‍රදේශ උපයෝගී කර ගැනීම සම්බන්ධයෙනුත් තිබෙන සැලසුම කුමක්ද කියලා.

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ)
(The Hon. (Prof.) Ruwan Ranasinghe)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රකාශය සමඟ මා එකඟ වෙනවා. විශේෂයෙන්ම යුද්ධය පැවැති කාලය තුළ ත්‍රිකුණාමලයේ ඒ ප්‍රදේශවල ඉඩම් වැඩි ප්‍රමාණයක් ත්‍රිවිධ හමුදාව භාරයේ තමයි පැවතුණේ. දැන් ඒ ඉඩම් ක්‍රමානුකූලව නිදහස් කරමින් පවතිනවා. විශේෂයෙන්ම Sweat Bay කියන ප්‍රදේශයේ ඉඩම සම්බන්ධයෙන් මේ වන විට නඩු කටයුත්තක් සිද්ධ වෙනවා. එය අවසන් වූ පසු ඒ ඉඩම සම්බන්ධයෙනුත්, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට පවරාගෙන තිබෙන අනෙකුත් ඉඩම් සම්බන්ධයෙනුත් පෞද්ගලික අංශයේ ආයෝජන වෙනුවෙන් යෝජනා කැඳවා, විදේශ ආයෝජකයින්ට වාගේම ඒ ප්‍රදේශවල පාරිසරික තත්ත්වයන්ට ගැළපෙන තිරසාරත්වය - sustainability - කේන්ද්‍ර කරගත් සංචාරක පහසුකම් සලසන ව්‍යාපෘති වෙනුවෙන් ඒවා නිදහස් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම ඒ ප්‍රදේශවල යුද හමුදාව, ගුවන් හමුදාව, නාවික හමුදාව සතු යම් ඉඩම් ප්‍රමාණයන් තවම තිබෙනවා. ඉදිරියේදී අපි ඒ අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කරලා, සංචාරක ක්ෂේත්‍රයට මුදා හැරිය හැකි ඉඩම් නිදහස් කර ගැනීමටත්, ඒවා වාණිජමය කටයුතු සඳහා ආයෝජකයන්ට නිදහස් කිරීමටත් අවශ්‍ය කටයුතු සූදානම් කරනවා.

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ ප්‍රශ්නය මම සංචාරක නියෝජ්‍ය ඇමතිතුමාට යොමු කරන්නේ මේ කාරණයටම සම්බන්ධ ප්‍රශ්නයක් විධියටයි. මම කලින් කිව්වා වාගේ, දැනට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වෙරළ තීරයට පමණයි සංචාරක කර්මාන්තය සීමා වෙලා තිබෙන්නේ. ඒ නිසාම එය seasonal industry එකක් විධියට, නැත්නම් වාරික සංචාරක කර්මාන්තයක් විධියට තමයි ක්‍රියාත්මක වෙන්නේ. නමුත්, දිස්ත්‍රික්කයේ සංචාරක කර්මාන්තය වර්ෂය පුරා ක්‍රියාත්මක වන කර්මාන්තයක් බවට සංවර්ධනය කරන්න අපි දිස්ත්‍රික්කයක් විධියට සැලසුම් කරමින් ඉන්නවා. එහෙම නොවුණොත්, දිස්ත්‍රික්කයේ සම්පත්වලින් සංචාරක කර්මාන්තයේ ප්‍රතිලාභ දිස්ත්‍රික්කයේ ජනතාවට, විශේෂයෙන් තරුණ පරම්පරාවට ලබා ගැනීමේ යම් බාධා ඇති වෙනවා. ඒ නිසා විශේෂයෙන් මොරවැව, ගෝමරන්කඩවල වාගේ ප්‍රදේශ ecotourism, rural tourism, agrotourism සහ religious tourism වාගේ පැතිවලින් සංවර්ධනය කරන්න අපි සැලසුම් කරමින් ඉන්නවා. දැනට අපි ඒ ප්‍රදේශවල තරුණ තරුණියන් එකතු කරගෙන, සංචාරක සමුපකාර සමිති හදාගෙන ඔවුන්ව පුහුණු කරමින් ඉන්නවා. විශේෂයෙන්ම homestay business වැනි පුහුණු පාඨමාලා පවත්වමින් ඒ තරුණයන් පුහුණු කරනවා.

කලින් අතුරු ප්‍රශ්නයේදී මම මතු කළ Sweat Bay ප්‍රදේශයේත් අපි සංචාරක සමුපකාර සමිතියක් හදලා, ඒ ප්‍රදේශයේ තරුණ තරුණියන්ට සංචාරක කර්මාන්තයට අවශ්‍ය පුහුණුව ලබා දෙන්න කටයුතු කරමින් ඉන්නවා. ඒ වාගේම සූරියපුර, මාවිල් ආරු වාගේ ප්‍රදේශත් එක්ක සම්බන්ධ කරලා කන්තලේ වැව ආශ්‍රිතව සංචාරක කලාපයක් විධියට සංවර්ධනය කරන්න කටයුතු කරනවා. මේ විධියට දිස්ත්‍රික්කයේ සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීමේ සැලැස්මක් හැදුවාම, ඒ සම්බන්ධයෙන් සංචාරක අමාත්‍යාංශය පැත්තෙන් ඉදිරි අය වැයේදී ලබා දෙන්න පුළුවන් සහයෝගය කුමක්ද කියන එකත්, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය පැත්තෙන් සහ Sri Lanka Tourism Promotion Bureau එක පැත්තෙන් ඒ සඳහා ලබා දෙන්න පුළුවන් වැඩ පිළිවෙළ කුමක්ද කියන එකත් මම දැනගන්න කැමැතියි.

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ)
(The Hon. (Prof.) Ruwan Ranasinghe)

ගරු කථානායකතුමනි, අපි දන්නවා, ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය සංවර්ධනය වුණේම මුහුදු තීරය කේන්ද්‍ර කර ගනිමින් බව. නමුත් ක්‍රමානුකූලව මහනුවර, නුවරඑළිය වාගේ රට අභ්‍යන්තරයේ ප්‍රදේශවල සංචාරක කර්මාන්තය දියුණු වුණත්, ත්‍රිකුණාමලය වාගේ ප්‍රදේශවල තවමත් වෙරළ කේන්ද්‍ර කරගෙන පමණයි සංචාරක කර්මාන්තය ක්‍රියාත්මක වෙන්නේ. ගෝමරන්කඩවල වාගේ අභ්‍යන්තර ප්‍රදේශවලට තවම සංචාරක කර්මාන්තය පැතිරී ගිහිල්ලා නැහැ. ඒ සඳහා අපි අමාත්‍යාංශයක් විධියට මැදිහත් වනවා. විශේෂයෙන්ම පළාත් නවයම කේන්ද්‍ර කරගත් සංචාරක සැලසුම් මේ වනකොට අපි සකස් කරමින් ඉන්නවා.

අපි මේ වසරේ ඒක අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ සංචාරක සැලසුම් කේන්ද්‍ර කරගෙන ඉදිරි අවුරුදු 10 සඳහා ජාතික සංචාරක සැලැස්මක් හදන්න පසුව බලාපොරොත්තු වෙනවා. මේ සඳහා ක්‍රියාත්මක කරන්න අවශ්‍ය ක්‍රියාකාරී සැලසුම් සහ ඒ වෙනුවෙන් අරමුදල් වෙන් කිරීම ඉදිරි අය වැයවලදී අපි සිදු කරනවා. මේ වෙනකොට අපි ඒ සඳහා කටයුතු කරමින් සිටිනවා.

## මුලතිව් සහ මන්නාරම මහ රෝහල්: කාර්ය මණ්ඩල සහ භෞතික සම්පත්
## முல்லைத்தீவு, மன்னார் பொது வைத்தியசாலைகள்: பணியாட்டொகுதி மற்றும் பௌதிக வளங்கள்
## MULLAITIVU AND MANNAR GENERAL HOSPITALS: STAFF AND PHYSICAL RESOURCES

1161/2025

**6. ගරු තුරෙරොසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) මුලතිව් සහ මන්නාරම මහ රෝහල්වල වෛද්‍යවරුන් සඳහාවූ සීමාවාසික පුහුණුව ලබා නොදෙන බව දන්නේද;

[ගරු තුරෙයිරාසා රවිකරන් මහතා]

(ii) බොහෝ මූලික රෝහල්වල වෛද්‍ය සභාවේ අනුමත විශේෂඥ වෛද්‍යවරුන් සිව්දෙනෙකුට වඩා සේවය කරනු ලැබුවද, මුලතිව් සහ මන්නාරම මහ රෝහල්වල පවතින විශේෂඥ වෛද්‍යවරුන්ගේ පුරප්පාඩු නොපිරවීමට හේතු කවරේද;

(iii) ප්‍රමාණවත් සම්පත් නොමැති වීම හේතුවෙන් මූලික වෛද්‍ය පරීක්ෂණ සහ වෛද්‍ය උපදෙස් ලබා ගැනීම සඳහා රෝගීන් වෙනත් දිස්ත්‍රික් රෝහල් වෙත යැවීමෙන් රජයේ සෞඛ්‍ය සේවාවේ අසමත්භාවය සහ අසමානතාවය සනාථ වන බව පිළිගන්නේද;

(iv) ඉහත රෝහල් ඇතුළුව ශ්‍රී ලංකාවේ තිබෙන සියලුම දිස්ත්‍රික් රෝහල්වලට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සහ භෞතික සම්පත් පැවතීම සහතික කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) முல்லைத்தீவு மற்றும் மன்னார் பொது வைத்தியசாலைகளில் மருத்துவர்களுக்கான உள்ளகப் பயிற்சி அளிக்கப்படாததை அறிவாரா என்பதையும்;

(ii) அநேகமான ஆதார வைத்தியசாலைகளில் மருத்துவப் பேரவையால் அங்கீகரிக்கப்பட்ட நான்குக்கும் மேற்பட்ட நிபுணத்துவ மருத்துவர்கள் பணியாற்றுகின்றபோதும், முல்லைத்தீவு மற்றும் மன்னார் பொது வைத்தியசாலைகளில் நிபுணத்துவ மருத்துவர்களுக்கான வெற்றிடங்கள் நிரப்பப்படாமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(iii) போதிய வளங்கள் இல்லாதிருப்பதால், பூர்வாங்க மருத்துவப் பரிசோதனைகளையும் மருத்துவ ஆலோசனைகளையும் பெற்றுக்கொள்வதற்காக நோயாளர்களைப் பிற மாவட்ட வைத்தியசாலைகளுக்கு அனுப்புவதன் காரணமாக அரசாங்க மருத்துவ சேவையின் இயல்திறன் இன்மையும் ஏற்றத்தாழ்வும் நிரூபணமாவதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iv) மேற்படி வைத்தியசாலைகள் அடங்கலாக, இலங்கையிலுள்ள அனைத்து மாவட்ட வைத்தியசாலைகளுக்கும் போதுமான பணியாட்டொகுதி மற்றும் பௌதிக வளங்கள் இருப்பதை உறுதிசெய்வதற்காக கொள்கை ரீதியான முடிவு எடுக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) whether he is aware that internship training for doctors is not provided at the Mullaitivu and Mannar General Hospitals;

(ii) the reasons for the unfilled vacancies of specialist doctors in the Mullaitivu and Mannar General Hospitals, even though more than four specialist doctors approved by the Medical Council are working in most of the Base Hospitals;

(iii) whether he admits that the failure and inequality of the Government health service is evident from the need to send patients to other district hospitals for basic medical examinations and consultations due to insufficient resources; and

(iv) whether a policy decision will be taken to ensure the availability of adequate staff and physical resources for all district hospitals in Sri Lanka, including the said hospitals?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**

(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)

(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

සීමාවාසික වෛද්‍ය නිලධාරින් පුහුණුව සඳහා යොදවන්නේ වෛද්‍ය සභාව විසින් අනුමත කරන ලද රෝහල්වලට පමණයි. මන්නාරම සහ මුලතිව් රෝහල් දැනට වෛද්‍ය සභාව අනුමත කරලා නැහැ.

ඒකට හේතු වෙලා තිබෙන්නේ වෛද්‍ය සභාවේ තිබෙන නිර්ණායක අනුව, අපි කියන major specialtiesවලට, ඒ කියන්නේ medicine, surgery, gynaecology and obstetrics සහ paediatrics කියන හතරට අවශ්‍ය කරන විශේෂඥ වෛද්‍යවරු - Board-certified Consultantsලා - හිටියොත් තමයි අපට internsලා යවන්න පුළුවන්කම ලැබෙන්නේ. අපිත් කැමැතියි, internsලා යවන්න පුළුවන් නම්. එතකොට ඒ වෛද්‍ය හිඟයට යම් උත්තරයක් හම්බ වෙනවා. නමුත්, මුලතිව් දිස්ත්‍රික් මහ රෝහලේ සිටින්නේ Board-certified Consultantsලා දෙන්නයි. විශේෂඥ වෛද්‍ය පුහුණුව ලබා දෙන, විශේෂඥ වෛද්‍ය සේවය ලබා දෙන වෛද්‍යවරු 14දෙනෙක් හිටියාට ඒකේ Board-certified Consultantsලා දෙදෙනායි ඉන්නේ. මන්නාරම දිස්ත්‍රික් මහ රෝහලේ විශේෂඥ වෛද්‍ය සේවාව ලබා දෙන වෛද්‍යවරු 20ක් හිටියාට Board-certified Consultantsලා ඉන්නේ දෙදෙනායි. ඒ නිසා තමයි දැනට අපට internsලා යවන්න විධියක් නැත්තේ.

(ii) වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලත්, මාණ්ඩලික සහතික ලත් ප්‍රමාණවත් විශේෂඥ වෛද්‍ය නිලධාරීන් හිඟ බැවින් මන්නාරම සහ මුලතිව් රෝහල් සඳහා විශේෂඥ ශ්‍රේණියේ වෛද්‍යවරුන් මඟින් පුරප්පාඩු පිරවීමට නොහැකි වී ඇත. නමුත්, වෛද්‍ය සභාවේ ලියාපදිංචි වීමේ සුදුසුකම් ලබමින් සිටින, දැනටමත් විදේශීය පුහුණුව ලැබූ සහ ලැබීමට නියමිත සුදුසුකම් ලත් වෛද්‍යවරුන් මඟින් මෙම රෝහල්වල විශේෂඥ වෛද්‍ය සේවාව ලබා දීමට අනුයුක්ත කර ඇත.

ගරු මන්ත්‍රීතුමනි, මම කලින් උත්තරයේ කියපු හැටියට විදේශීය පුහුණුවට ගිහින් පැමිණි, නමුත් තවමත් Board certification ගත්තේ නැති විශේෂඥ වෛද්‍යවරුන්ගෙන් සහ අනෙක් පැත්තෙන් විදේශීය විශේෂඥ වෛද්‍ය පුහුණුවට යන්න ඉන්න අයගෙන් තමයි අපේ විශේෂඥ වෛද්‍ය සේවාව ලබා දෙමින් ඉන්නේ; ඒ විධියට තමයි ඒ සේවාව ආවරණය කර ගනිමින් ඉන්නේ. ලංකාවට ඒ අය එන ප්‍රමාණය අනුව සහ Board-certified ප්‍රමාණය අනුව ඒ සේවාව අපි ලබා දෙනවා.

(iii) මේ වන විට මන්නාරම සහ මුලතිව් රෝහල් සඳහා අවශ්‍ය වන මූලික පරීක්ෂණ හා මූලික පහසුකම් ලබා දී ඇත. කෙසේ නමුත්, තවදුරටත් රෝගීන් සඳහා අවශ්‍ය වන විශේෂ පරීක්ෂණ - උදා: MRI, mammogram, cystography ආදිය - සඳහා සහ සුවිශේෂී රසායනාගාර පරීක්ෂණ සඳහා පමණක් ඒ ඒ අවස්ථාවට උචිත පරිදි යාපනය ශික්ෂණ රෝහල, වවුනියාව දිස්ත්‍රික් මහ රෝහල, අනුරාධපුරය ශික්ෂණ රෝහල මෙන්ම ඇතැම් විට මහනුවර හා කොළඹ ජාතික රෝහල් වෙතත් රෝගීන් යොමු කිරීම සිදු කරනු ලැබේ. මොකද, අපට හැම පරීක්ෂණයක්ම හැම දිස්ත්‍රික් මහ රෝහලකටම දෙන්න හැකියාවක් නැහැ. එම නිසා සුවිශේෂී පරීක්ෂණවලට යොමු කිරීමක් සිදු කරනවා.

(iv) දැනටමත් ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන තිබේ.

රජයේ අරමුදල් මඟින් වාගේම ප්‍රදානයන් මඟින් මාන්කුලම්, කිලිනොච්චි, පේදුරුතුඩුව සහ යාපනය රෝහල් වැඩිදියුණු කිරීමට කටයුතු යොදා තිබේ. අවශ්‍ය මානව සම්පත් ලබා දීම සඳහා අවශ්‍ය පරිදි කාර්ය මණ්ඩල පුහුණුව සඳහා බඳවාගෙන එම පුහුණුවීම් කරගෙන යන අතර, ජීව වෛද්‍ය ඉංජිනේරු ඒකකය - Biomedical Engineering Unit - සහ වෛද්‍ය සැපයීම් අංශය මඟින් අවශ්‍ය පරිදි වෛද්‍ය සැපයීම් ලබා දී ඇත.

(ආ) පැන නොනඟී.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

கௌரவ அமைச்சர் அவர்களே, உங்களுடைய சேவைகளுக்கு நன்றி! இருந்தாலும், முல்லைத்தீவு மற்றும் மன்னார் ஆகிய மாவட்டங்கள் கடைநிலையில் இருப்பதால்தான் அங்குள்ள குறைகளைப் பலரும் எங்களுக்குச் சொல்லிக் கொண்டிருக்கின்றார்கள். அந்த வகையில், கடந்த பாராளுமன்ற அமர்விலும் முல்லைத்தீவு மாவட்டப் பொது மருத்துவமனையின் பௌதிக வளக் குறைபாடுகள் தொடர்பில் கலந்துரையாடப்பட்டு அது தொடர்பாகக் கரிசனையான பதில் தங்களால் வழங்கப்பட்டது. அதன்படி, மிகவும் விரைவாக முல்லைத்தீவு மாவட்டப் பொது மருத்துவமனைக்கு நிரந்தர மருத்துவ விடுதி அமைக்கப்படும் என நீங்கள் சொல்லியிருந்தீர்கள். பின்னர் எமது கட்சியின் சார்பாகப் பாராளுமன்ற உறுப்பினர்கள் எட்டுப் பேரும் இலங்கைக்கான இந்தியத் தூதுவருடனும் இதுபற்றி கதைத்திருந்தோம். அவரும் காலந்தாழ்த்தாது அது செயல் வடிவம் பெறும் என்று சொல்லியிருந்தார். அவரிடம் தங்களுடைய துரிதமான நடவடிக்கைகளையும் நாங்கள் சுட்டிக்காட்டியிருந்தோம்.

கடந்த 2025.06.06 அன்று சுகாதார அமைச்சினால் வெளியிடப்பட்ட அறிக்கையில், உள்ளகப் பயிற்சி மருத்துவர்களுக்கான சேவை நிலையங்களாக இந்தத் தீவில் உள்ள 23 மாவட்டங்களைச் சார்பாக்கும் வகையில் 64 மருத்துவமனைகள் பட்டியலிடப்பட்டு இருந்தன. அந்த வகையில், இங்குள்ள 28 ஆதார வைத்தியசாலைகளில்கூட காணப்படும் இவ்வசதி, நாட்டின் 24ஆம், 25ஆம் மாவட்டங்களான மன்னாரிலும் முல்லைத்தீவிலும் இல்லை என்பது, இந்த நாட்டின் மருத்துவ சேவை வழங்கலில் மேற்படி இரு மாவட்டங்களும் மிகவும் சமச்சீராக அணுகப்படவில்லை என்பதைத்தான் காட்டுகின்றது. முல்லைத்தீவில் 21 மருத்துவர்களுக்குப் பற்றாக்குறை காணப்படுகின்றது. அங்கு ஒரு நிரந்தர மருத்துவ நிபுணர்கூட இல்லை. 23 மருந்துக் கலவையாளர்களின் தேவை இருக்கின்றது. 13 தாதிய உத்தியோகத்தர்கள் தேவையாக இருக்கின்றனர். 2025.07.21இல் உள்ளபடி, 300க்கும் மேற்பட்ட ஆளணி வெற்றிடம் முல்லைத்தீவுப் பிராந்திய மருத்துவ சேவை வழங்கலில் இருப்பதும் சமச்சீரற்ற சேவை வழங்கலின் சான்றே!

கௌரவ அமைச்சர் அவர்களே, எனது முதலாவது மேலதிகக் கேள்வியைக் கேட்கின்றேன்.

எப்போது அல்லது எப்போதிருந்து எங்களையும் உங்களில் ஒருவராக, நீங்கள் காணும் உலகத்தை நாங்களும் காணத்தக்கவர்களாக, நீங்கள் பெறும் மருத்துவ வசதியின் தரத்தை நாங்களும் பெறக்கூடியவர்களாக, எங்கள் மன்னார் மற்றும் முல்லைத்தீவு மாவட்ட மருத்துவமனைகளைக் கஷ்டப் பிரதேச மருத்துவமனைகள் என்ற பட்டியலில் இருந்து அகற்றிச் சமச்சீரான சேவை வழங்கலில் இணைப்பீர்கள்?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ඔබටත්, අපටත් කියලා වෙනම එකක් නැහැ, ගරු මන්ත්‍රීතුමනි. රටේ හැම පුරවැසියාටම ප්‍රශස්ත සෞඛ්‍ය සේවාවක් ලබා දීම සඳහා වන පහසුකම් සැලසීම තමයි රජයේ බලාපොරොත්තුව. ඒ වෙනුවෙන් අපි කටයුතු කරගෙන යනවා. හැබැයි, දිස්ත්‍රික් මහ රෝහල් සංවර්ධනය කිරීමේ සහ පළාත් සභා රෝහල් දිස්ත්‍රික් මහ රෝහල් බවට පත් කිරීමේ කටයුතු විවිධ කාලවල තමයි සිද්ධවෙලා තිබෙන්නේ කියන එක ඔබතුමා පිළිගන්නවා ඇති. එම නිසා ඒවායේ සංවර්ධන මට්ටම්වල විවිධ අවස්ථා, අදියර තිබෙනවා. ඇත්තටම මුලතිව්, වවුනියාව, කිළිනොච්චිය සහ මන්නාරම යන දිස්ත්‍රික් මහ රෝහල් තවමත් තිබෙන්නේ පළාත් සභාව යටතේ. එහෙම නැතුව රේඛීය අමාත්‍යාංශය යටතේ නොවෙයි. පළාත් සභා රෝහල් කියලා වෙනස් වෙන්නේ නැහැ, අපි සියලුම රෝහල්වලට අවශ්‍ය කරන කාර්ය මණ්ඩලය සපයනවා; ක්‍රමානුකූලව සම්පත් සපයනවා. ඒ විතරක් නොවෙයි. ඔබතුමා සඳහන් කළ ආකාරයට රෝහල් සංවර්ධනය සඳහා අපේ අරමුදල්වලට අමතරව සමහර අවස්ථාවලදී විදේශීය රටවලිනුත් අරමුදල් ලබා ගන්නවා. එකක් තමයි, මම කලිනුත් කිව්ව විධියට මන්නාරම රෝහලේ Accident and Emergency වාට්ටු සංකීර්ණය ඉන්දියානු මධ්‍යම ආණ්ඩුවේ සහාය සහිතව ඉදිකරන්න අපි ගිවිසුම්ගත වුණා. ඒ වාගේම අපි මුලතිව්වලටත් ව්‍යාපෘතියක් ගේනවා. මේ ආකාරයට අපි සංවර්ධන කටයුතු කරගෙන යනවා.

[ගරු නලින්ද ජයතිස්ස මහතා]

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම විශේෂඥ වෛද්‍යවරු යොමු කිරීමේදී තමයි මම වැඩිපුරම සැලකිලිමත් වෙන්නේ. මොකද, අපට සිටින විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන නිසා සමහර වෙලාවට විදේශීය පුහුණුවට යවන්න කලින් අපට කිහිපදෙනෙක් රටේ හැම තැනකටම - මුලතිව්ද, මන්නාරමද කියලා නැහැ - යවන්න සිද්ධ වෙනවා. මම කලින් කිව්ව විධියට පුහුණුව ලැබිලා Board-certified වෙන්න කලින් කිහිපදෙනෙක් යවන්න සිද්ධ වෙනවා. එතකොට, ළඟ ළඟ මාරුවීම් කරන්නත් සිද්ධ වෙනවා. හැබැයි, මේක ඒ පළාත්වල විතරක් සිද්ධ වන සිදුවීමක් නොවෙයි. අපි විශේෂඥ වෛද්‍ය සේවා ලබා දීම සඳහා උපරිමයෙන් කටයුතු කරන්න යෑමේදී ඇති වන තත්ත්වය අනුව කළමනාකාරණය කර ගන්නවා.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
நன்றி, கௌரவ அமைச்சர் அவர்களே!

முல்லைத்தீவு மாவட்டத்தில் புதுக்குடியிருப்பு, மாங்குளம், மல்லாவி ஆகிய வைத்தியசாலைகளுக்கு 'ஆதார வைத்தியசாலை' எனப் பெயர்ப்பலகை இடப்பட்டுள்ளது. இருப்பினும், இந்த ஆதார வைத்தியசாலைகளுக்கு முறையான ஆளணி வசதிகளோ, பௌதிக வளங்களோ இல்லை. 'ஆதார வைத்தியசாலை' எனப் பெயர்ப்பலகைகளை இடுவதை மாத்திரம் நாம் எதிர்பார்க்கவில்லை. தயவுசெய்து அந்த மக்களுடைய கோரிக்கைகளை நிறைவேற்றுங்கள்! நோய் என்பது எல்லோருக்கும்தான் வரும்!

முல்லைத்தீவு மாவட்டத்தில் மல்லாவி, மாங்குளம், முறிகண்டி போன்ற பகுதிகளில் உள்ள கர்ப்பிணித் தாய்மார் மகப்பேற்றிற்கென முல்லைத்தீவு மாவட்ட வைத்தியசாலைக்குச் செல்வதற்குப் போக்குவரத்து உள்ளிட்ட பாரிய இடர்பாடுகளை எதிர்கொள்கின்றனர். இதனால் குறித்த பகுதிகளைச் சேர்ந்த மக்கள் உடனடியாகக் கிளிநொச்சி வைத்தியசாலைக்கே போகவேண்டி இருக்கின்றது. மாங்குளம் வைத்தியசாலையில் நீங்கள் அதற்கான பௌதிக வசதிகளைச் செய்து கொடுத்திருக்கின்றீர்கள். ஆனால், அதற்குத் தகுந்த வைத்தியர்களோ, தாதியர்களோ, ஆளணி வசதியோ இல்லை. இதன் காரணமாக அந்த வைத்தியசாலைக்கு அண்மையில் இருக்கின்றவர்கள்கூட கிளிநொச்சி வைத்தியசாலைக்குச் செல்ல வேண்டிய நிலை காணப்படுகின்றது. எனவே, முல்லைத்தீவு மாவட்டத்தின்கீழ் வருகின்ற வைத்தியசாலைகளைத் தரமான வகையிலே இயங்கச் செய்வதற்கு ஏற்ற நடவடிக்கைகளை நீங்கள் செய்வது பொருத்தமானதாக இருக்கும் என்றுதான் நான் கருதுகின்றேன். உங்களுடைய சேவைகளை நான் குறை சொல்லவில்லை. ஆனால், அந்த வைத்தியசாலைகளில் இருக்கின்ற குறைகளை நான் சுட்டிக் காட்டுகின்றேன்.

எனது இரண்டாவது மேலதிகக் கேள்வி: நீங்கள் எங்களுடைய முல்லைத்தீவு மற்றும் மன்னார் மாவட்டங்களைக் கடைநிலை மாவட்டங்களாகக் கொண்டுவராமல் அவற்றையும் முன்னேற்றமடையச் செய்யவீர்களா?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු මන්ත්‍රීතුමනි, දිස්ත්‍රික්ක මට්ටමින් මේ පහසුකම් ලබා දීම සම්බන්ධව අපි සලකා බලනවා. ඒ වාගේම ඔබේ දිස්ත්‍රික්කයට ආසන්නව තිබෙන එසේ පහසුකම් ලබා දිය හැකි අනෙකුත් රෝහල්වලටත් මානව සහ භෞතික සම්පත් ලබා දුන්නා නම්, එම පැතිවල ජනතාවටත් ඒවායේ ප්‍රතිඵල ලබා ගන්න පුළුවන් කියා අපි කල්පනා කරනවා. එහෙම නැතුව දිස්ත්‍රික්කයේම තිබෙන රෝහල් ටික සංවර්ධනය කරලා එම දිස්ත්‍රික්කයේම ජනතාවට සහන සලසන ආර්ථික තත්ත්වයක නොවෙයි නේ, අපි ඉන්නේ. නමුත් කිලිනොච්චිය සහ අනෙකුත් රෝහල්වල තිබෙන පහසුකම් - උතුරේ තිබෙන මේ රෝහල් කිහිපය අතර සමහර සම්පත් කළමනාකරණය කර ගනිමින් සේවා සපයන්න අපි කල්පනා කර තිබෙනවා. මොකද, ඒකත් හොඳයි. සමහර රෝහල්වල තිබෙන විශේෂිත පහසුකම් අපි ඒ මුළු පළාතේම ජනතාවටත්, තදාසන්න දිස්ත්‍රික්කවල ජනතාවටත් ලබා දෙන්නට ඕනෑ.

අපි ඉතාම ඉක්මනින් ඔය රෝහල් පිළිබඳව සාකච්ඡාව කැඳවා තිබෙනවා, RD එක්ක. එහිදී ඔබතුමා ඉදිරිපත් කරපු කාරණා සම්බන්ධවත් අවධානය යොමු කරන්නම්. බොහොම ස්තුතියි.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් නඩත්තු කරන වැව් සහ ගංගා: විස්තර
## நீர்ப்பாசனத் திணைக்களத்தால் பராமரிக்கப்படும் குளங்கள் மற்றும் ஆறுகள்: விபரம்
## TANKS AND RIVERS MAINTAINED BY IRRIGATION DEPARTMENT: DETAILS

1251/2025

**7. ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා**
(மாண்புமிகு அஜந்த கம்மெத்தெகே)
(The Hon. Ajantha Gammeddage)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලේඛනගත කර ඇති වැව් සහ ගංගා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කරන වැව් සංඛ්‍යාව කොපමණද;

(iii) වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කරන, මාතර දිස්ත්‍රික්කයේ ඇති වැව්, ගංගා හා ඇළ මාර්ග සංඛ්‍යාව සහ ඒවායේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මාතර සහ තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල, නිල්වලා ගඟ නිම්නය ආශ්‍රිතව වාරි රක්ෂිත වෙන් කර තිබේද;

(v) ඒවා වෙනත් පාර්ශ්ව විසින් අත්පත් කරගෙන ඇති බව දන්නේද;

(vi) එසේ නම්, ඊට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නාදුගල ග්‍රාම නිලධාරි වසමේ නිල්වලා ගඟ ව්‍යාපාරයට අත්පත් කරගත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ වෙනුවෙන් වන්දි දී තිබේද;

(iii) වන්දි ගත් පුද්ගලයන් විසින් එම ඉඩම් වෙනත් පාර්ශ්වයන්ට විකුණා ඇති බව දන්නේද;

(iv) නිල්වලා ගඟ ව්‍යාපාරය ඉදිරියටත් ක්‍රියාත්මක කරන්නේද;

(v) නොඑසේ නම්, අත්පත් කරගත් ඉඩම් නැවත මුල් අයිතිකරුවන්ට ලබා දෙන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நீர்ப்பாசனத் திணைக்களத்தில் ஆவணப்படுத்தப்பட்டுள்ள குளங்கள் மற்றும் ஆறுகளின் எண்ணிக்கை வெவ்வேறாக எத்தனை என்பதையும்;

(ii) நீர்ப்பாசனத் திணைக்களத்தால் பராமரிக்கப்படும் குளங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iii) நீர்ப்பாசனத் திணைக்களத்தால் பராமரிக்கப்படும், மாத்தறை மாவட்டத்திலுள்ள குளங்கள், ஆறுகள் மற்றும் கால்வாய்களின் எண்ணிக்கை மற்றும் அவற்றின் பெயர்கள் வெவ்வேறாக யாவை என்பதையும்;

(iv) மாத்தறை மற்றும் திஹகொட பிரதேச செயலாளர் பிரிவுகளில், நில்வளா ஆற்றுப்படுகைக்கு அண்டியதாக நீர்ப்பாசனத்துக்கான ஒதுக்கங்கள் காணப்படுகின்றனவா என்பதையும்;

(v) அவற்றை வேறு தரப்பினர் கையகப்படுத்தியுள்ளமையை அறிவாரா என்பதையும்;

(vi) ஆமெனில், அதற்கெதிராக சட்ட நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டுள்ளனவா என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) திஹகொட பிரதேச செயலாளர் பிரிவின், நாதுகல கிராம அலுவலர் பிரிவில் நில்வளா ஆற்றுத் திட்டத்துக்குச் சுவீகரிக்கப்பட்டுள்ள காணியின் அளவு யாது என்பதையும்;

(ii) அதற்கான இழப்பீடுகள் வழங்கப்பட்டுள்ளனவா என்பதையும்;

(iii) இழப்பீடுகளை பெற்றுக்கொண்ட ஆட்கள் மேற்படி காணிகளை வேறு தரப்பினருக்கு விற்றுள்ளமையை அறிவாரா என்பதையும்;

(iv) நில்வளா ஆறு சார்ந்த கருத்திட்டம் தொடர்ந்தும் நடைமுறைப்படுத்தப்படுமா என்பதையும்;

(v) இன்றேல், சுவீகரிக்கப்பட்ட காணிகள் மீண்டும் அதன் ஆரம்ப உரிமையாளர்களுக்கு வழங்கப்படுமா என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he state -

(i) the number of tanks and rivers registered with the Irrigation Department, separately;

(ii) the number of tanks maintained by the Irrigation Department;

(iii) the number of tanks, rivers and canals in the Matara District maintained by the Irrigation Department and their names, separately;

(iv) whether irrigation reserves have been allocated in the Matara and Thihagoda Divisional Secretaries' Divisions by the Nilwala River Valley;

(v) whether he is aware that they have been occupied by other parties; and

(vi) if so, whether any legal action has been taken against it?

(b) Will he also state -

(i) the amount of land acquired for the Nilwala Ganga Project in the Nadugala Grama Niladhari Division of the Thihagoda Divisional Secretary's Division;

(ii) whether compensation has been paid for it;

(iii) whether he is aware that the persons who received compensation have sold the said lands to other parties;

(iv) whether the Nilwala Ganga Project will continue to be implemented; and

(v) if not, whether the acquired lands will be returned to the original owners?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - காணி மற்றும் நீர்ப்பாசனப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Deputy Minister of Land and Irrigation)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා

(අ) (i) වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලේඛනගත කර ඇති වැව් සංඛ්‍යාව 700කි. ගංගා 103කි.

(ii) ඉහත සඳහන් කරන ලද වැව් 700හි මෙහෙයුම් හා නඩත්තු කටයුතු වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබයි. ඉහත සඳහන් කරන ලද වැව් විශාලත්වය හා කලාප අනුව බෙදී යන ආකාරය ඇමුණුම 01 යටතේ පහත පරිදි දක්වා ඇත.

**ඇමුණුම 01**

- වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පවතින වැව් පහත පරිදි වේ.

ප්‍රධාන ජලාශ - 80

මධ්‍යම ප්‍රමාණයේ ජලාශ - 161

[ගරු සුසිල් රණසිංහ මහතා]

වෙනත් වැව් - storage tanks, level crossings, small tanks and feeder tanks - 459

| කලාපය | ප්‍රධාන ජලාශ | මධ්‍යම ප්‍රමාණයේ ජලාශ | වෙනත් වැව් |
|---|---|---|---|
| අම්පාර | 10 | 5 | 26 |
| අනුරාධපුර | 13 | 80 | 47 |
| බදුල්ල | 7 | 3 | 11 |
| මඩකලපුව | 6 | 3 | 1 |
| කොළඹ | - | 4 | - |
| ගාල්ල | 2 | 5 | 1 |
| හම්බන්තොට | 10 | 9 | 40 |
| මහනුවර | 4 | 8 | 21 |
| කුරුණෑගල | 9 | 10 | 108 |
| මන්නාරම | 4 | 4 | 163 |
| මොනරාගල | 3 | 19 | 6 |
| පොළොන්නරුව | 4 | 3 | 8 |
| පුත්තලම | 2 | 7 | 15 |
| ත්‍රිකුණාමලය | 6 | 1 | 12 |
| එකතුව | 80 | 161 | 459 |

වැව් නාම ලේඛනය ඇමුණුම 02හි සඳහන් කර ඇත. එය දීර්ඝ ලේඛනයක්. එම නිසා ඇමුණුම 02 **සභාගත*** කරනවා.

(iii)

- වැව්

විශාල වැව් - 02

1. ඇල්ලේ වැව
2. කැකනදුර වැව

මධ්‍යම ප්‍රමාණය වැව් - 04

1. දෙනගම වැව
2. ලේනබටුව වැව
3. උයන් වැව
4. නාපේ උඩුවතුර වැව

- ගංගා

නිල්වලා ගඟ සහ එහි ප්‍රධාන අතු ගංගා වන කිරම ආර, දිගිලි ඔය, හුලංදා ඔය සහ ගුරුත්ව වාරි ව්‍යාපාර 06ක ඇළ මාර්ග, අමුණු ව්‍යාපාර 07ක ඇළ මාර්ග, ගංවතුර පාලන වාරි ව්‍යාපාර 03ක ඇළ මාර්ග සහ උස්සාන වාරි ව්‍යාපාර 01ක ඇළ මාර්ග පවතී.

දෙනගම - ප්‍රධාන ඇළ මාර්ග කි.මී. 6.1 - පිටවාන් ඇළ - කි.මී. 0.6 - D ඇළ මාර්ග කි.මී. 15 - පෝෂිත ඇළ කි.මී. 0.6

ඇල්ලේවෙල - ප්‍රධාන ඇළ මාර්ග කි.මී. 8 - පෝෂිත ඇළ කි.මී. 0.6 - පිටවාන් ඇළ - කි.මී. 0.6

කැකනදුර - ප්‍රධාන ඇළ මාර්ග කි.මී. 8.4

උයන් වැව - ප්‍රධාන ඇළ මාර්ග කි.මී. 2.6 - D ඇළ කි.මී. 3 - පෝෂිත ඇළ කි.මී. 1.2 - පිටවාන් ඇළ කි.මී. 1.2

හාලි ඇළ - ප්‍රධාන ඇළ මාර්ග කි.මී. 5.8 - D ඇළ කි.මී. 3 - පෝෂිත ඇළ කි.මී. 10

කද්දුව - ප්‍රධාන ඇළ මාර්ග කි.මී. 8.8 - පිටවාන් ඇළ - කි.මී. 0.5

කඩවැද්දුව - ප්‍රධාන ඇළ මාර්ග කි.මී. 9.4 - D ඇළ කි.මී. 3.5 - අපවහන ඇළ කි.මී. 21.81

අකුරුගොඩ - ප්‍රධාන ඇළ මාර්ග කි.මී. 5.8

කිරලකැලේ - ප්‍රධාන ඇළ මාර්ග කි.මී. 47.5

දෙදියගල - ප්‍රධාන ඇළ මාර්ග කි.මී. 5.4

දියලපේ - ප්‍රධාන ඇළ මාර්ග කි.මී. 3.5

හමරගොඩ - ප්‍රධාන ඇළ මාර්ග කි.මී. 4 - බෙදුම් ඇළ කි.මී. 2.1

අලවතුගොඩ - ප්‍රධාන ඇළ මාර්ග කි.මී. 3.5 - බෙදුම් ඇළ කි.මී. 3.5

ඌරපොළ - ප්‍රධාන ඇළ මාර්ග කි.මී. 3.7 - බෙදුම් ඇළ කි.මී. 4.9 - D 113

පෙත්තර - ප්‍රධාන ඇළ මාර්ග කි.මී. 2.9 - බෙදුම් ඇළ කි.මී. 3.2 - D 27

සපුගොඩ - ප්‍රධාන ඇළ මාර්ග කි.මී. 2.0 - D 5-3

(iv) නිල්වලා යෝජනා ක්‍රමය යටතේ අත්පත් කර ගන්නා ලද නිල්වලා යෝජනා ක්‍රමයේ නිර්මිතවලට අදාළ රක්ෂිත වෙන් කර ඇත.

(v) ඔව්.

(vi) ඒ සඳහා නඩු කටයුතු 13ක් මේ වන විට පවතින අතර එක් නඩුවක වැඩ කටයුතු අවසන්ව ඇත. තවත් නඩු කටයුතු 42ක් ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

(ආ) (i) ආසන්න වශයෙන් හෙක්ටෙයාර 10.55ක් නාදුගල කොට්ඨාසය තුළ පවතී.

(ii) වන්දි ගෙවන ලද බවට ලේඛන ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ ඇත.

(iii) ඔව්.

(iv) 1988/89 කාලය තුළ අත්හැර දමන ලද ප්‍රංශ ආධාර ව්‍යාපෘතිය ඒ ආකාරයටම ක්‍රියාත්මක කිරීම අපහසු විය හැකි නමුත්, රට ආර්ථික වශයෙන් ස්ථාවර වූ පසු නිල්වලා ව්‍යාපාරය යම් පමණකට හෝ ඉදිරියටත් ක්‍රියාත්මක කළ යුතුව ඇත.

(v) නැත. නිල්වලා යෝජනා ක්‍රමයේ ගංවතුර පාලන හා වාරි කටයුතු මේ වන විටත් ක්‍රියාත්මක වෙමින් පවතින අතර, ඉඩම්වල අනවසර අල්ලා ගැනීම් සඳහා විධිමත් ලෙස නීතිමය කටයුතු සිදු කරමින් පවතී.

(ඇ) ඉහත පිළිතුර අනුව අදාළ නොවේ.

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා**
(மாண்புமிகு அஜந்த கம்மெத்தெகே)
(The Hon. Ajantha Gammeddage)

ගරු කථානායකතුමනි, මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. නිල්වලා ව්‍යාපාරය සඳහා අත්පත් කර ගන්නා ලද ඉඩම් ගැන විශේෂයෙන්ම පත් ඉරුවල සටහන් වෙලා තිබිලා නැහැ. ඒ ප්‍රදේශයේ මුල් අයිතිකරුවන් ඒ ඉඩම් නැවත විකුණා තිබෙනවා. නැවත විකිණුවාට පස්සේ අලුත් අයිතිකරුවන් විධියට අවුරුදු 25ක්, 30ක් තිස්සේ වෙනත් අය තමයි ඒ ඉඩම් පාවිච්චි කරන්නේ. ඔවුන් ගෙවල් දොරවල් හදාගෙන ඉන්නවා. දැනට තිබෙන ප්‍රශ්නය මේකයි. වාරිමාර්ග දෙපාර්තමේන්තුව කියනවා ඒ අයට ඒ ඉඩම්වලින් ඉවත් වෙන්න කියලා. කාලාන්තරයක් තිස්සේ ඔවුන් ඒ ඉඩම් භුක්ති විඳලා තිබෙනවා. ඒ පිරිසට සාධාරණයක් ඉෂ්ට කරන්න කටයුතු කරනවාද කියන එකයි මා අහන්නේ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු කථානායකතුමනි, ඒ මන්ත්‍රීතුමා කියන කාරණය හරි. එතැන ගැටලුවක් තිබෙනවා. අනවසරයෙන් ඒ ඉඩම් අත්පත් කරගෙන ඒවා විකුණා තිබෙනවා. මේක දීර්ඝ කාලයක් තිස්සේ තිබෙන ප්‍රශ්නයක්. වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් යම් යම් ක්‍රියාමාර්ග ගත්තාට, ඒ කටයුත්ත විධිමත් විධියට සිදු වෙලා තිබෙනවා සහ පූර්ණ පිළිතුරක් ලැබිලා තිබෙනවා කියලා මම හිතන්නේ නැහැ. ඒ සම්බන්ධයෙන් අපි කටයුතු කරන්න කැමැතියි. මාතර දිස්ත්‍රික්කයේ මහජන නියෝජිතයන් විධියට සිටින මන්ත්‍රීතුමන්ලාගේත් උදවු අරගෙන අපි ඒ කටයුත්ත විධිමත් කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙළ සූදානම් කරන්නම්.

## ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම්: කළුතර දිස්ත්‍රික්කය
## காணி மறுசீரமைப்பு ஆணைக்குழுவுக்கு உரித்தான காணிகள்: களுத்துறை மாவட்டம்
## LANDS BELONGING TO LAND REFORM COMMISSION: KALUTARA DISTRICT

1282/2025

**8. ගරු ධනුෂ්ක රංගනාත් මහතා**
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු සියලුම ඉඩම් නිශ්චිතව වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, ඒවා අතරින් මේ වන විට භාවිතයට නොගන්නා, නමුත් 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත අනුව භාවිතයට ගැනීමට හැකියාවක් ඇති ඉඩම් ප්‍රමාණය සහ ඒවායේ වර්තමාන හිමිකමේ ස්වභාවය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) කළුතර දිස්ත්‍රික්කයේ, කොමිෂන් සභාව සතු සියලුම ඉඩම් සඳහා හිමිකම් පත්‍ර සහ පිඹුරු පත්‍ර ලබාදී තිබේද;

(ii) එසේ නම්, ඒවායේ වලංගු කාලය කොපමණද;

(iii) ඉඩම් නොමැති හෝ නැවත පදිංචි කරන පුද්ගලයන් සඳහා කොමිෂන් සභාවේ ඉඩම් නිදහස් කිරීමට හැකිද;

(iv) එසේ නම්, ඊට අදාළ ක්‍රියාපටිපාටිය කවරේද;

(v) බදු පදනම මත ලබා දී ඇති කොමිෂන් සභාවේ ඉඩම්, අදාළ අරමුණ වෙනුවෙන් භාවිත කර නොමැති නම්, නැවත පවරා ගැනීමට හැකිද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) களுத்துறை மாவட்டத்தில், காணி மறுசீரமைப்பு ஆணைக்குழுவுக்கு உரித்தான சகல காணிகளும் திட்டவட்டமாக வெவ்வேறாக அடையாளம் காணப்பட்டுள்ளனவா என்பதையும்;

(ii) ஆமெனில், அவற்றுள் தற்பொழுது பயன்படுத்தப்படாத, எனினும் 1972 ஆம் ஆண்டின் 1ஆம் இலக்க காணி மறுசீரமைப்பு சட்டத்துக்கமைய பயன்பாட்டுக்கு எடுக்கக்கூடிய இயலுமையுள்ள காணிகளின் அளவு மற்றும் அவற்றின் தற்போதைய உரித்தின் தன்மை ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவுக்கமைய வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) மேற்படி காணிகள் தொடர்பில் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) களுத்துறை மாவட்டத்தில், ஆணைக்குழுவுக்கு உரித்தான சகல காணிகளுக்கும் உரித்துப் பத்திரங்கள் மற்றும் வரைபடங்கள் (plans ) வழங்கப்பட்டுள்ளனவா என்பதையும்;

(ii) ஆமெனில், அவற்றின் செல்லுபடியாகும் காலம் எவ்வளவு என்பதையும்;

(iii) காணியற்ற அல்லது மீளக் குடியமர்த்தும் நபர்களுக்கு ஆணைக்குழுவின் காணிகளை விடுவிக்க முடியுமா என்பதையும்;

(iv) ஆமெனில், அதற்குரியதான நடைமுறை யாது என்பதையும்;

[ගරු ධනුෂ්ක රංගනාත් මහතා]

(v) குத்தகை அடிப்படையில் வழங்கப்பட்டுள்ள ஆணைக்குழுவின் காணிகள், குறித்த நோக்கத்துக்காகப் பயன்படுத்தப்படவில்லை எனில், மீளக் கையகப்படுத்த முடியுமா என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he state -

(i) whether all the lands belonging to the Land Reform Commission in the Kalutara District have been precisely identified separately;

(ii) if so, among them, the extent of the lands that are not currently used but can be used in accordance with the Land Reform Law No. 1 of 1972, and of the nature of the present ownership of the lands concerned, separately for each Divisional Secretary's Division; and

(iii) the actions that will be taken in respect of the said lands?

(b) Will he also state -

(i) whether title deeds and survey plans have been issued for all the lands which belong to the Commission in the Kalutara District;

(ii) if so, their period of validity;

(iii) whether lands belonging to the Commission can be released for persons who do not have land or those being resettled;

(iv) if so, the relevant procedure relating thereto; and

(v) whether the lands which belong to the Commission and which have been given on lease basis could be repossessed, if the said lands have not been used for the relevant purpose?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතේ විධිවිධාන ප්‍රකාරව ඉඩම් පවරා ගැනීමේදී පැවරී ඇති සියලු ඉඩම් මැනුම් කිරීමකින් තොරව පැවරී ඇත. එසේ හෙයින්, නිශ්චිතව හඳුනා ගැනීමක් සිදු කර නොමැත.

(ii)

| අනු අංකය | ඉඩමේ නම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රමාණය | | | වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|---|
| | | | අක්කර | රූඩ් | පර්චස් | |
| 1 | විහාර වත්ත | අගලවත්ත | 09 | 02 | 08 | වට මැනුම් කර ඇත. කිහිපදෙනෙකු අනවසරයෙන් වගා කරයි. |
| 2 | මැද්දෙගෙදර වත්ත | මතුගම | 200 | 00 | 00 | අක්කර 47ක් සඳහා නඩුවක් ඇත. ඉල්ලීම් නැත. |
| 3 | ගීකියනකන්ද බටවලකැලේ | බුලත්සිංහල | 06 | 00 | 00 | අනවසරකරුවන් විසින් මේ වන විට තේ වගා කර ඇත. |
| 4 | හැගල්ල වත්ත | හොරණ | 20 | 00 | 00 | ගල් සහිත කැලෑ ප්‍රදේශයකි. |
| 5 | මඩබොක්කලන් කුඹුරුයාය | මිල්ලනිය | හෙක්ටෙයාර 34 | | | පුරන් වී ඇත. අද ගොවීන් සිටීද යන්න පරීක්ෂා කළ යුතුය. |

(iii) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතේ විධිවිධාන හා අනුමත චක්‍රලේඛ පරිදි ඉදිරි කටයුතු සිදු කෙරේ.

(ආ) (i) නැත.

(ii) කොමිෂන් සභාව විසින් බලපත්‍ර ලබා නොදෙන අතර, නේවාසික අරමුණු සඳහා 22(1)(ඇ) වගන්තිය යටතේද, කෘෂිකාර්මික කටයුතු සඳහා 22(1)(අ) වගන්තිය යටතේද සින්නක්කරව පවරා දේ. තවද, තිස් අවුරුදු බදු පදනම මත බදු ගිවිසුම් ලබා දීම සිදු කෙරේ.

(iii) හැකියාවක් පවතී.

(iv) ඉඩම් කච්චේරි ක්‍රමය හරහා සුදුසුකම්ලාභීන් තෝරා ගැනීම, ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රමය යටතේ ප්‍රාදේශීය ලේකම් වෙත පවරා දීම.

(v) හැකියාවක් පවතී.

(ඇ) ඉහත පිළිතුර අනුව අදාළ නොවේ.

**ගරු ධනුෂ්ක රංගනාත් මහතා**
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)

ගරු කථානායකතුමනි, 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත මත පදනම් වෙලා ඉඩම් කැබලි බෙදා දීම, ඔප්පු බෙදා දීම වැනි වැඩසටහන් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. දැනට ඵලදායී ලෙස භාවිතයට නොගන්නා ඉඩම් එම ආකාරයට, නව නිශ්චිත ක්‍රමවේදයක් තුළ ඵලදායී ලෙස භාවිතයට ගැනීම සඳහා හැකියාවක් පවතිනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය විධියට මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, නව ව්‍යවසායකයන්, ව්‍යාපාරිකයන් බිහි කිරීම සඳහා කොමිෂන් සභාව සතු ඉඩම් එම නව ව්‍යයසායකයන්ගේ, ව්‍යාපාරිකයන්ගේ ව්‍යාපාර අදහස් ඇගැයීමේ ක්‍රියාවලියක් හරහා යෙදවීමේ ක්‍රමයක් පවතිනවාද, මේ වෙනකොට එවැනි ක්‍රියාවලියක් ආරම්භ කරලා තිබෙනවාද කියලා.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු කථානායකතුමනි, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් ව්‍යාපෘති සඳහා ලබා දිය හැකි ආකාර 2ක් දැනට තිබෙනවා. ඒ කියන්නේ ආයෝජකයෙක් ආවොත්, නිශ්චිතව ඔහු නම් කරන ඉඩමට ව්‍යාපෘති වාර්තාවක් අරගෙන, ඒ වාගේම ඒ ඉඩම සඳහා අදාළ වෙනත් ආයතනවල අවසරය, ඔවුන්ගේ එකඟතාව අරගෙන ඉදිරියට යන්න පුළුවන්. ඒ වාගේම සමහර ව්‍යවසායකයෝ එනවා, ඔවුන් නිශ්චිතව ඉඩමක් හඳුනාගෙන නැහැ. ඒ වෙලාවට කොමිෂන් සභාවට හඳුනාගන්න පුළුවන් ඉඩම් ඔවුන්ට පෙන්වනවා. මේ වාගේ කටයුතු තිබෙනවා. ඒ වාගේම සමහර ඉඩම් තිබෙනවා, -ඇත්තටම අපි දැන් ඒවා ලේඛනගත කරමින් යනවා- ඒ ඉඩමට ආයෝජකයෙක් ඇවිල්ලා නැහැ, නමුත් ඒ ඉඩමේ කරන්න පුළුවන් ව්‍යාපෘතිය මොකක්ද කියලා හඳුනාගෙන තිබෙනවා. එසේ හඳුනාගෙන, සුදුසු ආයෝජකයින් කැඳවා ගැනීම සඳහා වූ වැඩකටයුත්තකුත් අපි කරගෙන යනවා. මේකෙදි බාධාවක් වෙලා තිබෙනවා, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු මේ වාගේ ඉඩම් කොහේද තිබෙන්නේ කියන එක සම්බන්ධයෙන් ලේඛනගත තොරතුරු නැති වීම. ඒ නිසා ඒවා එකතු කර ගනිමින් තමයි ඒක කරන්න වෙන්නේ. ඒ ක්‍රියාදාමයත් අපි ආරම්භ කරලා තිබෙනවා.

ඊට අමතරව, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ඉඩම්වල බොහෝ පිරිසක් කෘෂිකාර්මික කටයුතු කරනවා, නිශ්චිත බදු ගිවිසුම්වලට එළඹෙන්නේ නැතුව. ඒවාත් විධිමත් කිරීම සඳහා වූ ක්‍රියාදාමයක් අපි ආරම්භ කර තිබෙනවා.

**ගරු ධනුෂ්ක රංගනාත් මහතා**
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)

ගරු කථානායකතුමනි, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම කියන්නේ රජයේ ආයතනයක්. ඒ වාගේම ඉඩම් වැනි වටිනා සම්පත් සම්බන්ධයෙන් පිහිටුවා ඇති ආයතනයක්. 2024 විගණන වාර්තාවේ බදු අය කර ගැනීම පිළිබඳව නිර්දේශ රාශියක් සඳහන් වනවා. ඒ ඒ ගැටලු වෙන් වෙන් වශයෙන් නොසලකා නැවත එවැනි ගැටලු ඇති නොවන සේ කටයුතු කරමු කියන එකත් යෝජනා කරන ගමන්ම, මගේ දෙවන අතුරු ප්‍රශ්නයත් අහනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, බදු පදනම මත පුද්ගලයින් සඳහා ලබා දුන් ඉඩම් සඳහා බදු අය කර ගැනීමේ ක්‍රියාවලියේ ප්‍රගතියක් තිබෙනවාද?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු මන්ත්‍රීතුමනි, මේකේත් විශාල ගැටලුවක් තිබෙනවා. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ඉඩම් බදු දීලා තිබෙනවා. නමුත් ඒ ඉඩම්වලින් බදු අය වෙන්නේ නැහැ. ඒ සම්බන්ධවත් විශාල ගැටලු තිබෙනවා. ඒ නිසා ඇත්තටම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අය විය යුතු බදුවල අඩුවක් තිබෙනවා, අවිධිමත් බවක් තිබෙනවා, අකාර්යක්ෂම බවක් තිබෙනවා. ඒ නිසා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හරහා ක්‍රියාත්මක කරන ව්‍යාපෘති කිහිපය අතරින් එකක් තමයි, මේ බදු නැවත විධිමත් විධියට අය කර ගැනීම සඳහා කටයුතු කරන එක. අපි දැන් හඳුනාගෙන තිබෙනවා, මොන ඉඩම්වලින්ද බදු අය නොවන්නේ සහ මොනවාද ඒ ගැටලු කියන එක. මේ කටයුත්ත දිස්ත්‍රික් මට්ටමින් කෙරෙන්න ඕනෑ. ඒකත් ටිකක් සංකීර්ණ ක්‍රියාවලියක්. ප්‍රධානම හේතුව, මේවායේ කිසි පිළිවෙළක් නොමැති වීම. ඒ දේවල් සම්බන්ධයෙන් පසුගිය කාලයේ කටයුතු කරලා නැහැ. ඒ නිසා අපි දැන් ඒ කටයුතු විධිමත් කරමින් යනවා. ඇත්තටම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත අය විය යුතු බදු මුදල් අය කිරීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක්, කඩිනම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළේ නැත්නම් අරමුදල් පවා අර්බුදයකට යන තත්ත්වයක තමයි තිබෙන්නේ. ඒ සඳහා අපි දැනට වැඩසටහනක් ආරම්භ කරලා තිබෙනවා.

## ගාල්ල දිස්ත්‍රික්කය: උග්‍ර පානීය ජල හිඟය
## காலி மாவட்டம்: கடுமையான குடிநீர்த் தட்டுப்பாடு
## GALLE DISTRICT: ACUTE SHORTAGE OF DRINKING WATER

1306/2025

**9. ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ මේ වනවිට උග්‍ර පානීය ජල හිඟයක් පවතින බව දන්නේද;

(ii) එම පානීය ජල හිඟය විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) පසුගිය රජය විසින් ගාල්ල, වක්වැල්ල ජල පොම්පාගාරයේ, ජල ඝන ලීටර 50,000ක ධාරිතාවකින් යුතු ජල ටැංකියක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කරන ලද බව දන්නේද;

(iv) එම ජල ටැංකිය ඉදිකිරීමේ කටයුතු අතරමඟ නතර වීමට බලපාන ලද හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நகர அபிவிருத்தி, நிர்மாணிப்பு மற்றும் வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காலி மாவட்டத்தில் தற்போது கடுமையான குடிநீர்த் தட்டுப்பாடு நிலவுவதை அறிவாரா;

(ii) அந்தக் குடிநீர்த் தட்டுப்பாட்டை நிவர்த்தி செய்வதற்கு எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை;

(iii) கடந்த அரசாங்கத்தால் காலி, வக்வெல்ல நீர்ப்பம்பி நிலையத்தில் 50,000 கன லீற்றர் நீர்க் கொள்ளளவு கொண்ட நீர்த்தாங்கி ஒன்றை நிர்மாணிக்கும் பணிகள் ஆரம்பிக்கப்பட்டதை அறிவாரா;

(iv) அந்த நீர்த்தாங்கியின் நிர்மாணப் பணிகள் இடைநடுவே நின்றுவிடச் செல்வாக்குச் செலுத்திய காரணங்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

[ගරු චානක මාදුගොඩ මහතා]

asked the Minister of Urban Development, Construction and Housing:

(a) Will he inform this House -

(i) whether he is aware that there is currently an acute shortage of drinking water in the Galle District;

(ii) the measures that will be taken to address the aforesaid shortage of drinking water;

(iii) whether he is aware that the previous Government commenced the construction of a water tank with a capacity of 50,000 cubic litres at the Wakwella Water Pumping Station in Galle; and

(iv) the reasons for the construction of that water tank being halted midway?

(b) If not, why?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්. මෙයට හේතු වන්නේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් සපයනු ලබන ජල ධාරිතාව ප්‍රමාණවත් නොවීමයි.

විශේෂයෙන් ගාලු දිස්ත්‍රික්කයේ දෛනිකව නිෂ්පාදනය කරනු ලබන ජල ධාරිතාව ඝන මීටර් 106,100කි. මෙයින් අපතේ යන, එහෙම නැත්නම් ආදායම් නොලබන ජල ධාරිතාව හැටියට වාර්තා වෙනවා, ඝන මීටර් 31,830ක් -සියයට 30ක්-. ඒ ප්‍රමාණය හැරුණුකොට පරිභෝජනය සඳහා වන ජල ප්‍රමාණය ඝන මීටර් 74,270ක්. දැනට ගාල්ල දිස්ත්‍රික්කයේ ජල සම්බන්ධතා තිබෙනවා, 146,600ක්. මේ ජල ධාරිතාව ප්‍රමාණවත් නොවීම කියන කාරණය නිසා තමයි සමහර ස්ථානවල අඛණ්ඩ ජල සැපයුමක් පවත්වාගෙන යන්න අපහසු වෙලා තිබෙන්නේ.

(ii) අපි දැන් හපුගල intake එකෙන් ඝන මීටර් 30,000ක ධාරිතාවකින් යුත් ජල පවිත්‍රාගාරයක් ලබා ගන්න සැලසුම් කර තිබෙනවා. ඒ සඳහා රුපියල් බිලියන 37ක් ඇස්තමේන්තුගත කරලා තිබෙනවා. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අධ්‍යක්ෂ අනුමැතිය ලබාගෙන, දැන් එය ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කරලා තිබෙනවා.

ඒ වාගේම මේ ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න අවශ්‍ය වන විදේශ ණය ලබා ගැනීම සඳහා අපි මූලික සාකච්ඡාව සිදු කළා. ඔවුන් ඒ සඳහා මූලික එකඟතාව ලබා දී තිබෙනවා. ඒ අනුව අපි හිතනවා, 2027 අවුරුද්දේ මේ ජල ව්‍යාපෘතිය පටන් ගන්න පුළුවන් කියලා.

(iii) ඝන ලීටර 50,000ක ජල පවිත්‍රාගාරයක් ඉදිකරන්න කටයුතු කර තිබුණත්, 2021, 2022 හා 2023 වර්ෂවල පැවැති ආර්ථික අර්බුදය නිසා ඒ කටයුතු ඇනහිට තිබෙනවා. මම සඳහන් කළා වාගේ මූලික අදියර හැටියට ඝන මීටර් 30,000ක ජල පවිත්‍රාගාරයක් හදන්න අපි සැලසුම් සකස් කර ඒ සඳහා මූලික අනුමැතිය අරගෙන තිබෙනවා.

(iv) ඇත්තටම මම කලින් සඳහන් කළා වාගේ ආර්ථික අර්බුදය නිසා තමයි කලින් යෝජනා වෙච්ච ජල පවිත්‍රාගාරය ඉදිකිරීමේ කටයුතු නතර වෙලා තිබෙන්නේ. නමුත්, අපි බලයට පත් වුණාට පසු නැවත වරක් ඒ පිළිබඳව සොයා බලා දැන් ජල පවිත්‍රාගාරයක් ඉදිකරන්න කටයුතු කර තිබෙනවා. අපි විශ්වාස කරනවා, ඒ ජල පවිත්‍රාගාරය ඉදි කළාට පසු ගාල්ල දිස්ත්‍රික්කයේ තිබෙන - විශේෂයෙන් ඔය වෙරළ තීරය සහ ඒ අවට ප්‍රදේශවලත්, රට අභ්‍යන්තරයේ කොටසකත් - පානීය ජල අවශ්‍යතාව සම්පූර්ණ කරන්න අපට පුළුවන්කම ලැබෙයි කියලා.

(ආ) අදාළ නොවේ.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

ගරු ඇමතිතුමනි, එම පිළිතුර ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, මේ වනවිට ගාල්ල දිස්ත්‍රික්කය තුළ සංචාරක ව්‍යාපාරය විශාල වශයෙන් ක්‍රියාත්මක වෙනවා. ලංකාව තුළ සංචාරක ව්‍යාපාරය සම්බන්ධයෙන් ඉතා ප්‍රචලිතම ප්‍රදේශයක් තමයි, ගාල්ල දිස්ත්‍රික්කය. නමුත්, අද වනවිට ගාල්ල දිස්ත්‍රික්කය තුළ සංචාරක ව්‍යාපාරයේ යෙදී සිටින හෝටල් කර්මාන්තකරුවන් මේ ජල ගැටලුව නිසා විශාල අර්බුදයකට මුහුණ දී තිබෙනවා. ඒ වාගේම, ප්‍රධාන පාසල් 10ක් ගාල්ල දිස්ත්‍රික්කය තුළ තිබෙනවා. මෙම ජල ගැටලුව නිසා එම පාසල්වල කටයුතු පවත්වාගෙන යෑම සම්බන්ධවත් අද වනකොට ගැටලු මතුවෙලා තිබෙනවා. ඒ වාගේම, ගාල්ල දිස්ත්‍රික්කය තුළ ඉන්න ජනතාවටත් පානීය ජලය ක්‍රමවත්ව නොලැබීම නිසා මේ වනවිට ඔවුනුත් ඉතා දැඩි අපහසුතාවට පත් වෙලා සිටිනවා. ගරු ඇමතිතුමනි, අනාගතයේදී මේ සම්බන්ධයෙන් සිදු කරන වැඩ පිළිවෙළ ගැන ඔබතුමාගේ පිළිතුර තුළ සඳහන් වුණා. මම ගරු ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, ලබන වසරේ අය වැය ලේඛනය තුළින් මේ සඳහා අපට නිශ්චිත විසඳුමක් ලබා ගන්න පුළුවන් ද කියන කාරණය. ඒ සඳහා අපට යම්කිසි සුබදායී පණිවුඩයක් ආණ්ඩු පාර්ශ්වයෙන් ලබා ගන්න පුළුවන් ද?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ගරු මන්ත්‍රීතුමනි, මම ඒ සම්බන්ධයෙන් දැනටමත් උත්තර ලබා දීලා තිබෙන්නේ. අපි මේ ව්‍යාපෘතිය 2027දී ආරම්භ කරන්න සැලසුම් කර තිබෙනවා. 2026 අපේ ප්‍රමුඛතා ලේඛනයේ මෙය සඳහන්ව තිබෙනවා. විශේෂයෙන් ගාල්ල දිස්ත්‍රික්කයේ, ඇල්පිටියේ ඉඳලා හබරාදුව දක්වා තිබෙන වෙරළ තීරයේ පිහිටි සංචාරක කලාපය තුළත් මේ පානීය ජල ප්‍රශ්නය බරපතළව තිබෙන බව අපි දන්නවා. අපි ආණ්ඩුව භාර ගත්තාට පසුව මේ සම්බන්ධයෙන් සොයා බලා ඒ සඳහා අවශ්‍ය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතියත් ලබා ගන්න යොමු කර තිබෙනවා. ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත්තාට පසුව තමයි අපට අය වැය යෝජනාවලිය සඳහා මේ ව්‍යාපෘතිය ඉදිරිපත් කරන්න පුළුවන්කම ලැබෙන්නේ. 2026 අවුරුද්ද සඳහා වන අය වැය දැනටමත් අපි සකස් කර තිබෙන්නේ. නමුත්, නිශ්චිත කාල සීමාව තුළ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගන්න පුළුවන්කම ලැබුණේ නැහැ. ඒ සැලසුම් සම්බන්ධයෙන් සහ අනෙකුත් කර්තව්‍යයන් සඳහා විශාල කාලයක් ගත වුණා. නමුත්, 2027 අවුරුද්දේ ඉඳලා මේ ව්‍යාපෘතිය ආරම්භ කරන්න අපි කටයුතු කරනවා.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු ඇමතිතුමනි, 2027 වර්ෂයේදී ඒ කටයුත්ත යථාර්ථයක් බවට පත් වේවා කියලා අපි හැමෝම ප්‍රාර්ථනා කරනවා.

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, කෙටිකාලීන විසඳුමක් විධියට මේ කාල සීමාව තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හරහා මෙම ප්‍රදේශවලට පානීය ජලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ අවධානය යොමු වෙලා තිබෙනවාද? මොකද, අපි 2027 වසරේදී අය වැය ලේඛනයෙන් මේ සඳහා මුදල් වෙන් කර ගත්තත්, ඒ කටයුත්ත සම්පූර්ණ වෙන්න තවත් වසර 3ක, 4ක පමණ කාලයක් ගත වෙනවා.

ගරු කථානායකතුමනි, ඒ නිසා තව වසර 4ක්, 5ක් වාගේ කාලයක් ගාල්ලේ ජනතාවට පානීය ජලය සම්බන්ධයෙන් පීඩා විඳින්න සිදු වෙනවා. රජය මඟින් ඒ සඳහා කෙටි කාලීන විසඳුමක් හඳුන්වා දෙන්න පුළුවන්ද කියන එකට ගරු ඇමතිතුමාගෙන් මා පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
මා සඳහන් කළ ව්‍යාපෘතිය අවුරුදු 3කින් අවසන් කරන්න තමයි අපි සැලසුම් සකස් කරලා තිබෙන්නේ. එතකොට 2030 වෙනකොට මේ ගැටලුව විසඳන්න පුළුවන්. නමුත් අපි දන්නවා, ඒ වනතුරු මේ සමහර ප්‍රශ්න උග්‍රව තියා ගන්න බැහැ කියන එක. මම කලින් සඳහන් කළා වාගේ ගාල්ල දිස්ත්‍රික්කයේ ආදායම් නොලබන ජල ධාරිතාව සියයට 30ක්. ජල ප්‍රමාණය හැටියට ගත්තොත්, ඝන මීටර් 31,830ක් විවිධ හේතුන් - පැරණි උපකරණ, පැරණි ජල මාර්ග වාගේ හේතුන් - නිසා අපතේ යනවා. දැන් අපි වැඩ පිළිවෙළක් සකස් කරලා ක්‍රියාත්මක කරමින් ඉන්නවා, මෙන්න මේ අපතේ යන ජල ප්‍රමාණය අවම වශයෙන් සියයට 10ක සීමාවකට ගෙනෙන්න. ඒ වෙනුවෙන් අපි ලෝක බැංකු ආධාර වැඩසටහනත් එක්ක සමගාමීව දැනටමත් ව්‍යාපෘති ආරම්භ කර තිබෙනවා. අපි හිතනවා, මේ ව්‍යාපෘතිය ඉක්මනින් අවසන් කළාට පසුව මේ ජල ධාරිතාව තව සියයට 20කින් වැඩි කරන්න අපිට පුළුවන් වෙයි කියලා. එතැනිනුත් යම්කිසි විසඳුමක් අපිට ලබා ගන්න පුළුවන්, පරිපූර්ණ විසඳුමක් නොවුණත්.

## මොනරාගල දිස්ත්‍රික්කයේ ආයුර්වේද රෝහල්: පුරප්පාඩු

### மொனராகலை மாவட்டத்திலுள்ள ஆயுர்வேத வைத்தியசாலைகள்: வெற்றிடங்கள்

### AYURVEDIC HOSPITALS IN MONARAGALA DISTRICT: VACANCIES

1329/2025

**10.** **ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා**
(மாண்புமிகு டபிள்யூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ ඇති ප්‍රාදේශීය ආයුර්වේද රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම රෝහල් මඟින් ප්‍රදේශයේ ජනතාවට විශාල සේවයක් සිදු කරන බව පිළිගන්නේද;

(iii) මේ වනවිට එම රෝහල්වල පවතින සේවක පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) එම රෝහල් තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மொனராகலை மாவட்டத்திலுள்ள பிரதேச ஆயுர்வேத வைத்தியசாலைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) அவ்வைத்தியசாலைகள் மூலம் பிரதேச மக்களுக்குப் பாரிய சேவை ஆற்றப்பட்டு வருவதை அவர் ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iii) இன்றளவில் மேற்படி வைத்தியசாலைகளில் நிலவும் ஊழியர் வெற்றிடங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) மேற்படி வைத்தியசாலைகளை மேலும் அபிவிருத்தி செய்வதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்

asked the Minister of Health and Mass Media:

(a) Will he inform this House -

(i) the number of regional Ayurvedic hospitals in the Monaragala District;

(ii) whether he admits that the said hospitals provide a significant service to the people of the area;

(iii) the current number of staff vacancies in the said hospitals; and

(iv) measures that will be taken to further develop the said hospitals?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

| | |
|---|---|
| කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් කාර්ය මණ්ඩලය අනුමත කරන ලද ආයුර්වේද රෝහල් සංඛ්‍යාව - 02 | 1. බිබිල, මැදගම දිස්ත්‍රික් ආයුර්වේද රෝහල<br>2. කිරිඉබ්බන්වැව ග්‍රාමීය ආයුර්වේද රෝහල |
| ආයතනික නාම සංශෝධනය නොවූ සහ ග්‍රාමීය ආයුර්වේද රෝහල් ලෙස කාර්ය මණ්ඩල අනුමත නොවූ ආයුර්වේද රෝහල් සංඛ්‍යාව - 02 (කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවක් ලෙස කාර්ය මණ්ඩලය අනුමත කර ඇති අතර මේ වනවිට ග්‍රාමීය ආයුර්වේද රෝහලක් ලෙස උත්ශ්‍රේණිගත කර ඇත.) | 1. බුත්තල ග්‍රාමීය ආයුර්වේද රෝහල<br>2. වැලියාය ග්‍රාමීය ආයුර්වේද රෝහල |

(ii) ඔව්.

2025 ජනවාරි සිට අගෝස්තු දක්වා ප්‍රතිකාර ගනු ලැබූ රෝගීන් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත.

[ගරු නලින්ද ජයතිස්ස මහතා]

**ආයුර්වේද රෝහල්වල තොරතුරු ඉදිරිපත් කිරීම - මොනරාගල දිස්ත්‍රික්කය**

**2025 ජනවාරි සිට 2025 අගෝස්තු දක්වා**

| අ/අ | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ජනගහනය | ආයුර්වේද රෝහල | බාහිර රෝගී සංඛ්‍යාව (OPD) | අභ්‍යන්තර රෝගී දින ගණන (occluded beds at midnight) | එක් දින ප්‍රතිකාර (one day treat-ments) | ඇඳන් සංඛ්‍යාව (Beds) | වාට්ටු/ ගෙවන කාමර සංඛ්‍යාව | වර්ෂය තුළ මධ්‍යම රාත්‍රී භාවිත කළහැකි ඇඳන් සංඛ්‍යාව | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජනගහනයෙන් සේවා සපයන ඇඳන් ගණන | භාවිත කළ ඇඳන් සංඛ්‍යාව ප්‍රතිශතය (Bed occupancy rate %) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | මැදගම | 40,444 | බිබිල, මැදගම දිස්ත්‍රික් ආයුර්වේද රෝහල | 21,557 | 9,362 | 241 | 75 | 05/ගෙවන වාට්ටු 01/ ගෙවන කාමර 04 | 27375 | 1.85 | 34.20 |
| 2 | මොනරාගල | 55,817 | වැලියාය ග්‍රාමීය ආයුර්වේද රෝහල | 8,567 | 1,216 | 0 | 20 | 2 | 7300 | 0.36 | 16.66 |
| 3 | බුත්තල | 59,834 | බුත්තල ග්‍රාමීය ආයුර්වේද රෝහල | 13,145 | 6,215 | 894 | 22 | 2 | 8030 | 0.37 | 77.40 |
| 4 | සෙවනගල | 47,228 | කිරිඉබ්බන් වැව ග්‍රාමීය ආයුර්වේද රෝහල | 15,532 | 5,359 | 0 | 65 | 3 | 23725 | 1.38 | 22.59 |
| | | 203,323 | | 58,801 | 22,152 | 1,135 | 182 | 28/ගෙවන වාට්ටු 01/ ගෙවන කාමර 11 | 66430 | 0.90 | 33.35 |

(iii)

| ආයුර්වේද රෝහල | තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| බිබිල මැදගම දිස්ත්‍රික් ආයුර්වේද රෝහල | ආයුර්වේද වෛද්‍ය අධිකාරී | 1 | 0 | 1 |
| | ආයුර්වේද වෛද්‍ය නිලධාරී (කොන්ත්‍රාත්) | 3 | 1 | 2 |
| | හෙද නිලධාරී | 4 | 0 | 4 |
| | වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ | 1 | 0 | 1 |
| | සම්බාහනකරු | 4 | 1 | 3 |
| | උපස්ථායක | 15 | 7 | 8 |
| | ඕවර්සියර් | 1 | 1 (2025.09.06 විශ්‍රාම) | |
| | ටිකට් ලිපිකරු | 2 | 0 | 2 |
| | ඖෂධ සංයෝජක | 2 | 1 | 1 |
| | සෞඛ්‍ය කාර්ය සහායක (සාමාන්‍ය) | 14 | 2 | 12 |
| | බෙහෙත් ශාලා කම්කරු | 2 | 0 | 2 |
| | එකතුව | 49 | 13 | 36 |

| ආයුර්වේද රෝහල | තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| කිරිඉබ්බන්වැව ග්‍රාමීය ආයුර්වේද රෝහල | හෙද නිලධාරී | 3 | 0 | 3 |
| | භෛසජ්ජක | 1 | 0 | 1 |
| | සම්බාහනකරු | 2 | 0 | 2 |
| | උපස්ථායක | 6 | 3 | 3 |
| | සෞඛ්‍ය කාර්ය සහායක (සාමාන්‍ය) | 6 | 0 | 6 |
| | බෙහෙත් ශාලා කම්කරු | 2 | 1 | 1 |
| | එකතුව | 20 | 4 | 16 |

(iv) කිරිඉබ්බන්වැව ග්‍රාමීය ආයුර්වේද රෝහලේ ඖෂධ නිෂ්පාදනාගාරය ඉදිකිරීම ඇතුළුව අලුත්වැඩියා කටයුතු කිහිපයක් තිබෙනවා. ඒකට මිලියන 12ක ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරෙමින් පවතිනවා. මැදගම දිස්ත්‍රික් ආයුර්වේද රෝහලේ බාහිර රෝගී අංශය පුළුල් කිරීමත් ඇතුළුව මිලියන 17.08ක ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරෙමින් පවතිනවා. බුත්තල ග්‍රාමීය ආයුර්වේද රෝහලේ ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කෙරෙමින් පවතිනවා. අපි ඒ වෙනුවෙන් මිලියන 18.73ක් වැය කරමින් ඉන්නේ. ඊට අමතරව වැලියාය ග්‍රාමීය ආයුර්වේද රෝහල වෙනුවෙන් මිලියන 3ක පොඩි ප්‍රතිසංස්කරණ ප්‍රමාණයක් තමයි ගරු

මන්ත්‍රීතුමනි, සිදු කරමින් පවතින්නේ. මේ පිළිබඳ සවිස්තර තොරතුරු ඇතුළත් ඇමුණුමක් තිබෙනවා. මා එය **සභාගත*** කරනවා.

ඊට අමතරව කාර්ය මණ්ඩල ප්‍රශ්නයේදී, අපි දැන් සෞඛ්‍ය කාර්ය සහායකයන් බඳවා ගැනීමේදී රේඛිය අමාත්‍යාංශවලට ලබා දුන්නාම අපට පුළුවන්කමක් ලැබෙනවා පළාත් සභාවලටත්, ආයුර්වේදයටත් යම් ප්‍රමාණයක් යොමු කරන්නට.

(ආ) පැන නොනඟී.

**ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා**
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)
ගරු කථානායකතුමනි, ප්‍රශ්නයට විස්තරාත්මක පිළිතුරක් ගරු ඇමතිතුමා ලබා දුන්නා. ගරු ඇමතිතුමනි, එයට බොහොම ස්තුතියි.

ඇත්තටම අපේ මොනරාගල දිස්ත්‍රික්කයේ ආයුර්වේද රෝහල්වලට මේ වනකොට පෙරටත් වඩා නේවාසික රෝගීන් ඇතුළු වීමේ ලොකු වර්ධනයක් තිබෙනවා. එම නිසා ගරු ඇමතිතුමනි, ඔබතුමා දැන් ප්‍රකාශ කළා වාගේ, අපේ රෝහල්වල පවතින වෛද්‍යවරු, nurseලා ඇතුළු අදාළ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු ටික හැකි ඉක්මනින් සම්පූර්ණ කර දෙන්න කියන ඉල්ලීම කරනවා.

ගරු ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අපේ දිස්ත්‍රික්කයේ රෝහල්වල ඖෂධ හිඟව පවතින අවස්ථා තිබෙනවා. හැබැයි, අපේ දිස්ත්‍රික්කයෙන්ම ඖෂධ සපයා ගන්න තිබෙන අවස්ථා වැඩියි. අපේ මැදගම, නිල්ගල වනාන්තරය තිබෙනවා. බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තිබෙනවා පෙට්ටගම්තලාව වැනි ඖෂධ වනාන්තර. ඒ ඖෂධ වනාන්තරත් තිබෙනවා. ඖෂධ වගා කරන අයත් ඉන්නවා. මේ වගා කරන ඖෂධ ඒ අයගෙන් ආයුර්වේද දෙපාර්තමේන්තුව මිලදී අරගෙන ඖෂධ නිෂ්පාදනය කර ගන්න වැඩ පිළිවෙළක් හැදුවොත් හොඳයි නේද, එහෙම පුළුවන් ද කියන ප්‍රශ්නය මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු මන්ත්‍රීතුමා, ඇත්තටම ඌව පළාත් සභා ආයුර්වේද දෙපාර්තමේන්තුව ගත්තොත්, ඖෂධ නිෂ්පාදනයේදී සැලකිය යුතු වැඩකටයුතු ප්‍රමාණයක් කරමින් ඉන්නා තැනක්. ඊට අමතරව අපි අපේ ආයුර්වේද ඖෂධ සංස්ථාව මඟිනුත් යම් ප්‍රමාණයක් සපයනවා. මේ වෙලාවේදී සමහර ඖෂධවල අමුද්‍රව්‍ය සම්බන්ධ ප්‍රශ්නයක් තිබෙනවා. මම ඔබතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නය ගැන තව අවධානය යොමු කරන්නම්. අපි පුළුවන් තරම් බලන්නේ දේශීය අමුද්‍රව්‍ය සොයා ගෙන ඖෂධ නිෂ්පාදනය කරන්න තමයි.

**ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා**
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)
ගරු අමාත්‍යතුමනි, ඇත්තටම වරින් වර පළාත් සභාවෙන් මිලදී ගැනීම් කාලයක් තිස්සේම කරගෙන ආවා. හැබැයි, ඒ මිලදී ගැනීම ප්‍රමාණවත් මදියි කියලා තමයි මට නම් දැනෙන්නේ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මම අවධානය යොමු කරන්නම්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා**
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)
ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා අහනවා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමාට දෙවැනි ප්‍රශ්නය අහන්න අවස්ථාව ලබා දෙනවා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු කථානායකතුමනි, ණයට ඉල්ලා ගත්ත අතුරු ප්‍රශ්නය මම අහනවා. තුන් දෙනාම පළාත් සභාවේ, පළාතේ නේ? කමක් නැහැ. ගරු අමාත්‍යතුමනි, මම ඔබතුමාගෙන් අහන්නේ අපේ පළාතේ ප්‍රශ්නයක් නොවෙයි, පදවියේ එකක්. ගරු මන්ත්‍රීතුමාත් හිටියා. පදවියේ එක්කෙනෙක් කථා කළා. වකුගඩු රෝගීන් වැඩිපුර ඉන්නේ පදවි ශ්‍රී පුර පැත්තේ. පදවියේ දැනට තිබෙන තත්ත්වය hospital එකෙන් ඔබතුමා අහලා බලන්න. ලේ මාරු කරන්න කටු නැහැ. කටු ගන්නෙත් පෞද්ගලිකව. කටු දෙකකට රුපියල් 2,000ක් යනවා. අනුරාධපුරයේ ඇමති කෙනෙකුත් ඉන්නවා නේ ඒ, ලාල් කාන්ත මහත්තයා. මම හිතන විදියට, මාතලේ හන්දියේ ඉඳලා පදවියට කිලෝමීටර 100ක් විතර තිබෙනවා නේ. පදවිය රෝහලේ තත්ත්වය ඕකයි. පදවියේ විතරක් නොවෙයි, ලංකාවේම රෝහල්වල වකුගඩු රෝගීන්ගේ ලේ මාරු කරන්න කටුත් ගන්න ඕනෑ. ඒ මිනිස්සු බොහොම දුක් විඳිනවා. අන්න ඒ ගැන ඔබතුමා බලන්න. හැබැයි, ඔබතුමා හිනා වෙලා ලස්සනට ඉන්නවා, doctor. හිනා වෙලා හිටියාට වැඩක් නැහැ. ඒ වැඩෙත් බලන්න වෙයි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
හිනා වෙලා ඉන්නවා වාගේම ඒ ප්‍රශ්නය බලලා තිබෙන්නේ.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මේ, පදවිය රෝහලේ.

---

*** *පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

හරි. හරි. ගරු මන්ත්‍රීතුමා, පදවියේ පමණක් නොවෙයි, ඒ ප්‍රශ්නය රෝහල් ගණනාවක තිබුණා. හේතුව තමයි fistula needles වර්ග දෙකක් තිබුණා, fixed හා rotating කියලා. මේකෙදී මේ ටෙන්ඩරය ගත්ත සැපයුම්කරුවා ඒ අදාළ කරන තත්ත්වයේ කටු නොවෙයි සැපයුවේ. ඒක නිසා සෞඛ්‍ය අමාත්‍යාංශයට ඒ වෙලාවේ මිලදී ගැනීමේ හැකියාවක් තිබුණේ නැහැ. නමුත්, මේ වන විට දැන් ඒක වෙනත් සැපයුම්කරුවෙක් විසින් පෞද්ගලික රෝහල්වලට, එළියේ දාලා තිබෙනවා. ඒ නිසා අපි ඒ හැම රෝහලකටම අවශ්‍ය කරන විධියට ප්‍රාදේශීය මිලදී ගැනීම් සිදු කරන්න මුදල් ලබා දීලා තිබෙනවා. ඒ නියමිත පිරිවිතරයන්ට අනුකූලව සැපයුම ඔක්තෝබර් 12වන දා වෙනකොට ලැබෙනවා. දැන් මම දිනපතාම මේක කළමනාකරණය කර ගනිමින් යනවා. ප්‍රධාන රෝහල්වලටත්, ඒ වාගේම අපේ regional MSDවලටත් අවශ්‍ය කරන ප්‍රමාණ දැන් මේගොල්ලන් මිලදී ගෙන තිබෙනවා. තව කොහේ හෝ තැනක නැත්නම් මම නැවත සොයා බලන්නම්. අපේ වෛද්‍ය සැපයුම් ඒකකයට - MSD එකට - අදාළ කරන විධියට සපයා ගැනීමට බැරි වෙලා තිබෙනවා, ඒ සැපයුම්කරුගේ ප්‍රශ්නය නිසා. ඒ නිසා තමයි අපි local purchase කරන්න අවශ්‍ය මුදල් ලබා දීලා තිබෙන්නේ. දිනපතා මේ ගැන බලමින් ඉන්නකොට අපට දැනෙනවා, දැන් local purchase කරන ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා කියලා. ඕක තමයි ගරු මන්ත්‍රීතුමනි, එතැන ඇති වෙලා තිබෙන ප්‍රශ්නය.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවැනි වටය.

## උතුරු පළාතට අයත් සම්පත් අනුමැතියකින් තොරව රැගෙන යාම: වැළැක්වීම
## அனுமதியின்றி வட மாகாணத்தின் வளங்களைப் பரிமாற்றம் செய்தல்: தடுத்தல்
## TRANSFER OF RESOURCES BELONGING TO NORTHERN PROVINCE WITHOUT APPROVAL: PREVENTION

1083/2025

**2. ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) වන්නි ප්‍රදේශයේ සිදු කරනු ලබන ගල් කැඩීමේ සහ පස් කැපීමේ කටයුතු සඳහා පළාත් සභා පරිපාලනයට අයත් කිසිදු ආයතනයකින් අවසර නොගෙන සෘජුවම මධ්‍යම රජයේ ආයතනවලින් අනුමතිය ලබා ගන්නා බවත්;

(ii) එම ක්‍රියාවලියේදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යන ආයතන සම්බන්ධ වන බවත්;

(iii) කැනීම් කරන ඛනිජ සම්පත් ප්‍රවාහනය කිරීම සඳහා යොදා ගන්නා මාර්ග පළාත් පාලන ආයතනවල පරිපාලනයට අයත් වන අවස්ථාවලදී පමණක් අදාළ පළාත් පාලන ආයතනයේ අනුමතිය ලබා ගන්නා බවත්;

(iv) ඒ අනුව, උතුරු පළාතේ සම්පත් පළාත් සභාවේ සහ පළාත් පාලන ආයතනවල අනුමතියකින් තොරව පිට පළාත්වලට ගෙන යන බවත්;

එතුමා පිළිගන්නේද?

(ආ) (i) පළාත් සභාවේ සහ පළාත් පාලන ආයතනවල අනුමතියකින් තොරව උතුරු පළාතේ සම්පත් පිට පළාත්වලට ගෙන යාමට ඉඩ දෙන්නේද;

(ii) මෙම තත්ත්වය වැළැක්වීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන විකල්ප වැඩ පිළිවෙළ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வன்னிப் பிரதேசத்தில் மேற்கொள்ளப்படும் கருங்கல் உடைத்தல் மற்றும் மண் அகழ்வு நடவடிக்கைகளுக்கு மாகாண சபை நிருவாகத்தின் கீழுள்ள எந்தவொரு நிறுவனத்திடமிருந்தும் அனுமதி பெறாமல் நேரடியாக மத்திய அரசாங்கத்தின் கீழுள்ள நிறுவனங்களிடமிருந்தே அனுமதி பெறப்படுகின்றது என்பதையும்;

(ii) மேற்படி செயற்பாட்டின்போது தொல்பொருளியல் திணைக்களம், புவிச் சரிதவியல் அளவை மற்றும் சுரங்கப் பணியகம், மத்திய சுற்றாடல் அதிகாரசபை, வனப் பாதுகாப்புத் திணைக்களம், வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களம் மற்றும் உரிய பிரதேச செயலகம் ஆகிய நிறுவனங்கள் தொடர்புபடுகின்றன என்பதையும்;

(iii) அகழ்ந்தெடுக்கப்பட்ட கனிய வளங்களைக் கொண்டு செல்வதற்கு உள்ளூராட்சி நிறுவனங்களின் நிருவாகத்தின் கீழுள்ள வீதிகளைப் பயன்படுத்தும் சந்தர்ப்பங்களில் மாத்திரம் குறித்த உள்ளூராட்சி நிறுவனத்திடமிருந்து அனுமதி பெறப்படுகின்றது என்பதையும்;

(iv) அதன்படி, வட மாகாணத்தின் வளங்கள், மாகாண சபை மற்றும் உள்ளூராட்சி நிறுவனங்களின் அனுமதியின்றி பிற மாகாணங்களுக்குக் கொண்டு செல்லப்படுகின்றது என்பதையும்;

அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) (i) வட மாகாணத்தின் வளங்களை, மாகாண சபை மற்றும் உள்ளூராட்சி நிறுவனங்களின் அனுமதியின்றி பிற மாகாணங்களுக்குக் கொண்டு செல்வதற்கு இடமளிக்கப்படுமா என்பதையும்;

(ii) மேற்படி நிலையைத் தடுப்பதற்காக நடைமுறைப்படுத்தப்படும் மாற்றுத்திட்டம் யாது என்பதையும்;

அவர் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Provincial Councils and Local Government:

(a) Will he accept that -

(i) approval for extracting stones and earth carried out in the Vanni area is obtained directly from the institutions functioning under the Central Government without obtaining permission from any institution functioning under the administration of the Provincial Council;

(ii) the Department of Archaeology, the Geological Survey and Mines Bureau, the Central Environmental Authority, the Department of Forest Conservation, the Department of Wildlife Conservation and the relevant divisional secretariat are involved in that process;

(iii) approval of the relevant local government institution is obtained only in cases where the roads used for transporting the mined mineral resources are under the administration of the respective local government institution; and

(iv) accordingly, the resources belonging to the Northern Province are being taken away to other provinces without the approval of that Provincial Council and the local government institutions?

(b) Will he state -

(i) whether resources belonging to the Northern Province are allowed to be taken away to other provinces without the approval of that Provincial Council and local government institutions; and

(ii) the alternative arrangement that will be put in place to prevent this situation?

(c) If not, why?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මා **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) කළු ගල් කැඩීමේ යන්ත්‍ර - stone crushers - භාවිත කරන කම්හල් සඳහා ව්‍යාපාරික බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියට පමණක් පළාත් පාලන ආයතන සම්බන්ධ වේ.

(ii) පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ විධිවිධාන අනුව අවශ්‍ය ආයතනවල අනුමැතිය ලබා ගැනීම සිදු කරයි.

(iii) කැණීම් කරන ලද ඛනිජ සම්පත් පළාත් පාලන මාර්ග ඔස්සේ ප්‍රවාහනය කිරීමේදී මාර්ග භාවිතය සඳහා පළාත් පාලන ආයතනය අවසර දෙනු ලැබේ.

(iv) පතල් සහ ඛනිජ ද්‍රව්‍ය පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමේදී දිවයිනේ ඕනෑම ස්ථානයකට ඛනිජ ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ හැකියාව පවතින බැවින් පළාත් සභාවේ සහ පළාත් පාලන ආයතනවල අනුමැතිය අවශ්‍ය නොවේ.

(ආ) (i) පතල් සහ ඛනිජ ද්‍රව්‍ය පනත අනුව ඛනිජ සම්පත් ප්‍රවාහනයට පළාත් සභාවේ හෝ පළාත් පාලන ආයතනවල අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය නොවේ.

(ii) පැන නොනඟී.

(ඇ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -1102/2025- (2), ගරු සුරංග රත්නායක මහතා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, ගරු සුරංග රත්නායක මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### අනාගත සංවර්ධන ඉලක්ක සහ ණය තිරසරභාවය සාක්ෂාත් කර ගැනීම සඳහා ගෙන ඇති පියවර
### எதிர்கால அபிவிருத்தி இலக்குகள் மற்றும் கடன் நிலைத்தன்மையை அடைவதற்காக எடுக்கப்பட்ட நடவடிக்கைகள்
### MEASURES TAKEN TO ACHIEVE FUTURE DEVELOPMENT GOALS AND DEBT SUSTAINABILITY

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මම පහත සඳහන් ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

ශ්‍රී ලාංකික අපට බංකොලොත් වූ රටක අත්දැකීම් ලබන්නට හේතු වූ එක් සුවිශේෂී කරුණක් වන්නේ දුර්වල ණය කළමනාකරණයයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ගිවිසුම්ගතව

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

තිබියදී රට භාරගත් වත්මන් ආණ්ඩුව එය සංවර්ධිත මාවතකට හරවාවි යැයි ජනතාව බලාපොරොත්තු වුණා. ඒ අනුව නව රජයට වසරක් ඉක්ම ගොස් ඇති මේ අවස්ථාවේ රටේ ඉදිරි සංවර්ධිත ඉලක්ක හා ඒ සඳහා වන ආර්ථිකයේ සූදානම දැනගැනීම සඳහා මම මේ ප්‍රශ්න ඉදිරිපත් කරනවා.

1. මේ වන විට ශ්‍රී ලංකාවේ සමස්ත සංචිත මුදල් ප්‍රමාණය කොපමණද? ඒක දක්වනකොට හුවමාරු ප්‍රමාණය - swaps - වෙනම දක්වන්න. පසුගිය ගෙවුණු වසරේ සංචිතවල මාසික වෙනස්වීම් කෙසේද?

   මම මේ ප්‍රශ්නය විශේෂයෙන්ම අහන්නේ, 2028 වන විට ඩොලර් බිලියන 15ක සංචිත ඉලක්කයක් සපුරාලන්නට රජය සැලසුම් කර තිබෙන නිසායි.

2. මේ වන විට රටේ සමස්ත ණය ප්‍රමාණය කොපමණද? එම ණය තුළ දේශීය ණය සහ විදේශීය ණය කොපමණද යන්න වෙන් වෙන්ව සඳහන් කළ හැකිද? එයින් වත්මන් රජය බලයට පත්වීමෙන් පසු ලබා ගෙන ඇති ණය ප්‍රමාණ (දේශීය හා විදේශීය) කවරේද? විදේශ ණය සම්බන්ධයෙන් ගත් කළ එය ද්විපාර්ශ්වීය, බහුපාර්ශ්වීය සහ ස්වෛරී බැඳුම්කර ලෙස වෙන් වෙන් වශයෙන් තොරතුරු ඉදිරිපත් කරන්නේද?

3. මෙම වසර තුළ ණය වාරික සහ පොලී වශයෙන් සිදු කරන ලද ගෙවීම් ප්‍රමාණය කොපමණද? එය ඉදිරි වසර 5 සඳහා වෙනස් වන ආකාරය වාර්ෂිකව වෙන් වෙන්ව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ හැකිද?

   විශේෂයෙන්ම IMF වැඩසටහන අවසන් වූ පසු අපට ණය සේවාකරණය සඳහා අවම වශයෙන් සියයට 30ටත් වඩා වැඩි ප්‍රමාණයක් - තුනෙන් දෙකකට ආසන්න මුදලක් - රාජ්‍ය ආදායමෙන් ගෙවන්න සිද්ධ වෙනවා. ඒ නිසා මේ දත්ත රටේ ජනතාවත්, අපිත් දැනගැනීම ඉතාම වැදගත් වෙනවා.

4. ඉදිරි වසර 5 තුළ ණය ගෙවීමේ ක්‍රියාවලිය තිරසරව පවත්වා ගැනීම සඳහා රජයේ ඇස්තමේන්තුගත ආර්ථික වර්ධන වේගය කොපමණද? ඒ කියන්නේ 2028 ණය ගෙවීම සඳහා අපි 2025, 2026, 2027 නඩත්තු කළ යුතු ආර්ථික වර්ධන වේගයන් කොපමණද? මේ වසරේ එම ඉලක්ක කොපමණ ප්‍රමාණයක් සපුරා ගෙන තිබේද? ඊළඟ වසර 5 තුළ එය කෙසේ පුරෝකථනය කර තිබේද?

5. සාධනීය ලෙස ණය ගෙවීම සඳහා වාර්ෂිකව පවත්වාගෙන යා යුතු යැයි ඇස්තමේන්තුගත කර ඇති, එහෙමත් නැත්නම් අපේක්ෂිත අවම අපනයන ආදායම් ප්‍රමාණය සහ විදේශ ප්‍රේෂණ ප්‍රමාණයන් කොපමණ විය යුතුද? වෙනත් වචනයකින් කියනවා නම් 2028දී ණය ගෙවීම සඳහා අපි මේ වන විට වාර්ෂිකව නඩත්තු කරන්නට ඕනෑ අපනයන ආදායම සහ ප්‍රේෂණ ප්‍රමාණය කොපමණ විය යුතුද? ඒක ඉතාම වැදගත් ප්‍රශ්නයක්. ඒ සඳහා - ඒ ඉලක්ක කරා යෑම සඳහා - ගෙවුණු වසර තුළ රජය සකස් කර ඇති වැඩ පිළිවෙළ කුමක්ද?

   එම වැඩ පිළිවෙළ තුළ රජය විසින් සාර්ථක කර ගත් ඉලක්ක කවරේද?

6. ගෙවුණු වසරේ සෘජු විදේශ ආයෝජන ලෙස කොපමණ ප්‍රමාණයක් ලංකාවට ලැබුණාද? මොකද, හැමෝම අහනවා, පසුගිය වසර තුළ අපේ රටට ලැබුණු foreign direct investments ප්‍රමාණය ගැන. ඒවා කොපමණද? ඉදිරි වසර පහ තුළ රජය අපේක්ෂා කරන සෘජු විදේශ ආයෝජන - foreign direct investments - ප්‍රමාණ කොපමණද? කුමන ක්ෂේත්‍ර යටතේ කොපමණ ප්‍රමාණයන්ගෙන් එම ආයෝජන ආකර්ෂණය කර ගැනීමට රජය අපේක්ෂා කරන්නේද? ඒ කියන්නේ, foreign direct investments අපේ රටට ලබා ගන්නට අදහස් කරන්නේ මොන මොන sectorsවලින්ද කියන එකයි.

   ගරු කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය විශේෂයෙන්ම අහන්න හේතුව මේකයි. අද වන විට Centre for Poverty Analysis සඳහන් කර තිබෙනවා, අපේ රටේ දුප්පතුන් ලක්ෂ 80ක් ඉන්නවා කියලා. ඒ දුප්පත්කම තුරන් කරන්නට මේ foreign direct investments අතිශයින් වැදගත් වෙනවා කියන එක මම සඳහන් කරන්න කැමැතියි.

7. ඒ වාගේම, SVAT අහෝසි කිරීම හෝ තවදුරටත් පවත්වා ගැනීම තුළින් ආර්ථිකය මත ඇති විය හැකි බලපෑම් පිළිබඳ අධ්‍යයනයක් - impact assessment එකක් - රජය සිදු කර තිබේද? අපනයනකරුවන් දැඩි ලෙස ඉල්ලා සිටියා, මේ SVAT පහසුකම ක්‍රියාත්මක කරන්න කියලා. ගරු කථානායකතුමනි, ඒ බව ඔබතුමාත් දන්නවා. ඔක්තෝබර් 01වැනි දා ඉඳලා ඒ SVAT ක්‍රමය අහෝසි කරලා තිබෙනවා; අපනයනකරුවන් බරපතළ කලකිරීමකට ලක් වෙලා තිබෙනවා. මම දැනගන්න කැමැතියි, රජය ඒ අහෝසි කිරීමේ තීන්දුව ගැනීම සඳහා කරපු impact assessment එක මොකක්ද කියන එක. එය ක්‍රියාත්මක කිරීම තුළින් ඇති වන බලපෑම පිළිබඳව කරපු විශ්ලේෂණය මොකක්ද? එම මාතෘකාව සම්බන්ධයෙන් වූ සංඛ්‍යාත්මක දත්ත වාර්තා කවරේද? එම වාර්තා සභාගත කළ හැකිද?

   ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය කාලීනව අතිවැදගත් ප්‍රශ්නයක්. විශේෂයෙන්ම තව මාසයකින් පමණ අය වැය ලේඛනය ඉදිරිපත් කරන නිසා, මේ සඳහා වන පිළිතුර අද දවසේ අපි බලාපොරොත්තු වෙනවා.

   ස්තුතියි.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවේ ගරු මුදල් නියෝජ්‍ය ඇමතිතුමා සභා ගර්භයේ නැහැ. ඒ නිසා ගරු විපක්ෂ නායකතුමාගේ ප්‍රශ්නයට අපි මේ සතිය තුළදී උත්තරය ලබා දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මන්ත්‍රීතුමා.

# II

## උතුරේ ධීවරයින් මුහුණ දෙන අභියෝග
## வட பகுதி மீனவர்கள் எதிர்கொள்ளும் சவால்கள்
## CHALLENGES FACED BY FISHERMEN IN THE NORTH

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)

கௌரவ சபாநாயகர் அவர்களே, பாராளுமன்ற நிலையியற் கட்டளை 27(2)இன்கீழ் மீனவர்களுக்கான எரிபொருள் விநியோகம் பற்றி கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சரிடம் கேள்வி கேட்பதற்கு அனுமதித்ததற்கு நன்றி!

கௌரவ அமைச்சர் அவர்களே, மீன்பிடித் தொழிலானது எமது மக்களின் தொழில் மட்டுமல்ல, நூற்றுக்கணக்கான குடும்பங்களை வாழவைக்கும் வாழ்க்கை முறையுமாகும். அது தேசத்துக்குத் தேவையான ஊட்டச்சத்தை வழங்குவதோடு, உள்நாட்டு உணவுப் பாதுகாப்புக்கும் ஏற்றுமதிக்கும் நாட்டின் பொருளாதாரத்துக்கும் பெரும் பங்களிப்புச் செய்கின்றது. எனினும், எமது மீனவர்கள் இலங்கையில் மிகவும் வறிய சமூகங்களில் ஒன்றாகவே இருந்து வருகின்றனர். மலிவு விலையில் போதுமான அளவு எரிபொருள் கிடைக்கவில்லை எனில், அவர்களால் தங்களது படகுகளை இயக்க முடியாது; கடலுக்குச் செல்ல முடியாது; வாழ்வாதாரத்தைக் காப்பாற்ற முடியாது.

பல ஆண்டுகளாக இடம்பெற்ற போர் காரணமாக வன்னி மீனவர்கள் இடப்பெயர்வுகளுக்கு உள்ளாக்கப் பட்டிருந்தார்கள். இப்பொழுது அவர்கள் வறுமையிலிருந்து மீளும் நிலையில் உள்ளனர். அவர்களிடம் சிறிய படகுகள் மட்டுமே உண்டு. அவர்கள் மிகவும் குறைந்த வளங்களையே கொண்டுள்ளனர். அன்றாட மீன்பிடி மூலம்தான் அவர்களது குடும்பங்கள் வாழ்கின்றன. எரிபொருள் இல்லாதபோது அவர்களது குடும்பங்கள் பசியால் தவிக்கின்றன; குழந்தைகள் பள்ளியைவிட்டு விலகுகின்றனர்; கடன் சுமை அதிகரிக்கின்றது; வறுமையின் சுழற்சி மேலும் மோசமடைகின்றது. எரிபொருள் பிரச்சினையை மட்டுமல்ல, அதனுடன் தொடர்புடைய பல சவால்களையும் அம்மீனவர்கள் எதிர்கொள்கின்றனர்.

- வறுமை மற்றும் கடன் சுமை: இதனால் அதிக வட்டி விகிதத்துக்குப் பணம் கொடுப்பவர்களிடமும் microfinance கடன்களிலும் பலர் சிக்கித் தவிக்கின்றனர்.

- கட்டமைப்புப் பற்றாக்குறை: குளிர்சாதன வசதிகள், நவீன துறைமுகங்கள், பழுதுபார்த்தல் நிலையங்கள் போன்றவை கிராமப்புறங்களில் போதியளவு இல்லை.

- சூழல் சவால்கள் - கணிக்க முடியாத வானிலை, காலநிலை மாற்றம் இவர்களின் வாய்ப்புகளை மேலும் குறைத்து வருகின்றன.

- மீனவர்களுக்கு நியாயமான, திறம்படச் செயற்படும் எரிபொருள் விநியோகத்தை அரசு உடனடியாக உறுதி செய்ய வேண்டுமென நான் வலியுறுத்துகின்றேன்.

நாம் செய்யவேண்டியது:

- மீனவர்கள் கூட்டாகச் சேர்ந்து மானிய விலைக்கு எரிபொருளை வாங்கும் வகையில் கூட்டுறவு முறைகளை உருவாக்குதல்.

- சிறு அளவிலான மீனவர்களுக்கு கடன் தளர்வு மற்றும் நிதி உதவி வழங்குதல்.

- வன்னியின் மன்னார், முல்லைத்தீவு மற்றும் கிளிநொச்சி, யாழ்ப்பாணம் உள்ளிட்ட கடலோர மாவட்டங்களில் மீன்பிடித் துறைமுகங்கள் மற்றும் அடிப்படை வசதிகளை நவீனமயமாக்குதல்.

மேலும், எமது மீனவர்களின் மரியாதை பாதுகாக்கப்பட வேண்டும். எனவே, இந்த நாட்டில் எந்த மீனவரும் கொள்கைப் புறக்கணிப்புக் காரணமாகத் தமது தொழிலைக் கைவிடவேண்டிய நிலைக்குத் தள்ளப்படாமல் இருக்க, அரசு உறுதியான நடவடிக்கைகளை எடுக்க வேண்டுமென நான் வலியுறுத்துகின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, தற்பொழுது மானியங்கள் வழங்கப்படுகின்றன. ஆனால், உடனடியாக மானிய அப்படையில் மண்ணெண்ணெயைப் பெறுவதற்கான வாய்ப்பு எல்லா மீனவர்களுக்கும் எட்டுவதில்லை. குறிப்பிட்ட மீனவர்களுக்குத்தான் அது கிடைத்திருக்கிறது. எனவே, எல்லா மீனவர்களுக்கும் அது கிடைப்பதற்கான வாய்ப்பை உண்டுபண்ண வேண்டும். எங்களுடைய மீனவர்களுக்குச் சலுகை அடிப்படையில் மண்ணெண்ணெயை வழங்குவதற்கு இந்த அரசு ஏற்பாடு செய்திருக்கிறது. அதற்கு நான் நன்றி சொல்கின்றேன்.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர் - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர்)
(The Hon. Ramalingam Chandrasekar - Minister of Fisheries, Aquatic and Ocean Resources)

கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ அடைக்கலநாதன் அவர்களால் முன்வைக்கப்பட்ட இந்த விடயமானது மிகவும் முக்கியமானது. அதற்காக நான் அவருக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். இது நீண்ட உரையாடலுக்குரிய ஒரு விடயமாகும். நீங்கள் மண்ணெண்ணெய் மானியம் சம்பந்தமாகப் பேசினீர்கள். கடந்த காலத்தில் மண்ணெண்ணெய் மானியம் வழங்கப்படுவது நிறுத்தப்பட்டிருந்தது. நாங்கள் ஆட்சிக்கு வந்ததன் பின்னர், குறிப்பாக எங்களுடைய அநுர குமார திஸாநாயக்க அவர்கள் சனாதிபதியாகப் பதவியேற்றதன் பின்னர், அதனை வழங்குவதற்குரிய நடவடிக்கைகளைத் துரிதமாக மேற்கொண்டோம்.

உள்ளூர் மீன்பிடித் தொழிலில் டீசலை எரிபொருளாகப் பயன்படுத்தும் 5,750 படகுகளும் மண்ணெண்ணெயை எரிபொருளாகப் பயன்படுத்தும் 27,530 படகுகளும் உள்ளன. பாரம்பரிய படகுகள் உள்ளிட்ட எரிபொருளைப் பயன்படுத்தாத மற்றும் இயந்திரங்களைப் பயன்படுத்தாத சுமார் 17,000 சிறிய அளவிலான படகுகளும் இருக்கின்றன. மீன்பிடித் தொழிலில் இரண்டு இலட்சத்துக்கும் அதிகமானவர்கள் நேரடியாக ஈடுபடுகின்றார்கள்.

" வளமான நாடு - அழகான வாழ்க்கை" என்ற அரசாங்கத்தின் கொள்கைப் பிரகடனத்தின் அடிப்படையில், நீங்கள் கவனத்துக்குக் கொண்டுவந்துள்ள மீனவ சமூகத்தின் பிரச்சினைகள் தொடர்பில் தற்போதைய அரசாங்கமானது மிகுந்த கவனத்தைச் செலுத்தி, உரிய நடவடிக்கைகளையும் எடுத்து வருகின்றது என்பதை நான் இந்த இடத்தில் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

எங்களுடைய அரசாங்கம் ஆட்சிக்கு வரும்போது, எரிபொருள் விலை அதிகம் காரணமாக ஏராளமான மீனவர்கள் மிகவும் பாதிக்கப்பட்டு இருந்தார்கள். அப்போது ஒரு லீற்றர்

[ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා]

டீசலின் விலை 307 ரூபாயாகவும் ஒரு லீற்றர் மண்ணெண்ணெயின் விலை 202 ரூபாயாகவும் இருந்தது. தற்போது, ஒரு லீற்றர் டீசலின் விலை 277 ரூபாயாகவும் மண்ணெண்ணெயின் விலை 180 ரூபாயாகவும் குறைவடைந்து இருக்கின்றது. மாதாந்த எரிபொருள் விலைகள் இன்னும் மாற்றியமைக்கப்பட்டு வருகின்றன. அதில் ஏற்ற, இறக்கங்கள் காணப்படுகின்றன. மண்ணெண்ணெயின் விலை ஒவ்வொரு மாதமும் ஏதோவொரு வழியில் படிப்படியாக குறைக்கப்பட்டு வருகின்றது. உலக சந்தையின் விலைக்கேற்ப முடிந்தவரை அவற்றின் விலைகளைக் குறைப்பதற்கான முயற்சிகளை மேற்கொண்டு வருகின்றோம்.

அரசாங்கத்தின் கொள்கைப் பிரகடனத்தில் மீனவர்களுக்கு எரிபொருள் மானியம் வழங்குவதற்கு நடவடிக்கை எடுக்கப்படுமென உறுதியளிக்கப்பட்டது. அந்த வாக்குறுதியை நிறைவேற்றும் வகையில், சனாதிபதித் தேர்தலுக்குப் பிறகு உடனடியாக எரிபொருள் மானியம் வழங்குவதற்கு நடவடிக்கை எடுக்கப்பட்டது.

இதன்கீழ் டீசலை எரிபொருளாகப் பயன்படுத்தும் பல நாள் மீன்பிடிப் படகுகளுக்கு 6 மாதங்களுக்கு அதிகபட்சமாக 300,000 ரூபாய் மாதந்தோறும் வழங்கப்பட்டது. மேலும், மண்ணெண்ணெயை எரிபொருளாகப் பயன்படுத்தும் படகுகளுக்கு 6 மாத காலத்துக்கு 9,375 ரூபாய் மாதாந்தக் கொடுப்பனவு வழங்கப்பட்டது. இதன்படி, இயந்திர மீன்பிடிப் படகுகளுக்கு 2 பில்லியன் ரூபாய்க்கும் அதிகமான எரிபொருள் மானியம் வழங்கப்பட்டது. இதன்மூலம் மீன்பிடித் தொழிலை மீட்டெடுக்க அரசாங்கம் நடவடிக்கை எடுத்து வருகின்றது.

சர்வதேச நாணய நிதியத்தின் முன்மொழிவுகளைச் செயற்படுத்தும் வகையில், வலுசக்தி அமைச்சு மாதாந்தச் செலவைப் பின்பற்றியே எரிபொருள் விலையை நிர்ணயிக்கும். மேலும், மண்ணெண்ணெய் மானியம் வழங்குவதன் அவசியம் குறித்த கலந்துரையாடல் ஒன்று 2025.10.09ஆம் திகதி மாண்புமிகு வலுசக்தி அமைச்சரின் தலைமையில் பாராளுமன்றத்தில் நடைபெறவுள்ளது. அதில் அனைவரும் கலந்துகொண்டு, தங்களது கருத்துக்களையும் தெரிந்த விடயங்களையும் தெரிவிக்குமாறு மிகவும் அன்பாகக் கேட்டுக் கொள்கின்றேன்.

மேலும், கௌரவ உறுப்பினர் அவர்கள் கருத்துத் தெரிவித்த வடக்கு, கிழக்கு மக்களுக்கு நிறையப் பணிகளைச் செய்துள்ளோம். எதிர்காலத்திலும் நிறையப் பணிகளைச் செய்ய எதிர்பார்க்கின்றோம். வட, கிழக்கு மீனவர்களின் பிரச்சினை சம்பந்தமாக உங்களுக்கு நன்றாகத் தெரியுமென நான் நினைக்கின்றேன். இதுநாள் வரை வடக்கில் ஒரு மீன்பிடித் துறைமுகமோ, நல்லதோர் இறங்குதுறையோ இல்லாத நிலைமை காணப்படுகின்றது. அதுமாத்திரமல்ல, அங்கு அணைக்கட்டு அமைக்கும் விடயத்திலும் பல குறைபாடுகள் காணப்படுகின்றன. அங்கிருக்கின்ற ஒருசில துறைமுகங்களை எடுத்துக்கொண்டால், அதிலும் பல குறைபாடுகள் காணப்படுகின்றன. இருந்தபோதிலும், நாங்கள் அவற்றை நிவர்த்தி செய்வதற்கான நடவடிக்கைகளை முன்னெடுத்து வருகின்றோம்.

விசேடமாக, *சீன* அரசாங்கத்திடமிருந்து உதவியாகப் பெறப்பட்ட, ஆனால் மீனவ சமூகத்துக்கு வழங்கப்படாத 75,000 மீன்பிடி வலைகளை வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களிலுள்ள மீனவர்களுக்கு வழங்குவதற்கான நடவடிக்கைகளை நாங்கள் எடுத்து வருகின்றோம். மேலும், *சீன* அரசாங்கத்திடமிருந்து பரிசாக 500 container homes - பொருத்து வீடுகள் - எங்களுக்குக் கிடைத்திருக்கின்றன. அவற்றை நிறுவுவதற்குத் தேவையான நடவடிக்கைகளையும் நாங்கள் முன்னெடுத்து வருகின்றோம். அது தொடர்பான வேலைகளை நாங்கள் முப்படையினரிடம் ஒப்படைத்து இருக்கின்றோம். அவர்கள் மூலமாக அந்த செயற்பாடுகளை முன்னெடுப்பதற்கு நாங்கள் தீர்மானித்து இருக்கின்றோம்.

அதேபோல, பருத்தித்துறை மீன்பிடித் துறைமுகத்தை மேம்படுத்தும் நடவடிக்கைகளின் ஆயத்தப் பணிகள் ஏற்கனவே ஆரம்பிக்கப்பட்டு இருக்கின்றன. பருத்தித்துறை மீன்பிடித் துறைமுகத்தின் அபிவிருத்தி சம்பந்தமாகக் கலந்துரையாடுவதற்கு அண்மையில் இந்திய முதலீட்டாளர்கள் இலங்கைக்கு வந்திருந்தார்கள். அது சம்பந்தமாக இந்திய தூதுவரோடும் அதிகாரிகளோடும் பேசப்பட்டு இருக்கிறது. கடந்த காலத்தைப் போலன்றி மிகத் துரிதமாக நடவடிக்கை எடுப்பதாக அவர்கள் எங்களுக்கு உறுதியளித்து இருக்கின்றார்கள். அந்த வகையில், அப்பிரச்சினை எதிர்வரும் காலங்களில் தீர்க்கப்படும் என்பதை நான் இங்கு கூறிவைக்க விரும்புகின்றேன்.

அதேபோன்று, மயிலிட்டி துறைமுகத்தின் மூன்றாம் கட்ட அபிவிருத்தி வேலைகள் ஆரம்பமாகி இருக்கின்றன. அதில் பல்வேறு பிரச்சினைகளை நாங்கள் எதிர்கொண்டு இருக்கின்றோம். குறிப்பாக, மயிலிட்டி துறைமுகத்தில் வெளிநாட்டுப் படகுகள் தரித்து வைக்கப்பட்டு இருக்கின்றன. அதன் காரணமாக அந்தத் துறைமுகம் செயலிழந்து போயிருக்கின்ற நிலைமையைக் காணக்கூடியதாக இருக்கின்றது. அதனால் அங்குள்ள மீனவர்கள் பல்வேறு சவால்களை எதிர்கொண்டு இருந்தார்கள். அந்தச் சவால்களை முறியடிப்பதற்கான நடவடிக்கையாக நாங்கள் இரண்டாம் கட்ட அபிவிருத்தி வேலைகளை மேற்கொண்டோம். தற்பொழுது, அது முடிவடைந்து இருக்கின்ற நிலையில், மூன்றாம் கட்ட வேலைகளை அண்மையில் நாங்கள் ஆரம்பித்தோம். மூன்றாம் கட்ட வேலைகள் மூலமாக மீனவர்களுக்குப் பாதுகாப்பான நங்கூரமிடும் தளங்கள் உட்பட வசதிகளை ஏற்படுத்தல், மீன்களை ஏலமிடுவதற்கான கூடமொன்றை அமைத்தல், வலைகளைப் பழுதுபார்க்கும் கூடமொன்றை அமைத்தல், பொது மண்டபம் ஒன்றை அமைத்தல், தொலைத்தொடர்பு அறையொன்றை அமைத்தல் போன்றவற்றை மேற்கொள்வதற்கு நடவடிக்கை எடுத்து இருக்கின்றோம். அதேபோன்று, கடலோர காவற்படை அலுவலகம் மற்றும் தங்குமிடம், பாதுகாப்பு அலுவலகத்துடன்கூடிய நிருவாகக் கட்டிடம் என்பவற்றையும் அமைப்பதற்கு நாங்கள் தீர்மானித்து இருக்கின்றோம். அத்துடன், அங்கிருக்கின்ற ஊழியர்களுக்கான குடிமனைகளை அமைப்பதற்கும் நடவடிக்கை எடுத்திருக்கின்றோம். இவ்வாறு நாங்கள் மயிலிட்டித் துறைமுகம் சார்ந்து பல்வேறு வேலைத்திட்டங்களை முன்னெடுத்து வருகின்றோம்.

மேலும், காரைநகர் சீ-நோர் படகுகள் திருத்துமிடம் மீண்டும் தொடங்கப்பட்டு பணிகள் நடைபெற்று வருகின்றன. வடக்கு, கிழக்கில் அதிகாரிகளின் பற்றாக்குறையும் பாரியளவில் நிலவுகின்றது. அண்மையில் நாங்கள் அது சம்பந்தமாகப் பேசி முடிவுகளை எடுத்தோம். தற்பொழுது, அவற்றுக்கு Cabinetஇன் அனுமதியும் கிடைத்திருக்கின்றது. இப்பொழுது, அதிகாரிகளை ஆட்சேர்ப்பதற்கான நேர்முகப் பரீட்சை ஆரம்பமாகி இருக்கிறது. அதன்மூலம் அந்தப் பற்றாக்குறையை நிவர்த்தி செய்வதற்கான நடவடிக்கைகளை எடுப்போமெனக் கூறிக்கொள்கின்றோம்.

மேலும், மீன்பிடித் துறைமுகங்களுக்கான கலங்கரை விளக்கம் - lighthouse - அமைப்பதற்கும் நாங்கள் நடவடிக்கை எடுத்து வருகின்றோம். நாங்கள் செய்கின்ற முக்கியமான வேலைகளில் சிலவற்றை மாத்திரமே இங்கு குறிப்பிட்டேன். கடந்த அரசாங்கங்களின் கொள்கைகள் காரணமாக மீனவச் சமூகத்துக்குக் கஷ்டமான சூழ்நிலைகள் ஏற்பட்டுள்ளன. குறிப்பாக, நுண்நிதிக் கடன் - microfinance - மூலமாக மீனவச் சமூகத்துக்குப் பல்வேறு நெருக்கடிகள் ஏற்பட்டிருப்பது எங்களுக்குத் தெரியும்! அக்கடன் மூலம் பெறப்பட்ட கடன்களைத் திருப்பிச் செலுத்த முடியாமல் பல பெண்கள் தற்கொலை செய்துகொண்டு இருக்கிறார்கள். இந்த நிலைமை உங்களுடைய வன்னித் தேர்தல் மாவட்டத்தில்தான் அதிகமாக இருக்கின்றது. இவ்வாறான நிலைமையிலுள்ள பெண்களுடைய வாழ்க்கையை மேம்படுத்துவதற்காக நாங்கள் சனாதிபதி நிதியத்தின் மூலம் நடவடிக்கை எடுத்து வருகின்றோம். அதேபோன்று, மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சின் ஊடாகவும் பல்வேறு நடவடிக்கைகளை எடுத்து வருகின்றோம். அந்த வகையில், பெண்களுடைய அபிவிருத்தி தொடர்பில் நாங்கள் கூடுதலான கவனத்தைச் செலுத்தி இருக்கின்றோம் என்பதை இந்த இடத்தில் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

அதேபோன்று, உலக வங்கி, ஆசிய அபிவிருத்தி வங்கி, உலக உணவு மற்றும் விவசாய அமைப்பு ஆகியவை அதிக வட்டியுடனான கடன் திட்டத்துக்குப் பதிலாக சலுகை அடிப்படையில் மீன்பிடி சமூகத்துக்கான கடன் திட்டத்தைச் செயற்படுத்துவதற்கு ஏற்கெனவே ஒப்புக்கொண்டுள்ளன. அந்தக் கடன் திட்டத்தைச் செயற்படுத்துவதன்மூலம் மீனவ சமூகத்துக்குப் பெரும் நிவாரணம் கிடைக்குமென நாங்கள் எதிர்பார்க்கின்றோம்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා, පිළිතුර කෙටි කරන්න.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
ඉවරයි.

ஏற்கெனவே அரச வங்கிகள் ஓரளவுக்குச் சலுகை கடன் திட்டத்தை வழங்குவதற்கு நடவடிக்கை எடுத்துள்ளன. இது தொடர்பான தகவல்களை அரச வங்கிகள் மற்றும் உரிய அமைச்சின்மூலம் பெற்றுக் கொள்ளலாம். அந்த வகையில், உற்பத்தி, விவசாயம், சுற்றுலா, மீன்பிடி ஆகிய துறைகளில் ஈடுபட்டுள்ள சகலருக்கும் நிதி உதவிகளை வழங்குவதற்கு ஏதுவான நடவடிக்கைகளை எடுப்பதற்கும், அது தொடர்பான நிறுவனங்களை மென்மேலும் பலப்படுத்துவதற்கும் நாங்கள் நடவடிக்கை எடுத்திருக்கிறோம். கௌரவ உறுப்பினர் அவர்கள் தெரிவித்த கருத்துக்களைச் செவிமடுத்து, உரிய நடவடிக்கைகளை நாங்கள் நிச்சயமாக எடுப்போமெனக் கூறிக்கொள்கின்றோம்.

**ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**
(மாண்புமிகு அமிர்தநாதன் அடைக்கலநாதன்)
(The Hon. Amirthanathan Adaikkalanathan)
கௌரவ அமைச்சர் அவர்களே, எரிபொருள் மானியம் எல்லோருக்கும் வழங்கப்பட வேண்டும். ஏனெனில், கடந்த மாதம் குறிப்பிட்ட சிலருக்குத்தான் அந்த மானியம் கிடைத்திருக்கிறது. ஏனையவர்களுக்குக் கிடைக்கவில்லை என்ற குறையிருக்கிறது. இப்போது அது நிவர்த்தி செய்யப்பட்டு இருக்கிறதா? எல்லோருக்கும் அந்த மானியம் கொடுக்கப்பட்டு இருக்கிறதா? எனக் கேட்கின்றேன்.

**ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා**
(மாண்புமிகு ராமலிங்கம் சந்திரசேகர்)
(The Hon. Ramalingam Chandrasekar)
கௌரவ உறுப்பினர் அவர்களே, தற்போது எரிபொருள் மானியம் வழங்கப்படுவது நிறுத்தப்பட்டு இருக்கிறது. ஆனால், நாங்கள் முன்னர் வழங்கிய உதவித் திட்டங்கள் தொடர்கின்றன. அவை கிடைக்கப் பெறாதவர்களிடமிருந்து பல்வேறு முறைப்பாடுகள் வந்திருக்கின்றன. வங்கிக்கணக்கு இலக்கம், விலாசம் போன்ற தகவல்களைச் சரியான முறையில் வழங்காமை காரணமாக நாங்கள் கடந்த காலத்தில் வழங்கிய எரிபொருள் மானியம் பலருக்குக் கிடைக்கப் பெறாமல் இருந்தது. அவர்கள் அந்தத் தகவல்களைச் சரியாக மீளவும் எங்களுடைய அதிகாரிகளுக்குப் பெற்றுக்கொடுக்கும் பட்சத்தில், அவர்களுக்கு அந்த உதவித் திட்டங்களை வழங்குவதற்கு நாங்கள் தயாராக இருக்கின்றோம்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන, මහජන ආරක්ෂක අමාත්‍ය ගරු ආනන්ද විජේපාල මැතිතුමා.

## හිටපු ජනාධිපතිවරුන්ගේ ආරක්ෂාව: මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය

## முன்னாள் சனாதிபதிகளின் பாதுகாப்பு: பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரினது கூற்று

## SECURITY OF FORMER PRESIDENTS: STATEMENT BY MINISTER OF PUBLIC SECURITY AND PARLIAMENTARY AFFAIRS

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු කථානායකතුමනි, ජනාධිපතිවරයන්ගේ හිමිකම් (ඉවත් කිරීමේ) පනත පසුගිය දිනෙක මේ සභාවේදී සම්මත වුණා. ජනාධිපතිවරයන්ගේ හිමිකම් (ඉවත් කිරීමේ) එම පනත අනුව එතුමන්ලා බුක්ති විඳි සමහර හිමිකම් මේ වනකොට ආපසු භාර දීමක් කර තිබෙනවා. නමුත් ජනාධිපතිවරයන්ගේ හිමිකම් (ඉවත් කිරීමේ) පනත යටතට ආරක්ෂාව කියන කාරණාව ගැනෙන්නේ නැහැ. මේ වනකොට එතුමන්ලා තමන් භාවිත කරපු සමහර ආරක්ෂක වාහන පවා ආපසු භාර දී තිබෙනවා. ජනාධිපතිවරයන්ගේ හිමිකම් (ඉවත් කිරීමේ) පනත අනුව සමහර හිමිකම් භාර දිය යුතු වුණත්, ආරක්ෂාව සැපයීම ආණ්ඩුවේ වගකීමක්. ඒ නිසා ආරක්ෂාවට අදාළ වාහන ඇතුළු අනෙකුත් දේ පිළිබඳව එතුමන්ලා නැවත ඉල්ලීමක් කළොත්, ඒ පිළිබඳව ආණ්ඩුව සලකා බලන්න සූදානම්. ඒ නිසා ජනාධිපතිවරයන්ගේ හිමිකම් (ඉවත් කිරීමේ) පනත යටතේ නොගැනෙන ආරක්ෂාව දිගින් දිගටම තහවුරු කරන්න ආණ්ඩුව හැටියට අපි කටයුතු කරන බව මේ සභාවට දැනුම් දෙන්න කැමැතියි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වරප්‍රසාද ප්‍රශ්නය, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

## වරප්‍රසාද: ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කිරීම
## சிறப்புரிமை: அரசியலமைப்புப் பேரவைக்குத் தவறான தகவல்களைச் சமர்ப்பித்தல்
## PRIVILEGE: SUBMISSION OF FALSE INFORMATION TO CONSTITUTIONAL COUNCIL

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 29 (1) හා (2) යටතේ ඉදිරිපත් කරනු ලබන වරප්‍රසාද ප්‍රශ්නය.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ වත්මන් අධ්‍යක්ෂ ජනරාල්වරයා තෝරා ගැනීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් 2024.10.13 සහ 14 වන දින පුවත් පත් දැන්වීම් පළ කර තිබුණා. පසුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් ඉදිරිපත් වී ඇති අයදුම් පත්‍ර අතරින්, නීතිපති දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් මාධව තෙන්නකෝන් මහතා, මහාධිකරණ විනිසුරු රංග දිසානායක මහතා සහ ඉරේෂා සුභාෂිණී සිරිවර්ධන මහත්මිය යන තිදෙනාගේ නම් ජනාධිපතිවරයා වෙත යැවීමට තෝරාගෙන තිබෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් අපේක්ෂකයන් වෙත ලබා දී ඇති නිර්දේශ සලකා බැලීමේදී උතුරු මැද පළාත් ආණ්ඩුකාර හිටපු මහාධිකරණ විනිසුරු වසන්ත විමලසිරි ජිනදාස මහතාගේ සහ සබරගමුව පළාත් ආණ්ඩුකාර හිටපු මහාධිකරණ විනිසුරු චම්පා ජානකී රාජරත්න මහත්මියගේ නිර්දේශ පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව දීර්ඝ වශයෙන් සාකච්ඡා කර තිබෙනවා.

විශේෂයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ස්වාධීන ආයතනයක් වන බැවින්, ආණ්ඩුකාර තනතුර දේශපාලන පත්වීමක් හේතුවෙන් එම නිර්දේශ කිරීම දේශපාලන මැදිහත්වීමක් වන බව සලකා මේ සම්බන්ධව සාකච්ඡා කොට තිබෙනවා. විශේෂයෙන්ම 2024 සැප්තැම්බර් 27වන සිකුරාදා දින මෙම ආණ්ඩුකාරවරුන්ගේ නම් ගැසට් පත්‍රයේ පළ කර තිබෙනවා. ඒ අනුව, මහාධිකරණ විනිසුරු රංග දිසානායක මැතිතුමාට ලබා දී තිබෙන නිර්දේශයන් ලබා දී තිබෙන්නේ එම ආණ්ඩුකාරවරුන්ගේ නිල ලිපි ශීර්ෂවලින්. එබැවින් එය දේශපාලන පත්වීමක් ලද පුද්ගලයන් විසින් නිර්දේශ කිරීමක් ලෙස මේ අවස්ථාවේ සාකච්ඡා කොට තිබෙනවා. විශේෂයෙන්ම මේ කාරණය පිළිබඳව සාකච්ඡා කරන ලද පළමුවෙනි දිනය වන 2025 ජනවාරි මාසයේ 3වැනි දා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මේ සම්බන්ධව සාකච්ඡා කරලා තීන්දුවක් ගෙන තිබෙනවා. පළමුවෙනියට සිටින මෙත්සිරි මාධව තෙන්නකෝන් මැතිතුමාත්, දෙවනුව රංග දිසානායක මැතිතුමාත්, තෙවනුව ඉරේෂා සුභාෂිණී සිරිවර්ධන මැතිනියත් කියන තිදෙනාම නිර්දේශ කර ජනාධිපතිවරයාට යැවීම සඳහා තීන්දු කර තිබෙනවා. ඉන් පසුව 2025 ජනවාරි 07වැනි දින නැවත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව රැස් වී ඔබතුමා විසින් සඳහන් කර තිබෙනවා,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා මට ලබා දුන් ලිපිය කියෙව්වා නම් හරි නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒකේ තිබෙන එක තමයි කියවන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, ඒක වෙනස්.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
තව පොඩ්ඩක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, වෙනස්.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
හරි, හරි මම කියවන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණාකර එයට අවධානය යොමු කරන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
හරි, මම කියවන්නම්.

ඔබතුමා විසින් ප්‍රකාශ කර තිබෙනවා, විශේෂයෙන් නීතිපතිතුමා විසින් ඔබතුමාට කථා කළා කියලා ඒ සම්බන්ධව අවශ්‍ය නම් ඡන්දයක් පවත්වා හෝ එය තීන්දු කරන්න කියලා. ඒ අනුව මේ ක්‍රියාදාමය පිළිබඳව සාකච්ඡා කිරීමේදී ගරු බිමල් රත්නායක මැතිතුමා විසින් පවසා තිබෙනවා, මෙම ආණ්ඩුකාරවරුන් අත්සන් කරන වේලාවේ ඔවුන් විශ්‍රාම ගිය විනිසුරුවන් මිස ආණ්ඩුවේ දේශපාලන පත්වීම්ලාභීන් නොවන බව. එම කාරණය විශ්වාස කරමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජික මහාචාර්ය දිනේෂා සමරරත්න මහත්මිය විසින් රංග දිසානායක මහතා වෙත සිය ඡන්දය භාවිත කර තිබෙනවා. නමුත් ආණ්ඩුකාරවරුන් පත් කිරීමේ ගැසට් පත්‍රය මම කලින් සඳහන් කළා වාගේ 2024.09.27 වන දින ප්‍රසිද්ධ කර ඇති අතර, ඔවුන් විසින් රංග දිසානායක මැතිතුමාගේ නම නිර්දේශ කර තිබෙන්නේ ආණ්ඩුකාරවරුන් ලෙස පත් වූ පසු බව දැන ගැනීමෙන් පසු -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මට ලබා දුන් ලේඛනය කියවන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඒක තමයි මේ කියන්නේ. මේ, තුන්වෙනි ඡේදය.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා දැන් එයින් පිට දේවල් ගොඩක් කියෙව්වා. කරුණාකර මට භාර දීපු ප්‍රශ්නය කියවන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නැහැ, මම මේ කියාගෙන යනවා. මම ඒක තමයි කියන්නේ.

නමුත් ආණ්ඩුකාරවරුන් පත් කිරීමේ ගැසට් පත්‍රය 2024.09.27 දින ප්‍රසිද්ධ කර ඇති අතර, ඔවුන් විසින් රංග දිසානායක මැතිතුමාගේ නම නිර්දේශ කර තිබෙන්නේ ආණ්ඩුකාරවරුන් ලෙස පත් වූ පසුව බව දැන ගැනීමෙන් පසු එදිනම මහාචාර්ය දිනේෂා සමරරත්න මහත්මිය විසින් ගරු කථානායකතුමන් වෙත දිවුරුම් ප්‍රකාශයක් මඟින් e-mail පණිවුඩයක් හරහා සිය ඡන්දය භාවිත කිරීමේදී සිදු වූ තත්ත්වය පිළිබඳව ඇයගේ විරෝධය දක්වා තිබෙනවා.

පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ උපලේඛනයේ (අ) කොටසේ 4වෙනි වගන්තිය යටතේ පාර්ලිමේන්තුව හෝ යම් කාරක සභාවක් රැවටීමේ අදහසින් ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කිරීම බලවත් වරදක් වන අතර, එම වරද හිතා මතා සභානායක ගරු බිමල් රත්නායක මහතා විසින් සිදු කර ඇති බව පෙනී යනවා. එසේම ගරු කථානායකතුමන්ද අදාළ වරදම සිදු කර ඇති අතර, මෙම උත්තරීතර පාර්ලිමේන්තුවේ ප්‍රධානියා ලෙසත්, සභානායකවරයා ලෙසත් ඔවුන් දෙදෙනාම සමස්ත පාර්ලිමේන්තුවේ ගෞරවයට බලවත් හානියක් සිදු කර ඇත. එම තත්ත්වය මත සමස්ත පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද උල්ලංඝනය වී ඇති බැවින්, ඒ පිළිබඳව වරප්‍රසාද කමිටුව වෙත මෙය ඉදිරිපත් කරන ලෙසත්, පාර්ලිමේන්තුවේ ප්‍රධානියා ලෙස සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සභාපතිවරයා ලෙස මෙම සිදුව ඇති බරපතළ කාරණය පිළිබඳව ගරු කථානායකතුමාගේ පැහැදිලි කිරීමක් මෙම ගරු සභාවට ලබා දෙන ලෙසත් ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මහතා විසින් මතු කරන ලද මෙම වරප්‍රසාද ප්‍රශ්නය තුළින් වරප්‍රසාද කඩවීමක් සිදුවී තිබේදැයි යන්න පිළිබඳව මා පසුව තීරණය කරමි.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු කථානායකතුමනි, Commission to Investigate Allegations of Bribery or Corruption පිළිබඳව ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, - *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මම ඔය පිළිබඳව තීරණයක් දුන්නා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු කථානායකතුමනි, Standing Order No. 29 යටතේයි මම කථා කරන්නේ. මේ වරප්‍රසාද ප්‍රශ්නය ඉතා වැදගත්, බැරෑරුම් කාරණයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
118 (2) (අ) යටතේ - *[බාධා කිරීමක්]* ඒක point of Order එකක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා. ඒකට අදාළ කාරණාව මොකක්ද කියලා මම දැන් ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට කිව්වා. *[බාධා කිරීමක්]* කරුණාකර 118 (2) (අ) ස්ථාවර නියෝගය කියවන්න, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීමක්]* ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, මා ඒ සම්බන්ධව පසුව තීරණයක් ලබා දෙනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 92 (2) යටතේ එතුමාට අවස්ථාව දෙන්න පුළුවන්. කථා කරපු වරප්‍රසාද ප්‍රශ්නය සම්බන්ධ කාරණයක් තිබෙන්නේ. *[බාධා කිරීමක්]* විනාඩියක් දෙන්න, ඉතින්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා, මම ඒ සම්බන්ධයෙන් පසුව තීරණයක් ලබා දෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ඔබතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම සම්බන්ධව කථා කරන්න දෙන්නේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, කියන්න ගරු ෂාණක්කියන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු කථානායකතුමනි, අපි ස්ථාවර නියෝග 92 යටතේ point of Order එකක් ඉල්ලුවාම ඉස්සෙල්ලා කාරණය අහන්න. මේ රටේ ව්‍යවස්ථාව උල්ලංඝනය වෙනවා කියලා සැකයක් තිබෙන නිසා කාරණයක් මතු කරනකොට ඔබතුමා ඒකට ඉඩ දෙන්න.

ගරු කථානායකතුමනි, Commission to Investigate Allegations of Bribery or Corruption පිළිබඳව බැරෑරුම් ප්‍රශ්නයක් දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ඉදිරිපත් කළා. ඒ නම අනුමත කළ Constitution Council එකේ Member කෙනෙක් පිළිබඳවත් Commission to Investigate Allegations of Bribery or Corruptionහි entry එකක් දාලා තිබෙනවා. ඒ පිළිබඳව මේ

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

වෙනකම් පරීක්ෂණයක් නැහැ. ජාතික ජන බලවේගයේ ඇමතිවරු පිළිබඳව Commission to Investigate Allegations of Bribery or Corruption එකේ පැමිණිලි තිබෙනවා; ඒ පිළිබඳව ප්‍රශ්න කරන්නේත් නැහැ. පසුගිය සතියේ අපි දැක්කා, ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවියගේ පියා පිළිබඳව Commission to Investigate Allegations of Bribery or Corruptionහි පැමිණිල්ලක් තිබුණා. ඒ පිළිබඳව මොනවත් කරන්නේ නැහැ. *[බාධා කිරීමක්]* අවසන් කරනවා. මඩකලපුවේ බැංකුවක් කොල්ල කාපු -

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට වරප්‍රසාද ප්‍රශ්නයක් නඟන්න ඔබතුමා ඉඩ කඩ ලබා දුන්නා. ඊට පස්සේ ඔබතුමාගේ තීන්දුව කිව්වා. ඒ කාරණය විවාදයක් බවට පත් කරගෙන හැම දෙනාම ඒකට කරුණු එකතු කරන්න ගියොත් තේරුමක් නැති වෙනවා. අනික් එක, මේ කලබලය හරි පැහැදිලියි නේ, ගරු කථානායකතුමනි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමෙන් විමර්ශන කටයුතු කරගෙන යනකොට ඒවාට ගැවෙන ගැවෙන කෙනා නැඟිටලා කථා කරන්න පටන් ගන්නවා. පාර්ලිමේන්තුවේදී එහෙම කරන්න දෙන්න බැහැ. ගරු කථානායකතුමනි, මේ වරප්‍රසාද ප්‍රශ්නයට දවස් කිහිපයක් ඇතුළත ඔබතුමාගේ තීන්දුව ලබා දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීම. තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා.

## ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත
## விளையாட்டில் ஊக்கு பதார்த்தப் பயன்பாட்டிற்கெதிரான சமவாயம் (திருத்தம்) சட்டமூலம்
## CONVENTION AGAINST DOPING IN SPORT (AMENDMENT) BILL

***දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.***
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)
ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
Hon. Speaker, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
Sir, I have just three questions regarding the appointment the Hon. Dayasiri Jayasekera had spoken about. Number one, the Governors who had given their recommendations had not given those recommendations in a personal capacity; they had given those-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් තීරණයක් ලබා දෙන බව මම ප්‍රකාශ කළා. *[බාධා කිරීම්]* ගරු මන්ත්‍රීවරුන් කරුණාකර වාඩිවෙන්න. *[බාධා කිරීම්]* තීරණය ලබා දෙන්නම් කිව්වාම නැවත ඒ ගැන විවාද කරන්න එපා. මම ඒ සම්බන්ධයෙන් තීරණයක් ලබා දෙන්නම්. *[බාධා කිරීම්]*

The Hon. Sugath Thilakaratne, to start today's Debate. You have 14 minutes.

[පූ.භා. 11.18]

**ගරු සුගත් තිලකරත්න මහතා (ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுகத் திலகரத்ன - விளையாட்டுத்துறைப் பிரதி அமைச்சர்)
(The Hon. Sugath Thilakaratne - Deputy Minister of Sports)
ගරු කථානායකතුමනි, ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ විවාදයේදී අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම ගැන ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු කථානායකතුමනි, මෙම පනත ගැන කථා කරද්දී, විශේෂයෙන්ම ක්‍රීඩාව පිරිසිදු ක්‍රීඩාවක් කිරීමේ බලාපොරොත්තුවෙන් තමයි මෙය ක්‍රියාත්මක කරන්නේ. විශේෂයෙන්ම මේ පනත ක්‍රියාත්මක වෙන්නේ, ලෝක උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය මඟින්. මෙම ආයතනයේ නීති සහ රෙගුලාසිවලට යටත්ව ශ්‍රී ලංකා උත්තේජක මර්දන

නියෝජ්‍ය ආයතනය අපේ රට තුළ පවත්වාගෙන යනවා. විශේෂයෙන්ම එම ආයතනවලට මෙහිදී යම් වගකීමක් පැවරෙනවා.

ක්‍රීඩක ක්‍රීඩිකාවන් ක්‍රීඩා කරද්දි එය පිරිසිදු ක්‍රීඩාවක් වෙන්න ඕනෑය කියලා අපි කියනවා. එම පිරිසිදු ක්‍රීඩාව කරන්න ලබා දෙන මාර්ගෝපදේශ ගැන තමයි අද අපි මෙම පනත මඟින් කථා කරන්නේ. ක්‍රීඩක ක්‍රීඩිකාවන් බොහෝ වෙලාවට තහනම් උත්තේජකවලට යොමු වෙන්නේ ඇයි කියන කාරණය ගත්තොත්, අපට වැඩිපුරම දකින්න තිබෙන්නේ ඔවුන්ගේ දක්ෂතා ඉදිරියට ගේන්න එලෙස කටයුතු කිරීමයි. ඒ වාගේම ඔවුන්ගේ ක්‍රීඩා කුසලතා ඉදිරියට ගෙනැල්ලා මූල්‍යමය පැත්තෙන් යම් කිසි වාසිදායක ක්‍රියාදාමයකට පෙලඹෙන්න තමයි බොහෝ වෙලාවට ක්‍රීඩක ක්‍රීඩිකාවන් මේ තුළින් උත්සාහ කරන්නේ. හැබැයි, මෙවැනි තහනම් උත්තේජක වර්ග භාවිත කොට ක්‍රීඩාවට යොමු වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් නිසා විශේෂයෙන්ම දක්ෂතා ඇති, ඒ කියන්නේ සහජ දක්ෂතා එක්ක ඉස්සරහට එන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට විශාල අසාධාරණයක් සිද්ධ වෙනවා.

මෙම උත්තේජක වර්ග ලබා ගැනීමේදී ක්‍රීඩක ක්‍රීඩිකාවන් බලාපොරොත්තු වන දෙයක් තිබෙනවා. එම උත්තේජකවලින් විශේෂයෙන්ම ඔවුන්ගේ දරාගැනීමේ ශක්තියට, මාංශ පේශින්වල වර්ධනයට, ඒ වාගේම අභ්‍යන්තර පේශින්වලට, හෘදයට, ඒ වාගේම පෙණහලුවලට බලපෑමක් එල්ල කරනවා. අපි හෘදය වස්තුවට, ඒ වාගේම පෙණහලුවලට බලපාන උත්තේජක ද්‍රව්‍ය ගත්තොත්, ඒ තුළින් දුර දිවීම, බයිසිකල් පැදීම වැනි ක්‍රීඩාවලට විශාල පිටුවහලක් ලැබෙනවා. ක්‍රීඩකයෝ ගොඩක් වෙලාවට පෙලඹෙන්නේ එවැනි අවස්ථා උදා කරගන්නයි. ඒ වාගේම මාංශ පේශි වර්ධනය වීමට විශේෂයෙන්ම බර ඉසිලීම වැනි ක්‍රීඩාවල යෙදෙන ක්‍රීඩක ක්‍රීඩිකාවන් මේවා භාවිත කරනවා. ක්‍රීඩාව තුළදී ඔවුන් ජයග්‍රහණ වෙනුවෙන් මේවා ලබා ගත්තාට, මේවා භාවිත කරන නිසාම ක්‍රීඩකයාට වාගේම රටටත් ඒ තුළින් විශාල හානියක් වෙනවා. මොකද, තහනම් උත්තේජක භාවිතය නිසා ක්‍රීඩකයෙක් තරග තහනමකට ලක් වුණොත්, ඔහුට හෝ ඇයට මාස 3 සිට අවුරුදු 6ක් දක්වා වූ කාලයකට තරග තහනම් කරන්න පුළුවන්. ඒ වාගේම සම්පූර්ණයෙන්ම ක්‍රීඩාවෙන් ඈත් කර තබන්නත් පුළුවන්. ඒ කියන්නේ, අඩුම තරමේ ක්‍රීඩාංගණයකට ඇතුළුවීමට හෝ ක්‍රීඩා තරග නැරඹීමට යෑමේ අවස්ථාව පවා අහිමි වෙනවා, තහනම් උත්තේජක භාවිත කර යම් ක්‍රීඩකයෙක් හෝ ක්‍රීඩිකාවක් ඒ සම්බන්ධයෙන් වැරදිකරුවෙක් වුණොත්. ක්‍රීඩාව තුළ මෙවැනි දේවල් සිද්ධ වෙනවා. රටක් හැටියට ගත්තාම, ජාත්‍යන්තර තරගයකදී ක්‍රීඩකයෙක් තහනම් උත්තේජක භාවිත කර positive වුණොත් ජාත්‍යන්තරය තුළ අපේ රට අපකීර්තියට පත් වෙනවා. එම නිසා මේවා භාවිතයෙන් වෙන හානිය ඉතා විශාලයි. මොකද, පෞද්ගලිකව ක්‍රීඩකයාට වෙන හානිය වාගේම, සමාජයට වෙන හානිය සහ රටට වෙන හානිය ඉතාම බරපතළ බව එම තත්ත්වය සංසන්දනය කිරීමේදී අපට දැකගන්න පුළුවන්.

ඒ වාගේම පෞද්ගලිකව ගත්තොත්, තහනම් උත්තේජක භාවිතය ක්‍රීඩකයෙකුගේ පසුකාලීන ජීවිතයටත් විශාල වශයෙන් බලපානවා. මේවා භාවිතය නිසා ක්‍රෝධය, තරහ, ආක්‍රමණශීලී හැසිරීම්, නින්ද නොයාම, හෘදය රෝග, රුධිර පීඩනය ඉහළ යාම, වකුගඩු රෝග වැනි විශේෂිත වූ රෝගවලටත් ඔවුන් ගොදුරු වෙන්න පුළුවන්. ඒ නිසා මෙවැනි දේවල්වලට පෙලඹුණොත් ඔවුන්ගේ ජීවිත කාලයම අඳුරු වෙන්න පුළුවන්. ක්‍රීඩාව තුළදී තහනම් උත්තේජක භාවිත කර තිබේද යන පරීක්ෂාව සිදු කිරීමේදී තරග පවතින අවස්ථාවකදී හෝ තරගයෙන් පරිබාහිර අවස්ථාවකදී එම testing කරන්න පුළුවන්. ඒ කියන්නේ ඕනෑම අවස්ථාවකදී එය සිදු කරන්න පුළුවන්. හැබැයි, මම හිතන විධියට එය සිදු කරන්නේ කොහොමද කියන එක ගොඩක් වෙලාවට අපේ ක්‍රීඩකයින් පවා දන්නේ නැහැ. එම පරීක්ෂණය සිදු කරන්නේ මුත්‍රා සාම්පල සහ රුධිර සාම්පල තුළින්. අද ලෝකයේ එම පරීක්ෂණය සඳහා වැඩිපුරම ලබා ගන්නේ මුත්‍රා සාම්පල. විශේෂයෙන්ම අපි කියන්න ඕනෑ, එහිදී එම සාම්පල අපට තනිවම ගෙනැවිත් දෙන්නත් බැරි බව. ඒ කියන්නේ එම නියෝජිත ආයතනයේ නිලධාරි මහතෙක් හෝ මහත්මියක් ඉදිරිපිට තමයි එම මුත්‍රා සාම්පලය අරගෙන දිය යුත්තේ. මොකද, එතැනදි -මුත්‍රා සාම්පල ගෙනැවිත් දීමේදීත්- කිසිම රහස්‍යභාවයක් තිබෙන්න බැහැ. ගොඩක් අය දන්නේ නැහැ, කොහොමද එම test එක කරන්නේ කියා. එම මුත්‍රා සාම්පල ලබා ගැනීමේ ක්‍රමවේදය තිබෙන්නේ ඒ විධියටයි. ඒ ආකාරයෙන් ගත්තාම එම සාම්පල ගැනීමේදී සහ ඒවා test කිරීමේදී කිසිම අගතියක් වෙන්නේ නැහැ, ක්‍රීඩකයෙකුට හෝ ක්‍රීඩිකාවකට. මොකද, එහෙම කරන්නත් බැහැ. විනිවිදභාවයක් ඇතුව තමයි මේ සියලු දේවල් සිද්ධ වෙන්නේ.

එම සාම්පල test කිරීමට අවශ්‍ය රසායනාගාර පහසුකම් ලංකාවේ නැහැ. ඒ නිසා අපි ගොඩක් වෙලාවට මලයාසියාවට හෝ කටාර්වලට යවා තමයි එම කටයුතු සිදු කරන්නේ. ඒ සඳහා විශාල මුදලක් වැය වෙනවා. ඒ වාගේම ඒ සඳහා විශාල කාලයකුත් ගත වෙනවා. එහෙම බැලුවාම මේවා ක්‍රමානුකූලව කර ගැනීමේදී නොයෙක් අපහසුතා ඇති වනවා. මොකද, ක්‍රීඩකයෙක් තහනම් උත්තේජක භාවිතයෙන් වැරදිකරුවෙකු වුණා කිව්වාට පසු, එතැන් සිට තව ටික කාලයක් ගත වෙනවා, ඔහු වැරදිකරුද, නිවැරදිකරුද යන්න ඔප්පු වෙන්න. මේවා තමයි අපට දැනට තිබෙන ගැටලු. ඒ නිසා ඉදිරියේදී මේවා ක්‍රමානුකූලව විසඳා ගන්න අවශ්‍ය වෙනවා. ක්‍රීඩකයෙක් ක්‍රීඩා තහනමට ලක් වුණත්, ගොඩක් වෙලාවට B sample එක check කිරීමට නැවත ඔහුට ඉල්ලීමක් කරන්න පුළුවන්. හැබැයි, ඒ සඳහා කාලය ගොඩක් ගත වෙනවා. සමහර වෙලාවට මාස 6ක දඬුවමක් තිබෙන ක්‍රීඩකයෙකුගේ වාර්තා එනකොට ඒ මාස 6ත් ගත වෙලා අවසන්. ඒ වාගේ අවස්ථාත් තිබෙනවා. එවැනි අවස්ථාවලදී ක්‍රීඩකයින්ට අසාධාරණයක් සිද්ධ වෙන්නත් ඉඩකඩ තිබෙනවා.

2011 මැයි මාසයේ 24වැනි දා සිට 2025 මැයි 25වැනි දා දක්වා සියලු ක්‍රීඩාවලට අදාළව ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ මුත්‍රා සම්පල පරීක්ෂා කිරීමෙන් පසුව ක්‍රීඩක ක්‍රීඩිකාවන් 67දෙනෙක් තහනම් උත්තේජක භාවිත කර තිබෙන බවට වාර්තා වෙලා තිබෙනවා. විශේෂයෙන්ම එයිනුත් ක්‍රීඩා 11කට අදාළ ක්‍රීඩක ක්‍රීඩිකාවන් පිරිසක් 2011 වර්ෂයේ ඉඳලා මේ දක්වා වැරදිකරුවන් බවට පත් වී තිබෙනවා. මලල ක්‍රීඩාව, ක්‍රිකට්, bodybuilding, රගර්, බොක්සිං, බර ඉසිලීම, මල්ලව පොර, cycling, powerlifting, කබඩි, නෙට්බෝල් වාගේ ක්‍රීඩාවලදී තමයි විශේෂයෙන්ම ක්‍රීඩක ක්‍රීඩිකාවන් වැඩිපුරම තහනම් උත්තේජකවලට යොමු වෙලා තිබෙන්නේ. ඒකෙනුත් ගත්තාම powerlifting, එහෙම නැත්නම් සවි එසවීම කියන ක්‍රීඩාවේ නිරත ක්‍රීඩකයන් පහළොස්දෙනෙක් 2011 අවුරුද්දේ සිට මේ දක්වා කාලය තුළ තරග තහනමට ලක් වෙලා තිබෙනවා. බර ඉසිලීමේ ක්‍රීඩාවේදී ඔවුන් ගොඩාක් වෙලාවට මෙවැනි දේවල්වලට යොමු වෙලා තිබෙනවාය කියන එක ඒකෙන්ම පැහැදිලිව පෙනෙනවා. ඒ වාගේම bodybuilding ක්‍රීඩාවේ නිරත දොළොස්දෙනෙක් තහනම් උත්තේජකවලට යොමු වෙලා තිබෙනවා. විශේෂයෙන් මාංශ පේශීන් develop කිරීම සඳහා ගොඩාක් වෙලාවට මෙවැනි තහනම් උත්තේජකවලට යොමු වන අවස්ථා තිබෙනවා. ඒ වාගේම එවැනි තහනම් උත්තේජක වෙළෙඳ පොළේ මිලදී ගන්න තිබෙනවා. සමහර වෙලාවට ක්‍රීඩක ක්‍රීඩිකාවන් නොදැනුවත්ව එවැනි දේවල් ගන්නත් පුළුවන්. සමහර වෙලාවට ඔවුන් ඒ පරීක්ෂණවලට භාජන වුණාට පසුව තමයි දැන ගන්නේ තමන් තහනම් උත්තේජක තමයි ලබා ගෙන තිබෙන්නේ කියලා. මලල ක්‍රීඩකයන් දොළොස්දෙනෙක්, cycling ක්‍රීඩකයන් දහදෙනෙක්, රගර් ක්‍රීඩකයන් හත්දෙනෙක්, weightlifting ක්‍රීඩකයන් හතරදෙනෙක්, කබඩි, බොක්සිං, wrestling යන

[ගරු සුගත් තිලකරත්න මහතා]

ක්‍රීඩාවලින් දෙදෙනා බැගින්, නෙට්බෝල්, ක්‍රිකට්වලින් එක ක්‍රීඩකයා බැගින් ද පසුගිය කාලය තුළ තහනම් උත්තේජක ලබා ගැනීම සම්බන්ධයෙන් කරන ලද පරීක්ෂණයේදී positive වෙලා තිබෙනවා. ගොඩාක් වෙලාවට මේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් එවැනි දේවල්වලට යොමු වෙන්නේ ඇයි කියන එක මම පැහැදිලි කරලා කිව්වා. ඔවුන්ගේ ක්‍රීඩා ජීවිතය ඉස්සරහට ගෙන යන්න හොඳ ආර්ථික රටාවක් අපට හදලා දෙන්න පුළුවන් නම්, මේ වාගේ කෙටි මාර්ගවලට ක්‍රීඩක ක්‍රීඩිකාවන් නොයාවි කියලා අපි විශ්වාස කරනවා. ඇත්තටම මොවුන් ගොඩාක් වෙලාවට උත්සාහ කරන්නේ ලංකාවේ තිබෙන තරගවලින් ජයග්‍රහණය කරලා පළමුවැනියා වෙන්න. එහෙම නැත්නම් ජාත්‍යන්තර තරගයට සහභාගී වෙන්න ඒ අවස්ථාව සලසා ගන්න තමයි ඔවුන් වැඩිපුරම උනන්දු වෙන්නේ.

ලංකාවේ ජාතික මට්ටමේ ක්‍රීඩකයෙක් බවට පත් වුණොත් අපි ඔවුන්ට පෝෂණ දීමනාව ගෙවනවා; අනුග්‍රහ දීමනාව ගෙවනවා. ඒ මුදල වෙනුවෙන් තමයි සමහර වෙලාවට එවැනි උත්තේජක ලබා ගැනීමට ඔවුන් පෙලඹෙන්නේ. විශේෂත්වයක් තිබෙන්නේ එවැනි වැරැදිවලින් දඬුවම් ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන් ගොඩාක් වෙලාවට මේ ප්‍රශ්නයේදී තනි වන එකයි. ඔවුන්ට ඒවා දුන්නු කෙනෙක් නැහැ. කවුද ඒකට අනුබල දුන්නේ, එහෙම නැත්නම් ඒ උත්තේජක වර්ග කාගේ මාර්ගයෙන්ද ගත්තේ කියන තැන්වලදී ගොඩාක් වෙලාවට ඒ ක්‍රීඩක ක්‍රීඩිකාවන් හිර වෙනවා. මට මතක හැටියට එවැනි වැරැදි සම්බන්ධයෙන් මේ වෙන කල් කිසිම පුහුණුකරුවෙකුට කිසිම දඬුවමක් ලැබිලා නැහැ. ඒ වාගේම ඒ උත්තේජක වර්ග ලබා දෙන බාහිර පුද්ගලයන්ටත් මේ වෙන කල් කිසිම දඬුවමක් ලැබිලා නැහැ. හැබැයි, ක්‍රීඩක ක්‍රීඩිකාවන් බොහෝදෙනෙක් ඒ සම්බන්ධයෙන් දඬුවම් ලබා තිබෙනවා. හැබැයි, අපේ අල්ලපු රට වන ඉන්දියාව දිහා බැලුවොත් පෙනෙනවා, ගොඩක් වෙලාවට ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට වාගේම පුහුණුකරුවන්ටත් ඔවුන් වසර ගණන් ඒ තහනම ලබා දීලා තිබෙන බව. මොකද, පුහුණුකරු නොදැන මේ දේවල් කරන්න අපහසු තත්ත්වයක් තිබෙනවා කියලා අපි විශ්වාස කරනවා. තහනම් උත්තේජක භාවිතය සම්බන්ධයෙන් ගොඩාක් වෙලාවට ක්‍රීඩකයා ගැන පමණයි බැලෙන්නේ. එතැනින් එහාට බාහිර පුද්ගලයන් ගැන සොයා බැලීමක් වෙන්නේ නැහැ. අපි හිතනවා, ඒ දේවල් වෙනුවෙන් අපට කරන්න පුළුවන් වෙනසක් තිබෙනවාය කියලා. අපි දැන් ඒ දේවල් ක්‍රියාත්මක කරනවා.

විශේෂයෙන් ජාතික සංචිතවලට, එහෙම නැත්නම් කනිෂ්ඨ සංචිතවලට ඇතුළු වෙන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ඔවුන්ගේ මාසික දීමනාව ලෙස රුපියල් 150,000ක වාගේ විශාල මුදලක් අපි ලබා දෙනවා. ඊට අමතරව පුහුණුකරුවන්ගේ සුබසිද්ධිය වෙනුවෙන් අපි ඔවුන්ටත් යම් මුදලක් ලබා දෙනවා. ප්‍රථම වතාවට තමයි මම හිතන විධියට අපි දීර්ඝ කාලීනව පුහුණු සංචිතවල ඉන්න සියලු ක්‍රීඩකයන්ගේ පුහුණුකරුවන්ටත් මෙවර ඒ මුදල් ලබා දෙන්නේ. ඒ තුළින් ක්‍රීඩකයන්ගේ ආරක්ෂාව, රැකවරණය ඔවුන්ට ලැබෙයි කියලා අපි හිතනවා. එතකොට මෙවැනි උත්තේජක වර්ගවලට යෑමේ අඩුවීමක් දකින්න පුළුවන් වේවි කියාත් අපි විශ්වාස කරනවා. ඒ වාගේම තහනම් උත්තේජකවල තිබෙන ආදීනව පිළිබඳව කියා දෙමින් විශේෂයෙන්ම ඒවාට යොමු නොවෙන ආකාරයෙන් පාසල් වාගේම සියලු ක්‍රීඩා සංවිධාන දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කරනවා. මේ දේවල් එක්ක බැලුවාම අපි හිතන ක්‍රීඩා ආර්ථිකයට, ක්‍රීඩා සංස්කෘතියට ඉදිරියේදී යන්න අපට පුළුවන් වෙයි කියලා අප විශ්වාස කරනවා. මොකද, අද වනකොට ලෝකයේ ක්‍රීඩාවට විශාල ඉල්ලුමක් තිබෙනවා; හොඳ market එකක් හැදිලා තිබෙනවා. විශේෂයෙන් වොලිබෝල් ක්‍රීඩකයෝ පිට රටවලට ගිහිල්ලා වෙන clubsවලට සෙල්ලම් කරලා, අපේ රටට ඩොලර් උපයලා ගෙනෙනවා.

ගරු කථානායකතුමනි, ක්‍රීඩකයන් ගැන පමණක් නොවෙයි, ක්‍රීඩා සංගම් ගැනත් අපේ විශේෂ අවධානය යොමු කරන්න ඕනෑ.

මොකද, විදෙස් තරගවලට සහභාගි වන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට යම්කිසි අවස්ථාවක් ලබා දෙන්න පුළුවන් නම්, ඒක විශේෂයෙන්ම ඒ සංගම්වලට වැදගත් වෙනවාය කියලා මම හිතනවා. එහෙම නොවුණොත්, මම හිතන විධියට ඒ ක්‍රීඩකයන් අසරණ වෙනවා. මොකද, ඔවුන් අපේ රටට මුදල් ගෙනෙනවා වාගේම ඔවුන්ට අපේ රටේ ජාතික කණ්ඩායම්වලටත් පහසුවෙන් ක්‍රීඩා කරන්න හැකියාව ලැබෙයි කියලා මම විශ්වාස කරනවා. අපි මොන තරම් දේවල් කළත්, කොච්චර ක්‍රීඩා භාණ්ඩ බෙදුවත්, මොන තරම් සල්ලි බෙදුවත් ඒකේ ප්‍රතිඵලය අපට ගන්න බැහැ; ඒ සඳහා ක්‍රීඩා සංගම්වල සහ ඒ නිලධාරින්ගේ මනා වගකීමක් තිබෙන්න ඕනෑ. ඒ ක්‍රීඩකයන්ට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න ඔවුන් උත්සාහ කරන්න ඕනෑ. එහෙම නැත්නම් ක්‍රීඩා අමාත්‍යාංශයත් එක්ක ඒ දේවල් සම්බන්ධව කථා කරලා, ඔවුන්ට අවශ්‍ය පහසුකම් ලබා ගැනීම ඔවුන් ස්ථිර කර ගන්න ඕනෑ. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, ඒ ක්‍රීඩකයන්ට අවශ්‍ය විදේශීය දැනුම, තාක්ෂණය යන සියලු දේවල් ලබා දෙන්න. ඒ වාගේම මේ රට දිනවන්න කොන්දේසි විරහිතව අප හා අත්වැල් බැඳ ගන්න කියලා සියලු දෙනාටම මා ආරාධනා කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

The next speaker is the Hon. Ajith P. Perera. You have 14 minutes.

Before that, the Hon. Deputy Speaker will take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[පූ.භා. 11.32]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෛද්‍යවරයෙක් වන ඔබතුමා මූලසුනේ සිටින වෙලාවේ මේ මාතෘකාව සම්බන්ධයෙන් කථා කිරීමට ලැබීම බොහොම වැදගත්. 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත අපි එකඟ වෙච්ච ජාත්‍යන්තර සම්මුතියක්. අපි එය දේශීය නීතියක් බවට පත් කරන්න මේ පාර්ලිමේන්තුවේ සම්මත කළා. අවුරුදු 13කට ආසන්න කාලයකට පසුව ලෝකයේ ඇතිවෙලා තිබෙන ප්‍රවණතා සලකා බලා, ඒ ප්‍රවණතාවන්ට ගරු කරමින් දේශීය නීති යාවත්කාලීන කිරීම අවශ්‍යයි. ඒ නිසා රජය විසින් මේ කරන කටයුත්ත අපි අගය කරනවා. ඒ වාගේම මේ පනත් කෙටුම්පතට අපේ සහයෝගය පළ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පනත් කෙටුම්පත තුළ ප්‍රධාන වෙනසක් කරලා තිබෙනවා. අපේ ගරු සුගත් තිලකරත්න

නියෝජ්‍ය ඇමතිතුමා හොඳින් දන්නවා, සමහර අවස්ථාවලදී නොදැනුවත්කම නිසා, සමහර අවස්ථාවලදී එහි බරපතළකම නොදැන, සමහර අවස්ථාවල තමන්ගේ පුහුණුකරුවන්ගේ සහ කළමනාකරුවන්ගේ වුවමනාවට අපේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ක්‍රීඩාවල යෙදීමේදී තහනම් උත්තේජක ගැනීම නිරතුරුව සිද්ධ වන බව. මෙතෙක් තිබුණු නීතිය තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එවැනි අවස්ථාවලදී මහාධිකරණයේ නඩු පවරා දඬුවම් කිරීම. එහිදී මහාධිකරණයේ අධිචෝදනා පත්‍රයක් ගොනු කළා. ඒක ඉතා බරපතළ කාරණයක්. ඒ කියන්නේ, ඒ වරදේ ප්‍රමාණයට වඩා අතිශයින් බරපතළ දණ්ඩනයක් ලැබිය හැකි බරපතළ අධිකරණමය ක්‍රියාදාමයකට යොමු කරන්න තමයි 2013දී ගෙනා පනතෙන් කටයුතු කරලා තිබුණේ. හැබැයි, දැන් මේ පනත් කෙටුම්පතේ 3වැනි වගන්තිය මඟින් මහාධිකරණයට ඇති අධිකරණ බලය ප්‍රධාන ප්‍රඥප්තියෙන් ඉවත් කරලා එකතු කරනවා, උත්තේජක මර්දක රීති උල්ලංඝනය කිරීම පිළිබඳ විභාග කිරීමේ කමිටු සහ මූල මණ්ඩලයට. එතකොට, යම් ක්‍රීඩකයෙක් තහනම් උත්තේජක ද්‍රව්‍යයක් පාවිච්චි කර තිබෙන බව පරීක්ෂණවලදී ඒ samplesවලින් පෙනී ගියොත්, ඔහු පොලීසියට අරගෙන ගිහිල්ලා, මහෙස්ත්‍රාත් අධිකරණයට අරගෙන ගිහිල්ලා, අවසානයේදී මහාධිකරණයේ නඩු අහලා හිරේ දමන්නේ නැහැ. මක්නිසාද යත්, ඒ ප්‍රතිපත්තිය අනුව පැහැදිලියි, ඒ අවස්ථාගත කරුණු අනුව වරදක් කළත් ඒ වරදට නියමිත දඬුවම සහ ඒ දඬුවම් දෙන ක්‍රියාදාමය සිද්ධ වෙන්නේ විකල්ප ක්‍රමවේදයකට - alternative method එකකට - අනුව බව.

අද ලෝකය පිළිගන්නා දෙයක් තමයි, සෘජුව අධිකරණවලට යන්නේ නැතුව විකල්ප ක්‍රමවේදවලට අනුව සමහර ආරාවුල්වලට, සමහර ප්‍රශ්නවලට, සමහර වැරදිවලට විසඳුම් සොයන්න පුළුවන්, ඒවා මර්දනය කරන්න පුළුවන්, ඒවා පාලනය කරන්න පුළුවන් කියන එක, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා මේක බොහොම වැදගත්. මොකද, පසුගිය සතියේ මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා ඔබතුමාට මතක ඇති, දෙමව්පියන්, ගුරුවරුන්, ශිෂ්‍ය නායකයන්, පන්සලේ නායක හාමුදුරුවන්, දහම් පාසලේ හාමුදුරුවන්, පියතුමන් වැනි අයට සිර දඬුවම් ලැබීමට සිද්ධ වෙන ආකාරයේ බරපතළ ප්‍රතිපාදන සහිත දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත. එය ඉදිරිපත් කළේ මේ රජයමයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තහනම් උත්තේජක පිළිබඳව, වැරදි පිළිබඳව මහාධිකරණයේදී දඬුවම් දිය යුතුයි කියන 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී තහනම් උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත සංශෝධනය කරන්න මේ රජය අද කටයුතු කරනවා. අපි එය අගය කරනවා. හැබැයි, මේ රජයම මීට සති දෙකකට කලින් මේ පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් අරගෙන ආවා, කුඩා දරුවන්ව හිර ගෙදරට යවන්න. දැන් අවුරුදු 16-18 අතර ළමයෙක් තවත් ළමයෙකුට පහර දුන්නොත්, තවත් ළමයෙකුට බැණ වැදුණොත්, තවත් ළමයෙකුට නින්දා කළොත් මාස හයක් හිර ගෙදර. දෙමව්පියන්, වැඩිහිටියන්, ගුරුවරයෙක්, විදුහල්පතිතුමා, පන්සලේ හාමුදුරුවෝ, පාදිලිතුමා තමන්ගේ ගෝලයෙකුට, තමන්ගේ ශිෂ්‍යයෙකුට, තමන් යටතේ ඉන්න කෙනෙකුට යම් දඬුවමක් කළොත්, ඒ අයව හිරේ යවනවා. දඬුවම් කරන්න ඕනෑ. හැබැයි, අපි කිසිසේත්ම අනුමත කරන්නේ නැහැ, ශාරීරික දඬුවම්. අපි කිසිසේත්ම අනුමත කරන්නේ නැහැ, මානසික දඬුවම්. හැබැයි, එවැනි අවස්ථාවලදී දෙන දණ්ඩනය කුමක්ද? දැන් මේ පනත් කෙටුම්පතෙන් කරලා තිබෙන්නේ මොකක්ද? වරදේ අර්ථ නිරූපණය පිළිබඳ වඩා පුළුල් අර්ථ නිරූපණයක් ලබා දීලා තිබෙනවා, ඒකත් යාවත්කාලීන කරලා. එතකොට, පසුගිය පාර්ලිමේන්තු සතියේ මේ ආණ්ඩුව දරුවන්ට අදාළව -ඉතා වැදගත් ක්ෂේත්‍රයක්- දරුවන්ට එරෙහිව ශාරීරික හෝ මානසික දඬුවම් නොදිය යුතුයි කියන වැදගත් මූලධර්මය ආරක්ෂා කරන්නට මේ පාර්ලිමේන්තුවට අරගෙන එනවා, ළමයින්ව, අම්මලාව, තාත්තලාව, ගුරුවරුන්ව, විදුහල්පතිවරුන්ව හිරේ දාන නීතියක්. හැබැයි, මේ ආණ්ඩුවම අද අරගෙන එනවා, මහාධිකරණයේ දඬුවම් කරලා හිරේ යවන්න ඕනෑ කියලා තිබුණු නීතිය අයින් කරන්න නීතියක්. මේක බරපතළ පරස්පරයක්, ක්‍රීඩා ඇමතිතුමනි. බරපතළ පරස්පරයක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක තමයි කියන්නේ මේ රජයට ප්‍රතිපත්තියක් නැහැ කියලා. රජයට මේ නීති සම්පාදන කටයුතුවල තිබෙන අත්දැකීම් නැතිකම හෝ වුවමනාවක් නැතිකම හෝ ප්‍රතිපත්තියක් නැතිකම හෝ සම්බන්ධීකරණයේ අඩුවක් නිසා හෝ මේ බරපතළ තත්ත්වය සිද්ධ වෙනවා.

අද සමාජයේ බරපතළ කම්පනයක් ඇති වෙලා තිබෙනවා, මේ රජයේ ප්‍රතිපත්ති පිළිබඳව. අපි කවුරුත් පිළිගන්නා වැදගත් කාරණා පිළිබඳව පවා විශාල සාකච්ඡාවක් ඇති වෙලා තිබෙනවා. අපි අපේක්ෂා කරන වැදගත් අරමුණු පවා ඉටු කර ගන්න බාධා වෙන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රජය ප්‍රකාශයක් කරන්න ඕනෑ, පසුගිය පාර්ලිමේන්තු සතියේ ඉදිරිපත් කරපු දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ගන්නා ඉදිරි පියවර මොකක්ද කියලා. මොකද, ගරු සභානායකතුමාගෙන් කියැවුණේ, අපරාධ නඩු විධාන සංග්‍රහයත් සංශෝධනය කරන්න තිබෙනවා, ඒ සමඟ මේකත් අරන් එනවා කියන එකයි. සංශෝධනයක් ගැන තවම රජය කියලා නැහැ. ඒ වාගේම ඒ පනත් කෙටුම්පතේ තිබෙන දරුවන්ව, වැඩිහිටියන්ව, ගුරුවරුන්ව, විදුහල්පතිවරුන්ව, ඒ වාගේම ඒ හා සම්බන්ධ වන අනිකුත් අය හිරේ යවන්නට, අනිවාර්යයෙන් හිරේ යවන්නට, වසර 10 දක්වා හිරේ යවන්නට ප්‍රතිපාදන ගේන එක ගැන රජයේ ස්ථාවරය පැහැදිලිව කියන්න ඕනෑ. මොකද, අද මේ නිසා විශාල කම්පනයක් ඇති වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා, පසුගිය ලෝක ළමා දිනයේදී මොනරාගල පාසලක දරුවෙක් ගුරුවරයාට ගැහුවා කියන සිද්ධිය. ඇත්ත වශයෙන්ම එය බරපතළ කම්පනයක් ඇති වන කාරණයක්. මීට කලින් ඒ වාගේ දේවල් වෙලා තිබෙනවා. හැබැයි, එවැනි වේලාවලදී ගුරුවරු පොලීසියට ගියේ නැහැ. මේ අවස්ථාවේදී ගුරුවරයාට පොලීසියට යන්න වුණා. මොකද, යම් හෙයකින් දරුවා කලින් පොලීසියට ගියා නම් ගුරුවරයා හිරේ. ඒක තමයි ඒ මොනරාගල සිද්ධියේ අවාසනාව. ඒ ගුරුවරයා කවදාවත් දරුවෙකුට විරුද්ධව, දරුවෙකුගෙන් මොන තරම් දෙයක් සිද්ධ වුණත් පොලීසියට පැමිණිල්ලක් කරන කෙනෙක් නොවෙයි. මෙවැනි නීතියක් සම්පාදනය කරනවා කියන බරපතළයි. අපි දන්නවා, ඒ නීතිය තවම සම්මත වුණේ නැහැ කියලා. මම ස්තුතිවන්ත වෙනවා, අන්තිම මොහොතේ හරි ඒ නීතිය තාවකාලිකව හෝ පිටිපස්සට ගත්ත එක ගැන. හැබැයි, මෙහෙම නීතියක් අරගෙන එනවා, බරපතළ නීතියක් අරගෙන එනවා කියන කම්පනය නිසාම ඒ මොනරාගල පාසලේ ගුරුතුමාට සිද්ධ වුණා, තමන්ගේ ගෝලයාට විරුද්ධව පොලීසියට යන්න. ඇත්ත වශයෙන්ම ඒ ගුරුතුමා කියලා තිබෙන්නේ, "දරුවා මොන තරම් වරදක් කළත් මම දරුවාට විරුද්ධව පොලීසි යන කෙනෙක් නොවෙයි, නමුත් මට හිරේ යන්න වෙනවා, මේ අලුත් තත්ත්වය තුළ, ඒකයි මම පොලීසි යන්නේ" කියලා.

අපි දන්නවා, පාසල්වල මත්ද්‍රව්‍ය තිබෙනවා; පාසල්වල හෙරොයින් තිබෙනවා; අයිස් තිබෙනවා; ඒ වාගේම පාසල්වල වෙනත් විවිධාකාරයේ මත්ද්‍රව්‍ය තිබෙනවා කියලා. එවැනි දෙයක් අහු වුණාට පසුව විදුහල්පතිවරයෙකුගේ, ගුරුවරයෙකුගේ ප්‍රතිචාරයක් තිබෙනවා; විනය පාලනය භාර ගුරුවරයාගේ ප්‍රතිචාරයක් තිබෙනවා. මේ ප්‍රතිචාර පිළිබඳව ඒ අදාළ වරද කරන ශිෂ්‍යයා හෝ ඒ ශිෂ්‍යයාගේ පවුලේ කෙනෙකුට පොලීසියට ගිහිල්ලා ඒ ගුරුවරයාව, විදුහල්පතිවරයා හිරේ යවන්න පුළුවන් විධියේ අනතුරක් තිබෙන නීතියක් අරගෙන එන්න මේ රජය සති දෙකකට

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

කලින් කටයුතු කළා. හැබැයි, අද ඉතා වැදගත් සංශෝධනයක් ගෙනැල්ලා තිබෙනවා. අපේ ගරු සුගත් තිලකරත්න මැතිතුමා ජාත්‍යන්තර ක්‍රීඩකයෙක්; රටට ගෞරවයක් ගෙනැවිත් දීපු, රන් පදක්කම් ගෙනැවිත් දීපු ක්‍රීඩකයෙක්. අපි සතුටු වෙනවා, ඔබතුමා වාගේ කෙනෙක් නියෝජ්‍ය අමාත්‍ය ධුරය දරන එක ගැන. මේක ඉතාම වැදගත්. සමහර අවස්ථාවල ඒ ක්‍රීඩකයා හරියට දන්නේ නැහැ, මෙහි බලපෑම. සමහර අවස්ථාවල පුහුණුකරුගේ බලපෑමට වෙන්නේ. සමහර අවස්ථාවල කළමනාකරුවෝ දන්නේ නැතුව රැවටීමෙන් තමන්ගේ ක්‍රීඩකයාගේ performance වැඩි කරන්න මේ පියවර අරගෙන තිබෙනවා. ඒ වාගේ ප්‍රශ්නයක් වුණාම, ඒ ක්‍රීඩකයාට එරෙහිව මහාධිකරණයේ නඩු දාලා හිරේ දාන එක, ඒ පුහුණුකරුට එරෙහිව මහාධිකරණයේ නඩු දාලා හිරේ දාන එක සුදුසු නැති නිසා තමයි අපි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුගත වෙමින් කටයුතු කරන වැඩ පිළිවෙලට යන්නේ. World Anti-Doping Agency - WADA - කියලා තමයි සාමාන්‍යයෙන් ප්‍රසිද්ධ වෙලා තිබෙන්නේ. කවුරුත් දන්නේ ඒ විධියට. මේ ලෝක මත්ද්‍රව්‍යවලට එරෙහි ඒජන්සියේ තිබෙන ඒ ප්‍රමිතියට අනුගත වෙමින් තමයි අපි දැන් අධිකරණයට යන්නේ නැතුව, අධිකරණමය නොවන වෙනත් විනය මණ්ඩලයක් හරහා මේ අයට දඬුවම් කිරීම සඳහා වන වැඩ පිළිවෙළට යන්නේ. මේක අපි බොහොම අගය කරනවා. හැබැයි, ඔබතුමන්ලාගේ ආණ්ඩුවට ප්‍රතිපත්තියක් නැහැ. පසුගිය සතියේ එකක් කියනවා; අද එකක් කියනවා.

දැන් පාසල් දරුවන්, ගුරුවරු, විදුහල්පතිවරු, දෙමව්පියන් ගැන එක් ස්ථාවරයක්, ජාත්‍යන්තර ක්‍රීඩාව ගැන තවත් ස්ථාවරයක් දරනවා. ජාත්‍යන්තර ප්‍රමිතීන් ගෙනැල්ලා මෙන්න මෙහෙම කරන්න කියලා බල කළාම විතරද ඔබතුමන්ලා නීති සම්පාදනය කරන්නේ? ජාත්‍යන්තර ප්‍රමිතීන් අනුව මෙන්න මෙහෙම කරන්න කියලා කෙටුම්පත එවලා, මේ කෙටුම්පත අනුව සංශෝධනය නොකළොත් ඔබේ රටට ජාත්‍යන්තර මලල ක්‍රීඩා සංගමයේ කටයුතුවලදී බාධා ඇති වෙනවා, කරුණාකර ඉක්මනට මේ සංශෝධන කරන්න, ජාත්‍යන්තර ප්‍රමිතීන්වලට ගළපන්න කියලා කිව්වොත් විතරද සංශෝධන කරන්නේ? අපේ රටේ මිලියන ගණනක් දරුවන්ට, දෙමාපියන්ට, ගුරුවරුන්ට බලපාන නීතිවලදී ඒ ප්‍රතිපාදන, ඒ සම්මතයන් නැද්ද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක බරපතළ තත්ත්වයක්. ඒ නිසා මම නැවත කියනවා, මේ රජය දරුවන්ට අදාළව ශාරීරික හා මානසික වධ බන්ධන පැනවීමට එරෙහිව පනවන නීතියේ හැඩ රුව ගැන ගන්නා ඉදිරි ක්‍රියාමාර්ග ගැන පැහැදිලි ප්‍රකාශයක් කළ යුතුව තිබෙනවා. ඒක ඉතා වැදගත් එකක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රජය බලයට පත් වෙද්දී, ඒ වාගේම පසුගිය ජනාධිපතිවරණ ව්‍යාපාරයේදී, පාර්ලිමේන්තු මැතිවරණ ව්‍යාපාරයේදී ජනාධිපති ගරු අනුර කුමාර දිසානායක මහත්මයා බොහොම පැහැදිලි දෙයක් කිව්වා. ඒ තමයි, මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව සම්පූර්ණයෙන් සුළුතර කණ්ඩායමකගේ පාලනයට යටත් වෙලා තිබෙනවා, ක්‍රිකට් ක්‍රීඩාවේ ප්‍රජාතන්ත්‍රවාදයේ නාමයෙන් ඡන්ද ප්‍රමාණය සීමා කරගෙන ව්‍යවස්ථාවක් හදාගෙන, ඒ ව්‍යවස්ථාව තුළ කරන manipulations හරහා එකම කණ්ඩායමක් දිගින් දිගට බලයේ සිටීමේ ක්‍රමවේදයක් තිබෙනවා, ඒකට මේ පාර්ලිමේන්තුවේ සිටින 225දෙනාම එකඟ වෙයි කියන එක. අපිත් විපක්ෂයේ ඉන්නකොට මේ කථාව කිව්වා. මේ ප්‍රශ්නය දිගින් දිගටම මතු වුණා. ඒ වාගේම, විපක්ෂයේ ඉන්නකොට ගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ ඒ සියලුදෙනාමත් මේ කථාව කිව්වා, ඒකට උත්තරයකුත් කිව්වා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට මතක ඇති, මේ ප්‍රශ්නය පිළිබඳව කලින් පැවැති රජයක් විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු කේ.ටී. චිත්‍රසිරි මැතිතුමාගේ මූලිකත්වයෙන් යුතුව විශිෂ්ට වූ වාර්තාවක් ඉදිරිපත් කර තිබෙන බව. මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාවේ ප්‍රතිසංස්කරණ පිළිබඳව ඉදිරිපත් කරපු ඒ වාර්තාවේ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ව්‍යවස්ථාව සංශෝධනය කරන්නේ කොහොමද, මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව ඉදිරියට ගෙන යන්නට අවශ්‍ය කරන ඒ ප්‍රතිසංවිධාන කරන්නේ කොහොමද කියන එක ගැන විස්තරාත්මකව දක්වා තිබෙනවා. දැන් අවුරුද්දක් ගත වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම දැනගන්න කැමැතියි ජනාධිපතිවරණයේදී, මහ මැතිවරණයේදී පොරොන්දු වෙච්ච පරිදි ඔබතුමාගේ අමාත්‍යාංශය කේ.ටී. චිත්‍රසිරි වාර්තාවේ තිබෙන යෝජනා කීයක් ඉෂ්ට කර තිබෙනවාද කියලා.

ගරු ක්‍රීඩා ඇමතිතුමනි, ඔබතුමා බොහොම උනන්දුයි. ඔබතුමා සමඟ අපි සමහර ප්‍රශ්න ගැන කථා කළා. ඔබතුමා බොහොම උනන්දු වෙලා ඇවිල්ලා, පරීක්ෂා කර බලා, ඒවාට උත්තර සොයනවා. ඒකට බොහොම ස්තුතියි. හැබැයි, මම වැදගත් කාරණයක් අහන්න කැමැතියි. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ප්‍රතිසංස්කරණ පිළිබඳව, එහි ඇති විය යුතු වෙනස්කම් පිළිබඳව ගරු ජනාධිපතිතුමා ජනාධිපති වෙන්න කලින් ජනාධිපතිවරණ සමයේදී කියපු, එතුමාත් පිළිගත්ත කේ.ටී. චිත්‍රසිරි වාර්තාවේ තිබෙන යෝජනා කීයක් ඔබතුමා ඉෂ්ට කර තිබෙනවාද? ඔබතුමාට මම මේ සුහද අභියෝගයක් කරන්නේ. ඔබතුමාට පෞද්ගලිකව අභියෝග කරන්න දෙයක් නැහැ. ඔබතුමාට මම සුහද අභියෝගයක් කරනවා, කරුණාකර මේ විවාදයේදී කියන්න ඒ ඉෂ්ට කර තිබෙන යෝජනා මොනවාද කියලා. මොකද, අපි දන්නවා ක්‍රිකට් ක්‍රීඩාවේත් තහනම් උත්තේජක භාවිතය පිළිබඳ ප්‍රශ්න ඇති වුණා. මලල ක්‍රීඩාවේ පමණක් නොවෙයි, අනෙක් ක්‍රීඩා වන බර ඉසිලීමේ ක්‍රීඩා හෝ සවි එසවීමේ ක්‍රීඩාවල පමණක් නොවෙයි මේ ප්‍රශ්නය තිබෙන්නේ. දැන් වැදගත්ම, බරපතළම, බිලියන ගණනක් මුදල් රැස් වන, වියදම් කරන තැනට ඔබතුමන්ලා අත තබන්නේ නැහැ. ඇයි? මොකක්ද ප්‍රශ්නය? අනෙක් ඔක්කොම මලල ක්‍රීඩා ගැන බලනවා, රගර් ගැන බලනවා, නෙට්බෝල් ගැන බලනවා, වොලිබෝල් ගැන බලනවා. බොහොම හොඳයි. මේ පනතත් ජාත්‍යන්තර සම්මුතියට අනුව සකස් කරනවා. ඒකත් හොඳයි. හැබැයි, මේ රටේ ජනතාවගෙන් වැඩි පිරිසක් ක්‍රීඩා කරන, අපට ලෝක ශූරතාව ලබා දුන් ක්‍රිකට් ක්‍රීඩාවේ ප්‍රතිසංස්කරණ සිදු විය යුතු බව ඔබතුමන්ලාත්, අපත් ඔක්කොම පිළිගනිද්දී, ඒ පිළිබඳව මෙතෙක් ඉදිරිපත් වෙච්ච විශිෂ්ටතම වාර්තාවක් වන කේ.ටී. චිත්‍රසිරි වාර්තාව ක්‍රියාත්මක කරන්නේ නැහැ. දේශපාලන භේදයක් නැතිව, විශිෂ්ට උගතුන්ගෙන්, විශේෂඥයන්ගෙන් සමන්විත වාර්තාවක්, ඒක. ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමාත් කිව්වා ඒ වාර්තාව ක්‍රියාත්මක කරනවා කියලා. ඒ නිසා ආපසු කියන්න බැහැ අපි සොයා බලනවා, දන්නේ නැහැ, සලකා බලන්නම් කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාත් පිළිගන්නවා නේ, ජනාධිපතිවරණ සමයේදී වෙච්ච පොරොන්දු ඉෂ්ට කරන්න ඕනෑ කියලා. අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා මේ සභාවේදී කේ.ටී. චිත්‍රසිරි වාර්තාව ගැන කිව්වා. ඒක ක්‍රියාත්මක කරනවාමය කියලා කිව්වා. ජනාධිපති වුණාම අනිවාර්යයෙන්ම මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාවේ විප්ලවීය වෙනසක් කරනවාය කිව්වා. ඔබතුමා දැකලා තිබෙනවාද මොනවා හරි වෙනසක්? චිත්‍රසිරි වාර්තාවේ එකම නිර්දේශයක් හෝ ක්‍රියාත්මක කර තිබෙනවාද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කරුණාකර වෙච්ච පොරොන්දුව ඉෂ්ට කරන්න. දැන් අවුරුද්දක් ගත වුණා. මම මේක මාසයකින් කිව්වා නම්, ඒක අසාධාරණයි. මම මේක මාස තුනකින් කිව්වා නම්, ඒක අසාධාරණයි. මම මේක මාස හයකින් කිව්වා නම්, ඒක අසාධාරණයි. මම මේක කියන්නේ අවුරුද්දකට පසුවයි. මේ රටේ ජනතාවගෙන් වැඩි පිරිසක් ක්‍රීඩා කරන, අපට ලෝක ශූරතාව අරගෙන ආපු, අදත් ලෝකයේ අභිමානයට පාත්‍ර වන සේ අපේ රට වෙනුවෙන් අපේ ජාතික ගීය ජාත්‍යන්තර තලය තුළ හඬ නඟා

කියන්නට අවකාශ සලසන, නැවත ලෝකයේ අංක එකේ ජාතිය බවට පත් වන්නට අපට අවස්ථාව සලසන ක්‍රිකට් ක්‍රීඩාවේ ප්‍රතිසංස්කරණ උදෙසා අවශ්‍ය කරන ඒ ආයතනික ප්‍රතිසංස්කරණ යෝජනා කරපු, ජනාධිපතිතුමාත් එකඟ වෙච්ච කේ.ටී. චිත්‍රසිරි වාර්තාවේ තිබෙන යෝජනා ඉෂ්ට කරන්නේ නැත්තේ ඇයි? ගරු අධිකරණ ඇමතිතුමනි, හදිසියේවත් අප දන්නේ නැතිව එය ක්‍රියාත්මක කර තිබෙනවා නම්, ඔබතුමා හරි ඒ බව දන්නවා නම් ඒ ගැන අපට කියන්න. අප දන්නේ නැතිව ඒ එකක් හරි ඉෂ්ට කර තිබෙනවා නම් අපට කියන්න. ඉෂ්ට කරලා නැත්නම් වස ලජ්ජාවයි!

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Sunil Rajapaksha. You have 10 minutes.

[පූ.භා. 11.46]

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතට සංශෝධන ගෙනෙන මේ අවස්ථාවේ ඒ සම්බන්ධයෙන් අදහස් දක්වන්න ලැබීම ගැන මම සතුටු වෙනවා. අප මේ පනත් කෙටුම්පත ගෙන ඒමේදී, විශේෂයෙන්ම අපේ රටේ ක්‍රීඩාව ආරක්ෂා කිරීමත්, ක්‍රීඩකයා ආරක්ෂා කිරීමත් අරමුණු කර ගන්නවා. මේ සංශෝධන පනත් කෙටුම්පත මේ ගරු සභාවට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කථා කරද්දී, ක්‍රීඩාවෙන් ජාතික තලයත්, ජාත්‍යන්තරයත් ජය ගත්තු, ඒ වාගේම anti-doping testingවලට සිය වතාවකට වඩා භාජන වෙච්ච, ජගත් කීර්තිධර ක්‍රීඩකයෙකුම එම කාර්යයේ යෙදීම මේ පනත සංශෝධනයේ අවශ්‍යතාවේ ගැඹුර වඩවඩාත් දනවනවා.

අප පාසල් මට්ටමේ ඉඳලා ක්‍රීඩාව දියුණු කරන්නේ, ක්‍රීඩාව එතැනින් නවත්වන්න නොව, ඒ සෑම ක්‍රීඩකයෙකුම වෘත්තීමය වශයෙන් තම ක්‍රීඩා කුසලතාව දියුණු කරගෙන ජාතික තලයත්, ජාත්‍යන්තර තලයත් ජය ගැනීම සඳහා යොමු කරවන්නයි. එහෙම කළොත් තමයි ක්‍රීඩාව නිසා රටට කීර්තියත්, අභිමානයත් ගෙන ඒමට අපට හැකියාව ලැබෙන්නේ. එහෙම කළොත් තමයි ගරු නියෝජ්‍ය ඇමතිතුමා කියපු විධියට, කවුරුත් පිළිගන්නා විධියට ක්‍රීඩාව තුළින් රටට ආර්ථිකමය වාසි ලබා ගන්න පුළුවන් වන්නේ. අප ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ක්‍රීඩාවේ යෙදෙන කොට ඒ ක්‍රීඩාවේ සම්මත සම්මුතීන්, ජාත්‍යන්තර නීති රීති අනුව කටයුතු කිරීම ඉතාම වැදගත්. එහෙම නොවුණොත් අපට ජාත්‍යන්තර වශයෙන් කීර්තිය ලැබෙනවා වෙනුවට ලැබෙන්නේ අපකීර්තියයි; අපට ජාත්‍යන්තර වශයෙන් අභිමානය ළඟා වෙනවා වෙනුවට ලැබෙන්නේ අවමානයයි. මා එහෙම කියන්නේ, දැනට ලංකාවේ මේ සම්බන්ධව තිබෙන ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය කරපු පරීක්ෂණ දත්ත අනුවයි. මේ සම්බන්ධයෙන් 2020 අවුරුද්දේ වැරැදිකරුවන් දෙදෙනෙක්, 2021 අවුරුද්දේ වැරැදිකරුවන් 4 දෙනෙක්, 2022 අවුරුද්දේ වැරැදිකරුවන් 5 දෙනෙක්, 2023 අවුරුද්දේ වැරැදිකරුවන් 4 දෙනෙක් මේ විධියට දඬුවමට ලක් වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, 2024 අවුරුද්දේ 160 දෙනෙකුට අදාළව පරීක්ෂණ කරලා, 3 දෙනෙකුගේ සාම්පල් ධනාත්මක වෙලා තිබෙනවා. මේකෙන් පේන්නේ මොකක්ද? මෙවැනි ජාත්‍යන්තර නීති රීති, සම්මුතීන්වලට අප එකඟ වෙලා සිටියත්, නැවත නැවතත්, තවතවත් එවැනි ක්‍රියාවල යෙදෙන අය ඉන්නවා කියන එකයි. ඒ නිසා අපට අද සිද්ධ වෙලා තිබෙනවා, ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය - WADA එක - සමඟ සමගාමීව යමින්, කාලීනව ඇති වන ඒ අවශ්‍යතා මත ගැළපෙමින් ලංකාවට උචිත විධියට මේ පනත සංශෝධනය කර ගැනීමට සහ ඒ තුළින් ලංකාවේ මේ සම්බන්ධයෙන් වගකීම දරන ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ලෝක වශයෙන් පිළිගන්නා ආයතනයක් බවට පත් කර ගැනීමට. අන්න ඒ නිසා අද දවසේ මේ සංශෝධනත් එක්ක ජාතික වශයෙනුත්, ලෝක වශයෙනුත් කාලීනව ඇති වන අවශ්‍යතාවලට අනුව තහනම් උත්තේජක මර්දනයට සම්බන්ධ නීති යාවත්කාලීන වෙන්න ඕනෑ. අද දවසේ ඒ කාර්යය මෙහිදී සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණය සම්බන්ධයෙන් අපට යම් ඉතිහාසයක් තිබෙනවා. ලෝක මට්ටමින් ගත්තොත්, 1928දී පමණ තමයි තහනම් උත්තේජක පාලනය ෆින්ලන්තයෙන් ආරම්භ වන්නේ. පළමු තහනම් උත්තේජක නියෝජිතායතනය ආරම්භ වන්නේ 1984 වර්ෂයේදී. එය ක්‍රමක්‍රමයෙන් දියුණු වෙලා තමයි WADA එක ස්ථාපිත වන්නේ, 1999 වර්ෂයේදී. 2013 වර්ෂය වනකල් අපේ රටේ ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය කරන ඒ කටයුත්ත කළේ ක්‍රීඩා වෛද්‍ය ආයතනයෙන්. නමුත්, ඒ සඳහාම ක්‍රියාත්මක වන ස්වාධීන ආයතනයක අවශ්‍යතාව මත 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය පිහිටුවා අදත් එය පවත්වාගෙන යනවා. අද මේ පනත් කෙටුම්පතින් පනතට සිදු කරන සංශෝධන නිසා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය - WADA - පිළිගත්, අනුමැතිය ලත් ආයතනයක් බවට පත්වීමේ එක් සාධකයක් සම්පූර්ණ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය මේ සම්බන්ධයෙන් වන ජාතික සංවිධානයක් ලෙස තම වගකීම අනුව කළ යුතු කාර්යයන් කිහිපයක් තිබෙනවා. ඒවායෙන් පළමුවැන්න තමයි, තහනම් උත්තේජක විරෝධී පනත් කෙටුම්පත් සහ නීති සම්මත කර ක්‍රියාත්මක කරන එක. ඒ වාගේම, තහනම් උත්තේජක විරෝධී අධ්‍යාපනය සැලසුම් කරලා ක්‍රියාත්මක කරන එක තවත් එකක්. ඒ වාගේම තමයි, තහනම් උත්තේජක භාවිත කර තිබෙනවාද කියා පරීක්ෂා කර බැලීම සඳහා වන සාම්පල් එකතු කිරීම, ඒ සඳහා වන නිලධාරීන් පුරුදු පුහුණු කිරීම, සාම්පල් එකතු කිරීම හා වෙනත් පරීක්ෂණ පැවැත්වීම, ඒ පරීක්ෂණවල ප්‍රතිඵල කළමනාකරණය කිරීම සහ ජාතික මට්ටමේ ප්‍රතිඵල කළමනාකරණය කිරීම ආදියත් කළ යුතු වෙනවා. අන්න ඒ කටයුතු කරන කොට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයට ඒ කටයුතු ජාත්‍යන්තර මට්ටමින් නිසියාකාරව කරගෙන යන්න අවශ්‍ය භෞතික සම්පත් සංවර්ධනය, මානව සම්පත් සංවර්ධනය වාගේම ක්‍රියාවලි සංවර්ධනයත් ප්‍රමාණවත්ව සිදු වනවාද, නැද්ද කියන එක අපට තිබෙන ලොකු ප්‍රශ්නයක්. ගරු නියෝජ්‍ය ඇමතිතුමාම කිව්වා, "ඒ කාර්යයන් සඳහා ලාංකිය වශයෙන් අපිට ප්‍රමාණවත් පහසුකම් නැහැ. ඒ නිසා තමයි මෙහේ එකතු කරන සාම්පල් අපි මලයාසියාවට හෝ කටාර් රාජ්‍යයට යවලා අවශ්‍ය කටයුතු කරන්නේ" කියලා. ඒ නිසා මම මේ සභාවේදී මේ කාරණය අවධාරණය කරනවා. අපි ක්‍රීඩාවෙන් ජාත්‍යන්තරය ජය ගන්න අපේක්ෂා කරන ජාතියක්. ඒ නිසා අපට වගකීමක් තිබෙනවා, ජාත්‍යන්තර ක්‍රීඩාවත් එක්ක එකතු වෙමින් ඒ සම්බන්ධව කටයුතු කරන ජාත්‍යන්තර ආයතන සමඟ එකතුව කටයුතු කරමින් අපගේ කාර්යභාරය මැනවින් කිරීම සඳහා අවශ්‍ය භෞතික සම්පත් සහ මානව සම්පත් දියුණු කරගෙන ඉදිරියට යන්න. එම නිසා අපි මේ පනත් කෙටුම්පත සම්මත කිරීමෙන් නොනැවතී අපේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා, අපේ ක්‍රීඩකයන් ජාත්‍යන්තර මට්ටමට ගෙන යෑම සඳහා, ජාත්‍යන්තරය

[ගරු සුනිල් රාජපක්ෂ මහතා]

තුළ ලාංකික ක්‍රීඩකයන්ට තැනක් ගොඩනගා ගැනීම සඳහා අවශ්‍ය පසුබිමත් සකසා ගත යුතුයි කියලා මේ අවස්ථාවේ මම අවධාරණය කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමා පැහැදිලි කළා-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණය පොඩ්ඩක් පැහැදිලි කරන්න ඕනෑ. එම නිසා මට තව පොඩි වේලාවක් දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දැඩි සේ කනගාටු වනවා, තවම සාකච්ඡා කරලා පාර්ලිමේන්තුවේ සම්මත නොකළ පනත් කෙටුම්පතක වගන්තියක් පිළිබඳව වැරදි අදහස් සමාජ මාධ්‍ය ඔස්සේ සමාජගත කරලා ලාංකික ශිෂ්‍ය ප්‍රජාවත්, දෙමව්පියන් ඇතුළු සියලුදෙනාත් මහත් කලබගැනියකට පත් කර තිබීම ගැන. මේ කථාව අහගෙන ඉන්න ගරු සභාවේ සහ පාර්ලිමේන්තුවෙන් පිටත ඉන්න ඕනෑ කෙනෙකුට මම ආරාධනා කරනවා, ඒ ගැන කරුණු සොයා බලන්න කියලා. දැනටමත් ලංකාවේ පාසල්වල විනය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් 2016/12 චක්‍රලේඛය තිබෙනවා. ළමුන්ට දඬුවම් දෙන්න ඕනෑ කොහොමද කියලා එහි මැනවින් සඳහන් කර තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, would you please wind up?

**ගරු සුනිල් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சுனில் ராஜபக்ஷ)
(The Hon. Sunil Rajapaksha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණය කියලා අවසන් කරනවා.

ශාරීරික දඬුවම් දුන්නොත් කොහොමද දණ්ඩ නීති සංග්‍රහය බලපාන්නේ, කොහොමද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බලපාන්නේ සහ කොහොමද රජයේ සේවකයකුට ආයතන සංග්‍රහය බලපාන්නේ කියලාත් පැහැදිලි කරලා තිබෙනවා. එහෙම තිබෙද්දී ඒවා කියවන්නේ නැතුව වැරදි අදහස් ප්‍රකාශ කිරීම ගැන කනගාටුව ප්‍රකාශ කරමින්, මා නිහඬ වනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Leader of the Opposition Sajith Premadasa. You have an allocation of seven minutes.

[පූ.භා. 11.57]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ක්‍රීඩාවලදී උත්තේජක ද්‍රව්‍ය ගැනීම පිළිබඳව සහ ඒවාට තිබෙන තහනම පිළිබඳවයි අපි මේ අවස්ථාවේ සාකච්ඡා කරන්නේ. උත්තේජක තහනම් කිරීම සිදු වෙන්නේ ඒක වැරදි ක්‍රියාවක් නිසා. -කෘත්‍රිම උත්තේජක- එතැනදී හරි දේ, වැරදි දේ තෝරා ගැනීමක් සිද්ධ වෙන්න ඕනෑ. අපේ රටේ දරු පරපුරට කුඩා කාලයේ ඉඳලාම සුදුසු දේ සහ නුසුදුසු දේ, හරි දේ සහ වැරදි දේ, සත්‍ය සහ අසත්‍ය කියන මේ කරුණු කාරණා පිළිබඳ අවබෝධය ලබා දීම දෙමව්පියන්, ගුරුභවතුන් -ආචාර්යවරුන්- ඇතුළු වැඩිහිටියන්ගේ කාර්යභාරයක්. ඒ අයගේ කාර්යභාරය තුළ තමයි දූවා දරුවාගේ වර්තමානය, අනාගතය හා පැවැත්ම තීන්දු වෙන්නේ.

අපි හැමෝගෙම බලාපොරොත්තුව ශිෂ්ටසම්පන්න ජන සමාජයක් නිර්මාණය කිරීමයි. ශිෂ්ටසම්පන්න ජන සමාජයක් නිර්මාණය කිරීම සඳහා කුඩා කාලයේ ඉඳලාම දූවා දරුවන්ට අවශ්‍ය නිසි මාර්ගෝපදේශකත්වය -මඟ පෙන්වීම-, හරි වැරදි දේ තේරුම් කරලා දීම හා සත්‍ය අසත්‍ය පිළිබඳව ඒ අවබෝධය ලබා දීම ගුරුවරුන්, විදුහල්පතිවරුන් හා දෙමව්පියන් ඇතුළු වැඩිහිටියන් කරන කාර්යයක්. දූ දරුවන් ලක්වන හිංසනය කියන මාතෘකාව කේන්ද්‍ර කරගෙන වර්තමාන රජය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරන්න අදහස් කරන, දරුවන්ට හරි වැරදි කුමක්ද කියන එක තේරුම් කර දීමේ ක්‍රියාවලිය පිළිබඳව ලොකු ව්‍යාකූලත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා. දූ දරුවන් හිංසනයට ලක් වන සේ කෲරත්වයෙන්, ම්ලේච්ඡත්වයෙන් කෙරෙන දඬුවම්වලින්, දූ දරුවන්ගේ අභිමානය පලුදු කරන ඒ ක්‍රියාවලින් බැහැර වෙන්නට ඕනෑ. ඒ ගැන කිසිදු විවාදයක් නැහැ. එය නුසුදුසුයි. එය සාපරාධී ක්‍රියාවක්. ඒ ගැන කිසි ගැටලුවක් නැහැ. නමුත්, දෙමව්පියන්ගේ කාර්යභාරය, වැඩිහිටියන්ගේ කාර්යභාරය, ආචාර්යවරුන්ගේ -ගුරුවරුන්ගේ- කාර්යභාරය අද බරපතළ ව්‍යාකූලත්වයට පත් වෙලා තිබෙනවා.

මේ අවස්ථාවේ මේ නීති පද්ධතියේ වෙනස්වීම් පිළිබඳව සමාජයේ ලොකු කතිකාවක් ඇතිවීම තුළ, සමහර අවස්ථාවල දරුවා තීන්දු කරනවා, ගුරුවරයාට උගන්වන්න. ඒ ඉගැන්වීමේ කටයුතු අතින් පයිනුත් ක්‍රියාත්මක කරනවා. මම හිතන්නේ නැහැ ඒක සාමාන්‍ය දෙයක් කියලා. ඒක අසාමාන්‍ය දෙයක්. නමුත්, මේකේ බරපතළකම අපි හඳුනා ගන්න ඕනෑ. ඒ නිසා විශේෂයෙන්ම මේ අවස්ථාවේ අපට සිදු වෙනවා පක්ෂ හෝ වෙනත් භේද භින්නවීම්වලින් තොරව මේ කාරණාව පිළිබඳ හොඳ කතිකාවකට ගිහිල්ලා කටයුතු කරන්න. කෲරත්වය, හිංසනය, ම්ලේච්ඡත්වය ඇතුළුව දරුවන්ට සිද්ධ වන ඒ ක්‍රියාදාම සහමුලින්ම බැහැර කරමින්, වැඩිහිටියාගේ කාර්යභාරය, අම්මලා තාත්තලාගේ වගකීම, ගුරුභවතුන්ගේ වගකීම නිසියාකාරව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සුදුසු නීති පද්ධතියක් ගැන අපි වැඩිදුර සාකච්ඡා කරලා එය රටේ ප්‍රතිපත්තිය බවට පත් කිරීම ඉතාම කාලෝචිතයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ ගුරු දිනය සැමරුවා. ඒ අයට කරපු පඩි වැඩි කිරීම්වලින් තුනෙන් එකක් ලැබුණා, ඉතිරි තුනෙන් දෙක දෙන්න පොරොන්දු වුණා, ඒක බලාපොරොත්තුවෙන් ඉන්නවා කියන එක තමයි ගුරුවරුන්ගේ අඳෝනාව. ඒ අයගේ බලාපොරොත්තු කඩ වෙලා. "ගුරු සෙත" ණය යෝජනා ක්‍රමය තුළ ඉහළ පොලියක් අය කරනවා, ඒ ණයවලට. ඒ පොලිය අඩු කරන්න කියලා ඒ අය ඉල්ලීමක්

කරනවා. ඒ වාගේම, කොරෝනා සමයේ සංවර්ධන නිලධාරින් 16,600ක් ගුරුවරුන් බවට පත් වෙලා, වසර ගණනාවක් මුළුල්ලේ ලොකු කැපකිරීම් කළත් අද ඒ අයට සිද්ධ වෙලා තිබෙනවා ඒ අයගේ අයිතිය වෙනුවෙන් මහ පාරේ උද්ඝෝෂණය කරන්න. ඉතින්, ඇත්ත වශයෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රයේ බරපතළ කඩා වැටීමක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තහනම් උත්තේජන පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේ කියන්න ඕනෑ, තහනම - තහංචිය- පැනවිය යුත්තේ වැරැද්ද තේරුම් අරගෙන බව. හැබැයි, දූ -දරුවන්ට මේ තහනම -තහංචිය- හෝ වරද පිළිබඳව කියා දීමේ දී මානුෂීය ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා වැඩිහිටියන්ටත්, ගුරුභවතුන්ටත් නිසි ක්‍රමයක් සකස් කිරීම අද යුගයේ අවශ්‍යතාවක්. විශේෂයෙන්ම අපේ රටේ දරු සම්පත අපි ආරක්ෂා කරන්නට ඕනෑ. ඒ දරු සම්පතට අවශ්‍ය නිසි නායකත්වය මාර්ගෝපදේශකත්වය ලබා දෙන්න ඕනෑ. ඒ දරුවන් යම් ප්‍රමාණයක් වැරදි පාරේ යනවා නම්, ඒ වැරැද්ද පෙන්වා දෙන මානුෂීය ක්‍රමය කුමක්ද කියන එක ගැන පුළුල් විග්‍රහයක්, පුළුල් සංවාදයක් ඇති වෙන්නට ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවැනි කරුණු නිසා අපේ රටේ ගුරුභවතුන් 250,000කට ආසන්න සංඛ්‍යාවක් අද වෙනකොට දැඩි කනස්සල්ලෙන් ඉන්නවා. සංවර්ධන නිලධාරින් ගුරු සේවයට අන්තර්ග්‍රහණය කිරීම අධිකරණ සමථකරණයක් තුළ තීන්දු වුණ නිසා ඒ කටයුත්තත් වහාම ක්‍රියාත්මක කරන්න කියලා මේ රජයට මම යෝජනා කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. (Dr.) Nihal Abeysinghe. You have 13 minutes.

[අ.භා. 12.04]

**ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි කථා කරන්නේ 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී තහනම් උත්තේජක ද්‍රව්‍ය භාවිතයට ගැනීමට එරෙහි සම්මුති පනතට අවශ්‍ය සංශෝධන ගෙන ඒම පිළිබඳවයි. මේක අන්තර්ජාතික සම්මුතියක්. මේක, 2005දී සාකච්ඡා කරලා, 2007දී ක්‍රියාත්මක වුණු, UNESCO එක විසින් එකඟත්වයට පත් කළ සම්මුතියක්. මේ සම්මුතිය අපට වැදගත් වෙන්නේ, ක්‍රීඩා තරගවලදී, විශේෂයෙන්ම අන්තර්ජාතික තරගවලදී මෙන්ම, දේශීය තරගවලදීත් ඒ ක්‍රීඩකයන්ට අවශ්‍ය සම බිමක් නිර්මාණය කර ගන්න අවශ්‍ය නිසායි. මේ නිසා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට තරගවලදී සම බිමක් සකස් කරලා දෙන්න ජාතික වශයෙන් ඒ රාජ්‍යයන්ගේ මැදිහත්වීම අවශ්‍යයි. අවශ්‍ය කරන නීති ක්‍රියාත්මක කරවීම, ඒ අයගේ පෞද්ගලික සෞඛ්‍යයට අදාළ අත්‍යවශ්‍ය කරුණු පිළිබඳව කටයුතු කිරීම තමයි මේ සම්මුතියෙන් බලාපොරොත්තු වෙන්නේ. 2017දී තමයි මේ සම්මුතිය ක්‍රියාත්මක වෙන්න පටන් ගත්තේ. අපි මේ පනත ඉදිරිපත් කරලා තිබෙන්නේ 2013දී. අද අපි ඒ පනතට සංශෝධනයක් ඉදිරිපත් කරනවා. මොකද, අපේ රටට මේ සම්මුතියට එකඟව වැඩ කටයුතු රාශියක් කරන්න ඉතිරි වෙලා තිබෙන නිසා.

මේ පනතේ අරමුණ වුණේ තහනම් උත්තේජක භාවිත නොකරන ක්‍රීඩා පරිසරයක් නිර්මාණය කිරීමයි. ඒ වාගේම තහනම් උත්තේජක භාවිතය වැළැක්වීමට ජාත්‍යන්තර සහයෝගය ලබා ගන්න, ඒ ඒ රටවල සකස් කරන ප්‍රතිපත්ති, නීති රීති ජාත්‍යන්තර සම්මුතියට අදාළව සකස් කරගන්න, තහනම් උත්තේජක භාවිතය නිසා ඇති විය හැකි ඵල විපාක ගැන ක්‍රීඩකයින්ට, ඔවුන්ගේ පුහුණුකරුවන්ට, පාසල් දරුවන්ට, පාසල් ගුරුවරුන්ට අවශ්‍ය දැනුම සහ වැළැක්වීමේ ක්‍රියාමාර්ග හඳුන්වාදීමට තමයි මේ පනත විශේෂයෙන් වැදගත් වුණේ. ඒ වාගේම අදාළ පර්යේෂණ කරන්නට අවශ්‍ය රසායනාගාර ඇති කිරීමට, අදාළ පරීක්ෂණවලට විවිධ ආයතනවල සහයෝගය ගැනීමට, අවශ්‍ය වෙලාවට විදේශ රටවල රසායනාගාරවල සහයෝගය ලබා ගැනීම යන කටයුතු ක්‍රියාත්මක කරන්නට මේ සම්මුතිය මඟින් රාජ්‍ය මැදිහත්වීම ලබා ගන්නවා. එතකොට, මේ තහනම් උත්තේජක නිෂ්පාදනය වැළැක්වීමට, ප්‍රවාහනය වැළැක්වීමට සහ භාවිතය වැළැක්වීමට තීන්දු තීරණ ගන්නට රාජ්‍යයට හැකියාවක් ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද වාගේ කාල සීමාවක, විශේෂයෙන් අපේ රට මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් කේන්ද්‍රීය ස්ථානයක් බවට පත් වෙලා තිබෙනකොට, මුළු ලෝකයේම අවධානය අපේ රට කෙරෙහි යොමු වෙලා තිබෙනකොට, අපි මේ පනත සංශෝධනය කර ගන්න එක වැදගත් වෙනවා. මොකද, අපේ ක්‍රීඩකයින් ජාත්‍යන්තර තරගවලට සහභාගි වෙනකොට, විශේෂයෙන් වෙනත් රටවල ක්‍රීඩකයින් මේ රටේ අන්තර්ජාතික තරගවලට සහභාගි වෙනකොට අපේ රටේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳව දැන් ඇති වෙලා තිබෙන තත්ත්වය අපේ රටේ අභිමානය කෙරෙහි බලපානවා. ඒ නිසා මේ වෙනස්කම් කර ගැනීම ඉතාම වැදගත් වෙනවා. ඒ නිසා තමයි අපේ තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය මේ වෙලාවේ මේකට මැදිහත් වෙන්නේ.

ඒ වාගේම අපි විවිධ රටවල තොරතුරු හුවමාරු කරගන්නට අවශ්‍ය වෙනවා. විවිධ රටවල තරග පවත්වනකොට ක්‍රීඩකයින් විවිධ රටවලින් ඒ, ඒ රටවලට පැමිණෙනවා. ඒ වාගේම අපේ රටේ අන්තර්ජාතික ක්‍රීඩා උළෙලක් තිබෙනකොට විවිධ රටවලින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහභාගි වෙනවා. ඒ නිසා අපේ රටටත් මේ සම්මුතියට අදාළ පහසුකම් සපයා ගන්න අවශ්‍යතාව තිබෙනවා. ඒ පර්යේෂණවලට අවශ්‍ය කරන පරිසරය සකස් කර ගැනීමට මේ පනත සංශෝධනය වීම වැදගත් වෙනවා.

ඊළඟට, ප්‍රමිතියෙන් යුත් සාම්පල එකතු කර ගැනීමට, ප්‍රමිතියෙන් යුතු සාම්පල වෙනත් රටවල හෝ අපේ රටේ තිබෙන රසායනාගාරවල පරීක්ෂා කිරීමට මේ සම්මුතියට අදාළ කරුණු අපේ පනතට ඇතුළත් කර ගැනීම අවශ්‍ය වෙනවා. තහනම් උත්තේජකයක් පාවිච්චි කළ ක්‍රීඩකයින් යම් කිසි විධියකින් හඳුනා ගත්තොත්, ඔවුන් සම්බන්ධයෙන් නීතිය පැත්තෙන් තීන්දු තීරණ ගැනීමේදී විශාල පමාවීම් ඇති වෙනවා. ඒ වාගේම ගැටලු ඇති වෙනවා. ඒ පමාවීම් හරහා ඒ ක්‍රීඩකයින්ට ලොකු අවාසියක් සිද්ධ වෙනවා. අන්න ඒවා නිවැරදි කරගන්න, ඒ පමාව වළක්වාගන්න මේ අලුතෙන් ගෙනෙන සංශෝධන අපට අවශ්‍ය වෙනවා. ඒ වාගේම රසායනාගාර පහසුකම් ප්‍රමාණවත් නොවීම නිසා ඒවා වැඩිදියුණු කරගන්නත් මේ පනත් සංශෝධනය අපට වැදගත් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදේශ රටවල තිබෙන සම්මුතීන් හා සමාන සම්මුතියක් අපේ රටේ පනතට ඇතුළත් කර ගත්තාම අපට වෙනත් විදේශ රටවලින් සාම්පල test කිරීම වැනි කටයුතුවලට සහයෝගය ලබා ගන්න හැකි වෙනවා. අපේ රටේ සීමිත අවස්ථාවලදී තමයි මේ උත්තේජක පිළිබඳව පරීක්ෂණ කෙරෙන්නේ. විශේෂයෙන්ම තරග බිමේදී - තරගවලට සහභාගි වීමේදී - ඒ කාර්යය කෙරෙනවා. නමුත්, තරගවලින් බාහිරව, ඒ කියන්නේ තරග නොපැවැත්වෙන කාල සීමාවල මේ පිළිබඳව පරීක්ෂණ පැවැත්වෙන්නේ සීමා සහිතවයි. ඒ නිසා එම සම්මුතිය, ඒ පනත වෙනස් කිරීම තුළින්, එය දියුණු කර ගැනීම තුළින්

[ගරු නිහාල් අබේසිංහ මහතා]

ජාත්‍යන්තරයේ සහයෝගය ලබා ගන්න අපට අවස්ථාව ලැබෙනවා. මේ පනත් සංශෝධනය මඟින් පුහුණුකරුවන්ට, සෞඛ්‍ය කාර්ය මණ්ඩලවලට, වෛද්‍යවරුන්ට, පාසල්වල ගුරුවරුන්ට අවශ්‍ය කරන දැනුම ලබා දීමේ ඉඩකඩත් පුළුල් වෙනවා.

මේ උත්තේජක පිළිබඳව දැනුම ලබා ගැනීම අපි හැම කෙනෙකුටම වැදගත්. Doping, එහෙම නැත්නම් තහනම් උත්තේජක කියන්නේ, ක්‍රීඩකයින්ගේ ක්‍රියාකාරකම් කෘත්‍රිමව වෙනස් කරන ද්‍රව්‍යයක්. මේවා ශරීරයේ ජීව විද්‍යාත්මක වෙනස්කම් ඇති කරනවා. විවිධ ඉන්ද්‍රිය පද්ධතිවලට බලපානවා. මේ වෙනකොට තහනම් උත්තේජක වර්ග කිහිපයක් භාවිත වෙනවා; සංසරණය වෙනවා. සමහර උත්තේජක ස්වාභාවික හෝර්මෝන මෙන් කෘත්‍රිමව ක්‍රියාත්මක වෙනවා. රතු රුධිර සෛලවල සංයුතිය වෙනස් කරනවා. මධ්‍ය ස්නායු පද්ධතියට බලපෑම් ඇති කරනවා. සෛලවල ක්‍රියාකාරිත්වය වෙනස් කරනවා. ආශ්වාස ප්‍රශ්වාස ක්‍රියාවලියට බලපෑම් ඇති කරනවා. වේදනා දැනීම වෙනස් කරනවා. මේ නිසා තුවාලයක් - injury එකක් - වුණොත් ඒ තුවාලය බරපතළ තත්ත්වයට පත් වෙනතුරු ක්‍රීඩකයාට ඒක දැනෙන්නේ නැති වෙන්න පුළුවන්. මේ උත්තේජකවලට ක්‍රීඩකයින් ඇබ්බැහි වෙන්න පුළුවන්. මේ පනත් සංශෝධනය අපට වැදගත් වෙනවා, තහනම් උත්තේජක භාවිතය සම්බන්ධයෙන් ජාත්‍යන්තර මට්ටමේ තත්ත්වයන් ශ්‍රී ලංකාව තුළ පවත්වා ගෙන යන්න. මේ උත්තේජක පාවිච්චි කිරීම නිසා ක්‍රීඩකයින්ට දීර්ඝ කාලීනව බලපෑම් ඇති කරනවා. ඒ හේතුවෙන් අක්මාවට, හෘදය වස්තුවට හානි සිද්ධ වෙන්න ඉඩ තිබෙනවා. ඒ වාගේම හෝර්මෝන අසමතුලිතතා ඇති වීම, ප්‍රජනනයේදී සරු බව හීනවීම, ඉක්මනින් කිපෙනසුලු ගතිය තුළින් aggressive behaviour එකක් ඇති වීම ආදියත් දකින්න පුළුවන්. ඒ නිසා ක්‍රීඩකයින් වෙනුවෙන් මේ කටයුතු නිසියාකාරව පාලනය කිරීමට අවශ්‍ය කරන ජාත්‍යන්තර සහයෝගය ලබා ගැනීමට සහ ජාත්‍යන්තර සම්මුතීන්ට එකඟවීමට මේ පනත් සංශෝධනය අපට වැදගත් වෙනවා. ඇත්තටම, මේ වෙනස් කිරීම් රටකට වැදගත් වෙනවා. මොකද, ජාත්‍යන්තරව සහ ජාතික වශයෙන් අපි නිසියාකාරව, ක්‍රමානුකූලව ඒ සම්මුතීන්ට එකඟ වුණේ නැත්නම්, ඒක රටේ අභිමානයට බලපානවා. විශේෂයෙන්ම අපේ රටේ හෝ වෙනත් රටක තරගයක් පැවැත්වෙද්දී අපේ ක්‍රීඩකයින් තහනම් උත්තේජකවලට ගොදුරු වෙලා කියලා දැනගන්න ලැබුණොත්, ඔවුන්ට ඒ තරගවලින් ඉවත් වෙන්න සිද්ධ වෙනවා. සමහර විට තරගයෙන් ඒ ක්‍රීඩකයින් ජයග්‍රහණයත් කළත්, ඔවුන්ට ඒ ජයග්‍රහණය නොලැබෙන්න ඉඩ තිබෙනවා.

විශේෂයෙන්ම අපේ රටේ අභිමානය පැත්තෙන් ගත්තොත්, මේ සම්මුතීන්ට එකඟ වෙලා ජාත්‍යන්තරයේ සහයෝගය ලබා ගැනීම ඉතා වැදගත්. ඒ වාගේම අපි මේ සම්මුතීන්වලට එකඟ නොවුණොත් WADA ආයතනයට පුළුවන්, අපට සම්බාධක පනවන්න. එතකොට අපේ ක්‍රීඩකයින්ට අපේ ජාතික කොඩිය යටතේ තරග කරන්න බැරි වෙනවා. තරග තහනමකට ලක් වෙන්න පුළුවන්, අපි හරියාකාරව මේ සම්මුතියට එකඟත්වය ඇති කර ගත්තේ නැත්නම්. ඒ නිසා තමයි මේ පනත් සංශෝධනය අපට වැදගත් වෙන්නේ. විශේෂයෙන්ම ඔලිම්පික් සහ ලෝක කුසලාන වගේ තරගවලදී අපේ ක්‍රීඩකයින්ට ඒ තත්ත්වයට මුහුණ දෙන්න සිදු වුණොත් එමඟින් අපේ රටේ අභිමානයට කැළැලක් ඇති වෙනවා. ඒ වාගේම අන්තර්ජාතික ක්‍රීඩා උත්සව අපේ රටේ පවත්වනකොට, විශේෂයෙන්ම ජාත්‍යන්තරය මැදිහත් වෙන තරග පැවැත්වෙනකොට ඒ සඳහා අවශ්‍ය කරන පහසුකම් අපි සපයා ගත්තේ නැත්නම්; අදාළ නීති රීති සකස් කර ගත්තේ නැත්නම් ඒක ඒ තරග පැවැත්වීමටත් බලපානවා. මේ සම්බාධක නිසා අපේ රටේ ජාත්‍යන්තර තරග පැවැත්වීම තහනම් වෙන්නත් ඉඩ තිබෙනවා. ඒ වාගේම ක්‍රීඩකයින් තරග කරලා ජයග්‍රහණය කළත්, ඒ ක්‍රීඩකයින්ට දීර්ඝ කාලයක් තිස්සේ ඒ බලපෑම ඇති වෙනවා. එතකොට ඒගොල්ලන්ගේ මනෝභාවයටත් බලපෑම් ඇති වෙනවා. ඒ වාගේම අපට ලැබෙන්න තිබෙන මුදල් ප්‍රතිපාදනත් නොලැබී යනවා. ඒ වාගේම රටටත්, ක්‍රීඩකයින්ටත් තමන්ගේ අවස්ථාව අහිමි වෙනවා. ඒ නිසා මම හිතනවා, ඒ සම්මුතිය අනුව අපේ පනත සකස් කර ගැනීම අපේ ක්‍රීඩකයින්ට වාගේම අනාගතයේ ක්‍රීඩාවල නියැළෙන්නට බලාපොරොත්තු වන අපේ ශිෂ්‍යයන්ට, ගුරුවරුන්ට හා පුහුණුකරුවන්ට විශාල වශයෙන් වැදගත් වෙයි කියලා. මේ සම්මුතියට එකඟවීමෙන්, එහෙම නැත්නම් මේ පනත පාර්ලිමේන්තුවේ සම්මත කර ගැනීමෙන් අපේ රටේ අනාගත ක්‍රීඩකයින්ටත් සහයෝගයක් ලැබෙනවා වාගේම, ක්‍රීඩාව හරහා අපේ රටේ අන්තර්ජාතික ප්‍රතිරූපය නංවාලන්නටත් හැකි වෙනවා. ඒ නිසා මේ පනත ඉතා වැදගත් පනතක් බව සඳහන් කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. (Dr.) Pathmanathan Sathiyalingam. You have 16 minutes.

[பி.ப. 12.16]

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, 2013ஆம் ஆண்டின் 33ஆம் இலக்க, விளையாட்டில் ஊக்குப் பதார்த்தப் பயன்பாட்டிற்கெதிரான சமவாயச் சட்டத்தைத் திருத்துவது தொடர்பான இன்றைய விவாதத்திலே பேசுவதற்கு எனக்கும் சந்தர்ப்பம் தந்ததற்கு முதலில் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கிறேன். விளையாட்டிலே ஊக்குப் பதார்த்தங்களைப் பாவிப்பது என்பது நீண்ட காலமாக இடம்பெறுகின்ற ஒரு செயற்பாடு. இப்போது விளையாட்டு என்பது ஒரு நாட்டினுடைய பொருளாதாரத்தை மேம்படுத்துவதற்காக அல்லது விளையாட்டு வீரர்கள் தங்களுடைய பொருளாதாரத்தை மேம்படுத்துவதற்காகப் பணம் சம்பாதிக்கின்ற ஒரு செயற்பாடாக மாறியுள்ள சூழலிலே, தாங்கள் வெற்றியைப் பெறுவதற்காக இந்த ஊக்குப் பதார்த்தங்களை விளையாட்டு வீரர்கள் பயன்படுத்துவது அதிகரித்து வருவதைக் காணக்கூடியதாக இருக்கிறது. அவ்வாறான ஒரு சந்தர்ப்பத்திலே, இது தொடர்பில் எங்களுடைய நாட்டிலே உருவாக்கப்பட்டிருக்கின்ற சட்டத்தை நாங்களும் உலகப் போக்கிற்கு ஏற்ற வகையிலே திருத்தி, உலகத்துடன் ஒத்தோட வேண்டிய ஒரு நிலைமை இருக்கின்றது.

விளையாட்டைப் பொறுத்தவரையிலே, விளையாட்டு வீரர்களுக்குச் சம அந்தஸ்து கொடுக்கப்பட வேண்டியது மிகவும் முக்கியமானது. சில விளையாட்டு வீரர்கள் தங்களுடைய capability - திறனைக் கூட்டலாம் என்ற ஓர் எண்ணத்தோடு இந்த ஊக்குப் பதார்த்தங்களைப் பயன்படுத்துகிறார்கள். கௌரவ விளையாட்டுத்துறைப் பிரதி அமைச்சர் அவர்கள் குறிப்பிட்டதுபோல, சில வேளைகளிலே இந்த விளையாட்டு வீரர்களுக்குத் தெரியாமலேயே அவர்களுக்கு இந்த ஊக்குப் பதார்த்தங்கள் வெற்றியை எதிர்நோக்குகின்ற, வெற்றியை விரும்புகின்ற அந்தக் குழாமிலே இருக்கின்ற வேறு நபர்களினால் வழங்கப்பட்ட பல

சந்தர்ப்பங்களை நாங்கள் அறிந்திருக்கின்றோம். அந்த வகையிலே, ஊக்குப் பதார்த்தத்தைப் பயன்படுத்திய விளையாட்டு வீரரை மாத்திரமல்லாமல், அவரது பயிற்சியாளராலோ அல்லது அந்த விளையாட்டுக் குழாமிலே இருக்கின்ற இன்னுமொரு நபராலோ இந்தச் செயல் நடைபெற்றிருந்தால், அவர்களையும் தண்டிக்கக்கூடிய ஒரு நிலைமை இந்தச் சட்டத் திருத்தத்தினூடாகக் கொண்டுவரப்பட வேண்டும்.

இந்த ஊக்குப் பதார்த்தங்களைப் பயன்படுத்தும் சில விளையாட்டு வீரர்கள் அதன் பின்விளைவுகளை அறியாதவர்களாக இருக்கின்றார்கள். இதனால் விளையாட்டுப் போட்டிகளில் விளையாடுவதில் இருந்து சட்டரீதியாக விலக வேண்டிய சூழல் ஏற்படுவது மாத்திரமல்ல, உடல் ரீதியாக, சுகாதார ரீதியாக அவர்களுடைய எதிர்காலம் பாதிக்கப்படுவதையும் அறியாமல் அவர்கள் இதனைப் பயன்படுத்துகின்றார்கள். ஆகவே, இந்தச் சட்டமூலத்தில் திருத்தங்களைக் கொண்டுவருவதன் ஊடாக, எங்களுடைய நாட்டின் விளையாட்டுத் துறைக்கு அபகீர்த்தி ஏற்படுவதைத் தடுப்பதற்கும் எங்களுடைய வீரர்கள் சர்வதேச மட்டத்தில் வெற்றிகளைப் பெறுவதற்கும் உதவியாக இருக்கும் என்பதில் எந்த ஐயப்பாடும் இல்லை.

இப்போது விளையாட்டில் ஊக்குப் பதார்த்தப் பயன்பாட்டிற்கெதிரான சமவாயச் சட்டமூலத் திருத்தம் பற்றி நாங்கள் பேசினாலும் இந்த ஊக்குப் பதார்த்தம் அல்லது போதையூட்டல் என்பது விளையாட்டுத் துறையை மாத்திரம் பாதிக்கின்ற ஒரு செயற்பாடாக எங்களுடைய நாட்டில் இப்போது இல்லை. இன்று எமது நாட்டிலுள்ள போக்குவரத்துத் துறைச் சாதனங்களில், குறிப்பாகப் பேருந்துகளில் பயணிப்பதற்கு மக்கள் அஞ்சுகின்ற நிலை ஏற்பட்டுள்ளது. விபத்துகள் ஏற்படும்போது, வாகனத்தைச் செலுத்தியவர் மதுபானத்தை மாத்திரமன்றிப் பல்வேறு வகையான ஊக்குப் பதார்த்தங்களை - போதைப்பொருட்களை - பாவித்திருப்பதுதான் அதற்குக் காரணமாக இருந்திருப்பதை விசாரணைகள்மூலம் கண்டறியக்கூடியதாக இருந்த செய்திகளை நாங்கள் அறியக் கூடியதாக இருக்கிறது. ஆகவே, எங்களுடைய நாட்டில் விளையாட்டுத் துறையில் மாத்திரமன்றிப் பல்வேறு துறைகளில், எங்களுடைய நாட்டின் பொருளாதாரத்தில், எங்களுடைய நாட்டினுடைய இளைஞர்களின் எதிர்கால வாழ்க்கையில், இந்த ஊக்குப் பதார்த்தம் அல்லது போதைப்பொருள் பயன்பாடு என்பது மிகவும் பாரதூரமான ஒரு நிலைமையை ஏற்படுத்தி இருப்பதை நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது.

அடுத்து, விளையாட்டில் ஊக்கு பதார்த்தப் பயன்பாட்டிற்கெதிரான சமவாயத்திற்கான சட்டங்களை ஆக்குகின்றபோது அல்லது அதற்குத் திருத்தங்களைச் செய்கின்றபோது, குறித்த நோக்கத்தை அடைவதற்குரிய வசதிகள் எங்களுடைய நாட்டிலே இருக்கின்றதா என்பதை நிச்சயமாக இந்தப் பாராளுமன்றம் கவனத்தில் எடுக்க வேண்டும். நான் ஏன் இதைச் சொல்கிறேன் என்றால், பாடசாலை மாணவர்களாக இருக்கட்டும், பல்கலைக்கழக மாணவர்களாக இருக்கட்டும், அவர்கள் விளையாட்டில் ஈடுபடுவதற்கு முன்னர் அவர்களது உடற்றகுதி தொடர்பான மருத்துவப் பரிசோதனையொன்று செய்யப்பட வேண்டுமென்ற சட்டம் இப்போது இருக்கின்றது. ஆனால், இந்த நாட்டிலே ஆயிரக்கணக்கான பாடசாலைகள் இருக்கின்றன. குறிப்பாக, எங்களுடைய மாவட்டத்தில் நூற்றுக்கணக்கான பாடசாலைகள் இருக்கின்றன. இந்தப் பாடசாலைகளில் வருடாந்த விளையாட்டுப் போட்டிகள் குறிப்பிட்ட காலத்தில் குறிப்பிட்ட திகதிக்குள் நடாத்தி முடிக்கப்பட வேண்டுமென்ற கட்டாயம் இருக்கின்றது. அவ்வாறிருக்கும்போது, விளையாட்டு விஞ்ஞானம் பயின்ற விசேட வைத்தியர்கள் சிலரோ அல்லது ஒருவரோகூட இல்லாத பல மாவட்டங்கள் இருக்கின்றன.

இவ்வாறான சூழலில், அந்தப் பாடசாலை அதிபர், ஆசிரியர்கள், மாணவர்கள் விளையாட்டிலே பங்குகொள்கின்ற மாணவர்களுடைய உடற்றகுதிப் பரிசோதனையைச் செய்வதற்குப் பல இடங்களுக்கு அலைந்து திரிவதையும் அவர்கள் வைத்தியசாலைகளுக்கு வந்து வைத்திய நிருவாகத்துக்கு அழுத்தங்களைக் கொடுப்பதையும் நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது. அதாவது, விளையாட்டுக்கு முன்னர் சாதாரண உடற்றகுதி - body fitness - பரிசோதனையைச் செய்து ஒரு மாணவன் அல்லது மாணவி விளையாட்டிலே பங்குபெறலாம் என்ற மருத்துவ அறிக்கையைப் பெறுவதற்குக்கூட எங்களுடைய நாட்டிலே போதுமான வசதிகள் இல்லை என்பதை நான் இந்தச் சபையிலே சுட்டிக்காட்ட விரும்புகிறேன். ஆகவே, சம்பந்தப்பட்ட சுகாதார மற்றும் விளையாட்டுத்துறை அமைச்சுக்கள் இதிலே கூடிய கவனம் செலுத்த வேண்டுமென்று இச்சந்தர்ப்பத்திலே கேட்டுக் கொள்கின்றேன். அவ்வாறானதொரு சூழ்நிலையில், எங்களுடைய விளையாட்டு வீரர்கள் ஊக்குப் பதார்த்தங்களைப் பயன்படுத்தி விளையாட்டிலே ஈடுபடுகின்றார்கள் என்பதைக் கண்டுபிடிப்பதென்பது மிகவும் சவாலான விடயமாகும். கௌரவ பிரதி அமைச்சர் அவர்கள் இங்கு குறிப்பிட்டதுபோல, எங்களுடைய நாட்டிலே அதற்கான வசதிகள் இல்லை. ஆகவே, சர்வதேசத்தின் உதவிகளைப் பெற்று எங்களுடைய நாட்டிலே இவற்றுக்கான வசதிகளை மேம்படுத்துகின்ற செயற்பாட்டுக்கு இந்தச் சட்ட திருத்தம் உதவியாக இருக்கும் என்பதை நான் இந்தச் சந்தர்ப்பத்திலே தெரிவித்துக்கொள்ள விரும்புகிறேன்.

இப்போது எங்களுடைய நாட்டிலே போதைப்பொருட் பாவனை அல்லது போதைப்பொருட்களின் கண்டுபிடிப்பு என்பது மிகவும் மோசமான, பாரதூரமான செய்தியாக உள்நாட்டிலும் வெளிநாட்டிலும் பேசுபொருளாக இருக்கின்றது. இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்த ஒரு வருட காலத்திலே பெருந்தொகையான போதைப்பொருட்கள் வெவ்வேறு இடங்களில் கண்டுபிடிக்கப்பட்டிருக்கின்றன. இந்தப் போதைப்பொருள் வியாபாரத்தின் பின்னணியில் மிகவும் பலம்வாய்ந்த தனவந்தர்கள், அரசியல்வாதிகள் இருக்கிறார்கள். ஆகவே, எங்களுடைய நாட்டில் போதைப்பொருள் வியாபாரத்தை நிறுத்துவது அல்லது போதைப்பொருள் பாவனையை இல்லாமற் செய்வது அல்லது குறைப்பது என்பது அரசாங்கத்துக்கு மிகவும் கடினமான காரியமாக இருப்பதை நாங்கள் காணக்கூடியதாக இருக்கின்றது.

இந்தியாவிலிருந்து வெளிவருகின்ற 'ஆனந்த விகடன்' என்ற சஞ்சிகையில் அண்மையில் ஒரு கேலிச் சித்திரத்தைப் பார்க்கக்கூடியதாக இருந்தது. "இலங்கை போதைப்பொருளால் நிறைந்த இந்து மஹா சமுத்திரத்தின் முத்து" என்ற ஒரு 'கார்ட்டூன்'உம் "இலங்கை மண்டை ஓடுகளால் நிறைந்த இந்து மஹா சமுத்திரத்தின் முத்து" என்று ஒரு 'கார்ட்டூன்'உம் அதில் வரையப்பட்டிருந்தன. வடக்கிலே புதைகுழிகள் தோண்டப்படுகின்றன; அந்தப் புதைகுழிகளிலிருந்து மண்டை ஓடுகளும் மனித எச்சங்களும் வெளிவருகின்றன. தெற்கிலேயும் புதைகுழிகள் தோண்டப்படுகின்றன; அவற்றிலிருந்து பெருந்தொகையான போதைப்பொருட்கள் வெளிவருகின்றன.

[ගරු පත්මනාදන් සත්‍යලිංගම් මහතා]

அந்தப் புதைகுழிகளிலிருந்து போதைப்பொருள் மாத்திரமல்ல, இலங்கையிலே எங்கும் கிடைக்காத பெருந்தொகையான நவீன ஆயுதங்களும் கண்டெடுக்கப்படுகின்றன. அவற்றைப் பார்க்கும்போது, யுத்தமானது கடந்த 30 வருடங்களாக வடக்கு, கிழக்கிலே நடந்ததா அல்லது தெற்கிலே நடந்ததா? என்ற சந்தேகம் எழுகின்றது. அவ்வளவு பெருந்தொகையான நவீன ஆயுதங்கள் தெற்கிலே இருக்கிற புதைகுழிகளிலே போதைப்பொருளுடன் சேர்ந்து கண்டெடுக்கப்படுவதை அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. இந்த அரசாங்கத்திற்கு இது ஒரு பாரிய சவால்!

யுத்தம் முடிந்து ஒருசில ஆண்டுகளுக்குப் பிறகு எங்களுடைய பிரதேசங்களில் பாடசாலை மட்டத்திலே இந்தப் போதைப் பொருளை அறிமுகப்படுத்துகின்ற செயற்பாடு மிகவும் பரவலாக, வெளிப்படையாக நடைபெற்றது. அந்த நேரத்திலே எங்களுடைய பிரதேசங்களிலே இது ஒரு பிரதான பேசுபொருளாக இருந்தது. ஏன் இவ்வாறு பாடசாலைகளிலே போதைப்பொருளை introduce பண்ணினார்கள் - அறிமுகப்படுத்தினார்கள் என்பதற்கு வெவ்வேறு வியாக்கியானங்கள் சொல்லப்பட்டது. ஏற்கெனவே போதைப்பொருளைப் பாவிக்கின்ற ஒருவரை அதற்குப் பழக்கவேண்டிய தேவை இல்லை; அவராகவே அதைப் பெற்றுக்கொள்வார். ஆனால், போதைப்பொருள் வியாபாரிகளுக்குப் புதியவர்களைத் தங்களுடைய வட்டத்திற்குள் கொண்டுவரவேண்டிய தேவை இருந்தது. அதற்காக அவர்கள் பாடசாலை மட்டத்திலேயே இளம் தலைமுறையினரை இந்தப் போதைப்பொருளுக்கு அடிமையாக்குகின்ற வேலைத்திட்டத்திலே ஈடுபட்டார்கள். 2009 - 2010ஆம் ஆண்டில் இருந்த அரசாங்கத்தின் ஆட்சிக் காலத்திலே இன்னும் ஒரு காரணம் சொல்லப்பட்டது. அதாவது, எங்களுடைய பிரதேசத்திலே இருக்கின்ற இந்த நாட்டினுடைய எமது எதிர்கால இளம் சமுதாயத்தினரைப் போதைக்கு அடிமையாக்குவதனூடாக ஓர் இனத்தை அழித்து விடலாம் என்ற எண்ணத்துடன் இது நடைபெற்றதாகவும் வியாக்கியானம் சொல்லப்பட்டது.

நான் ஏன் இந்தச் சந்தர்ப்பத்திலே இதைக் கூறுகின்றேன் என்றால், இரண்டு நாட்களுக்கு முன் வெளிவந்த ஒரு பத்திரிகையிலே, "தெற்கிலே இப்போது பாடசாலைகளுக்குள் போதைப்பொருளை அறிமுகப்படுத்துகிறார்கள்" என்ற செய்தியைப் பார்க்கக்கூடியதாக இருந்தது. "தன்வினை தன்னைச் சுடும்", "முற்பகல் செய்யின் பிற்பகல் விளையும்" என்றெல்லாம் சொல்வார்கள். அதாவது, எல்லாம் boomerang போன்றதுதான். 2009ஆம் ஆண்டு அங்கு செய்ததனுடைய விளைவை இப்போது இங்கு காணக்கூடியதாக உள்ளது. ஆனபடியால், "வளமான நாடு, அழகான வாழ்க்கை" என்ற மகுட வாசகத்தை நீங்கள் கனவு கண்டுகொண்டு இருக்க முடியாது. அதை நடைமுறைக்குக் கொண்டுவருவதாக இருந்தால் எங்களுடைய நாட்டில் இருக்கின்ற மிகவும் மோசமான இந்தப் போதைப்பொருள் வியாபாரத்திற்கு முற்றுப்புள்ளி வைக்க வேண்டும். அதற்குரிய பொறுப்பு அரசாங்கத்திற்கு மாத்திரமானதல்ல, இந்த நாட்டிலுள்ள மக்கள் என்ற வகையில் எங்கள் எல்லோருக்கும் அதில் முக்கிய பங்கு இருக்கின்றது. நாங்கள் அதற்கான பங்களிப்பை வழங்குவதற்காக அச்சமின்றி உங்களோடு சேர்ந்து இயங்குவதற்குத் தயாராக இருக்கின்றோம்.

நான் எங்களுடைய பகுதிகளில் விளையாட்டோடு தொடர்புடையதாக உள்ள சில விடயங்களைச் சொல்லி என்னுடைய பேச்சை முடிக்கலாமென்று நினைக்கின்றேன். குறிப்பாக வடக்கு, கிழக்கிலே எங்களுடைய பிரதேசங்களிலே, எங்களுடைய மாவட்டங்களில் சர்வதேச தரத்தில் இல்லாவிட்டாலும், எங்களுடைய தேசத்தின் ஏனைய பிரதேசங்களின் தரத்திலான விளையாட்டு மைதானங்கள்கூட இல்லை. எங்களுடைய நாட்டின் விளையாட்டு வீரர்களைப் பார்க்கும்போது, அவர்களில் எங்களுடைய மாவட்டங்களிலிருந்து பங்குபற்றுகின்ற விளையாட்டு வீரர்களின் எண்ணிக்கை விரல்விட்டு எண்ணக்கூடியதாக அல்லது அறவே இல்லாத நிலைமை காணப்படுகின்றது. அது 'கிரிக்கெட்' விளையாட்டாக இருக்கட்டும் அல்லது வேறு ஏதாவது விளையாட்டாக இருக்கட்டும், எந்தவொரு சர்வதேச விளையாட்டுப் போட்டியைப் பொறுத்தமட்டிலும் எங்களுடைய பிரதேசங்களிலிருந்து பிரதிநிதித்துவம் செய்கின்றவர்களின் அளவு மிகவும் குறைவாகவே இருக்கின்றது. இதற்கு மிகவும் முக்கியமான காரணம், எங்களுடைய பிரதேசங்களிலே யுத்தம் முடிந்து 16 ஆண்டுகள் கடந்துவிட்டிருந்தாலும்கூட விளையாட்டுத் தொடர்பான பௌதிக வளமும் மனித வளமும் மிகவும் அரிதாகக் காணப்படுவதாகும். கௌரவ விளையாட்டுத்துறைப் பிரதி அமைச்சர் அவர்கள் இங்கே இருக்கின்றார். கௌரவ பிரதி அமைச்சர் அவர்களே, நீங்கள் எங்களுடைய பிரதேசங்களையும் முன்னிலைப்படுத்த வேண்டும்; அங்கு விளையாட்டுத் தொடர்பான பௌதிக மற்றும் மனித வள அபிவிருத்திகளை நீங்கள் செய்ய வேண்டுமென்று இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன்.

இன்னுமொன்றைப் பத்திரிகைச் செய்தியில் பார்க்கக்கூடியதாக இருந்தது. அது, இப்போது தென்பகுதியிலே போதைப்பொருள் மற்றும் மதுவுக்கு அடிமையானவர்களுக்குப் புனர்வாழ்வளிக்கின்ற பல நிலையங்கள் - alcohol and drug rehabilitation centres - நிறுவப்படுவது பற்றியது. ஆனால், கடந்த மாகாண சபை ஆட்சிக் காலத்திலே எங்களுடைய மாகாணத்திலே இருக்கின்ற ஐந்து மாவட்டங்களிலும் கட்டப்பட்ட ஐந்து alcohol and drug rehabilitation centresஉம் இயங்காமல் அநாதரவாக இருக்கின்றன.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. (Dr.) Pathmanathan Sathiyalingam, would you please wind up?

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

Please give me only one more minute, Sir.

அதற்கு முக்கியமான காரணம், இந்தப் புனர்வாழ்வு நிலையங்களிலே பணிபுரிவதற்கான பயிற்றுவிக்கப்பட்ட ஆளணியினர் அங்கு நியமிக்கப்படாமையாகும். இந்த ஆளணியைப் பெறுவதற்காக வடக்கு மாகாண சுகாதார அமைச்சு பல தடவை முயற்சி செய்திருந்தாலும்கூட, MSDஆல் அதற்குரிய approval வழங்கப்படவில்லை. இப்போது இங்கே சுகாதார அமைச்சர் இல்லாவிட்டாலும்கூட, எங்களுடைய மாகாணத்திலே இருக்கின்ற போதைப்பொருள் மற்றும் மதுவுக்கு அடிமையானவர்களுக்குப் புனர்வாழ்வளிக்கின்ற 5 புனர்வாழ்வு நிலையங்களும் இயங்குவதற்கான ஆளணியை வழங்கி, எங்களுடைய பிரதேசத்தில், குறிப்பாக வடக்கு மாகாணத்திலே போதைப்பொருளாலும் மதுவாலும்

பாதிக்கப்பட்டவர்கள் மருத்துவப் புனர்வாழ்வு பெறுவதற்கான வசதியை ஏற்படுத்திக் கொடுக்க வேண்டும் என்று கேட்டு, இந்தச் சந்தர்ப்பத்திற்கு நன்றி கூறி, விடைபெறுகின்றேன். வணக்கம்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! The Sitting is suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Dinindu Saman Hennayake. You have 10 minutes.

[අ.භා. 1.00]

**ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා**
(மாண்புமிகு தினிந்து சமன் ஹென்நாயக்க)
(The Hon. Dinindu Saman Hennayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2025.09.04 දිනැති ගැසට් පත්‍රයේ පළ කරන ලද ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් තමයි, අපි අද දවසේ සාකච්ඡා කරන්නේ. අපේ ක්‍රීඩකයෝ ක්‍රීඩාවල නිරත වෙලා සිටියදී ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය විසින් මේ රෙගුලාසි දිගටම ක්‍රියාත්මක කරනවා. ඒකට අදාළව ලෝක උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය විසින් සෑම රටකම උත්තේජක මර්දනයට අදාළ නීති රීති වරින්වර විමසා බැලීම් කරනවා සහ ඒවාට අදාළ කරන සංශෝධන ඉදිරිපත් කරනවා. ඒ ආකාරයට ලෝක උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය විසින් ඉදිරිපත් කරපු සහ ලංකාවේ තිබෙන නීති රීතිවලට අදාළව සංශෝධනය විය යුතු යම් යම් කාරණා සම්බන්ධයෙන් තමයි අද දවසේ අපි සාකච්ඡා කරන්නේ. 2024 වර්ෂයේදී ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද සංශෝධන අපේ රටේ නීතියට ගැළපෙන ආකාරයට සකස් කරලා, ඊට අදාළ සංශෝධන ඉදිරිපත් කිරීම අද දවසේ සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මත්ද්‍රව්‍ය, තහනම් උත්තේජක යනාදී සියල්ල ගැන කථා කරද්දී අපි දන්නවා, ඒවා අපේ සාමාන්‍ය සමාජයට වාගේම ක්‍රීඩාවට ව්‍යසනයක් වෙලා තිබෙන බව. අපේ රටේ වාගේම ලෝකයේ අනෙක් රටවලත් තහනම් උත්තේජක භාවිත කරලා, මත්ද්‍රව්‍ය භාවිත කරලා, ඒවායේ ප්‍රතිඵල විධියට දීප්තිමත් ක්‍රීඩකයින්ගේ ක්‍රීඩා ජීවිත අවසන් වෙච්ච අවස්ථා අපි දැකලා තිබෙනවා. ඒ වාගේම මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ අඳුරු පැතිකඩ විධියට රටේ ක්‍රීඩාව පිටුපසට තල්ලු වෙලා, රටට කළු පැල්ලම් එකතු කරපු අතීතයක් අපි දැකලා තිබෙනවා. ඒ නිසා මේ තහනම් උත්තේජක භාවිත කිරීම සම්බන්ධයෙන් අපි රටක් විධියට සැලකිලිමත් වෙන්න ඕනෑ. ඒකට අදාළ කරන නව නීති රීති සම්පාදනය කරන්න ඕනෑ, වැඩ කරන්න ඕනෑ. ඒ වාගේම ජාත්‍යන්තරය තුළ ක්‍රීඩාවට තිබෙන සැලකිල්ල තව වර්ධනය කරනවා නම්, රජයක් විධියට ඒකට අදාළ මැදිහත්වීම අපි කරන්න ඕනෑ. අද දවසේ මේ සිද්ධ වෙන්නේ, ඒකට අදාළ කරන මූලික මැදිහත්වීම් ප්‍රමාණයක් කරන සංශෝධනයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සංශෝධන කරද්දී අපට පෙනෙන දෙයක් තිබෙනවා. ඒ තමයි ක්‍රීඩාව, මත්ද්‍රව්‍ය, පාතාලය යනාදී සියල්ල ඒකාබද්ධ වෙලා ගිය ගමනක් තිබෙනවා. අපේ රටේ ක්‍රීඩාව කොතැනටද ගියේ කියලා රටේ ඉතිහාසය දන්නා සියලු දෙනා දන්නවා. මේ රටේ ක්‍රීඩාව කියන එකට වාණිජමය වටිනාකමක් ලැබුණාට පස්සේ, ක්‍රීඩාව ආර්ථික උත්පාදන ව්‍යාපෘතියක් බවට පරිවර්තනය වුණාට පස්සේ, ඒක සල්ලි හොයන්න පුළුවන් දෙයක් බවට පරිවර්තනය වුණාට පස්සේ, දේශපාලනය සහ ක්‍රීඩාව එකට බැඳිලා ගිය විධියක් අපි දැක්කා. ක්‍රීඩාවට, ක්‍රීඩා සමාජවලට තමන්ගේ සභාපතිවරු දමා ගන්න පොර කන, ක්‍රීඩා සමාජ සල්ලිවලට ගන්න උත්සාහ කරන, ක්‍රීඩා සමාජ පවත්වා ගෙන ගිහිල්ලා ඒක ඇතුළේ තමන්ගේ දේශපාලන න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරන අවස්ථා ඕනෑ තරම් අපි මේ රටේ දැකලා තිබෙනවා. මේ ක්‍රීඩාවට දේශපාලන න්‍යාය පත්‍ර ගෙන එන්න කලින්, අපේ රටේ අපරාධ රැල්ල ක්‍රියාත්මක වීමට අදාළවත් දේශපාලනය ක්‍රියාත්මක වුණා. අපි දැක්කා, ජනාධිපතිවරු සහ අපරාධ ලෝකයේ godfathersලා අතර තිබුණු සම්බන්ධය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතිහාසයේ ඉඳලා තිබුණු ඒවා විමර්ශනය කරලා බැලුවාට පස්සේ අපට පෙනෙනවා, ජේ.ආර්. ජයවර්ධන, රනිල් වික්‍රමසිංහ යන අය ඒ කාලයේ එක්සත් ජාතික පක්ෂයට අදාළ කරන වටපිටාවේදී "ගෝනවල සුනිල්" කියලා අපරාධකරුවෙක් ඉස්සරහට දමාගෙන තමයි අපරාධ ක්‍රියාත්මක කළේ කියලා. ඒ සුනිල්ට අදාළ දේශපාලනය ගත්තාම, අවුරුදු 16ක දරුවෙක් දූෂණය කරලා හිරේ හිටපු කෙනෙක් නීතිය වෙනස් කරලා එළියට අරගෙන, මුළු දිවයිනටම බලපාන පරිදි සාමදාන විනිශ්චයකාර තනතුරක් දීලා, මේ අපරාධ ක්‍රියාත්මක කරන්න ඒ ආණ්ඩු උත්සාහ කළා. ඒ වාගේම තමයි, අපරාධ රැල්ල ක්‍රියාත්මක වුණේ.

ඒ වාගේම අපට මතකයි, ඊට පස්සේ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ කාල වකවානුව වෙද්දී පෝස්ටර් ගහන්න "සොත්ති උපාලි" වාගේ මැරයෝ යොදාගෙන ඊට පස්සේ ඔවුන්ගේ අතට ආයුධ දීලා කටයුතු කළ ආකාරය. එල්ටීටීඊ එකට විතරක් නොවෙයි ඒගොල්ලන් ආයුධ දුන්නේ. මැරයින්ටත් ආයුධ දුන්නා. එහෙම වැඩකටයුතු කළා අපි දැක්කා. ඒ වාගේම චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ කාලය වනකොට "බැද්දගානේ සංජීව" වාගේ අපරාධකාරයෝ ඉස්සරහට ඇවිල්ලා අපරාධ ක්‍රියාත්මක කළ ආකාරය අපි දැක්කා.

මේකේ කූට ප්‍රාප්තිය විධියට තිබෙන්නේ රාජපක්ෂ යුගය. දේශපාලනයට අපරාධ ගාවපු වැඩීම සම්බන්ධතාව තිබෙන්නේ එතැනයි. ඉස්සර කොළඹ කේන්ද්‍ර කරගෙන ගිය අපරාධ රැල්ල දකුණට අරගෙන ගියේ එතැනින්. අද ඔබට පෙනෙනවා, දකුණේ එක පිට එක මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෝ අහුවෙන විධිය. ඔබට පෙනෙනවා, අනෙක් තැන්වලට සාපේක්ෂව දකුණේ වෙනදාට වඩා අවි ආයුධ පරිහරණය කරන විධිය, අපරාධ ක්‍රියාත්මක කරන විධිය. මේ godfathersලා ඇති කළේ, දකුණට මේ දේවල් අරගෙන ගියේ රාජපක්ෂ දේශපාලනය ඇතුළේ. අපි දැක්කා, අයිස්ලන්තයේ කුමාරයාගේ පිටුපස ඉන්න "ජුලම්පිටියේ අමරේ" කියන නම ගිය අපරාධකාරයා. අපරාධකාරයෝ තියාගෙන තමයි ඔවුන් දකුණේ දේශපාලනය කළේ. "වම්බොට්ටා", "කජ්ජා" වාගේ අය ගැන කරළියට එනකොට, ඔවුන් ගැන යම් යම් කථාබහක් ඇති වනකොට අපි දැක්කා, ඒ දේශපාලන ව්‍යාපාරයට අදාළ අයට රිදෙන විධිය. "කජ්ජා" ගැන සාකච්ඡාවක් එනකොට වෙන වෙන කණ්ඩායම්වලට තමයි රිදෙන්නේ; වෙන වෙන කණ්ඩායම් තමයි අඬන්නේ. ඉස්සර දවසේ වෙඩිල්ල කියලා ඔවුන්ම නිර්මාණය කරපු කාරණය දැන් දවසේ ඇඬිල්ල බවට පරිවර්තනය වෙලා තිබෙනවා, ඒ දේශපාලන පක්ෂවලට අදාළව. මේ අපරාධ ඒ බරින්ම ක්‍රීඩාවටත් යොමු වෙලා තිබුණා.

[ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා]

ඔබතුමන්ලාට මතක ඇති, මෑත ඉතිහාසය අරගෙන බැලුවොත් පේනවා ක්‍රීඩාව සහ දේශපාලනය කියන එක ඉතා නින්දිත විධියට ක්‍රියාත්මක වුණු ආකාරය, රාජපක්ෂ සමය ඇතුළේ. එක පැත්තකින් අපි දැක්කා, තාත්තා අනුග්‍රහය දෙනවා; පුතා සංවිධානය කරනවා; පුතාගේ ටීවී චැනල් එකේ ඒ ක්‍රීඩාව පෙන්වනවා; අනෙක් පුතා ක්‍රීඩා කරනවා; අම්මා ඇවිල්ලා කුසලානය දෙනවා. අපේ රටේ ක්‍රීඩාව පැවතුණේ එහෙමයි. ඒගොල්ලන්ගේ හීන, ඒගොල්ලන්ගේ බලාපොරොත්තු තමයි අපේ රටේ ක්‍රීඩාව බවට පරිවර්තනය වුණේ. එයා කැමැති මොන ක්‍රීඩාවටද, ඒ කැමැත්තට අනුව තමයි අපේ රටේ ක්‍රීඩාවට මුල් තැනක් හම්බ වුණේ. පාලකයාගේ කැමැත්ත තමයි එතැන නිරූපණය වුණේ. අපේ රටේ අවශ්‍යතාව හෝ අපේ ක්‍රීඩකයන්ගේ අවශ්‍යතාව හෝ නොවෙයි, එක පිරිසකගේ අවශ්‍යතාවක් තමයි ක්‍රීඩාවට යොමු වෙලා තිබුණේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ක්‍රීඩාව දේශපාලනීකරණය කළා වාගේම ඔවුන් ඒ ක්‍රීඩාවේ ආධිපත්‍යය ගන්න දේශපාලන මැර බලය පාවිච්චි කළා. ළඟම එක තමයි, වසීම් තාජුඩීන්ගේ ඝාතනය පිළිබඳ සිද්ධිය. අපි දන්නවා, වසීම් තාජුඩීන් කියන රගර් ක්‍රීඩකයා අභියෝගයක් වුණේ කාටද කියන එක. වසීම් තාජුඩීන් කියපු ඒ ලපය ප්‍රශ්නයක් වුණේ කාටද? ඒ ප්‍රශ්න තිබුණු අය මේ ක්‍රීඩාවට දේශපාලනය කොච්චර ගෙනාවාද කියන එක අපි දන්නවා. ක්‍රීඩාව ඇතුළේ සහකම්පනය සහිත මිනිසෙක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාවයි තිබෙන්නේ. ක්‍රීඩාව ඇතුළේ පරිපූර්ණ මිනිසෙක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාවයි තිබෙන්නේ. සාමාන්‍යයෙන් ක්‍රීඩාව ඇතුළේ මිනිසාට උගන්වනවා, සහකම්පනය සහිතව ජීවත් වෙන්න. හැබැයි, අවාසනාවකට ඒ යුගයේ ක්‍රීඩාව පාවිච්චි කළේ සහකම්පනය සහිත මිනිසෙක් නිර්මාණය කරන්න නොවෙයි. තමන්ගේ ප්‍රතිවාදියාගේ දත් ගලවලා, ගිනි තියලා, මරලා දමන තැනට ක්‍රීඩාව අරගෙන ගියා. ඒ තරමට නින්දිත දේශපාලනයකට ක්‍රීඩාව ලක් වෙලා තිබුණු ඉතිහාසයක් අපි දැක්කා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් ඒක වෙනස් කරන්න කාලය ඇවිල්ලා තිබෙන්නේ.

අපේ රජය, මේ රටේ නීතියේ විධානයේ ආධිපත්‍යය ආරක්ෂා කරන රජයක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. මෙච්චර කාලයක් ලංකාව ඇතුළේ නීතිය ක්‍රියාත්මක වුණා. නීතියක් තිබුණාට විධානයේ ආධිපත්‍යය ක්‍රියාත්මක වුණේ නැහැ. නීතියට උඩින් තමයි ජනාධිපතිවරු හිටියේ. අපේ රටේ කියනවා, නීතිය සැමදෙනාට සමාන වෙන්න ඕනෑ කියලා. හැබැයි, විධායක ජනාධිපතිවරු ඒගොල්ලන්ගේ රැස් වළල්ලත් එක්ක ඉන්න දරුවෝ, මේ නීතියට එපිටින් ගිහිල්ලා තමයි වැඩ කටයුතු කළේ. ඒ නිසා නීතියේ විධානයේ ආධිපත්‍යය ආරක්ෂා කිරීමේ වගකීමක් සහිත රටක් බවට අපි දැන් පරිවර්තනය වෙන්න ඕනෑ. ඒ නිසා තමයි ජනාධිපතිවරුවන්ට දැන් නඩු වැටෙන්නේ; ඒ නිසා තමයි දැන් ජනාධිපතිවරුන්ට එරෙහිව වංචා, දූෂණ විමර්ශනයට ලක් වෙන්නේ. විධානයේ ආධිපත්‍යය අපේ රටේ ක්‍රියාත්මක නොවීමේ ප්‍රතිඵලය දැන් අපි අනෙක් පැත්තට හරවලා තිබෙනවා. එතකොට මත්ද්‍රව්‍ය කියන එකත් මේක ඇතුළෙම අපි හඳුනා ගන්නා ලක්ෂණයක්. ක්‍රීඩාවට මත්ද්‍රව්‍ය ආවා වාගේම ක්‍රීඩාව කරන අය, මත්ද්‍රව්‍ය විකුණන අය, මත්ද්‍රව්‍ය භාවිත කරන අය ක්‍රීඩා සමාජවලට එන්න පටන් ගත්තා, ක්‍රීඩාව වාණිජකරණය වීමත් සමඟම.

අපි දැක්කා, ඉතිහාසයේ ඉඳලාම ක්‍රීඩකයෝ බිහි වෙනවා. ඒ ක්‍රීඩකයා මොන ක්‍රීඩාවද කරන්න ඕනෑ, ඒ ක්‍රීඩකයා කොතැනටද යොමු කරන්න ඕනෑ කියලා තීරණය කළේ ක්‍රීඩා සමාජවල නිශ්චිත පිරිසක්. ඒ නිශ්චිත පිරිස දිහා අපි ආපහු හැරිලා බලනකොට දේශපාලන ආධිපත්‍යය තියා ගත්ත, මැර බලය තියා ගත්ත බහුතරයක් ඉන්නවා. ඒ වාගේම මත්ද්‍රව්‍ය ජාවාරම්වල හිනිපෙත්තේ ඉන්න කට්ටිය ක්‍රීඩා සමාජ අත්පත් කරගෙන ඉන්නවා අපි දැකලා තිබෙනවා.

අපේ රටේ ක්‍රීඩාව දියුණු කරනවා වාගේම, ක්‍රීඩාවට එරෙහිව තිබෙන මේ අඳුර නැති කරනවා වාගේම නව වැඩ පිළිවෙළක්, නව සංස්කෘතියක් නිර්මාණය කිරීමේ වගකීමත් අප ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා. අපේ රටේ ක්‍රීඩකයාට අවශ්‍ය පහසුකම් ටික අපි දෙන්න ඕනෑ. අපේ රටේ ක්‍රීඩකයාගේ හැකියාවට සාධාරණ විධියේ අවස්ථා අපි අරගෙන දෙන්න ඕනෑ; ඒ සඳහා වන වැඩ කටයුතු නිර්මාණය වෙන්න ඕනෑ. මෙච්චර කාලයක් ක්‍රීඩකයන්ට ඒ අවස්ථාව දුන්නේ නැහැ.

දකුණෙන් හමුවන මත්ද්‍රව්‍ය ජාලය ගත්තාම, සෑහෙන ප්‍රමාණයක් ඉන්නවා දේශපාලන හිතවතුන්, දේශපාලනඥයන් එක්ක එකට වැඩ කරන අය. කන්ටේනර් පිටින් කුඩු ගේන්න, කන්ටේනර් පිටින් අයිස් ගේන්න, මේ රටේ අයිස් නිෂ්පාදනය කරන්න මේ රටේ දේශපාලනඥයෝ, දේශපාලනඥයන්ගේ දරුවෝ, දකුණට පාතාලය අරගෙන ගිය සියලුදෙනා කටයුතු කර තිබෙනවා. ඒ ම්ලේච්ඡත්වයට එරෙහිව මනුෂ්‍යත්වය එකතු කරලා මනුෂ්‍යයන් විධියට අපි ඒවාට එරෙහි වෙන්න ඕනෑ, ඒ ම්ලේච්ඡත්වය පරාජය කරන්න ඕනෑ. ඒ වගකීම අප ඉස්සරහා තිබෙනවා. ඒ නිසා අප මේ රටේ සමස්තයට කිව යුතු කාරණයක් තිබෙනවා. අපේ රටේ ක්‍රීඩාව වෙනස් කිරීමට අදාළව දේශපාලන ව්‍යාපාරයක් විධියට වැඩ කරන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. නීතියේ විධානයේ ආධිපත්‍යය ආරක්ෂා කරන එකට, පාතාලය මර්දනය කරන එකට අදාළ මැදිහත්වීමත් කරන්න අපට සිද්ධ වෙලා තිබෙනවා. ඒ මැදිහත්වීම නිකම් කරන්න අපට බැහැ. ඒ සඳහා හැමෝගේම දායකත්වය ඕනෑ. ක්‍රීඩාවට කර තිබෙන විනාශය නැති කරන්නත්, රටේ තිබෙන මේ ව්‍යසනය නැති කරන්නත් හැමෝගේම දායකත්වය, අවශ්‍යතාව, මග පෙන්වීම ලබා දෙන්න කියා මම ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Chanaka Madugoda. You have eight minutes.

[අ.භා. 1.10]

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ මාතෘකාව ගැන කථා කරන මේ වෙලාවේ, මීට පෙර කථා කළ මන්ත්‍රීවරයා කියපු දේවලට උත්තර දෙන්න ගියොත් මට ලැබී තිබෙන කාලය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් මතු වෙනවා. තමන් තවම විපක්ෂයේ ඉන්නවා කියලා හිතාගෙන තමයි එතුමා කථාව කළේ. ඒ නිසා මම ඒ පිළිබඳව ඊට වඩා දීර්ඝව කියන්න උත්සාහ ගන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුතිය (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කරන මේ වෙලාවේ මේ පනත් කෙටුම්පත ගෙන ඒම පිළිබඳව පක්ෂයක් විධියට අපි අපේ ප්‍රසාදය සහ එකඟත්වය පළමුවෙන්ම පළ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි අද උදේ දැක්කා, ගරු ආනන්ද විජේපාල ඇමතිතුමා මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ ආරක්ෂාව ඉවත් කිරීම පිළිබඳව, එතුමාට වෙඩි නොවදින රථය නැවත ලබා දීම පිළිබඳව මේ සභාවේ කථා කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහින්ද රාජපක්ෂ කියන්නේ, ලෝක ඉතිහාසය වෙනස් කළ, ලෝක ඉතිහාසයේ යුද්ධයකින් යුද්ධයක් අවසන් කළ එකම නායකයා. ඒ නායකයාගේ ජීවිතය පිළිබඳව තිබෙන අනතුර ගැන අපි අමුතුවෙන් විවාද කරන්න අවශ්‍ය නැහැ. එල්ටීටීඊ හිතවාදීන්, ඒ දෙමළ ඩයස්පෝරාව වාගේම වෙනත් කල්ලි අද එතුමාගේ ආරක්ෂාව මේ ආණ්ඩුව ලවා ටිකෙන් ටික ඉවත් කරවමින් ඉන්නේ යුද්ධය අවසන් කිරීම නිසා ඔවුන්ට සිදු වුණු විපාකවලට ප්‍රතිඋත්තර ලබා දෙන්නයි. ඒ නිසා මම විශ්වාස කරනවා එතුමාට නැවත ඒ වෙඩි නොවදින රථය අවශ්‍ය නම් ලබා දෙන්න ඕනෑ කියන තීරණය ගත යුත්තේ මේ සභාවේ ඉන්න අප නොව මේ ආණ්ඩුව බව. එතුමාට ආරක්ෂාව ලබා දීමේ වගකීම තිබෙන්නේ, එතුමා ආරක්ෂා කිරීමේ වගකීම තිබෙන්නේ ආණ්ඩුවටයි. එයින් මිදෙන්න මේ ආණ්ඩුවට බැහැ කියන කාරණයත් මම මේ මොහොතේ සිහිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ක්‍රීඩාවට අදාළ මෙම සංශෝධන පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදය පැවැත්වෙන මේ වෙලාවේ විශේෂයෙන් කිව යුතු කාරණයක් තිබෙනවා. පසුගිය මාර්තු මාසයේ ලෝක තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය තමන්ගේ නීති සංග්‍රහයට අනුකූල නොවන බවට ප්‍රකාශයක් නිකුත් කළා. හැබැයි, ඒ ප්‍රකාශය නිකුත් කළ වෙලාවේ මේ ආණ්ඩුව ඒ පිළිබඳව තැකීමක් කළේ නැහැ, ඒ පිළිබඳව අවධානය යොමු කළේ නැහැ. ඒ නිරීක්ෂණ කාලය අවසන් වන විටත් නීති පද්ධතියට අවශ්‍ය සංශෝධන ඉදිරිපත් නොකිරීම නිසා තමයි පසුගිය දවසක ලෝක තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය තහනම් කළේ. ඒ තහනම් කිරීම තුළින් රටට විශාල ප්‍රශ්න ගණනාවක් ඇති වුණා. ඒ හේතුවෙන් ලෝක තහනම් උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් සංවිධානය කරනු ලබන විවිධ වැඩසටහන්වලට සම්බන්ධ වීම, ඔවුන්ගේ අනුග්‍රහයන් සහ ආධාර මුදල් ලබා ගැනීම ආදි සියල්ල මේ වන විට අපේ රටට අහිමි වෙලා තිබෙනවා. විශේෂයෙන්ම එම වගකීමේ කොටසක් ආණ්ඩුවට තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔලිම්පික් තරගාවලිය වෙන්න පුළුවන්, පැරා ඔලිම්පික් තරගාවලිය වෙන්න පුළුවන්, ලෝක ශූරතා තරගාවලිය වෙන්න පුළුවන්, වෙනත් කලාපීය තරගාවලි වෙන්න පුළුවන්, ඒ කිසිදු තරගාවලියක ශ්‍රී ලංකා ධජය ඔසවන්න තිබෙන අයිතිය අද අපට නැති වෙලා තිබෙනවා. මෙම පනත් කෙටුම්පත ගෙන ඒම පිළිබඳව අප සතුටු වෙනවා වාගේම, මෙම පනත් කෙටුම්පත ගෙන එන්න ප්‍රමාද වීම නිසා මේ රටට අහිමි වුණු දේවල වගකීම මේ ආණ්ඩුව ගත යුතුයි කියන කාරණයත් මම මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ක්‍රීඩාව ගැන අප කථා කරන මේ වෙලාවේ, ගමේ ක්‍රීඩා කරන, පාසලේ ක්‍රීඩා කරන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ඇති වෙලා තිබෙන විශාල ගැටලුවක් පිළිබඳවත් මේ ගරු සභාව තුළ සඳහන් කරන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා. ක්‍රීඩා කරන්න අවශ්‍යතාව, වුවමනාව තිබුණත් අද ක්‍රීඩා උපකරණවල මිල ගණන් අධික වීම නිසා මේ මොහොත වන විට ක්‍රීඩකයන්ට -පාසල් ක්‍රීඩකයින්ට වෙන්න පුළුවන්, ක්‍රීඩා සමාජවල ක්‍රීඩකයින්ට වෙන්න පුළුවන්- ක්‍රීඩා කරන්න අවශ්‍ය පහසුකම් නොමැති වී තිබෙනවා. අපි දන්නවා, වෙළෙඳ පොළේ එදා රුපියල් 5,700ක වාගේ මිලකට තිබුණු Mikasa original volleyball එකක් අද රුපියල් 12,000ක් පමණ වන බව. ඒ විතරක් නොවෙයි, ඉතාම හොඳ වර්ගයේ පාපන්දුවක මිල අද රුපියල් 7,500 දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම ධාවන තරගවලට භාවිත කරන spikes යුගලයක් අද රුපියල් 20,000 දක්වා ඉහළ ගිහින් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාසල්වල ලෙදර් බෝල් ක්‍රිකට් ක්‍රීඩාව ආරම්භ කළාම ග්‍රාමීය පාසල්වල දරුවන් විශාල පිරිසක් ලෙදර් බෝල් ක්‍රිකට් ක්‍රීඩාවට යොමු වන බව අපි දන්නවා. නමුත්, පහළ ජීවන තත්ත්වයක් හිමි, ග්‍රාමීය දිළිඳු ජනතාවට එම ලෙදර් බෝල් ක්‍රිකට් ක්‍රීඩාවට අවශ්‍ය උපකරණ කට්ටලයක් මිල දී ගන්න අද හැකියාවක් නැහැ. ඒ හේතුවෙන්, ආර්ථිකමය හැකියාවක් නැති එම ආදරණීය අම්මලා, තාත්තලා අද බොහෝ අපහසුතාවට පත් වෙලා සිටිනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ක්‍රීඩා භාණ්ඩ කට්ටලයක් අද රුපියල් 60,000ක් පමණ වෙනවා. ලෙදර් බෝල් ක්‍රිකට් ක්‍රීඩාව තවත් එහාට කරගෙන යනකොට ඊට අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ ගත යුතුව තිබෙනවා. එකී ක්‍රීඩා භාණ්ඩ කට්ටලයක මිල රුපියල් ලක්ෂ දෙකක්, තුනක් පමණ වනවා. අද එම ක්‍රීඩාවට යොමු වන දරුවන් එම හේතුව නිසා ක්‍රීඩාවේ රැඳී සිටින්න බැරි තත්ත්වයට පත් වෙලා සිටිනවා. එම නිසා මම මේ ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා, ක්‍රීඩා භාණ්ඩවලට අදාළව පනවපු බදු මුදල් ඉවත් කරලා, ගමේ සිටින ආදරණීය දරුවන්ට, එම ක්‍රීඩාවට යොමු වුණු දරුවන්ට එම ක්‍රීඩාවේ දිගටම නිරත වෙන්න පුළුවන් වට පිටාවක්, හැකියාවක් හදා දෙන්න කියලා. ඒ වගකීම මේ ආණ්ඩුව ඉටු කරයි කියන විශ්වාස අප තුළ තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගාල්ල ඇතුළු අනෙකුත් දිස්ත්‍රික්කවල තිබෙන තවත් ගැටලුවක් පිළිබඳවත් මම මේ මොහොතේ සිහිපත් කරන්න ඕනෑ. අද තේ වගාව ආශ්‍රිතව විශාල ප්‍රශ්නයක් තිබෙනවා. 1867දී තමයි ශ්‍රී ලංකාවේ තේ වගාව ආරම්භ කළේ. එම තේ වගාව අද වන විට අවුරුදු 158ක් ඉදිරියට ඇවිත් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි අද තේ වගාවේ යෙදෙන, කුඩා තේ වතු හිමියන් විශාල ප්‍රශ්නයකට මුහුණ දීලා සිටිනවා. විශේෂයෙන් මා නියෝජනය කරන දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරි වසම් 800 ගණනින් 600 ගණනක පමණ අද තේ වගාවේ නිරත වන අය සිටිනවා. අද ඔවුන් ද ඉහත කී විශාල ප්‍රශ්නයට මුහුණ දී සිටිනවා. ඒ ප්‍රශ්නය තමයි, තේ වගාවේ යෙදී සිටින අයට තේ වගාවේ යෙදීමට අද ආර්ථිකමය හැකියාවක් නොමැති වී තිබීම. එම නිසා මම ආණ්ඩුවෙන් විශේෂ ඉල්ලීමක් කරන්න කැමැතියි.

පසු ගිය දා ජපානයේ පැවැති තේ වෙන්දේසියේදී ලංකාවට විශාල වාසියක්, එහෙම නැත්නම් විශාල වරප්‍රසාදයක් හිමි වුණා අපි දැක්කා. අපි ඒ පිළිබඳව අපේ ප්‍රසාදය විශේෂයෙන් පළ කරනවා. අපි ඒ පිළිබඳව සතුටු වෙනවා. ඒ ගැන සතුටු වනවා වාගේම අපි කියනවා, එහි ප්‍රතිලාභ ගමේ සිටින කුඩා තේ වතු හිමියන්ට, ගම්වල තේ වගාවේ යෙදී සිටින තේ වගාකරුවන්ට ලැබෙනවා නම් වටින බව. ඒ අයට එම ප්‍රතිලාභ ලබා දෙන්න කියා මම විශේෂයෙන් ඉල්ලා සිටිනවා. තේ වගාව අද තිබෙන තැනට ගෙන එන්න, ඒ කියන්නේ තේ වගාව ඉදිරියට ගෙන එන්න, විශේෂයෙන්ම "Ceylon Tea" නාමය ඉදිරියට ගෙන එන්න පසුගිය කාලයේ පැවැති හැම ආණ්ඩුවක්ම කටයුතු කළා. එම නාමය අද ශක්තිමත් වෙලා තිබෙන්නේ පසුගිය ආණ්ඩුවලින් සිදු කළ යම් යම් කාර්යභාරයන් ද නිසායි. අපේ රටේ තේ වගාව ඉදිරියට ගෙන යන්න ඒවාත් ඉවහල් වුණා. හැබැයි අපේ තේ වගාව ඉදිරියට යනකොට, තේ වගාවේ මේ මොහොතේ යෙදෙන කුඩා තේ වතු හිමියන්ට අවශ්‍ය දිරි දීමනා, සහනාධාර ලබා දීමේ වැඩ පිළිවෙළක් ද ඊට එකතු කරන්න පුළුවන් නම් වටිනවා කියන කාරණයත් මම මේ මොහොතේ සඳහන් කරනවා.

[ගරු චානක මාදුගොඩ මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගාල්ල දිස්ත්‍රික්කයේ, කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට අදාළවත් විශාල ගැටලු රාශියක් තිබෙනවා. විශේෂයෙන්ම එහි සේවක මණ්ඩලයේ අඩුපාඩු තිබෙනවා. අද ගාල්ල දිස්ත්‍රික්කයේ කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට අනුයුක්ත තේ පර්යේෂණ ව්‍යාපෘති නිලධාරින්ගේත් දැඩි හිඟයක් තිබෙනවා කියන කාරණයත් මම විශේෂයෙන් සඳහන් කරනවා. නිලධාරින් 23දෙනෙකු සිටිය යුතු වුවත්, අද ඉන්නේ නිලධාරින් 12දෙනෙකු පමණයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. තේ වගාව ප්‍රකෘතිමත් කරන්න නම්, තේ වගාව ඉදිරියට ගෙන යන්න නම්, රජයෙන් අවශ්‍ය පහසුකම් ලබා දෙන්න ඕනෑ.

මට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමා කිව්වා අයිස් මත්ද්‍රව්‍යය ගැන. අයිස් මත්ද්‍රව්‍යය ගැන කථා කරන එක අද ඒ අයගේ ජනප්‍රිය මාතෘකාව බවට පත් වෙලා. හැබැයි, ඒ අයගේ සඟවන කාරණයක් තිබෙනවා. ඩී.වී. චානක මැතිතුමන්ලා-අපි එදා නිතරම මේ පාර්ලිමේන්තුව තුළදී ඇහුවා, කන්ටේනර් පෙට්ටි 323ක් නිදහස් කිරීමේ වගකීම ගැන. කන්ටේනර් පෙට්ටි තුළ අයිස් මත්ද්‍රව්‍යය රටට ගෙනාවා කියලා කථා කරන ආණ්ඩුව අද ඒ හරහා වෙනත් පක්ෂවලට ලේබල් ගහන්න උත්සාහ ගන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කන්ටේනර් පෙට්ටි 323 වරායෙන් එළියට ගෙනයෑමේ වගකීම දැරුවේ කවුද කියලා ආණ්ඩුවෙන් අපි අහනවා. විශේෂයෙන්ම ඒ සම්බන්ධයෙන් ජනාධිපතිවරයා පත් කළ කමිටුවෙන් ලබා දුන් වාර්තාව සභාගත කරන්න කියලා අපි කිව්වා. නමුත් අද වෙනකම් ඒක සභාගත කළේ නැහැ. අපි අහනවා ආණ්ඩුවෙන්, ඇයි ඒ වාර්තාව සභාගත කරන්න බැරි කියලා. කන්ටේනර් පෙට්ටි ගැන කථා කරන මොහොතේ, අයිස් මත්ද්‍රව්‍යය ගැන කථා කරන මොහොතේ, ඒවා මේ රටට ආපු ක්‍රමය ගැන කථා කරන මොහොතේ, කන්ටේනර් පෙට්ටිවල අයිස් තිබුණා කියලා කථා කරන මොහොතේ, ඇයි ආණ්ඩුවට බැරි මේ ආණ්ඩුවෙන්ම ඉදිරිපත් කළ ඒ වාර්තාව සභාගත කරන්න? ඒ නිසා අපි ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, ඒ වාර්තාව සභාගත කරන්න කියලා. හැම දාම කුඩු, අයිස් මත්ද්‍රව්‍යය ගැන කථා කළත් එතුමන්ලාට සමාජයෙන් එල්ල වෙන විරෝධය මැඩ පවත්වන්න බැහැ කියන කාරණය අපි කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද සතොස විශාල ගැටලුවකට පත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම කරාපිටියේ තිබුණු සතොස, ගාල්ල දිස්ත්‍රික්කයේ ඉතා ජනප්‍රිය එකක් හැටියට තමයි තිබුණේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා ඉපදුණු, ඔබතුමාගේ ඥාතීන් ඉන්න ප්‍රදේශයක් තමයි, ඒ. ඒ ප්‍රදේශය ඉතා ජනප්‍රියයි. ඒ ප්‍රදේශයේ කරාපිටිය රෝහල තිබෙනවා, කරාපිටිය මාතෘ රෝහල තිබෙනවා. එවැනි ජනාකීර්ණ ප්‍රදේශයක තිබුණු සතොස අද එතැනින් ඉවත් කර තිබෙනවා. ඒක තමයි ගාල්ලේ වැඩිම ආදායමක් ලැබූ සතොස. අද අපට අහන්න වෙනවා, ඒ අවට තිබෙන වෙනත් බහු ජාතික වෙළෙඳ සැල්වලට සහයෝගය ලබා දීම වෙනුවෙන් ඒ සතොස ආයතනය ඉවත් කළාද කියලා. ගාල්ලේ ජනතාව ඒ ගැන අහනවා. සතොස කියන්නේ මේ රටේ භාණ්ඩ මිල නියාමනය කරන ආයතනයක්. විශේෂයෙන්ම රජය සහතික මිලක් පැනෙව්වාම ඒ සහතික මිලට භාණ්ඩ මිලදී ගන්න පුළුවන් ආයතනය තමයි සතොස කියන්නේ. හැබැයි, ඒ සතොස දිනෙන් දින අකර්මණ්‍ය කරමින් තිබෙනවා. අද අපි සතොසෙන් මිලදී ගන්නා භාණ්ඩයම ඊට එහායින් තිබෙන පෞද්ගලික වෙළෙඳ සැලකින් ඊට වඩා අඩු මිලකට ගැනීමට පුළුවන්කම තිබෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සතොස පිහිටුවීමේ අරමුණින් බැහැර වෙලා සතොස වසා දමන තැනට අද මේ ආණ්ඩුව කටයුතු කරනවාද කියන සැකය ගාල්ල දිස්ත්‍රික්කයේ ජනතාවට තිබෙනවා කියන කාරණයත් මේ මොහොතේ මා සිහිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ක්‍රීඩාව ගැන කථා කරන මේ වෙලාවේ, ක්‍රීඩාවට අදාළ පනත් කෙටුම්පතක් ඉදිරිපත් කර තිබෙන මේ වෙලාවේ අපි විශ්වාස කරනවා, මේ පනත් ගෙනෙනවා වාගේම මේ පනත්වල තිබෙන හරය ගැන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට, පුහුණුකරුවන්ට අවබෝධයක් ලබා දෙන්න ඕනෑ කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවැනි පනත් කෙටුම්පත් ගෙනැල්ලා සම්මත කළාට, ඒ පිළිබඳව අපේ සමාජය දැනුවත් නොකළොත්, මේ පනත් හරහා ගෙනෙන වගකීම, මේ පනත් හරහා සමාජගත කරන්න ඕනෑ පණිවුඩය යන්නේ නැහැ කියා මම විශ්වාස කරනවා. ඒ නිසා අපි විශේෂයෙන්ම ඉල්ලීමක් කරනවා, මේ පනත් ගෙනෙනවා වාගේම තහනම් උත්තේජක පිළිබඳව ක්‍රීඩක ක්‍රීඩිකාවන් දැනුවත් කිරීමත් සිදු කළ යුතු බවට. සමහර විට ක්‍රීඩක ක්‍රීඩිකාවන් නොදැනුවත්ව ඒවාට පෙලඹෙනවා. ඒ නිසා මේ ගෙනෙන නීති සමාජගත කිරීමේ වගකීම තිබෙන්නේත් ආණ්ඩුවටය කියන කාරණය මේ මොහොතේ මා සිහිපත් කරනවා.

මේ ගැටලු ගැන කථා කරන මේ වෙලාවේ අපි විශේෂයෙන්ම මේ ආණ්ඩුවෙන් තවත් ඉල්ලීමක් කරනවා. පසුගිය ආණ්ඩු කාලයේ, නාමල් රාජපක්ෂ මැතිතුමා තරුණ හා ක්‍රීඩා ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේ දිවා-රාත්‍රී ක්‍රීඩා කළ හැකි ක්‍රීඩා පිට්ටනි හැදුවා. ඒ වාගේම මහින්දානන්ද මැතිතුමා ක්‍රීඩා ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේ දිස්ත්‍රික් ක්‍රීඩා පිටි හැදුවා. ගමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ඒවායේ ප්‍රතිලාභ ලබා ගත්තා. හැබැයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ඒ දිස්ත්‍රික් ක්‍රීඩා පිටිවලට ගිහිල්ලා නොමිලේ පහසුකම් ලබා ගැනීමට තිබුණු ඒ තැන අහිමි වෙලා. ක්‍රීඩකයන් නොමිලේ පුහුණු කිරීමේ අවස්ථාව අද ඒ පුහුණුකරුවන්ට අහිමි වෙලා. ඒ නිසා මම විශේෂයෙන්ම ඉල්ලීමක් කරනවා, ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට එම පහසුකම -දිස්ත්‍රික් ක්‍රීඩා පිටිවලට ගිහින් නොමිලේ ක්‍රීඩා පුහුණුවීම්වල යෙදීමේ අවස්ථාව- නැවත සලසා දෙන්න කියලා. එම කාරණයත් සඳහන් කරමින්, අද දවසේ දෙවන වර කියවීමට ඉදිරිපත් කර තිබෙන මේ වැදගත් පනත් කෙටුම්පත සම්මත වීම හරහා මේ රටේ ක්‍රීඩාවේ අභිවෘද්ධියට මෙන්ම, විනයගරුක ක්‍රීඩාවක්, ජීවමාන ක්‍රීඩාවක් බිහිවීමටත්, ක්‍රීඩාවේ ජීව ගුණය රකිමින් ඉදිරියේදී හොඳ ක්‍රීඩක පරපුරක් බිහි කිරීමටත් අවශ්‍ය ඉඩකඩ ලැබෙන්න කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා**
(மாண்புமிகு சுனில் குமார கமகே)
**(The Hon. Sunil Kumara Gamage)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ කරුණක් නිවැරදි කරන්න අවශ්‍යයි. එතුමා සඳහන් කළා, අපේ නොසැලකිලිමත්භාවය නිසා ලෝක තහනම් උත්තේජක විරෝධී නියෝජිත ආයතනය අපේ රටේ ආයතනය තහනම් කළා කියලා. එහෙම එකක් සිදු වුණේ නැහැ. අපි පටන් ගත්ත දවසේ ඉඳලා ඒ ක්‍රියාවලිය කළා. එතුමා දන්නවා, පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පතක් සම්මත කරන්න යන කාලය ගැන. ඒක කැබිනට් මණ්ඩලයට යන්න ඕනෑ, නීතිපති දෙපාර්තමේන්තුවට යන්න ඕනෑ. එවැනි විශාල කාලයකට පස්සේ තමයි මේ වාගේ පනත් කෙටුම්පතක් සම්මත වෙන්නේ. ඒක නිසා අපි ඒ ක්‍රියාවලියේ දිගටම හිටියා. ඒ නිසා ඒ කාරණයත් නිවැරදි කරගන්න වෙනවා.

ඒ වාගේම මේ වෙනකොට ධජය එසවීම අහිමි වීම, අරමුදල් නැති වීම වාගේ කාරණා මේක ඇතුළේ සිදු වෙලා නැහැ. එහෙම දේවල් වෙලා නැහැ. ඒක නිසා ඒ කාරණා නිවැරදි වෙන්න ඕනෑ.

අපි දැනටත් ජාත්‍යන්තර තරගාවලිවලට යනවා. ඒ වාගේම අපට ඒ අවශ්‍ය අරමුදල් හම්බ වෙනවා. අපට Anti-Doping Agency එකෙන් මුදල් දෙන්නේ නැහැ.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, we are not going for a debate on that. But, I will give you a few seconds.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා සඳහන් කළා පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමට යන කාල සීමාව පිළිබඳව. කැබිනට් මණ්ඩලයට ගිහිල්ලා ඒ කටයුතුවලට දීර්ඝ කාලයක් ගියා කිව්වා. හැබැයි, මේ රටට මේ අනතුර වෙනවා කියලා එතුමන්ලා දන්නවා නම්, එතුමන්ලාට මීට වඩා කඩිනමින් ඒ කටයුතු කරන්න තිබුණා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම තව එක් දෙයක් කියන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, we are not going for a debate on that.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
මේ පනත් කෙටුම්පත පිළිබඳව යම් උනන්දුවක් තිබුණා නම්, මේ සංශෝධන පිළිබඳව නිරීක්ෂණ කාල සීමාව තුළ ආණ්ඩුවට මේ ආයතන දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක් කරන්න තිබුණා. එහෙම නැතුව තහනම් කරන කල් ආණ්ඩුවක් විධියට බලාගෙන හිටපු එක වැරැදියි කියන කාරණය තමයි අපි සිහිපත් කරන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Mrs.) Nilusha Lakmali Gamage. You have 10 minutes.

[අ.භා. 1.25]

**ගරු නීතිඥ නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலூஷா லக்மாலி கமகே)
(The Hon. (Mrs.) Nilusha Lakmali Gamage, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදයේදී අදහස් ඉදිරිපත් කරන්න මටත් අවස්ථාව ලැබී තිබෙනවා.

ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහිව ජාත්‍යන්තර සම්මුතිය 2005 වර්ෂයේ ඔක්තෝබර් 19වන දින පැරිස් නුවරදී එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක, සංස්කෘතික සංවිධානය, ඒ කියන්නේ "යුනෙස්කෝ" මහා සමුළුවේදී පිළිගත්තා. ඒ අනුව, ශ්‍රී ලංකාව 2011 වසරේදී ඒ සම්මුතියට අත්සන් කිරීමේ ප්‍රතිඵලයක් විධියට එම සම්මුතිය යටතේ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වූ බැඳීම්වලට බලාත්මකභාවයක් ලබා දීමට, ඒ වාගේම ඒක ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය නීතිමය විධිවිධාන සැකසීම අවශ්‍ය වුණා. ඒ අනුව ලංකාව තුළ එකී සම්මුතිය බලාත්මක කිරීමට ඒ වාගේම උත්තේජක ද්‍රව්‍ය මර්දන නියෝජ්‍යායතනයක් ශ්‍රී ලංකාව තුළ පිහිටුවීම මඟින් එකී සම්මුතිය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමට විධිවිධාන සැලැස්වීම සඳහා 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත් කෙටුම්පත පාර්ලිමේන්තු විසින් සම්මත කර ගත්තා. ඒ අනුව ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි වීම සඳහා අදාළ දේශීය නීතිමය යන්ත්‍රණයක් නිශ්චිතව සඳහන් කිරීම සඳහා සහ ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවෙන් තහනම් ද්‍රව්‍ය හා ක්‍රම මුලිනුපුටා දැමීම සඳහා ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය නමින් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් පිහිටුවා ගත්තා. ශ්‍රී ලංකාවේ ක්‍රීඩකයන් ජාත්‍යන්තර තරග සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ඉදිරිපත් වෙන අවස්ථාවලදී යම් තහනම් උත්තේජක ද්‍රව්‍යයක් ලබා ගෙන නැති බවට ලංකාව තුළදීම තහවුරු කර ගැනීමට මෙමඟින් හැකියාව ලැබුණා. එයින් යම් තහනම් උත්තේජක ද්‍රව්‍යයක් ලබා ගෙන ක්‍රීඩාවලින් ලබා ගන්නා ජයග්‍රහණ අහිමිවීම තුළින් ලංකාවට වෙන අපකීර්තිය වළක්වා ගැනීමට හැකියාව ලැබුණා.

ඇත්තටම ලෝක උත්තේජක මර්දන නීති රීති, ලංකාවේ නියෝජ්‍යායතනයේ නීති රීති සකස් කිරීමේදී පදනම් කර ගන්නවා. ශ්‍රී ලංකාවේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ශ්‍රී ලංකා ජාතික ධජය යටතේ ජාත්‍යන්තර ක්‍රීඩා තරග නියෝජනය කිරීම සඳහා අවස්ථා ලබා ගැනීමට ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය ලෝක උත්තේජක මර්දන නීති රෙගුලාසිවලට අනුගතව ක්‍රියාත්මක විය යුතු වෙනවා. WADA එක විසින් සෑම රටකම උත්තේජක මර්දන නීතිය නියමිත මට්ටමක පවතිනවාද යන්න වරින් වර විමසීමට ලක් කරනවා; සංශෝධනය සඳහා නිර්දේශ ඉදිරිපත් කරනු ලබනවා. එකී ඉදිරිපත් කරනු ලබන නිර්දේශ මත 2013 අංක 33 දරන පනත සංශෝධනය කිරීම සඳහා මෙම පනත් කෙටුම්පත සකස් කර තිබෙනවා. මෙම පනත මඟින් රෝගී තත්ත්වයක් ඇති ක්‍රීඩකයෙකු යම් ක්‍රීඩා ඉසව්වකට සහභාගී වෙන විට තහනම් කරන ලද ද්‍රව්‍යයක් හෝ තහනම් කරන ලද ක්‍රමයක් භාවිත කිරීමට ඒ ක්‍රීඩකයාට අවසර දෙමින් චිකිත්සික භාවිත මුක්තියක් ප්‍රදානය කරනු ලැබීම වළක්වන්නේ නැහැ. එය ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය විසින්, චිකිත්සක භාවිත මුක්තිය ප්‍රදානය කිරීමේ කමිටුවේ තීරණය අනුව සිදු කරනු ලබනවා. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනයේ කටයුතු අධීක්ෂණය කිරීම පාලක මණ්ඩලයක් විසින් සිදු කරනු ලබනවා. ඒ වාගේම කෙටුම්පත මඟින් උත්තේජක මර්දන නීති රීති උල්ලංඝනය කිරීම පිළිබඳව විභාග කිරීමට පිහිටුවා ගන්නා විනය මූල මණ්ඩලයේ සංයුතිය විභාගයක් පැවැත්වීමේ කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් විධිවිධාන සලසා තිබෙනවා.

***[මෙම අවස්ථාවේදී ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා සභා ගර්භයට පැමිණියේය.]***

*[இச்சந்தர்ப்பத்தில் மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் சபாமண்டபத்துட் பிரவேசித்தார்.]*

*[At this stage, the Hon. President Anura Kumara Dissanayake entered the Chamber.]*

අභියාචනා ඉදිරිපත් කිරීමට, අභියාචනා මූල මණ්ඩලය විසින් විභාග කිරීම සම්බන්ධයෙන් සහ ක්‍රීඩා බේරුම්කරණ අධිකරණය වෙත අභියාචනා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්ද ප්‍රතිපාදන මෙම පනත් කෙටුම්පතේ ඇතුළත් වෙනවා. ඒ වාගේම මෙම පනත් කෙටුම්පතෙන් ලෝක තහනම් උත්තේජක මර්දන නීති සංග්‍රහයේ

[ගරු නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය]

අදාළ විධි විධාන ක්‍රියාත්මක කිරීම සඳහා රීති සෑදීමට ලංකාවේ නියෝජ්‍ය ආයතනයට බලය පවරා නියම කරලා තිබෙනවා. ක්‍රීඩාවේ යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත මඟින් සිදු වන මූලික බලපෑම මොකක්ද? වඩාත් පැහැදිලි සහ ශක්තිමත් රාමුවක් ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහිව සම්මුති පනත සඳහා ලැබීම, ඒ වාගේම ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා වැඩිදියුණු කළ පාලනයක් සහ වගවීමක් ලැබීම, ඒ වාගේම ශ්‍රී ලංකාව ලෝක උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතන සංග්‍රහයට අනුගත වීම සහ ගෝලීය පිළිවෙත් සමඟ ගැළපීම මෙම පනත් කෙටුම්පත මඟින් සිද්ධ වෙනවා.

මම හිතන විධියට, ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය භාවිතයට ප්‍රධාන හේතුවක් තමයි පරාජයට ඇති අකමැත්ත. අපි කුඩා කාලයේ ඉඳලාම ඉගෙන ගන්නේ, අපේ ආකල්ප හුරු කරලා තිබෙන්නේ දිනන්නම විතරයි. අපේ දරුවෝ මූලික අවස්ථාවේදී ක්‍රීඩාවට යොමු වීමේදී තියා ජීවිතය පටන් ගන්න අවස්ථාවේ ඉඳලාම අපි ඔවුන්ව යොමු කරන්නේ දිනන්න. පරාජය වෙන එක ලජ්ජාවක් විධියට තමයි සලකන්නේ. නමුත් පරාජය තුළින් නැවතත් ජයග්‍රහණය සඳහා අවස්ථාවක් ලබා ගැනීම සඳහා විශේෂයෙන්ම අපගේ ආකල්ප වෙනස් විය යුතුයි. පරාජය තුළින් මානසික කඩා වැටීමක් නැතුව ශක්තිමත්ව නැඟී සිටීම සඳහා අපගේ දරුවන්ගේ ආකල්ප වෙනස් කළ යුතු වෙනවා. මෙහිදී ඇත්තටම ක්‍රීඩාව සම්බන්ධයෙන් සලකන විට පුහුණුකරුවන්ට, ගුරුවරුන්ට, දෙමව්පියන්ට, යහළුවන්ට විශාල ක්‍රියාදාමයන් ප්‍රමාණයක් තිබෙනවා, ක්‍රීඩකයන් දිරිමත් කිරීම සඳහා.

ඇත්තටම ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය භාවිතය පිළිබඳව කථා කරනකොට අපි මත්ද්‍රව්‍ය පිළිබඳව කථා කළ යුතුම වෙනවා. දරුවන් විශාල වශයෙන් මත්ද්‍රව්‍ය සඳහා යොමු වෙමින් සිටිනවා. මේ නිසා ඔවුන්ගේ අනාගතය සම්පූර්ණයෙන්ම විනාශ වෙමින් පවතිනවා. අතීතයේදී මත්ද්‍රව්‍ය සඳහා විශාල වශයෙන් යොමු වුණේ පිරිමි දරුවන් විතරයි. නමුත් වර්තමානය වන විට අපගේ ගැහැනු දරුවන්, අපගේ කාන්තාවන් මේ සඳහා ශීඝ්‍රයෙන් ඇබ්බැහි වන බව පෙනී යනවා. පසුගිය කාලයේ පැවැති දේශපාලනය ක්‍රියාත්මක වීම තුළින් ඇති වූ අනීතික තත්ත්වයන් මෙයට හේතු වුණා කිව්වොත් මම නිවැරදියි. නීතිය ක්‍රියාත්මක වුණේ මත්ද්‍රව්‍ය පාලනය කරන්න නොවෙයි, ජාවාරම්කරුවන් ආරක්ෂා කරන්නයි. ඉතින්, ඒ නිසා පසුගිය දේශපාලන අධිකාරීන්වල ආරක්ෂාව මත කිසිම බාධාවකින් තොරව මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් ඉහළින්ම වැජඹුණා. තෝරු, මෝරු නිදැල්ලේ සිටියදී හාල්මැස්සන්ට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කළා. ජාතික ජන බලවේගයේ ආණ්ඩුව දැන් ඒ තත්ත්වයට තිත තියලා තිබෙනවා. අද නිසි පරිදි නීතිය ක්‍රියාත්මක වෙන්න පටන් අරගෙන තිබෙනවා. ජාවාරම්කරුවන් විශාල සංඛ්‍යාවක් නීතිය ඉදිරියට ගෙනැල්ලා තිබෙනවා. ගම්වල ඉන්න අහිංසක අම්මලා දැන් සැනසුම් සුසුම් හෙළනවා, මේ තත්ත්වය නිසා. ගින්දර ඇවිළුණු ඔවුන්ගේ පපුවලට දැන් සහනයක් සැලසී තිබෙනවා. ඇත්තටම, මත්ද්‍රව්‍ය තුරන් කිරීමෙන් සැනසීම තිබෙන රටක් ගොඩනැඟීම සඳහා ගෙන තිබෙන මේ ක්‍රියා පිළිවෙත සම්බන්ධව ගම්වලට ගියාම ඒ අම්මලා ජනාධිපතිතුමා ප්‍රමුඛ ආණ්ඩුවට පින් දෙනවා.

දරුවන් වැඩිපුරම පාසල් අධ්‍යාපනයට යොමු කිරීමත්, ඔවුන් ක්‍රියාකාරකම් සඳහා යොමු කිරීමත් මත්ද්‍රව්‍ය භාවිතය, තහනම් උත්තේජක භාවිතය අවම කිරීමට හේතුවක් වන බව සමාජ අධ්‍යයන තුළින් හෙළි වෙලා තිබෙනවා. ඒ නිසා දැනට ක්‍රියාත්මක වන Youth Club සංකල්පය අපි ඇත්තටම අගය කළ යුතුයි. එය තරුණ දරුවන්; දුරකථනයට හුරු වෙමින් යන දරුවන් ක්‍රියාශීලී දරුවන් ලෙස, හොඳ සෞඛ්‍ය සම්පන්න පුරවැසියන් ලෙස සමාජගත කිරීමට යම් පිටුවහලක් වෙනවා. ඒ වාගේම සමාජ මාධ්‍යවලටත්, රූපවාහිනී නාළිකාවලටත් මේ සම්බන්ධයෙන් විශාල කර්තව්‍යයක් සිදු කළ හැකියි.

සමාජ ශෝධනයක් සිදු කර සමාජය මේ පත්වෙලා තිබෙන තත්ත්වයෙන් ගොඩ ගැනීමට මේ සමාජ මාධ්‍ය භාවිත කරන සියලු දෙනාගේ සහ සියලු මාධ්‍ය ආයතනවල අවධානය යොමු කරන්න කියා සමාජ ක්‍රියාකාරිනියක්, මවක්, නීතිඥවරියක් විධියට මා ඉල්ලීමක් කරනවා. ඒ වාගේම ඔවුන්ගේ දෑස මේ සඳහා යොමු වේවා කියා මා ප්‍රාර්ථනා කරනවා.

මීට කලින් කථා කරපු මන්ත්‍රීවරයෙක් ලෝකයේ සිටින, රට යුද්ධයකින් බේරා ගත්ත එක නායකයෙක් ගැන කිව්වා. ඇත්තටම එතුමාට ලෝක ඉතිහාසය අධ්‍යයනය කරන්න වෙනවා. මොකද, ලෝක ඉතිහාසයේ අපි නායකයන් බොහෝ ප්‍රමාණයක් දැකලා තිබෙනවා. ඒ, යුද්ධයෙන් රට ගලවාගෙන තමන්ගේ රට සංවර්ධනය කරා ගෙනිච්ච නායකයන්. නමුත් ලංකාව තුළ අපි දැක්කේ, සාමූහික ප්‍රයත්නයක් විධියට යුද්ධය දිනලා, ඒ ලැබුණු පැසසුම් ඔක්කෝම තමන්ගේ පෞද්ගලික account එකට දමාගෙන, තමන්ගේ පරම්පරාව විතරක් පොහොසත් කරගෙන රට දුප්පත් කරපු පවුලක් ගැනයි. ඒ විධියට තමයි අපි ඒක දැක්කේ. ඒ නිසා, ආපසු ලෝක ඉතිහාසය ගැන අධ්‍යයනය කරන්න කියා අපි එතුමාගෙන් ඉල්ලනවා.

මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Amila Prasad. You have 14 minutes.

[අ.භා. 1.35]

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාවේ ක්‍රීඩාවට සම්බන්ධ ඉතා වැදගත් සංශෝධන පනත් කෙටුම්පතක් තමයි අද දවසේ ඉදිරිපත් කර තිබෙන්නේ. ඇත්තටම තහනම් උත්තේජක කියන මේ මාතෘකාව ගත්තාම, මේක ඇතුළේ සිද්ධ වෙන ක්‍රියාවලිය තමයි දැනුවත්ව ගනු ලබන උත්තේජක නිසා ඇති වන බලපෑම් සහ නොදැනුවත්කම නිසා ගන්නා සමහර උත්තේජක නිසා ඇතිවන බලපෑම්. මේ විධියට දෙයාකාරයකින් මෙය බලපානවා. විශේෂයෙන්ම ලංකාව වාගේ කාලයකට වතාවක් ක්‍රීඩාව අතින් ඉහළ දක්ෂතාවන් පෙන්වන්න අවස්ථාව ලැබිලා තිබෙන රටකට, ඒ කියන්නේ ඔලිම්පික් පදක්කම් ගත්තොත්, ඔලිම්පික් පදක්කම් දෙකක් විතරයි අපට මේ වෙනකම්ම ලැබිලා තිබෙන්නේ. ඒ ඔලිම්පික් පදක්කම් දෙක ගත්තොත්, ගෙවුණු අවුරුදු 25ක කාල සීමාව තුළ එක ඔලිම්පික් පදක්කමක් විතරයි ලැබිලා තිබෙන්නේ. ඒ, සුසන්තිකා ජයසිංහ ලංකාව වෙනුවෙන් දිනා ගත් ඔලිම්පික් පදක්කම. එතැනින් පසුව ක්‍රීඩාවේ අපට සුවිශේෂී ජයග්‍රහණ ලබා ගැනීම සඳහා තවමත් අවස්ථාවක් ලැබිලා නැහැ. ඒ නිසා මේ ක්ෂේත්‍රය විශාල වශයෙන් දියුණුවට පත් විය යුතු ක්ෂේත්‍රයක් විධියට තමයි මම දකින්නේ.

මොකක්ද, මේ උත්තේජනය කියන ක්‍රියාවලිය ඇතුළේ සිද්ධ වෙන්නේ? මේ උත්තේජනය කියන ක්‍රියාවලිය ඇතුළේ සිද්ධ වෙන්නේ, තමන්ගේ දක්ෂතා වර්ධනය කර ගන්නට බාහිරින් ලබා ගන්නා සංඝටක, එහෙමත් නැත්නම් ප්‍රෝටීන් වර්ග නිසා ඇති වන

තත්ත්වයන්. ලංකාවේ මේ සම්බන්ධ ආයතන සමූහයක් තිබෙනවා. ඒ ආයතන සමූහයේ බොහොම දක්ෂ වෛද්‍යවරුන් ඉන්නවා. ඊට අමතරව දක්ෂ නිලධාරින් ඉන්නවා. ඒ අයට අවශ්‍ය පහසුකම් සහ අරමුදල් ප්‍රමාණවත් ලෙස අපේ ආණ්ඩුවලින් සපයනවාද කියන ප්‍රශ්නය පළමුව පැන නඟිනවා. දෙවැනි කාරණාව, ක්‍රීඩාව කියන එක අද වෙද්දී පිට්ටනිය ඇතුළේ සිද්ධ වෙන කාරණයකට වඩා පරීක්ෂණාගාර ඇතුළේ තමයි සිද්ධ වෙන්නේ. ඔලිම්පික් පදක්කමක් දිනන එක වෙන්න පුළුවන්, ක්‍රිකට් ක්‍රීඩකයෙක් හදන එක වෙන්න පුළුවන්, නමුත් තවදුරටත් මේක පිට්ටනියට සීමා වෙන්නේ නැහැ. පිට්ටනියෙන් එළියේ, භෞතික විද්‍යාව, ගණිතය, පෝෂණය කියන මේ කොටස් සියල්ල එකතු කරලා නිර්මාණය කර ගන්නා ක්‍රීඩකයෝ තමයි ලෝක මට්ටමට යන්න සුදුසුකම් සපුරන්නේ. මේ ගෙවුණු කාලසීමාව පුරාවටම අපේ දක්ෂ දරුවන්ට මෙන්න මේ තාක්ෂණික සහාය නිසි පරිදි ලැබුණාද, එහෙමත් නැත්නම් මේ තාක්ෂණික සහායට අමතරව ඒ අයගේ දක්ෂතා වර්ධනය කර ගන්න අවශ්‍ය දැනුම නිසියාකාරයෙන් ලැබුණාද කියන ප්‍රශ්නය තිබෙනවා. ඒක තමයි මේ ජයග්‍රහණ ප්‍රමාද වෙන්නට බලපෑ හේතුව. ඒ නිසා මේ පිළිබඳව තහනම් උත්තේජකවලින් එහාට ගිහිල්ලා, මේ ක්‍රියාවලිය ඇතුළේ මේ ක්‍රීඩකයන්ගේ දක්ෂතා වර්ධනය කර ගන්නේ කොහොමද කියන එක පිළිබඳව අපට සොයා බලන්න සිද්ධ වෙනවා. මම අර කලිනුත් සඳහන් කළ පරිදි දක්ෂ නිලධාරින් සහ වෛද්‍යවරුන් ඉන්නවා. හැබැයි, මේ පනත් කෙටුම්පත ප්‍රමාද වීම ඇතුළේම කියැවෙනවා, රජයක් විධියට අකාර්යක්ෂමතාව. මේ පනත් කෙටුම්පත ප්‍රමාද වීම හරහා සමහර ක්‍රීඩා තරග පැවැත්වීම සඳහා තිබූ අවස්ථා පවා ගිලිහී ගිහින් තිබෙන බව ක්‍රීඩා ඇමතිතුමා දන්නවා ඇති කියලා මම හිතනවා. එකක් තමයි, සවි එසවීමේ ජාත්‍යන්තර තරගාවලිය. මේ පනත ක්‍රියාත්මක වෙලා තිබුණා නම්, මේ සංශෝධන ගෙනැල්ලා තිබුණා නම්, එම තරගාවලිය අපට ගන්න තිබුණා.

මම අහලාවත් නැති තව ක්‍රීඩාවක් පිළිබඳව අද දවසේ ක්‍රීඩා අමාත්‍යාංශයෙන් දැනගන්න ලැබුණා. ඒ, ජු-ජිට්සු ක්‍රීඩාව. මේ ක්‍රීඩාව මොකක්ද කියලා මම දන්නේ නැහැ. මම හිතන විධියට, මේක කරාටේ වාගේ ක්‍රීඩාවක්. තරගකරුවන් 500ක් විතර සහභාගි වීමට නියමිතව තිබුණු ජු-ජිට්සු ක්‍රීඩා තරගාවලියක් සංවිධානය කිරීමේ අවස්ථාව මඟ හැරුණේත් මේ පනත් කෙටුම්පත ගෙනෙන්න ප්‍රමාද වුණු නිසායි. ඒකට හේතුව, ආණ්ඩුවේ අකාර්යක්ෂමතාව. අපට ලැබුණු ඒ අවස්ථාව අහිමි වීම නිසා එක් පැත්තකින් විදේශ විනිමය අහිමි වීමකුත් සිද්ධ වනවා. ඒ වාගේම මේ කාල සීමාව තුළ පනතක් කෙටුම්පත් කර ක්‍රියාත්මක කරන්න මාස ගණනක් යනවා, මෙය ඒ නිසා ඇති වෙච්ච තත්ත්වයක් කියලා කලින් උත්තර දෙනවා මම දැක්කා. එහෙම මාස ගණනක ප්‍රමාදය අකාර්යක්ෂමතාව මිසක් වෙන එකක් නොවෙයි, ඇමතිතුමනි. හැබැයි, ඔබතුමා බොහොම කාර්යක්ෂමව කටයුතු කරලා අනුරාධපුර නගර සභාවේ නගරාධිපති අපේක්ෂකතුමාගේ තහනම ඉවත් කරපු වැඩේ නම් කරලා දුන්නා. අර Cycling Federation එකේ ක්‍රීඩාවට සම්බන්ධ වෙන්න බැහැ කියලා නේපාලයේ ගිහින් තහනම් කර සිටියේ, "කරු අයියා" කියලා කෙනෙක්. "කරු අයියා" කියලා ජනාධිපතිතුමා කථා කරන කෙනා. ඔහුගේ තහනම නම් ඉක්මනට ඉවත් කරලා පළාත් පාලන මැතිවරණයට ඉදිරිපත් වෙන්න අවස්ථාව දුන්නා. එච්චර ඉක්මනට -යුහුසුළුව- පනත් ක්‍රියාත්මක කරන්නත් කටයුතු කරන්න කියලා ක්‍රීඩා ඇමතිතුමාගෙන් මම ඉල්ලනවා.

ඒ වාගේම මේ ආණ්ඩුව ක්‍රීඩාව සම්බන්ධයෙන් කටයුතු කරන්න සුගත් තිලකරත්න කියලා නියෝජ්‍ය ඇමතිවරයෙක් පත් කරගෙන තිබෙනවා. ක්‍රීඩාව ගැන දන්නා කෙනෙක් ක්‍රීඩා නියෝජ්‍ය ඇමතිවරයා හැටියට පත් කරගෙන, ක්‍රීඩාව ගැන දන්නා අය තමයි දැන් ඉන්නේ කියලා ජනතාවට කිව්වා. සුගත් තිලකරත්න නියෝජ්‍ය ඇමතිතුමා මේ සභාවේ ඉන්නවා නම්, -මම එතුමාගෙනුත් මේ කථාව ඇහුවා- මීට පෙර සිටි ක්‍රීඩා නියෝජ්‍ය ඇමතිවරුන්ගෙන් සිදු වුණාට වඩා ඔබතුමාගේ පැමිණීම හරහා ක්‍රීඩාවට සිද්ධ වෙච්ච සේවය පිළිබඳව අදහසක් කියන්න ඔබතුමාට පුළුවන් වෙන්න ඕනෑ. හේතුව, ඔබතුමා පත් වන්නේම විශේෂ icon එකක් විධියට. ඔබතුමාගේ පත්වීම ඇතුළේ මිනිස්සු බලාපොරොත්තු වුණා, මීට පෙර ක්‍රීඩාවට වෙච්ච දේ සිදු නොවෙයි කියලා. නමුත්, මම ඔබතුමාගෙන් එක් දෙයක් දැක්කා. මගේ අදහස නම්, ඒකත් අසාර්ථකයි. රුපියල් 10,000ක් ලබා දීම හරහා ක්‍රීඩකයෙකුට ඔලිම්පික් මට්ටමට යන්න බැහැ, ක්‍රීඩා නියෝජ්‍ය ඇමතිතුමනි. හේතුව, මම අර කලින් කියපු කාරණය. අපේ රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය අලුත් තත්ත්වයකට ගෙනෙන්න ඔබතුමන්ලාට වුවමනා නම්, කරුණාකර ලංකාවේ ක්‍රීඩා විශ්වවිද්‍යාලයක් හදන්න. Faculty එකක් නොවෙයි, faculties තිබෙනවා. අපට ක්‍රීඩා විශ්වවිද්‍යාලයක් හදන්න වුවමනායි. සබරගමුව වාගේ ඉඩ තිබෙන ප්‍රදේශයක් අරගෙන දක්ෂතා ඇති ළමයින් තෝරාගෙන ඔවුන්ව මේ විශ්වවිද්‍යාලයට අනුබද්ධ පාසලකට ඇතුළත් කරලා, එතැන ඉඳලා උගන්වලා, අවශ්‍ය දැනුම ලබා දීලා, ක්‍රීඩාවට අමතරව ඉතිරි විෂයනුත් උගන්වලා, ඒ හරහා විශ්වවිද්‍යාල උපාධියක් අරගෙන, ඒ උපාධිය හරහා මේ අයව උපාධියක් තිබෙන ක්‍රීඩකයන් වශයෙන් ඔලිම්පික් සහ ජාත්‍යන්තර මට්ටමට ගෙනයන්න ඕනෑ. රුපියල් 10,000ක් දීලා, පෝෂණය ලබා දීලා මේක කරන්න බැහැ. ඒක යල් පැන ගිය ක්‍රමයක්. ඔබතුමා ඊට වඩා ඉදිරි පියවරක් තබයි කියලා මම හිතද්දී, ඊට මෙහා එකක් තමයි ඔබතුමා කළේ. ඒකෙන් සාර්ථක ප්‍රතිඵල එයිද කියලා අපි බලමු, මේ අවුරුදු 5ක කාල සීමාව තුළ. මම විශ්වාස කරනවා, එහෙම ප්‍රතිඵල එන්නේ නැහැ කියලා. මම නැවත කියනවා, අපේ රටේ ක්‍රීඩාව තිබෙන්නේ පරීක්ෂණාගාර ඇතුළේ බව. ක්‍රීඩකයෙකුට තමන්ගේ දක්ෂතාව පෙන්වන්න වුවමනා වුණාට, දක්ෂතාව පෙන්වන්න ඒ ක්‍රීඩකයා ලැහැස්ති වන විධිය අපට අනිවාර්යයෙන්ම ඔහුට කියා දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. වෛද්‍යවරුන් සහ ක්‍රීඩාව පිළිබඳ විශේෂඥයන් - විශේෂයෙන්ම sports scientistලා - අපට වුවමනා කරනවා. එවැනි ප්‍රමාණවත් පිරිසක් අපේ රටේ ඉන්නවාද?

මේ සාකච්ඡා කරන ආයතනයට අවශ්‍ය සභාපතිවරයාව සොයාගන්නත් අපට සැහෙන කාලයක් ගත වුණා. මම හිතන විධියට, එතුමා අද රාජ්‍ය නිලධාරින්ගේ මැදිරියට ඇවිල්ලාත් ඇති. ඔබතුමා ඇවිල්ලා ඉන්නවා නම්, ඇත්තටම ලංකාවට සාදරයෙන් පිළිගන්නවා. එතුමා කියුබාවේ ඉඳලා ඇවිල්ලා සිටින, ක්‍රීඩාව සම්බන්ධ ආචාර්ය උපාධියක් තිබෙන කෙනෙක්. ඔබට මේ රටේ විශාල කාර්යයක් පැවරෙනවා, ක්‍රීඩාව පිළිබඳව ලොකු වගකීමක් පැවරෙනවා. මොකද, අපේ රට ක්‍රීඩා පැත්තෙන් පසුපසින් සිටින රටක්; ක්‍රීඩාවෙන් ඉදිරියට යන්න ඕනෑ රටක්. නමුත්, තවම අපේ රට සිටින්නේ පිටුපසින්. ඔබ සැහෙන බලාපොරොත්තු සහගතව කියුබාවෙන් ආපු දේශපාලන පත්වීමක්. මම ඒකත් කියන්න ඕනෑ. දේශපාලන පත්වීම් කරන එකට විරුද්ධව ආපු ආණ්ඩුවක්, මේ ආණ්ඩුව. මම දේශපාලන පත්වීම්වලට විරුද්ධ නැහැ. දේශපාලන පත්වීම් ලබපු දක්ෂ මිනිස්සු ඉන්නවා. ඒ මිනිස්සුන්ගෙන් වැඩ ගන්න ඕනෑ. ඒ වාගේම ඔය ආයතනයේ වෛද්‍යවරියක් ඉන්නවා. මට එතුමියගේ නම හරියට මතක නැහැ. එතුමියත් ක්‍රීඩාව වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉෂ්ට කරනවා. ඒ නිසා එතුමියට අවශ්‍ය ශක්තිය ලබා දෙන්න සභාපතිතුමා. දේශපාලන පත්වීම් තුළත් දක්ෂ මිනිස්සු ඉන්නවා.

මේ සභාව ඇතුළෙදි කියනවා, 76 අවුරුද්දක ශාපයක් ගැන. ඒ වාගේම මොකක් හරි යුද්ධයක් ගැන මේ විවාදය අස්සේත් කියවනවා. මේ වන විට 77වන අවුරුද්දත් ගෙවී ගිහින් ඉවරයි. දැන් 78වන අවුරුද්ද එන්නේ. ඒ නිසා අලුත් පියවරකට අඩිය තියන්න ඕනෑ. ඒ 76 අවුරුද්ද ඇතුළේත් සිදු වුණේ, ක්‍රීඩකයෙකුට

[ගරු අමිල ප්‍රසාද් මහතා]

සල්ලි ටිකක් දෙන එක, ආපුවාම තෑග්ගක් දෙන එක. ඒකම කරන ගමන් තවදුරටත් කියනවා, 76 අවුරුද්දක ශාපයක් ගැන. මොකක්ද, මේකේ තේරුම? කෝ, අලුත් පියවර? පනත් කෙටුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාදයි. මම මේ කියන ක්‍රීඩා විශ්වවිද්‍යාලය තවම ආරම්භ කරලා නැහැ. සමහර මැෂින් තිබෙනවා, ඒ මැෂින් ක්‍රියා කරවන්න අවශ්‍ය අය තවම සූදානම් කරලා නැහැ. මේ වාගේ වැඩ ගොඩක් කරන්න තිබෙනකොට තවමත් 76 අවුරුද්දක් ගැන කියව කියවා ඉන්නවා. නමුත් මේ වන විට 77වන අවුරුද්දත් ඉවර වුණා කියන එකත් මම කියන්න කැමැතියි.

මේ තහනම් උත්තේජක කියන ක්‍රියාවලිය සිදු වෙන්නේ ඇයි? ලංකාවේ ක්‍රීඩා පුහුණුකරුවන්ට අවශ්‍ය දැනුම ලබා දීමේ ගැටලුවක් තිබෙනවා. ලංකාවේ පාසල්වල ක්‍රීඩා පුහුණුකරුවන් ඉන්නවා. මොකද, පසුගිය කාල සීමාවේ සෑම පාසලකටම ක්‍රීඩා පුහුණුකරුවන් බඳවාගත්තා. මේ ක්‍රීඩා පුහුණුකරුවන්ගේ පත්වීමේ ඉඳලා තවම ගැටලු තිබෙනවා. ක්‍රීඩාව පිළිබඳව උපාධියක් ලබා දීලා, ඒ අයව මොකක් හෝ ක්‍රමයකින් නැවතත් අධ්‍යාපනයට අරගෙන, ඒ අයව නිසි සුදුසුකම් සහිත තත්ත්වයකට පත් කරලා, level 01, level 02, level 03 වාගේ තත්ත්වයට ගන්න ඕනෑ. ඒක ක්‍රිකට් ක්‍රීඩාවට අදාළව ICC එකෙන් සූදානම් කරලා තිබෙනවා මම දැක්කා. Coaching level 01, level 02, level 03 කියලා තිබෙනවා. ICC එක මතක් වූ නිසායි මම ඒක කිව්වේ. ලංකාවේ ජාතික ක්‍රිකට් කණ්ඩායමේ පුහුණුකරුවා මේ කියන පුහුණුවීම ලබලා ද ඉන්නේ කියලා හොයා බලන්න ඕනෑ.

ක්‍රීඩකයෙකු දක්ෂ වූ පමණින්, දක්ෂ පුහුණුකරුවෙකු වන්නේ නැහැ. පුහුණුකරුවාගේ දක්ෂතාව ප්‍රමාණවත් ලෙස නැත්නම්, පුහුණුකරුවාට මේ දැනුම නැත්නම් සිද්ධ වෙන්නේ මොකක්ද? තමන්ගේ දක්ෂතාව පෙන්වන්න ක්‍රීඩකයන්ට තහනම් උත්තේජක ලබා දෙනවා, පුහුණුකරුවන්ගේ දැනුවත් කිරීමෙන්. ක්‍රීඩකයෙකු දැනුවත්ව හෝ නොදැනුවත්ව ගන්න කිසියම් බෙහෙතක් නිසා හෝ කිරිපිටි වර්ගයක් නිසා ඒක තහනම් උත්තේජක ගණයට වැටිලා එම ක්‍රීඩකයාගේ රුධිරයේ හෝ මුත්‍රාවල එම සංයුතිය අවශ්‍ය මට්ටම ඉක්මවා ගිහිල්ලා තිබෙනවා නම්, තහනම් කළ යුතු වන්නේ ක්‍රීඩකයාගේ ක්‍රීඩා කිරීම නොවෙයි, පුහුණුකරුගේ තනතුරයි.

අපේ රටේ තහනම් උත්තේජක ලබා ගැනීම් සිද්ධ වෙනවා. මේක අමුතුවෙන් හංගන්න දෙයක් නොවෙයි. පාසල් මට්ටමේ සමස්ත ලංකා තරගවලදී පවා මේ තහනම් උත්තේජක දෙනවා. ඒක රහසක් නොවෙයි. විශේෂයෙන්ම අපේ රටේ ප්‍රධාන පාසල්වල රග්බි, කරාටේ, බර එසවීම වැනි ක්‍රීඩාවන්හිදී මේ ක්‍රියාවලිය වෙනවා. හැබැයි අපට තවම lab එකක් නැහැ, මේ සියලු පර්යේෂණ ටික ලංකාව ඇතුළේ කරන්න. ඔබතුමන්ලා පසුගිය අවුරුදු 76ක් ගැන කියවන්නේ නැතිව මේ අවුරුද්දේවත් lab එකක් පටන් ගන්න විධියක් හොයන්න ඕනෑ. මේ මුත්‍රා සාම්පල, රුධිර සාම්පල යවන්නේත් අහඹු ලෙස තෝරාගෙන. ඒවාත් යවන්නේ ඉන්දියාවට, නැත්නම් සිංගප්පූරුවට. ඒකට ලොකු වියදමක් යනවා වාගේම මාස ගණනක් ගත වනවා. කවුරු හෝ කෙනෙක් ඉහළ දක්ෂතාවක් ප්‍රදර්ශනය කළොත් ඒ ක්‍රීඩකයාගේ හෝ ක්‍රීඩිකාවගේ එම සාම්පල් අරගෙන බලනවා. එහෙම නොවෙයි කරන්න ඕනෑ. මේ අය සියලුදෙනාම පරීක්ෂා කරන්න පුළුවන් lab system එකක් ලංකාව තුළ හදලා, එහෙම නැත්නම් මේ ආයතනය තව ටිකක් විමධ්‍යගත කරලා -ආයතන කිහිපයක් බවට පත් කරලා- මේ ඉන්න දක්ෂ මිනිස්සුන්ගෙන් වැඩ ගන්න ක්‍රමයක් අපි හොයන්න ඕනෑ. එහෙම නැතිව මේ ක්‍රියාවලිය කරගෙන යන්න බැහැ.

වයස අවුරුදු 16දී, 17දී, 18දී අසාමාන්‍ය කුසලතා පෙන්වන අය අවුරුදු 24, 25 වෙනකොට ලංකාව තුළ පදක්කමකට නොයන්නේ ඇයි? එකම හේතුව, මේ තහනම් උත්තේජක භාවිතය. මේක තෝරා ගත් ක්‍රීඩකයන්ගෙන් ඉහළ දක්ෂතා ප්‍රදර්ශනය කරවන්නට පුහුණුකරුවන් විසින් කරන වැඩක්. පුහුණුකරුවන්ට බැණලා වැඩකුත් නැහැ. හේතුව, මේක ඇතුළේ තිබෙන භෞතික විද්‍යා මූලධර්ම සහ අනෙකුත් සියලු කාරණා පිළිබඳව ඒ අයට උගන්වන්නේ නැතිව ඒ අය තමුන්ගේ දක්ෂතා ප්‍රදර්ශනය කරන්නේ කොහොමද? එතකොට පුහුණුකරුවා බලනවා, වෙන ක්‍රමයකින් මේ දක්ෂතාව පෙන්වන්න පුළුවන්ද කියලා. එම නිසා පුහුණුවේ වැදගත්කම සහ දැනුම ලබා දීමේ වැදගත්කම මොකක්ද කියන එක ගැනත් අපි බලන්න ඕනෑ. විශේෂයෙන්ම ක්‍රීඩාවෙන් සමුගත් ගමන් පුහුණුකරුවෙකු බවට පත්වීමට කලින් ඔවුන්ට තහනම් උත්තේජක පිළිබඳ දැනුම, ක්‍රීඩාව පිළිබඳ දැනුම, තාක්ෂණය පිළිබඳ දැනුම ආදී සියල්ල ලබා දුන්නේ නැත්නම්, අපට කවදාවත් මේ රටේ දක්ෂ පුහුණුකරුවෝ හදන්න බැහැ. දක්ෂ පුහුණුකරුවෝ හදන්නේ නැතිව කවදාවත් දක්ෂ ක්‍රීඩකයෝ නිර්මාණය කර ගන්නත් බැහැ. ඒක තමයි මේකේ කථාව. ඒ කියන්නේ කවුරු හෝ ක්‍රීඩකයෙකු අපට හම්බ වෙනවා, ක්‍රිකට් ක්‍රීඩාවට අදාළව ගත්තොත්, පැයට කිලෝමීටර 150ක වේගයෙන් දුවන්න පුළුවන් අයෙක්. එහෙම එක්කෙනෙක්, දෙන්නෙක් අපට හම්බ වෙනවා. එහෙම නැත්නම් තරුණ ළමයෙකු අපට හම්බ වෙනවා, පැයට කිලෝමීටර 140ක විතර වේගයෙන් බෝල දමන්න පුළුවන් කෙනෙක්. හැබැයි, ඒ ළමයාට තිබෙන තාක්ෂණික දැනුම ප්‍රමාණවත් නැහැ. ඔහු දුවගෙන එන විධියේ ගැටලු තිබෙනවා. ඊට අමතරව ඔහුගේ ත්වරණ කාල සීමාවේ අර්බුද තිබෙනවා, අත කරකවන විට ඇතිවන ව්‍යාවර්තයේ ගැටලු තිබෙනවා, බලය ලබා ගත යුතු ස්ථානය පිළිබඳව දන්නේ නැහැ. මේ අය ඇවිල්ලා ස්වාභාවික විධියට බෝල දානවා. ඒ අයට තව රුපියල් 10,000ක් දුන්නා කියලා මේ වැඩේ හරියට වෙන්නේ නැහැ. අන්න ඒ අයව ගෙනැල්ලා විශ්වවිද්‍යාලයකට ඇතුළත් කරලා, මේ ආයතනය මේ ඉන්න නිලධාරින්ට භාර දීලා academy එකක් බවට පත් කරලා මේ දැනුම දෙන්න ඕනෑ. දැන් අලුතින් කැමරාවක් ගෙනැල්ලා තිබෙනවා, තත්පරයකට shots 1,000ක් ගන්න පුළුවන්. තවම ඒකෙන් වැඩ අරගන්නේ නැහැ. ඇයි? නිලධාරින්ගේ ප්‍රශ්න තිබෙනවා. ඒගොල්ලන්ට අවශ්‍ය පහසුකම් ටික දෙන්න ඕනෑ. ඒගොල්ලන්ට මොනවත් කියලා වැඩක් නැහැ. තත්පරයකට shots 1,000ක් වදින කැමරාවක් කියන්නේ කොයි තරම් සාර්ථක එකක්ද?

මේ කියන දේවල් සම්බන්ධයෙන් පහසුකම් ටික නිසියාකාරයෙන් ක්‍රියාත්මක කර ගැනීමේ වගකීම මේ ආණ්ඩුවට තිබෙනවා. එහෙම නොවුණොත් මොකද වෙන්නේ? පසුගිය කාලයේ අපේ හොඳ, දක්ෂ ක්‍රිකට් ක්‍රීඩකයන්ට වෙච්ච දේවල් වාගේම අනික් ක්‍රීඩකයන්ට වෙච්ච දේවලුත් අපි දැක්කා නේ. ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍ය සුගත් තිලකරත්න මැතිතුමාත් සභාවේ සිටින නිසායි මේ දේවල් මම මේ කියන්නේ. ඔබතුමා ක්‍රීඩා කළ කාල සීමාවට වඩා දැන් අනතුරු වැඩියි කියලා ඔබතුමාටත් පෙනෙනවා. ඇයි ඒ? ඒකට හේතුව තමයි, මේ කියන ආකාරයට නිසි පුහුණුව නොලැබීම. චමින්ද වාස් ගත්තොත්, ඔහු අවුරුදු ගණනක් injuries නැතිව සෙල්ලම් කළා. හැබැයි, ලංකාවේ Cricket Team එකේ කීයෙන් කී දෙනාටද pace bowling කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ? තව වැදගත් හේතුවක් තිබෙනවා. ක්‍රීඩාවට සම්බන්ධ තවත් ආයතන අපේ රටේ තිබෙනවා. අනතුර සිද්ධ වුණාට පස්සේ ඒක යථා තත්ත්වයට පත් කර ගන්න ඒ ආයතනවල යම් වැඩ පිළිවෙළක් තිබෙනවා. හැබැයි, මේක වෙන්න කලින් මම කියපු ආකාරයට, දුවන style එක වෙන්න පුළුවන්, බෝලය දමන්න අත කරකවන විධිය වෙන්න පුළුවන්, උස පනින කෙනෙකු නම් ඒ පනින විධිය වෙන්න පුළුවන්, ඒවා පිළිබඳව විද්‍යාත්මක පර්යේෂණ කරන්න සුදුසු විධියේ වැඩ

පිළිවෙළකට තවම අපි ඇවිල්ලා නැහැ. අනෙක් රටවල ක්‍රීඩකයෙක් ඔලිම්පික් පදක්කමක් ගත්තාම ඔහුගේ නමින් සඳහන් වෙන්නේ අහවල් විශ්වවිද්‍යාලයේ ක්‍රීඩකයෙක් කියලායි. අපට එහෙම එකක් නැහැ. එම නිසා මේක මීට වඩා පුළුල් ලෙස අපි දැකිය යුතු වනවා. ක්‍රීඩකයන් තහනම් උත්තේජක භාවිත කිරීමට හේතු වන්නේ, නිසි දැනුම, නිසි පුහුණුව, ඊට අමතරව තමන්ගෙන් අපේක්ෂා කරන මට්ටමට වඩා වැඩි ප්‍රමාණයක දක්ෂතාවක් ලබා ගැනීමට දරන උත්සාහය නිසා වෙන්න පුළුවන්.

පාසල් මට්ටමේ ඉඳලා මේ පිළිබඳව අවධානය යොමු කරලා, සියලු ජාතික ක්‍රීඩාවලට සහභාගි වන අයගේ මුත්‍රා සාම්පල්, රුධිර සාම්පල් පරීක්ෂා කරන්න labs හදලා, ඊට අමතරව ඒගොල්ලන්ගේ ක්‍රීඩා කෞශල්‍යය තාක්ෂණිකව දියුණු කරන්න තිබෙන ආයතනවලට මේ අයව ගෙනැල්ලා, ඒ අයට ඕනෑ කරන පහසුකම් ටික ලබා දීලා, සබරගමුව වාගේ විශ්වවිද්‍යාලයකට අනුබද්ධව ක්‍රීඩා පාසලක් නිර්මාණය කරලා, ඒකෙන් උපාධියක් අරගෙන එන්න පුළුවන් තත්ත්වයට ඒ අයව පත් කරලා, දැනට පාසල්වල ක්‍රීඩා කටයුතු කරන ක්‍රීඩා පුහුණුකරුවන්ට මීට වඩා ඉහළ තත්ත්වයකට දැනුම ලබා දීලා, ඔවුන් උපාධිධාරින් බවට පත් කළ යුතුයි.

ඒ වාගේම ක්‍රීඩකයෙක්, පුහුණුකරුවෙක් වෙන්න කලින් ඔවුන්ට අවශ්‍ය කරන විභාග ටික පවත්වන්න ඕනෑ. මෙවැනි විශාල කාර්ය ප්‍රමාණයක් කරන්න තිබෙන අතරතුර මේ වාගේ පනත් ගෙන ඒම ප්‍රමාදවීමම ගැටලුවක්. ඒ නිසා මීට වඩා කාර්යක්ෂමව ලෝකය දිහා බලමින් ක්‍රීඩාව තුළින් පදක්කම් ලබා ගන්න වුවමනා නම් මේ ඉන්න නිලධාරින්ට අවශ්‍ය කරන පහසුකම් නිසියාකාරව සපයන්න ඕනෑ. මිනිසුන්ව සතුටු කරන එක රුපියල් 10,000ක් හෝ රුපියල් 5,000ක් හෝ රුපියල් 2,000ක් දීලා කරන්න බැහැ. කළ යුතු වෙනත් දේවල් ඊට වඩා ඉස්සරහින් තිබෙනවා. එළඹෙන දශකය තුළ හෝ ලංකාවට ඔලිම්පික් ඇතුළු ක්‍රීඩා උළෙලවලින් ජයග්‍රහණ ලබා ගන්න ඕනෑ නම් අලුත් විධියට හිතන්න කියලා ආණ්ඩුවට යෝජනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු සුගත් තිලකරත්න මහතා (ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுகத் திலகரத்ன - விளையாட்டுத்துறைப் பிரதி அமைச்சர்)
(The Hon. Sugath Thilakaratne - Deputy Minister of Sports)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා කිව්වා, ළමයින්ට රුපියල් 10,000ක දීමනාවක් විතරයි දෙන්නේ කියලා. ආරම්භයේදී පාසල් මට්ටමේ ළමයි නවසිය ගණනකට තමයි අපි ඒ දීමනාව දුන්නේ. හැබැයි, අපි ජාතික මට්ටමේ - ඔලිම්පික්, ආසියානු සහ පොදු රාජ්‍ය මණ්ඩලීය පරිසාධන මට්ටම්වල- සිටින ළමයින්ට මේ වෙනකොට රුපියල් ලක්ෂ 1 ½කුත්, ඊට අමතරව පෝෂණ දීමනාව විධියට රුපියල් 60,000කුත් ලෙස රුපියල් 210,000ක මුදලක් ලබා දෙනවා. කාණ්ඩ 4ක් යටතේ ඒ මුදල් මේ වෙනකොට අපි ලබා දී තිබෙනවා. ඒ, දෙවැනි කාණ්ඩය යටතේ රුපියල් 100,000කුත්, තුන්වැනි කාණ්ඩය යටතේ රුපියල් 75,000කුත්, හතරවැනි කාණ්ඩය යටතේ රුපියල් 50,000කුත් වශයෙන්.

ඒ වාගේම, පුහුණුකරුවන්ටත් යම් ගෙවීමක් අපි කරලා තිබෙනවා. මෙතෙක් කල් අපි පුහුණුකරුවන්ට දීමනා වශයෙන් ලබා දීලා තිබෙන්නේ සාමාන්‍යයෙන් Asian Games, එහෙම නැත්නම් Commonwealth Games වාගේ විශේෂ ක්‍රීඩා උළෙලක් අරබයා විතරයි. හැබැයි, මෙවර අපි පුහුණුකරුවන්ටත් ඒ ගෙවීම් කරලා තිබෙනවා. ක්‍රීඩකයන්ට ලබා දුන් මුදලින් තුනෙන් එකක වාගේ මුදලක් පුහුණුකරුවන්ටත් ලබා දීලා තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඊට අමතරව පුහුණුකරුවන් ගැනත් කථා කළා. විශේෂයෙන් පාසල් පුහුණුකරුවන් සම්බන්ධයෙන් ගැටලුවක් තිබෙනවා. ඔවුන් අතර මේ වෙනකොටත් අනධ්‍යයන මට්ටමේ සහ සුදුසුකම් නැති අය ඉන්නවා. අපි ඔවුන්ව දැනුවත් කරන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අපි ඉදිරියේදී සැලසුම් කරනවා, මේ විශේෂඥ දැනුම ලබා ගන්න. ඒ කියන්නේ, විදෙස් පුහුණුකරුවන් ලංකාවට ගෙන්වලා, ලංකාවේ ඉන්න පුහුණුකරුවන්ව දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක් අපි ඉදිරියේදී ක්‍රියාත්මක කරන්න සැලසුම් කරලා තිබෙනවා. මොකද, එක් එක් ක්‍රීඩාවන්ට අදාළව පුහුණුකරුවන් පිට රටකට යවනවා නම් අපිට පුහුණුකරුවන් දෙතුන් දෙනෙකු පමණයි යවන්න වෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක අපිට පාඩුයි. නමුත් අපි බලාපොරොත්තු වෙන්නේ විදෙස් පුහුණුකරුවන් ලංකාවට ගෙනැල්ලා ඔවුන්ගේ දැනුම විශාල පිරිසකට එකවර ලබා දෙන්නයි. ඒ අනුව මේ වැඩ පිළිවෙළ ඉදිරියේදී ක්‍රියාත්මක වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The next speaker is the Hon. Roshan Akmeemana. You have 10 minutes.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. (Prof.) Sena Nanayakkara to the Chair?

**ගරු සුගත් තිලකරත්න මහතා**
(மாண்புமிகு சுகத் திலகரத்ன)
(The Hon. Sugath Thilakaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

[අ.භා. 1.52]

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)

මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති (සංශෝධන) පනත විවාදයට ගන්න මේ අවස්ථාවේදී

[ගරු රොෂාන් අක්මීමන මහතා]

බොහොමයක් කථිකයන් මේ පනත් සංශෝධනය ගැන ප්‍රමාණවත් කරුණු දැක්වීමක් කරපු නිසාත්, ඒ සම්බන්ධයෙන් විපක්ෂයේ මන්ත්‍රීවරු මතු කරපු යම් යම් ගැටලු ගැන අපේ ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා ප්‍රමාණවත් පැහැදිලි කිරීමක් කරපු නිසාත් මගේ කථාව තුළ මම කැමැතියි, මේ විවාදය අතරතුර විපක්ෂය විසින් ආණ්ඩුවට ඉදිරිපත් කරපු යම් විවේචන කිහිපයකට පිළිතුරු ලබා දෙන්න.

ඇතැම් අය මතු කළා, ආණ්ඩුව අකාර්යක්ෂමයි, ආණ්ඩුව හිතපු තරම් සාර්ථකව ක්‍රියාත්මක වෙන්නේ නැහැ කියලා. මට හිතෙනවා, විපක්ෂයේ මන්ත්‍රීවරුනුත් තහනම් උත්තේජක පාවිච්චි කරලාද දන්නේ නැහැ ඒ කථාව කියන්නේ කියලා. එම නිසා මම හිතුවා, ඒ ගැන යම් අදහස් ප්‍රමාණයක් පළ කළා නම් හොඳයි කියලා.

මේ රටේ ජනතාව විශේෂයෙන් අපේ පක්ෂයට ආණ්ඩු බලය ලබා දුන්නේ, මේ රට භාර දුන්නේ system change එකකට. එක පැත්තකින් ආර්ථික ක්‍රමය වෙනස් කරන්න. අසමානතාව පිරි අසාධාරණ ආර්ථික ක්‍රමය වෙනස් කරලා ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය ඇති කරන්නත්, දේශපාලන ක්ෂේත්‍රයේ තිබුණු වංචා හා දූෂණ ඉවත් කරලා, යම් ඉදිරි පියවරක් තබා යහපත් දේශපාලන සංස්කෘතියක් ඇති කරන්නත්, සමාජ දේහයේ ඇති වෙලා තිබෙන යම් යම් තුවාල, ඇති කරන ලද තුවාල සුවපත් කරන්නත් තමයි මේ රටේ ජනතාව කෙටි කාලීනව මේ ආණ්ඩුවෙන් බලාපොරොත්තු වුණේ. ඒ වාගේම දීර්ඝ කාලීන වශයෙන් ජනතාව බලාපොරොත්තු වුණේ, අපේ රටේ ආර්ථිකය සංවර්ධන මාවතකට රැගෙන යන්න ඕනෑ කියන එකයි. ඒ කියන්නේ, මේ රට දියුණු රටක් බවට පත් කරන්න ඕනෑ කියන එක මේ රටේ ජනතාව දීර්ඝ කාලීනව මේ ආණ්ඩුවෙන් බලාපොරොත්තු වුණා. අපි සංවර්ධිත රටක් බවට පත් වනවා කියන්නේ, එය දීර්ඝ කාලීන වැඩක්. ඒ වෙනුවෙන් අපි විශාල පියවරක් ඉදිරියට තබන්න ඕනෑ. එය ලෙහෙසි වැඩක් නොවෙයි. හැබැයි, එවැනි දීර්ඝ කාලීන ගමනක් යන්න නම්, අපි ඊට කලින් රටේ වැඩ කරන ජනතාවගේ, ව්‍යාපාරිකයන්ගේ, ආයෝජකයන්ගේ, අපිත් එක්ක ගනුදෙනු කරන විදේශ රටවල විදේශ ආයෝජකයන්ගේ හා ජාත්‍යන්තර ආයතනවල විශ්වාසය දිනා ගන්න ඕනෑ. ඒ සඳහා දේශපාලන සහ ආර්ථික ස්ථාවරභාවය ඇති කර ගන්න ඕනෑ. එම නිසා අපේ ආණ්ඩුවේ මුල් කාල පරිච්ඡේදය -ඒ කියන්නේ, පළමු මාස 10, 11, පළමුවැනි අවුරුද්ද- අපි වෙන් කළේ අන්න ඒ විශ්වාසය, අන්න ඒ දේශපාලන සහ ආර්ථික ස්ථාවරභාවය ඇති කරන්නයි.

අපේ fiscal ප්‍රතිපත්තියත්, මහ බැංකුව තමන්ගේ මූල්‍ය ප්‍රතිපත්තියත් පසුගිය මාස කිහිපයේදී ක්‍රියාත්මක කළේ මෙන්න මේ ආර්ථික ස්ථාවරභාවය ඇති කර ගන්නයි. ඉතින්, අපි අභ්‍යන්තර ආර්ථිකය ගත්තත්, අපේ විදේශ අංශය ගත්තත්, සියලු ආර්ථික දර්ශකවලින් පැහැදිලි වෙන්නේ අප ඉතාම කෙටි කාලයක් ඇතුළත මෙන්න මේ ආර්ථික ස්ථාවරභාවය ඇති කරගෙන තිබෙනවාය කියන එකයි. මොකද, ආසියානු සංවර්ධන බැංකුව, ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පවා අපේක්ෂා කළාට වඩා ඉක්මනින් අපි එම අපේක්ෂා කළ ඉලක්ක ඉක්මවා ආර්ථික ස්ථාවරභාවය මේ වනකොට ඇති කරගෙන තිබෙනවා. පසුගිය අවුරුද්දේ පළමු මාස නවයේ ලබා ගත් රේගු ආදායමට වඩා සියයට 55කින් මේ වසරේ පළමු මාස නවයේ රේගු ආදායම වැඩි කර ගන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. පසුගිය සැප්තැම්බර් මාසයේ විතරක් අපේක්ෂා කළ, එහෙම නැත්නම් ඉලක්ක කළ රේගු ආදායම ඉක්මවා සියයට 37කින් එය වැඩි කර ගන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. එයට හේතු වුණේ රේගු යාන්ත්‍රණයේ ඩිජිටල්කරණය, under-invoicing වාගේ දේවල් සමීපව අධීක්ෂණය කිරීම හා ඒවා නියාමනය කිරීම වාගේ කාරණා. එම නිසා රේගු ආදායම ඉතා ශීඝ්‍රයෙන් ඉහළ ගියා. ඒ විතරක් නොවෙයි. මේ අවුරුද්දේ පළමු මාස අට තුළ රාජ්‍ය ආදායම පසුගිය අවුරුද්දට සාපේක්ෂව සියයට 30කින් වැඩි වෙලා තිබෙනවා. අපි මේ අවුරුද්දේ ඇස්තමේන්තුගත කළ රජයේ සමස්ත ආදායමෙන් සියයට 65ක් මේ වනකොට උපයාගෙන අවසන්. ඒ අනුව අපට හිතා ගන්න පුළුවන්, මේ අවුරුද්දේ මුල අපි රාජ්‍ය අය වැය ලේඛනයෙන් අපේක්ෂා කළ රාජ්‍ය ආදායමටත් වඩා, ඒ ආදායම් ඉලක්කය ඉක්මවා සමහර විට රජයේ ආදායම වැඩි කර ගන්න අපට පුළුවන් වෙයි කියලා. එහෙම වුණොත් මේ රටේ ඉතිහාසයේ ප්‍රථම වතාවට තමයි ඇස්තමේන්තුගත කළ රජයේ ආදායම ඉක්මවා රාජ්‍ය ආදායමක් ලබා ගන්න පුළුවන් වෙන්නේ.

ඊළඟට, අපි මේ අවුරුද්දේ අපේ රාජ්‍ය අය වැය ලේඛනයේ ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක් බලාපොරොත්තු වුණා. අපි මේ අවුරුද්ද අවසාන වෙද්දී ඉලක්ක කළේ ප්‍රාථමික ගිණුමේ රුපියල් බිලියන 750ක අතිරික්තයක්. හැබැයි, පළමු මාස 8 අවසාන වෙද්දීම ප්‍රාථමික ගිණුමේ රුපියල් බිලියන 1,300ක පමණ අතිරික්තයකට යන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. ඒ නිසා අපි මේ අවුරුද්දේ අපේක්ෂා කරපු අපේ ප්‍රාග්ධන වියදම් කරන එක ගැන, අපේ සංවර්ධන ව්‍යාපෘති කරන එක ගැන දැන් අපිට බාධාවක් නැහැ. අපි අපේක්ෂා කරපු ආකාරයෙන් අපේ ඉතුරු සංවර්ධන ව්‍යාපෘති ටික මේ අවුරුද්දේ අවසාන මාස කිහිපය තුළ කරන්න අපිට පුළුවන් වෙලා තිබෙනවා.

ඊළඟට, අපේ විදෙස් ශ්‍රමික ප්‍රේෂණ පසුගිය අවුරුද්දට සාපේක්ෂව සියයට 18කින් ඉහළ ගිහිල්ලා තිබෙනවා. අපනයන ක්ෂේත්‍රයේ සමස්ත අපනයන සියයට 6කින් වැඩි වෙලා තිබෙනවා. ජංගම ගිණුමේ පසුගිය මාස කිහිපයේදීම අපි අඛණ්ඩව අතිරික්තයක් වාර්තා කරලා තිබෙනවා. මේ අවුරුද්දේ අපි අපේක්ෂා කරපු ආර්ථික වර්ධන වේගය සියයට 5යි. මේ අවුරුද්දේ පළමු කාර්තු දෙකේ අපි එක දිගට -අඛණ්ඩව- සියයට 5ක ඉලක්කයට ළඟා වුණා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ආසියානු සංවර්ධන බැංකුව, ලෝක බැංකුව පවා අපේක්ෂා කළේ අපි ආර්ථික වර්ධන වේගයේ සියයට 3ක, සියයට 4ක වාගේ ඉලක්කයක ඉඳියි කියලා. හැබැයි, අපි ඒ ප්‍රමාණය ඉක්මවා සියයට 4ත්, සියයට 5ත් අතර ඉලක්කයට ඇවිල්ලා තිබෙනවා. මේ ඉලක්කගත ආර්ථික වර්ධන වේගයට වඩා ආර්ථික වර්ධන වේගය සියයට 1.5කින් වැඩි වුණා කියලා අපි සතුටු වෙන්නේ ඇයි? අපේ ජනතාව බලාපොරොත්තු වෙනවා, අපේ ආණ්ඩුවේ දීර්ඝ කාලීන ඉලක්කය විධියට අපි සංවර්ධිත රටක් බවට පත් වෙයි, ඉහළ ආදායම්ලාභී රටක් බවට පත් වෙයි කියලා. ඒක ලෙහෙසි, පහසු ඉලක්කයක් නොවෙයි. අපි බංකොලොත් වෙච්ච රාජ්‍යයක්; ණය ගෙවා ගන්න බැහැ කියලා හංවඩු ගැහුණු රාජ්‍යයක්; දූප්පත්කම සියයට 25ක් දක්වා ඉහළ ගිය රාජ්‍යයක්; සේවා වියුක්ති අනුපාතය ඉහළ ගිය රාජ්‍යයක්. එතැන ඉඳන් අපි හීනයක් දකිනවා, ඉහළ ආදායම්ලාභී රටක් වෙන්න. මේක හීනයක් නොවී තිබෙන්න නම් අපි සැලසුම් සහගතව වැඩ කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඉහළ ආදායම්ලාභී රටක් වෙන්න නම් මොකක්ද කරන්න ඕනෑ? මේ මොහොතේ ඉහළ ආදායම්ලාභී රටක් කියලා හඳුන්වන්නේ වාර්ෂික ඒක පුද්ගල ආදායම ඩොලර් 14,000කට වැඩි රටවල්. ඒ නිසා අපි 2050 අවුරුද්ද වෙනකොට හෝ ලෝකයේ ඉහළ ආදායම්ලාභී රටක් බවට පත් වෙන්න ඕනෑ නම් ඒ කාලය වෙද්දී ඩොලර් 30,000ක ඒක පුද්ගල ආදායම් ඉලක්කයකට යන්න ඕනෑ. අන්න එහෙම ඉලක්කයකට යන්න නම් මේ ඉදිරි දශක දෙක තුළ අපි අඩුම ගණනේ සියයට 6ක, 7ක ආර්ථික වර්ධන වේගයක් පවත්වා ගන්න ඕනෑ. ඒ නිසා අපි මේ ඉලක්කගත කරන ආර්ථික වර්ධන

වේගයන් සහ පහු කරනු ලබන සෑම ආර්ථික වර්ධනයක්ම ඉතාම සතුටින් භාර ගන්නවා. අපි ඒ ගැන කථා කරනවා වාගේම සතුටු වෙනවා. ඒ වාගේම අපි පහළ මැදි ආදායම්ලාභී රටක ඉඳන් ඉහළ ආදායම්ලාභී රටක් බවට පත් වෙන්න ඉලක්ක කරනවා කියන එක ඉතා අසීරු කාර්යයක්. මීට කලින් අපේ රටේ ගොඩාක් අය මේ රට සංවර්ධනය කරනවා කියලා ආවාට ඒක කර ගන්න බැරි වුණා. මේක අපේ රටේ කවුරුවත්, කිසිම ආණ්ඩුවක් අපේක්ෂා නොකරපු ඉලක්කයක්. අපි අන්න එහෙම ඉලක්කයක් වෙනුවෙන් මහන්සි වෙන්න ඕනෑ. නමුත්, මේක ඉතා අපහසු කාර්යයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ග්‍රීක මිථ්‍යා කථාවක් වන හර්කියුලිස්ගේ කථාව මට මේ අවස්ථාවේදී මතක් වෙනවා. හර්කියුලිස්ට එතෙක් හිටපු කාටවත් කරන්න බැරි වුණු කාර්යයන් 12ක් භාර දුන්නා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

කවුරුවත් ධෛර්යසම්පන්න වුණේ නැහැ, ඒ කාර්යයන් 12 කරන්න. ඒ කාර්යයන් 12 කරන්න කියලා හර්කියුලිස්ට භාර දුන්නා. ඒ කාර්යයන් 12 ඇතුළේ තිබෙන එක කාර්යයක් තමයි, ඔළු 9ක බිහිසුණු සර්පයෙක් විනාශ කිරීමේ කාර්යය. මේ ඔළු 9 සර්පයා විනාශ කිරීමේ කාර්යය හර්කියුලිස්ට භාර දුන්නා. ඉතින්, අන්න ඒ වාගේ ඔළු 9ක සර්පයෙක් විනාශ කරන්න තමයි අපිට භාර දීලා තිබෙන්නේ. පාතාලය, මත්ද්‍රව්‍ය, ආර්ථික වශයෙන් බංකොලොත් වෙච්ච, දේශපාලන වශයෙන් කඩා වැටුණු, සමාජ දේහය පිරිහුණු රටක් අපට භාර දීලා තිබෙන්නේ. හර්කියුලිස්ට ආපු බාධාව තමයි, මේ සර්පයාගේ ඔළුව කපන්න, කපන්න ඒ කපන හැම ඔළුවකින්ම ඔළු දෙකක් මතු වෙන්න පටන් ගත්ත එක. ඒ නිසා ඒක අපහසු කාර්යයක් විධියටයි පෙනුණේ. දැන් අපිටත් ඒ වාගේ තත්ත්වයකට තමයි මුහුණ දෙන්න වෙලා තිබෙන්නේ. අපි ආර්ථිකය ස්ථාවර කරගෙන, දේශපාලනය ස්ථාවර කරගෙන, ආර්ථික වර්ධන වේගයට යනකොට උසාවි භූමියේදී "ගනේමුල්ලේ සංජීව" නමැත්තාට වෙඩි තියලා මැරුවා. පාතාලය අතර ගැටුම එතැනදී පටන් ගත්තා. ගනේමුල්ල සංජීවගේ ඝාතකයා හොයා ගෙන යනකොට "කෙහෙල්බද්දර පද්මේ" කියලා කෙනෙක් හමු වුණා. කෙහෙල්බද්දර පද්මේව අල්ලන්න යනකොට තවත් පාතාල නායකයන් කිහිප දෙනෙක් හමු වුණා. ඒ පාතාල නායකයන්ගෙන් ප්‍රශ්න කරගෙන යනකොට ඔවුන්ට උදවු කරපු, ඔවුන්ගේ මත්ද්‍රව්‍ය, අයිස් කන්ටේනර් පිටින් හංගාගෙන හිටපු මනම්පේරි කියලා හිටපු පළාත් පාලන මන්ත්‍රී අපේක්ෂකයෙක් හමු වුණා. ඔහු කලින් පැවති ආණ්ඩුවේ දේශපාලන යන්ත්‍රණයේ හිටපු පොහොට්ටුවේ සංවිධායකයෙක් බවත් හෙළි වුණා. ඔහුගෙන් තවත් ප්‍රශ්න කරගෙන යනකොට ඔහු රාජපක්ෂලාගේ හිතවතෙක්, ජොන්ස්ටන් ප්‍රනාන්දු හිටපු ඇමතිවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයෙක් කියලාත් හෙළි වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. ඊට සති කිහිපයකට කලින් "මිද්දෙනියේ කජ්ජා" කියන කෙනා ඝාතනය කරන්න ආයුධ සැපයුවේත් ඔහු කියලා හෙළි වුණා. මිද්දෙනියේ කජ්ජා ගැන පරීක්ෂණ කරනකොට හෙළි වුණා, ඔහු තාජුඩීන් ඝාතනය කළ වෙලාවේ ඔහුගේ වාහනය පිටුපසින් ගිය කෙනෙක් කියලා. ඝාතනය වෙන්න මාසයකට කලින් ඔහු කියලා තිබෙනවා, "රාජපක්ෂලාගේ සියලු දේවල් මම දන්නවා. මම ඒවා හෙළි කරනවා" කියලා. මේ වාගේ, අපි විනාශ කරන්න ආවේ ඔළු 9ක සර්පයෙක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
මම අවසන් කරනවා. මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ සර්පයාගේ ඔළු එකින් එක කපාගෙන යනකොට එතැනින් තව ඔළු දෙකක් මතු වෙනවා. ඒ නිසා හර්කියුලිස් අනුගමනය කළ උපාය මාර්ගයක් තිබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔහු තීරණය කළා, සර්පයාගේ බෙල්ල කපනකොට ගිනියම් වෙච්ච කඩුවකින් කපන්න ඕනෑ කියලා. නැත්නම් එතැනින් ආයේ තව ඔළු දෙකක් මතුවෙනවා. අද අපිත් කරන්නේ ඒක තමයි. අපි පසුගිය මාස අටක් තිස්සේ කඩුව ගිනියම් කළා. දැන් අපි මේ ඔළු නවයේ සර්පයා විනාශ කරන්න පටන් අරගෙන තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, මේ රටේ ජනතාව අපේක්ෂා කරපු, මේ රටේ ජනතාව බලාපොරොත්තු වන ස්ථාවර සංවර්ධිත රට බිහිකිරීම වෙනුවෙන් වැඩ කරන්න. ඒකට අපට යම් කාලයක් ගත වෙනවා. අපි ඒ වෙනුවෙන් වැඩ කරමින් ඉන්නවා කියා මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.02]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදයට අද දවසේ සම්බන්ධ වීමට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. ආණ්ඩුව ගොඩක් දේවල් කරලා තිබෙනවා. අපට හිතෙනවා, ආණ්ඩුවට අවුරුදු පහ වෙනකොට අර නොබෙල් තෑග්ගත් ලැබෙයි කියලා. එහෙම නේද, අපේ මන්ත්‍රීතුමා? ඔබතුමන්ලාට නොබෙල් තෑගි එහෙම ලැබෙනවා නේ, ඔබතුමන්ලා කරලා තිබෙන ඒවාට. ඔබතුමන්ලාගේ ඇමතිවරුම කියනවා නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝක ඉතිහාසයේ වැඩියෙන්ම බොරු කියපු, ඒ බොරුවටත් බොරුව කරපු, ඒ වැඩ පිළිවෙළ සොයා ගත්ත ආණ්ඩුව හැටියට ඔය කියන වැරදිච්ච නොබෙල් තෑග්ග තමුන්නාන්සේලාගේ ආණ්ඩුවට නම් නිසැකයෙන්ම ලැබෙනවා කියලා මට හිතෙනවා.

අද උදේ විපක්ෂ නායකතුමා ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නයක් ඇහුවා, රටට ආයෝජන ආවේ කොහෙන්ද, කාගෙන්ද, කොපමණද කියලා. ඒ ප්‍රශ්නයට උත්තර දුන්නේ නැහැ. හැබැයි,

[ගරු චමින්ද විජේසිරි මහතා]

ඇමතිවරයාට, එහෙම නැත්නම් සභානායකවරයාට, එහෙම නැත්නම් ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයාට බැරි වෙච්ච දේ දැන් මන්ත්‍රීවරයෙක් එතුමාගේ කථාවේදී කියනවා. විපක්ෂ නායකවරයා රීත්‍යානුකූලව කියනවා, ආයෝජන කොහෙන්ද ආවේ, කොතැනින්ද ආවේ කියලා තොරතුරු දෙන්න කියලා. අකුල් හෙළන්න නොවෙයි. ආයෝජන ඇවිත් තිබෙනවා නම් අපි සතුටු වෙනවා. හැබැයි, ඒ තොරතුරු අද දවසේ දෙන්න බැහැ. එළියේ ජනතාව කියන්නේ නැති නිසා, ඡන්ද දායකයා මේක ගැන කථා කරන්නේ නැති නිසා, ආදායම ලැබෙන්න ඇති, ආදායම් වියදම් ගිණුම ආණ්ඩුවට සරු වෙන්න ඇති, ඔබතුමන්ලා අය වැය පරතරය පියවා ගන්න ඇති. හැබැයි ඒ සියලු දේ ගිණුම් වශයෙන්, මුදල් වශයෙන්, දත්ත වශයෙන් තිබුණාට වැඩක් වෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද වෘත්තිකයාට, කම්කරුවාට, පාරේ දුක් විඳින ජනතාවට ඒවා ලැබිලා නැහැ. ඒ නිසා ක්‍රීඩකයින් ක්‍රීඩාවේ යෙදීමේදී උත්තේජක ගැනීම කියන කාරණය පිළිබඳව නීති කෙටුම්පත් කරනවා වාගේම දේශපාලන වශයෙන් උත්තේජනය අරගෙන ඒ උත්තේජක පාවිච්චි කරලා කටයුතු කරන තමුන්නාන්සේලාට විරුද්ධව ගන්නා වූ වැඩ පිළිවෙළ පිළිබඳවත් හිතන්න වෙනවා. නැද්ද මම අහන්නේ? කල්පනා කරලා බලන්න.

අද මම එනකොට පාරේ හිටපු පුද්ගලයෙක් කිව්වා, "මහත්තයෝ, මේ ආණ්ඩුව විදුලි බිල අඩු කරන්න ආවේ. විදුලි බිල ඒකක වශයෙන් ගෙදරට අඩු කරන්නේ කොහොමද, ව්‍යාපාරවලට අඩු කරන්නේ කොහොමද කියලා ජනාධිපතිවරයා කාලසටහන් එක්කයි කිව්වේ. දැන් ජනාධිපතිවරයා මොනවා හරි, ආණ්ඩුව මොකක් හරි උත්තේජකයක් පාවිච්චි කරනවාද දන්නේ නැහැ, මහත්තයෝ. දැන් එයාලා මේක වැඩි කරන එක පිළිබඳ මහජන උපයෝගිතා කොමිෂමෙන් අහනවා ලු. අහවල් එකටද අහන්නේ?" කියලා. එයාලා ආවේ අඩු කරන්නයි, ලජ්ජා නැතිව, හිරිකිත නැතිව එයාලා අඩු කරනවා කියපු ක්‍රමවේදයෙන් බැහැර වෙලා දැන් ගිහිල්ලා මහජන උපයෝගිතා කොමිසමෙන් අහනවා ලු, විදුලි බිල වැඩි කරන්න ඕනෑද, අඩු කරන්න ඕනෑද කියලා. ඇත්තටම රටේ ජනතාවට ප්‍රශ්නයක් තිබෙනවා, ඔබතුමන්ලා උත්තේජක පාවිච්චි කරනවාද කියලා. මේවාට අවශ්‍ය වැඩ පිළිවෙළ හදන්න දෙවියනේ. අවුරුද්දක් ගත වුණා. දැන් අපි පාර හරියට හදාගත්තා කියලා කියනවා. ඒක හොඳයි. හැබැයි, ඒක රටට දැනිලා නැහැ. රටේ පුරවැසියාට දැනෙන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හදලා නැහැ. ඒකයි තිබෙන ගැටලුව; ප්‍රශ්නය.

මෙවර ඒ අවශ්‍ය, ඔබින, ගැළපෙන විධියට ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ තිබෙන වැඩ පිළිවෙළ හදන එක හොඳයි, ගරු ඇමතිතුමනි. හැබැයි ඔබතුමා කියනවා, ක්‍රීඩකයින්ගෙන් ගන්න රුධිර සාම්පල, මුත්‍රා සාම්පල පරීක්ෂා කරන්න ස්ථානයක්, වැඩ පිළිවෙළක් අපේ රටේ නැහැ, ඒවාත් අපි විදේශ රටවලට යවනවා කියලා. එහෙම යවන සියලු දේ පර්යේෂණවලට භාජන කරලා උත්තේජක පාවිච්චි කරලා නැහැ කියන කාරණය තහවුරු කිරීම නිශ්චිතවම අපට පිළිගන්න පුළුවන්ද? ඉතිහාසයේ අපි දැක්කා, විවිධ රාජ්‍යයන්ට ජයග්‍රහණ ලබා ගන්න වැඩ පිළිවෙළේදී විවිධ ක්‍රීඩකයින්ගේ දක්ෂතා, විවිධ ක්‍රීඩා -ඒ සියල්ල- ඔවුන්ට ඕනෑ විධියට, ඔවුන්ට අවනත වන විධියට අවශ්‍ය වැඩ පිළිවෙළ හදාගත්ත බව. එම ක්‍රමවේදයෙන් මිදෙන්න පුළුවන් වැඩ පිළිවෙළක් මේ සංශෝධනවල තිබෙනවාද කියලා තමුන්නාන්සේලා අපට කියන්න. මේ ගන්නන්වාලේ හැම වැඩ පිළිවෙළක්ම අරගෙන ජාත්‍යන්තරයට, විදේශ කුමන්ත්‍රණවලට ඔබින විධියට, ගැළපෙන විධියට ඔබතුමන්ලා හැඩ ගැහිලා තිබෙනවා. හැබැයි, බලයට එන්න කලින් තමුන්නාන්සේලා එහෙම නැහැ. බලයට එන්න කලින් කිව්වේ, ජාත්‍යන්තර කුමන්ත්‍රණවලට, විදේශ සංවිධානවලට ඔබින විධියට, ගැළපෙන විධියට තමුන්නාන්සේලා හැඩ ගැහෙනවා කියලා නොවෙයි. කෝ, අද ඒ වැඩ පිළිවෙළ? ඒවා නැහැ නේ. ඒවා කරනවා කියලා ආපු උදවියට අද ඒ සියලු දේවල් අමතක වෙලා තිබෙනවා.

ඒ කාලයේ යාපනයේ ක්‍රීඩා පිටියක් හදන්න අපේ විපක්ෂ නායකතුමා ගිහිල්ලා කථා කරපු වෙලාවේ ඔබතුමන්ලා මොනවාද කිව්වේ? ඔබතුමන්ලාගේ කට්ටිය සමහර තැන්වලදී හිනා වුණා. හැබැයි, ඊයේ පෙරේදා ගිහිල්ලා ඒ ක්‍රීඩා පිටිය හදන්න අවශ්‍ය වැඩ පිළිවෙළ කළා. ඒක හොඳයි. හැබැයි, තිබෙන ප්‍රශ්නය මොකක්ද? ක්‍රිකට් ක්‍රීඩාව විනාශ කරන, ක්‍රිකට් ක්‍රීඩාවේ සූදු කෙළින, ක්‍රිකට් ක්‍රීඩාව තමන්ගේ ආදායම බවට පරිවර්තනය කරනවා කියලා කෑ ගහපු ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ඒ සභාපතිවරයා ඇතුළු කණ්ඩායම එක්ක කරට අත දමා ගෙන ජනාධිපතිවරයා ඒක හදන්න අවශ්‍ය නියෝග, වැඩ පිළිවෙළ දෙනකොට හිරිකිතයක් නැද්ද? ලජ්ජාවක් නැද්ද? ඒවා රටේ ජනතාව බලාගෙන ඉන්නවා. ඒවා ජනතාව දන්නවා. එදා ඔබතුමන්ලා විපක්ෂයේ ඉදිරි පෙළේ ඉඳගෙන ක්‍රිකට් ගිල ගන්න, ක්‍රිකට් අළෙවි කරන, ක්‍රිකට් සූදුවක් බවට පරිවර්තනය කරන්න කටයුතු කරන්නේ කවුද කියලා නම් වශයෙන් කියලා කෑ ගහපු උදවිය අද ළඟ තියාගෙන කටයුතු කරමින්, ඔබතුමන්ලාගේ නොහැකියාව වසන් කරගන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හදාගන්න මේ පනත් ගෙනැල්ලා කටයුතු කරනවාදෝ කියන සැකය අපට තිබෙනවා.

අපේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාත්‍යන්තර වශයෙන් රටට ගෞරවය ගේනවා වාගේම, ක්‍රීඩාවේ උන්නතිය, පැවැත්ම වෙනුවෙන් අපි පෙනී හිටිනවා වාගේම රටක ශක්තිමත් ශරීර සෞඛ්‍යයෙන් හෙබි පුරවැසියෙක් නිර්මාණය කිරීමට ක්‍රීඩාවේ වැදගත්කමක් තිබෙන බව මතක තබාගන්න. හැබැයි, අද පාසල් මට්ටමේ ඉඳලා ක්‍රීඩාව නිසි විධියට ගේන්න පුළුවන් වැඩ පිළිවෙළක් නිර්මාණය වෙනවාදෝ කියන සැකය අපට තිබෙනවා. අද පාසල් යන දරු දැරියන් අධ්‍යාපනයට යොමු වෙනවා වාගේම ක්‍රීඩාවෙන් ඈත් වෙනවාදෝ කියන සැකයත් අපට තිබෙනවා. අපිත් හොඳ ක්‍රීඩකයෝ. නමුත්, අපේ ක්‍රීඩා පිටි අද කැලෑ බවට පත්වෙලා තිබෙනවා අපි දකිනවා. ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අවශ්‍ය විධියට, ක්‍රීඩාවට රුචිකත්වය -කැමැත්ත- පෙලඹීම ඇති වෙන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළක් ඔබ අමාත්‍යාංශය විසින් අනිවාර්යයෙන් නිර්මාණය කළ යුතුව තිබෙනවා. ග්‍රාමීය මට්ටමේ තිබෙන විවිධ ක්‍රීඩා අද බිඳ වැටී තිබෙනවා, ගරු ඇමතිතුමනි. ඒකට හේතුව සොයා බලන්න. අද බොහෝ අම්මලා තාත්තලා දරුවන්ට උගන්වන්න මූලිකත්වය දීලා තිබෙනවා. ඒක වැරදි නැහැ. හැබැයි, ශරීර සෞඛ්‍ය පිළිබඳවත්, ක්‍රීඩාව පිළිබඳවත්, එයින් රටට සහ ඔබට ලැබිච්ච දේවල් පිළිබඳවත් එයට සෘජුව සම්බන්ධ පුද්ගලයෙක් හැටියට ඔබතුමා හොඳට දන්නවා ඇති ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ඒ නිසා එවැනි වැඩ පිළිවෙළක් නිර්මාණය කිරීම ගැනත් හිතන්න කියන කාරණය ඔබතුමාට මතක් කරනවා.

හැම වෙලාවේම -හැම මොහොතේම- තමුන්නාන්සේලාගේ පැවැත්ම වෙනුවෙන් කටයුතු කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හදලා තිබෙනවා. සමහර මන්ත්‍රීවරු, සමහර ඇමතිවරු කථා කරන හැම වෙලාවේම -හැම මොහොතේම- පසුගිය ආණ්ඩුවල වැරදි ටික පෙන්වා දීලා, ඔබතුමන්ලා තමයි හොඳ, ඔබතුමන්ලා තමයි සුපිරි, ඔබතුමන්ලා තමයි හොඳටම කරගෙන යන්නේ කියන කාරණය කියන්න උත්සාහ කරනවා. එහෙම කරන්න බැහැ. මීට වඩා වගකිව යුතු වගකීමක් තමයි ඔබතුමන්ලාට මේ රටේ බහුතර පුරවැසියා භාර දී තිබෙන්නේ. ඔබතුමන්ලා අද කන්ටේනර් අල්ලනවා, කුඩු අල්ලනවා කියලා කෑ ගැහුවාට අවසානයේ ඒ කන්ටේනර් පිටුපස ඉන්නේ තමුන්නාන්සේලා. ඒ කුඩු ජාවාරම් පිටුපස ඉන්නේ තමුන්නාන්සේලා සහාය දීපු උදවිය. එතකොට, ඒගොල්ලන් ඔබතුමන්ලාගේ නොවෙයි. හැබැයි, ඉතිහාසයේ හිටපු ඒ කණ්ඩායම්වලට ඇඟිල්ල දිගු කරලා ඒ අය එක්ක ෆොටෝ

ගහලා තිබෙනවා, ඒ අය තමයි මේක කළේ, ඒ අය තමයි මේ මාෆියාව ගෙනාවේ, ඒ අය තමයි මේ රට විනාශ කළේ කියන කාරණය කියන්න හුදෙක්ම හදන්නේ, ඔබතුමන්ලාගේ පැවැත්ම වෙනුවෙන්.

ඔබතුමන්ලා බලය ගන්න පාවිච්චි කරපු උත්තේජනය මොකක්ද? හොරු අල්ලනවා කියපු එක; හොරුන්ට දඬුවම් දෙනවා කියපු එක. හැබැයි, අද මොකක්ද ඒ හොරු කරන්නේ? අද ඔබතුමන්ලා මයිනෝ ෆෝම් කරනවා. අද, මයිනෝ ඔබතුමන්ලාට විරුද්ධව නඩු දමන්න කියනවා. ඒ නඩු ෆයිල් ගෙනැල්ලා හිරේ දමන්න කියනවා. එහෙම නොවෙයිද අද වෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? මෙතුමන්ලා විසින් හිරේ දමනවා කියපු උදවිය අද කියනවා, පුළුවන් නම් හිරේ දමන්න කියලා. ඔබතුමන්ලාට ලජ්ජාවක් නැද්ද කියා අපි අහනවා. අපි එහෙම කියන්නේ ඔබතුමන්ලා කියපු දේ නොකරන නිසා. ඒ උදවිය අද වීරයෝ බවට පත් වෙලා ඉන්නවා. මේ පාර්ලිමේන්තුවේ ඇවිල්ලා කෑ ගහනවා. මේ පාර්ලිමේන්තුවේ ඇවිල්ලා කෑගහනවා, පුළුවන් නම් අපි හිරේ දමන්න කියලා. හැබැයි, එතැනින් ඒක කරගන්න බැරි වුණාම, එතැනින් ඒක කරන්න තමුන්නාන්සේලා දන්නේ නැති වුණාම, ෆයිල් මිටි ගණන් ඩබල් කැබ්වල තිබෙනවා, ඒවා ගෙනැල්ලා පැය 24න් කටයුතු කරනවා කියලා කිව්ව ඒ බලාපොරොත්තු කෝ, දැන්? ඒවා සුනු විසුනු වෙලා ගිහින් තිබෙනවා. මෙන්න මේ කාල වකවානුව තුළ ඔබට ඉටු කරන්න බැරිවෙච්ච බොහෝ දේවල් පිළිබඳව අපි විපරමෙන් ඉන්නවා. ඒ නිසා ඔබ අද උත්තේජන අරගෙන මේ රටේ පුරවැසියා, ඡන්ද දායකයා නොමඟ යවන දේශපාලනික වැඩ පිළිවෙළක යෙදෙන බව තේරුම් ගන්න කියලා පුරවැසියාට අපි කියනවා. ඒ අය නිසි වෙලාවට, නිසි තැනට අවශ්‍ය දඬුවම දෙන්න සූදානමක ඉන්නවා. ඔබ ඉදිරි පළාත් සභා මැතිවරණයට එන්න. ඔබ ඒ උත්තේජනය අරගෙන මේ රටේ ජනතාව මෝහනය කරපු වැඩ පිළිවෙළට ඒ පළාත් සභා මැතිවරණය තුළදී රටේ ජනතාව නිසි පණිවුඩයක් ලබා දෙන බව නිසැකයි.

එහෙම නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොරුවට ආයුෂ නැහැ. හැමදාම බොරු කියලා, බොරුව කරලා, තමන්ගේ ආණ්ඩුව බොරුවෙන් රැක ගන්න පුළුවන් කියලා ආණ්ඩුවේ අය හිතනවා නම්, එහෙම බැහැ. බොරුවෙන්ම තමයි ඔබතුමන්ලාට ගෙදර යන්න වෙන්නේ. අද ඔබට අවලාද අහන්න ලැබිලා තිබෙන්නේ, ඔබට, ඔබේ පවුලට, ඔබේ දරුවාට සමහර වෙලාවට මහ පාරේ යන්න බැරි වෙලා තිබෙන්නේ අප නිසා නොවෙයි. හැබැයි, ඉතිහාසයේ අපට, අපේ දරුවන්ට, සමහර දේශපාලන නායකයන්ට මහ පාරේ යන්න බැරි තැනට මඩ ගැහුවා, තමුන්නාන්සේලා. අද මොකද වෙලා තිබෙන්නේ? මම දැක්කා, ගාල්ල පැත්තේ, ඔබතුමන්ලාගේ නියෝජ්‍ය අමාත්‍යවරයෙකුට වෙච්ච දේ. මගේ හිතට ඒ ගැන ලොකු කනගාටුවක් ඇති වුණා. එතුමාගේ වත්කම් හා බැරකම් ප්‍රකාශය පිළිබඳ යම් කාරණයක් එතුමා සමාජයට කිව්වා. හැබැයි, ඒකෙන් සමාජය ගත්තේ මොකක්ද? ඒ කාරණය ඇතුළේ තිබුණේ තමන්ගේ පවුල, තමන්ගේ දරුවා ගැන. ඒ මොහොතේ ඒ නියෝජ්‍ය ඇමතිවරයාගේ දරුවා පිළිබඳ දැවැන්ත දුකක්, වේදනාවක් අපට දැනුණා. හැබැයි, ඔබතුමන්ලාටත් දැනෙන්න ඕනෑ, අවුරුදු 76ක් තිස්සේ ආණ්ඩු කරපු හැමෝටම ඔබතුමන්ලා මඩ ගහලා, ඒ අයගේ දරුවන්ට මහ පාරේ යන්න බැරි තැනට පත් කරන කොට, එතුමා අවංකභාවයෙන් පිළිතුරු දුන්නු කාරණය නිසා, අද ඒ දරුවාට පාසලට යන්න බැරි තැනට පත් වෙලා තිබෙනවා කියන එක. අප හැමෝටම දරු පවුලක් ඉන්නවා, හැමෝටම තමන්ගේ පවුලේ කණ්ඩායමක් ඉන්නවා කියන කාරණය අමතක කරන්න එපා. ආණ්ඩුවේ තමුන්නාන්සේලා විපක්ෂයට ඒ චෝදනාව දැනුවත්ව නැඟුවා. හැබැයි, අවසානයේ එවැනි කාරණා අද තමුන්ටම පාරා වළල්ලක් හැටියට එන තත්ත්වයක් අද රටේ, සමාජයේ තමුන්නාන්සේලා විසින්ම නිර්මාණය කරගෙන තිබෙනවා.

විපක්ෂය අද තමුන්නාන්සේලාට මඩ ගහන්නේ නැහැ. තමුන්නාන්සේලාගේ පෙර ක්‍රියාකාරකම් සියල්ල මාධ්‍ය හමුවේ නැවත එළියට ඇවිල්ලා නොවෙයිද අද තමුන්නාන්සේලාට මඩ එල්ල වෙන්නේ? ඒ නිසා එය මතක තබා ගන්න. දැන්වත් ඒක නවත්වන්න. ආණ්ඩුව ඔබතුමන්ලාගේ; පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධුර 159ක් ඔබතුමන්ලාගේ; විධායක ජනාධිපතිවරයා ඔබතුමන්ලාගේ; අගමැතිවරයා ඔබතුමන්ලාගේ; කථානායකවරයාත් ඔබතුමන්ලාගේ. එහෙම තිබියදී කුඩු ගැන කථා කරනවා, පාතාලය ගැන කථා කරනවා, ඒ සම්බන්ධයෙන් දේශපාලනය නායකත්වයට ලේබල් අලවනවා. හැබැයි, ඔබට අද වනකල්, මේ මොහොත වනකල් ඒ එක දේශපාලන නායකයෙකුවත් ගෙනැල්ලා හිරේ දමන්න බැරි වුණා. "මෙයා තමයි කුඩු ගෙනාවේ, මෙයා තමයි පාතාලය පෝෂණය කළේ, මෙයා තමයි අර නම් කියපු ඒ පාතාලයේ උදවිය එක්ක ආයුධ ගනුදෙනු කළේ" කියලා කියන්න පුළුවන්, ඒවා ගැන කථා කරන්න පුළුවන්. හැබැයි, ජනතාව බලාගෙන ඉන්නවා, ආණ්ඩු බලය තියාගෙන, අධිකරණ ඇමතිකමත් තියාගෙන, ඒ සියල්ල තියාගෙන තමුන්නාන්සේලා කියවනවා විතරයි කියන කාරණය දිහා. ඒ බව මතක තබා ගන්න. ඔබතුමන්ලා කියන ඒ හැම වැඩ පිළිවෙළකම අවසානයේ ඔබතුමන්ලාගේ පරාජයයි තිබෙන්නේ.

මම කනගාටු වන කාරණය මේකයි. ඔය ආණ්ඩුව ඇතුළේ ඉන්නවා, ජාතික ජන බලවේගයේ කණ්ඩායම. මම ඒක හැමදාම මතක් කරනවා. අප වාගේම ඒ අයත් රට හැදෙයි, ජාතිය හැදෙයි, ආර්ථිකය හැදෙයි කියන එක දකින්න අවශ්‍ය වැඩ පිළිවෙළත් එක්ක හිටගත්තු, උගතුන්, වියතුන්, බුද්ධිමතුන්, තමන්ගේ වෘත්තිය කැප කරලා ආපු උදවිය. කෝ, එතුමන්ලාගේ පෙනී සිටීම? කෝ, එතුමන්ලාගේ ඒ දේශපාලන වැඩ පිළිවෙළ? ඔබතුමන්ලාට කොන්දක් -කශේරුකාවක්- තිබෙන්න ඕනෑ මේ ඉදිරි පෙළේ ඉන්න

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ටිකට ඇඟිල්ලෙන් ඇනලා කියන්න, "අපි ආවේ ඔබතුමන්ලා යන ඒ හොර ගමන යන්න නොවෙයි, එය නිවැරදි කරන්නයි. හොඳ ගමනක් යන්නයි" කියලා. නමුත්, එහෙම වෙන්නේ නැහැ. එහෙම කරන්න බැහැ. හැබැයි, එහෙම කළොත් අවසානයේ මොකද වෙන්නේ? පසුගිය ආණ්ඩුව කාලයේ වැඩියෙන්ම ගෙවල් නැති වුණේ කාගේද? උගතුන්ගේ, වියතුන්ගේ, බුද්ධිමතුන්ගේ. එතුමන්ලාත් "වියත් මඟ" හැටියට ආවේ අවංකවම මේ රට හදන්න. හැබැයි, තමන්ගේ දේශපාලන නායකයන්ගේ කඳවුරුවල හිටගෙන, ඒ ගොල්ලෝ කියපු හැම අලුකුත්තේරු වැඩක් එක්කම හිටගත්තු නිසා අවසානයේ එතුමන්ලාට මොකද වුණේ? ඒ නිසා NPP එකේ උදවියගෙන් මම ඉල්ලීමක් කරනවා, ඔබතුමන්ලා මේ JVP එකේ නඩයේ දේශපාලනික බලාපොරොත්තු ඉටු කරන්න යනවාද නැද්ද කියන කාරණය ගැන හිතලා, මේ රට ගොඩගන්න පුළුවන් තැන හිටගෙන, මේ රටේ අනාගතය හදන්න අවශ්‍ය මහ පෙන්වීම ලබා දීමේ වගකීම ඉටු කරන්න කියලා. එම ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නීතිඥ සුනිල් වටගල නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.15]

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම බෙහෙවින් සතුටු වෙනවා, අද දින, ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත සම්මත කර ගැනීම සඳහා වන විවාදය පැවැත්වෙන මේ වෙලාවේ, වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි විශේෂයෙන්ම පැකිළෙන්නේ නැහැ, ජාත්‍යන්තර නීති, සංකල්ප, හොඳ දේවල් අපේ රටට උකහා ගැනීමට. මෙය දේශීය පනත් කෙටුම්පතක් ලෙස සම්මත කරලා, දේශීය අවශ්‍යතාවලට අනුව කටයුතු කිරීමට හැකි වීම සම්බන්ධයෙන් අපි බෙහෙවින්ම සතුටු වෙනවා. අද ඇති වී තිබෙන්නේ එසේ කටයුතු කරන තත්ත්වයක්. ගරු අජිත් පී. පෙරේරා මැතිතුමාත් කිව්වා, එය ජාත්‍යන්තර නීති සංකල්පයක් බව. ඇත්ත, 2013 අංක 33 දරන පනතත් ඒ ආශ්‍රයෙන් ආපු එකක්. අද අපි ඒ ජාත්‍යන්තර නීතියේ තිබෙන හොඳ ගති ලක්ෂණ උකහාගෙන, දේශීය පනතක් නිර්මාණය කරන වෙලාවක්, මෙය. අපි ඒ පනත් කෙටුම්පත සම්මත කර ගැනීම වෙනුවෙන් කටයුතු කරගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම අවධානයට ලක් කරනවා, ජාතික ජන බලවේගයේ අපේ ආණ්ඩුව ඉලක්ක කරලා පදනමක් නැති, එහෙම නැත්නම් අපව යම් යම් කරුණු කාරණාවලට පටලවන්න උත්සාහ කරන විපක්ෂයේ අසාර්ථක ප්‍රයත්නයන් පිළිබඳව. අද සම්මත කිරීමට නියමිත පනත් කෙටුම්පත පිළිබඳ කථා කරන මේ අවස්ථාවේ ගරු අජිත් පී. පෙරේරා මැතිතුමා තමන්ගේ තර්කය විධියට මතු කළේ මොකක්ද? මේ පනත් කෙටුම්පත හොඳයි; හැබැයි, කලින් දණ්ඩ නීති සංග්‍රහයට ගෙන ආ සංශෝධන මාර ප්‍රශ්නයක්, ලොකු ප්‍රශ්නයක් මේ සමාජයේ ඇති කරලා තිබෙනවා, විශේෂයෙන්ම ඉස්කෝලවල ප්‍රශ්නයක් ඇති කරලා තිබෙනවා කියලායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අදාළ හැන්සාඩ් වාර්තා අරගෙන බලන්න. අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාගේ කථාවේ හරයාත්මක කොටස වුණේ මොකක්ද කියලා. ඒ මොහොතේ මෙහි සිටියා විෂය භාර ගරු අමාත්‍යතුමිය. ඒ මන්ත්‍රීතුමා ගරු අමාත්‍යතුමියට ඇඟිල්ල දිගු කරලා කිව්වා, මේ සියලු කාරණාවලට තමා එකඟ වන නමුත් එක දෙයක් මේකට එකතු වෙන්න ඕනෑ කියලා. එම හැන්සාඩ් හොඳින් පරිශීලනය කරලා බලන්න. "සද්භාවයෙන් කරන වැරැදි" සම්බන්ධයෙන් කියන කොටස ඇතුළත් විය යුතුය කියලා එතුමා කිව්වා. ඊටපසු අවස්ථාවකදී - එතුමාට පසුව කථා කළ කථිකයන් දෙදෙනෙකුට පසුව- මම නැඟිටලා දණ්ඩ නීති සංග්‍රහයේ 74 වගන්තිය ගැන සඳහන් කරමින් කිව්වා, "සද්භාවය" නමැති වචනය සමස්ත පනත් කෙටුම්පතටම අදාළ වෙලා තිබෙනවා. ඒ නිසා "සද්භාවය" නමැති වචනය එකතු කරන්න අවශ්‍ය නැහැ කියලා. නමුත්, අද එතුමා මෙතැනට ඇවිල්ලා, එදා කිව්වාට වඩා සම්පූර්ණයෙන් විරුද්ධ අදහසක් ඉදිරිපත් කරමින් කියනවා ඒ සංශෝධනයම මේ රටේ දරුවන්ට එරෙහි එකක් කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම එතුමන්ලාට කියන්නේ මේ අපරාධය කරන්න එපා කියලායි. යම් නීතියක තිබෙන හරයාත්මක කොටස විතරක් අපි සැලකිල්ලට ගනිමු. මොකද, අප ඒ ගෙනාවේ දරුවන් ආරක්ෂා කිරීමට අදාළ පනත් කෙටුම්පතක්. අඩුම තරමින් මේ පාර්ලිමේන්තුවේ එය සම්මත වුණා නම් කිසි ගැටලුවක් නැහැ. එය සම්මත වෙලාත් නැති තත්ත්වයක් තිබෙන්නේ; කාරක සභා අවස්ථාවට යෑමට නියමිත තත්ත්වයක් තිබෙන්නේ. විශේෂයෙන්ම එය අපරාධ නඩු විධාන සංග්‍රහයත් එක්ක බද්ධ කරලා සම්මත කර ගන්න ඕනෑ තත්ත්වයක් තිබෙන අවස්ථාවකත් අප ඒ පනත් කෙටුම්පත සම්මත කළා යැයි හුවා දක්වමින් එතුමන්ලා මෙතැන කථා කරනවා. තවම එය විවාදයට භාජන වී ඇති කාරණයක්.

ඊට අමතරව, තවත් පරස්පරතා කිහිපයක් ගැන කියන්න මම අවසර ගන්නවා. පසුගිය පාර්ලිමේන්තු සතියේ මේ ගරු සභාවේදී අපේ ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිවරයාටත්, අපේ ගරු වසන්ත සමරසිංහ අමාත්‍යවරයාටත් අදාළව ගල්කිස්ස අධිකරණයේ පවතින නඩුවක් සම්බන්ධයෙන් කරුණු දක්වන්න ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා පැය එකහමාරකට ආසන්න කාලයක් ගත්තා. ඔබතුමාටත් ඒක හොඳින් මතක ඇති, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතුමා මේ සභාව මොන තරම් නම් නොමඟ යැව්වාද? එතුමාම නඩු වාර්තාවක් අරගෙන ඇවිල්ලා කථා කළා. ඒ නඩු වාර්තාව තුළ තිබුණු පරස්පරතාව අපි පෙන්නුවා. පෙන්නලා එය එක තර්කයකට කොටු කළා. මොකක්ද? ඒ තර්කය ඇතුළේ අපි කිව්වා, මොවුන් එම නඩුවේ විත්තිකරුවන් කර නොමැත කියලා. ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා සභාවේ ඉන්න මේ වෙලාවේ මේ ගැන කියන්න ලැබීම ගැන මම ඇත්තටම බෙහෙවින් සතුටු වෙනවා. ඔවුන් සැකකරුවන් කරලා නැහැ කියලා අපි කිව්වා. අපි ඒ තර්කය මතු කළා. ඒ වාදයට පසුව, පසුගිය 26වැනි දා ගරු අධිකරණයේදී නඩුව කැඳෙව්වා. නඩුව කැඳවලා තීන්දුවක් දුන්නා. ඒ තීන්දුවේ මොකක්ද කියන්නේ? තීන්දුවේ හරයාත්මක කොටස හැටියට කියන්නේ වසන්ත හෝ මහින්ද හෝ සැකකරුවන් කිරීමට හැකියාවක් නැති බවයි. එවැනි තත්ත්වයක් තුළ ඒ මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ කාලය මොන තරම් නම් කෑවාද? එය තහවුරු කරන්න ඒ අදාළ වාක්‍යය විතරක් මම කියන්නම්. "පැමිණිලිකරු රුබසිංහ වහලුගේ දයාජි අමරසිංහ නමැති අයගේ ඉල්ලීම -එයා තමයි පැමිණිලිකරු- යම්කිසි නිශ්චිත පුද්ගලයින් සැකකරුවන් ලෙසට නම් කර ඔවුන් අත් අඩංගුවට ගැනීමට නියෝග කිරීමට තරම් හේතුවක් නොමැති බවට මේ අවස්ථාවේදී පැහැදිලිව පෙනී යයි" කියා මෙහි සඳහන් වනවා. කවුද කියන්නේ? විනිශ්චයකාරතුමායි. "විමර්ශන නිලධාරීන් විසින් විමර්ශනය සිදු කර වාර්තා ඉන් අනතුරුව ඔවුන්ට අවශ්‍ය නම් නීතිපතිවරයාගේ උපදෙස් ද ලබාගෙන විමර්ශන අවසන් කර අවසාන වාර්තාව ඉදිරිපත් කළ පසු ඉදිරිපත් කර ඇති නීතිපති උපදෙස් අනුව කටයුතු කරන්නේද, එසේ නොමැති නම් ඉදිරියට නඩු කටයුතු වෙනත් ආකාරයකින් පවත්වාගෙන යන්නේද යන්න තීරණය කිරීමට මහෙස්ත්‍රාත්වරයාට හැකියාව ඇත" යනුවෙන් ද මෙහි සඳහන් වනවා. ඔන්න ආපු අවසන් තැන.

ඊට පස්සේ මොකක්ද කියන්නේ? “ඉහත සඳහන් සියලු හේතු මත මේ අවස්ථාවේදී අපරාධ වරදක් සිදු වී ඇති බවට තීරණය කර මුල් පැමිණිලිකරු විසින් නම් කර ඇති පුද්ගලයන් සැකකරුවන් ලෙසට නම් කර, ඔවුන් අත්අඩංගුවට ගන්නා ලෙසට නියම කරන ලෙසට මුල් පැමිණිලිකරු වෙනුවෙන් කරන ලද ඉල්ලීම ප්‍රතික්ෂේප කරමි.” ඔන්න, මෙතුමා සැකකාරයෙක් කරන්න කියලා කළ ඉල්ලීම ගරු අධිකරණය ප්‍රතික්ෂේප කරලා තිබෙනවා. නමුත් මේ ගරු සභාවේ පැය එකහමාරකට ආසන්න කාලය කාලා දැම්මා බොරු තර්කයක් අරගෙන ඇවිල්ලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපි මේ ක්‍රීඩා පනත් කෙටුම්පතක් ගැන නේ කථා කරන්නේ. ක්‍රීඩා පනත් ගැන කථා කරනකොට අපට මතක් වෙන්නේ මොකක්ද? වසීම් තාජුඩීන් ඝාතනය. ක්‍රීඩා පනත් කෙටුම්පතක් සම්මත වෙන මේ වෙලාවේ අපට මතක් වෙනවා ඔහු මොන තරම් කීර්තිමත් ක්‍රීඩකයෙක්ද කියලා. ඒ ක්‍රීඩකයාගේ ඝාතනයට අදාළව යම්කිසි විමර්ශන කටයුත්තක් මේ වෙලාවේ සිදු වෙනවා. ඒ විමර්ශනය සම්පූර්ණයෙන් යට ගිහිල්ලා තිබෙන්නේ, ඒ විමර්ශනවල සාක්ෂිවල මදය මරලා තිබෙන්නේ, සාක්ෂිවල මදය ගළවලා අයින්

කරලා තිබෙන්නේ. නමුත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවත්, පොලීසියත් මැදිහත් වෙලා ඊට අදාළ විමර්ශන කටයුතු ආරම්භ කරලා තිබෙනවා. ඒ විමර්ශනවලදී එක්තරා පුද්ගලයෙක්, විදානගමගේ අරුණ ප්‍රියශාන්ත නොහොත් කජ්ජා නමැති අයෙක් දර්ශනවල ඉන්නවා කියලා හඳුනා ගත්තා. ඊට අදාළ හඳුනා ගැනීමක් කළා. දැන් කජ්ජා තමයි අපි මේ විමර්ශනවලින් සොයාගෙන යන්නේ. හැබැයි එළියේ පිරිසක් කලබල වෙලා තිබෙනවා. ඒ, දේශපාලනයට සම්බන්ධ පිරිසක්. ඒ කජ්ජා අංක 2, 3 වෙන්න ඇති. හැබැයි ඒ අය දැන් කලබල වෙලා. මොකද, ඒ අය කලබල වෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? දැන් ඒවා හීනෙන් පේනවා ඇති. තමන් කළ අතීත වැරදි, ඒවාට උල්පන්දම් දීපු හැටි, අනුබල දීපු හැටි හීනෙන් පේනවා. හීනෙන් පේනකොට ඉන්න බැහැ, ගිහින් ප්‍රවෘත්ති සාකච්ඡා තියනවා. නමුත් අපි මේ යන්නේ කජ්ජා පසුපස. එතැන කජ්ජා සිටියාද, නැද්ද? එදා කජ්ජා ආශ්‍රය කළේ කවුද? මීට අදාළ පරීක්ෂණ තමයි අපි මේ කරන්නේ. දැන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කජ්ජා සම්බන්ධයෙන් ඔහුගේ භාර්යාවගෙන් කටඋත්තර අරගෙන තිබෙනවා. එදා කජ්ජා ඝාතනයට ලක් කළා. ඒ කටඋත්තර මත පදනම්ව, මරණකරු ගිය පාර දැන් සොයාගෙන යනවා. දුරකථන දත්ත අරගෙන, ඊට අදාළ කුලුනු පරීක්ෂාව කරගෙන, ඊට අදාළ මැදිහත්වීමක් දැන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කරනවා. ඉතින් ඇයි මේ කලබල? ඇයි මේ එළියේ ඉන්න කට්ටිය කලබල? මාර ප්‍රශ්නයක්නේ. තාජුඩීන් ඝාතනයට අදාළව එළියේ කලබලවීමයි, මේ විමර්ශනයයි අතර සම්බන්ධයක් තිබෙනවාද කියලා ඉදිරි පරීක්ෂණවලදී හෙළිදරවු වෙයි. කලබල වෙන්න එපා ඒකට.

ඊට අමතරව අපේ තව කට්ටියක් කලබල වෙලා ඉන්නවා. අපේ කට්ටියක් කියන්නේ අපේ පක්ෂයේ හිටපු කට්ටියක්. මේ පක්ෂයෙන් එළවපු කට්ටියක්. මාර වැඩේ, අපිත් JVP කළා, අපිත් හිටියේ JVP එකේ කියලා දැන් identity එක ගන්න හදනවා. තැන් තැන්වල හතර පිල්වල ලැගලා, ලැගලා, ලැගලා මේ පක්ෂයට කරන්න පුළුවන් උපරිම ද්‍රෝහීකම් ටික කරලා දැන් මොකක්ද කියන්නේ? අපිත් JVP එකේ හිටියා, අපිත් එදා JVP එකේ අහවල් අහවල් තැන හිටියා කියනවා. අමු බින්න, අමු පට්ට බොරු මේ රටේ මිනිස්සුන්ට කියමින් යනවා.

දැන් බලන්න, "පුවක්දණ්ඩාවේ සනා" එක්ක අපේ පක්ෂයේ නායකයන්ට සම්බන්ධයක් තිබුණා, ඒ ගෙදර ගිහින් කෑම කෑවා කියලා මාවරමණ්ඩියේ දේශපාලන හිඟන්නා ප්‍රකාශයක් කළා. ඒක කිව්වාට පස්සේ මේ හිඟන්නාට එන්න කිව්වා තංගල්ල පොලීසියෙන්. ගියේ නැහැ. අදටත් හැංගි හැංගි ඉන්නවා, යන්නේ නැහැ. එහෙම නම් ගිහිල්ලා කියන්න ඒවා ඕනෑ නේ. නේද? ගිහිල්ලා කියන්න ඕනෑ, මෙන්න අනුර දිසානායක ජනාධිපතිවරයා අහවල් දවසේ තමයි කෑම කෑවේ, අහවල් දවසේ තමයි ගියේ කියලා. ඒවා කියනවාද? මේ තනිකර මඩ ව්‍යාපාරයක් අරගෙන යන්නේ. ඊට අමතරව තව කෙනෙක් එයාගේ පෙන්ෂන් එක නැතිවෙයි කියන බයට කිව්වා, එතුමා පරීක්ෂණයක් සඳහා කැඳවපු අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් නීති කම්ටුවේ හිටියා කියලා. මේවා අමු පට්ට බින්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා කිව්වා, ඇවිල්ලා ඒ කියන ලේඛනය ඉදිරිපත් කරන්න කියලා. නමුත් තවම ඒ සම්බන්ධයෙන් වචනයක් නැහැ. ඉතින්, ඔබතුමාට පෙනෙනවා ඇති, මෙන්න මේ සියලු සාධක මත ජාතික ජන බලවේගය සාර්ථකව මේ ගමන යනකොට, ඒ සාර්ථක ගමන ඉදිරියේ ඉස්පිලි පාපිලි හැරෙන්න, වාක්‍ය අතර තිබෙන සම්බන්ධය හැරෙන්න අද මේ විපක්ෂයට අප සම්බන්ධයෙන් එකදු හරයාත්මක විවේචනයක් තිබෙනවාද කියලා.

දැන් විපක්ෂය පැත්තෙන් කියැවුණා, අපි හොරු අල්ලන්නේ නැහැ කියලා. අපි හොරු අල්ලනවා. හොරු අල්ලනවා විතරක් නොවෙයි, මන්ත්‍රීකම කෝටි 8කට විකුණපු අය ගැනත් සොයා බලා ඊට අදාළ මැදිහත් වීම කරන්න කියලාත් අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට කියලා තිබෙනවා. බය වෙන්න එපා, අපි ඊට අදාළ පරීක්ෂණ කටයුතු කරනවා. අපි කියමු, කන්ටේනර් පරීක්ෂණය ස්වාධීන වාර්තාවකින්,- *[බාධා කිරීමක්]* පොඩ්ඩක් අහගන්න. ජනාධිපතිවරයා තමයි ඒ ස්වාධීන පරීක්ෂණය නම් කළේ. ඒක මත එල්ලිලා තමයි දැන් ඔබතුමන්ලා කෑ ගහන්නේ. අපි ඒ තත්ත්වය බලා ගන්නම්. අනිවාර්යයෙන්ම ඒ සම්බන්ධ පරීක්ෂණය කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිලන්ති කොට්ටහච්චි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.29]

**ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියැවීමට අදාළ විවාදය තුළයි අපි මේ ඉන්නේ. අද විපක්ෂයේ බොහෝ මන්ත්‍රීවරු වරින් වර විවිධ දේශපාලනික කතන්දර ඉස්මතු කරමින් තහනම් උත්තේජක ද්‍රව්‍ය භාවිතය නිසා රට ජාත්‍යන්තර වශයෙන් සහ ජාතික වශයෙන් අපකීර්තියට පත් වීම පිළිබඳව බොහෝ කරුණු ඉදිරිපත් කළා. නමුත්, මම කැමැතියි මගේ කථාවේ මිනිත්තු කිහිපයක් පාවිච්චි කරමින් ගෞරවය ලැබිය යුතු තැනැත්තියකට එම ගෞරවය ලබා දෙන්න.

කාන්තා ක්‍රිකට් ලෝක කුසලාන තරගාවලිය මේ වන විට ඉන්දියාවේදී පැවැත්වෙනවා. ශ්‍රී ලංකා කාන්තා ක්‍රිකට් කණ්ඩායමේ වේග පන්දු යවන්නියක වන උදේශිකා ප්‍රබෝධනී පසුගිය දා ශ්‍රී ලංකාව වෙනුවෙන් වාර්තාවක් තැබුවා. කාන්තා එක්දින තරගයකදී කඩුල්ලක් දවාගත් වයස්ගතම ශ්‍රී ලාංකික වේග පන්දු යවන්නිය විධියට තමයි ඒ වාර්තාව තැබුවේ. වයස අවුරුදු 40යි, දින 10ක දී තමයි ඇය මේ වාර්තාව තබන්නේ. ඇය ලංකාව වෙනුවෙන් වාර්තාවක් තබනවා වාගේම, වයස කියන්නේ ඉලක්කමක් විතරයි කියන එකත් මේ රටේ බොහෝ කාන්තාවන්ට, ඒ වාගේම ක්‍රීඩාවේ නියැළෙන බොහෝ තරුණ තරුණියන්ට පාඩමක් විධියට කියා දෙනවා. ඒ වාගේම, තහනම් උත්තේජක නොමැතිව වුණත්, වයස්ගතව වුණත් සාධාරණ ලෙස තරග කිරීමෙන් ජයග්‍රහණ ලබාගත හැකියි කියන පාඩම ඇය ලංකාවට වාගේම ජාත්‍යන්තරයටත් කියා දෙනවා. ඒ නිසා ඇයට උපහාරයක් කරන්න අද මගේ කථාවේ මිනිත්තු කිහිපයක් වෙන් කරන්න මම මුලින්ම කල්පනා කළා.

[ගරු නිලන්ති කොට්ටහච්චි මහත්මිය]

අපේ "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශය ගත්තාම, එහි එක් පරිච්ඡේදයක් පුරාම කථා කරනවා ක්‍රීඩාව වෙනුවෙන් අපි කොහොමද ප්‍රතිපත්ති සකස් කරලා තිබෙන්නේ කියලා. ජවසම්පන්න පුරවැසියෙක්, ජයග්‍රාහී ජනතාවක් බිහි කිරීමට තමයි අපි ක්‍රීඩාව හරහා මේ පස් අවුරුදු සැලැස්ම ඇතුළේ ප්‍රතිපත්ති සම්පාදනය කරමින් යන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තරගයකට සහභාගි වීමෙන් වාගේම, ජයග්‍රහණය කිරීමෙනුත් කෙනකුට අභිමානයක් ගෙන දෙනවා වාගේම, රටට, ජාත්‍යන්තරයට අභිමානයක් ගෙන එන්නත් පුළුවන්. ඒ වාගේම, කායිකව සහ මානසිකව ඉතාම සමබර ජීවිතයක් ගතකරන පුරවැසියෙක්, මනුෂ්‍යයෙක් මේ ලෝකයට බිහි කරන්න පුළුවන්, මේ ක්‍රීඩා තරග ඉසව් හරහා. හැබැයි අපි දන්නවා, ලංකාව කියන්නේ හීන බිඳ වැටුණු රටක්, හීන බිඳ වට්ටපු රටක් බව. ඒකට බලපෑ විවිධ කරුණු තිබුණා. විපක්ෂය හැම තිස්සේම අපට කියනවා, අපි අවුරුදු 76ක ශාපය ගැන කථා කරමින් ඉන්නවා, ඒක ජප කරමින් ඉන්නවා කියලා. හැබැයි, නැවත, නැවත අවධාරණය කළ යුතු සියල්ල කොතෙක් අවධාරණය කළත් කමක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ රටේ ක්‍රීඩාවටත් දේශපාලනික වශයෙන් මැදිහත් වීම්, බලපෑම් සිද්ධ වුණු නිසා ක්‍රීඩාව කඩාගෙන වැටුණු තැන් තිබුණා.

අපි ඒවා ඇන ඇන මතක් කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. අකාර්යක්ෂම පරිපාලනය, දේශපාලනික වශයෙන් කරන අනීතික මැදිහත්වීම්, පෙලඹවීම් වාගේම නගරය පමණක් මුල් කරගෙන සම්පත් කේන්ද්‍රගත කරපු නිසා ගමට, විශේෂයෙන්ම වතුකරයට - අපේ රටේ සම්පත් අවශ්‍ය තැන්වලට - සම්පත් ඌන උපයෝජනය වෙච්ච නිසා, දේශපාලනික වශයෙන් නිවැරදිව තීන්දු තීරණ නොගත් නිසා තමයි තමයි අපට 76 වසරක ශාපය ගැන අද නොවෙයි, හෙටත් මතුරන්න වෙන්නේ. අපි හෙටත් මේ ගැන කථා කරනවා. 76 වසරකට ශාප කරන්න අපට සිද්ධ වෙලා තිබෙන්නේ ඒ 76 වසර ඇතුළේ ඔවුන් මේ රටේ ක්‍රීඩාවට සිදු කර තිබෙන විනාශය නිසායි. අවධාරණය කළ යුතු දේ කොතෙක් අවධාරණය කළත් කමක් නැහැ. ඒ නිසා අපි ඒක නැවත නැවතත් අවධාරණය කරනවා; පුනරුච්චාරණය කරනවා. හැබැයි, මේ පස්අවුරුදු සැලැස්ම තුළ අපට වැඩ පිළිවෙළක් තිබෙනවා. අපි ඒ වැඩ පිළිවෙළ ඇතුළේ යනවා.

ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියැවීමේ විවාදය තමයි අද මේ පාර්ලිමේන්තුව තුළ සිදු කරන්නේ. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ මූලධර්ම 6ක් තිබෙනවා. ඒ වාගේම අපි ආණ්ඩුවක් විධියට ගන්නා ක්‍රියාමාර්ග 30ක් මෙම ප්‍රතිපත්ති ප්‍රකාශයට ඇතුළත් කර තිබෙනවා. ඒ 30න් 19වැනි ක්‍රියාමාර්ගය තමයි, "නීති විරෝධී ඖෂධ භාවිතය, තරග පාවාදීම් සහ වෙනත් වංචා ඇතුළු සියලු වංචා හා දූෂණ තුරන් කිරීමට යාන්ත්‍රණයක්" කියන එක. අනෙකුත් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන අතරේ අපි මේ 19වැනි ක්‍රියාමාර්ගයේ එක අදියරක් විධියට තමයි මේ අවශ්‍ය නීති රීති සම්පාදනය කර ගැනීම කරන්නේ.

ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය වරින් වර පනවන නීති රීති, රෙගුලාසි, ප්‍රමිති කියන සියල්ලට අනුගත වෙමින් ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය බොහොම සක්‍රියව පවත්වා ගැනීම තමයි අපේ බලාපොරොත්තුව වන්නේ. මොකද, අපට ඒ හරහා ඉටු කර ගන්න අරමුණු කීපයක් තිබෙනවා. ජාත්‍යන්තර වශයෙන් ක්‍රීඩා තරගවලට සහභාගි වීම විතරක්ම හෝ එසේ සහභාගි වී ජයග්‍රහණය කිරීම හරහා ලංකාවට කීර්තියක් අත්පත් කර ගැනීම කියන අරමුණ විතරක්ම නොවෙයි අපට තිබෙන්නේ. අපි දන්නවා, එතැනින් එහාට සත්කාරක රාජ්‍යයක් විධියට අපේ රට ජාත්‍යන්තරයට අරගෙන යන්න පුළුවන් බව. ඒ හරහා අපට පුළුවන්, ලංකාවට විදේශ ආයෝජන ලබා ගන්න. ඒ සඳහා ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුකූලව රටේ තිබෙන නීති පද්ධතිය සකස් කරගෙන ආයතන ව්‍යුහය ගොඩ නඟා ගැනීම කියන එකත් අපට වැදගත්. ඒ නිසා අපි ඒකට අවශ්‍ය ක්‍රියාමාර්ග යම් කාල පරිච්ඡේදයක් පුරා ඉදිරියට අරගෙන ආවා.

අපි නින්දෙන් නැඟිටලා වාගේ එකවර මේ නීති රීති හදා ගන්නවා නොවෙයි. මේ ආයතනවල වැඩ කරන රාජ්‍ය නිලධාරින් ඉන්නවා. ඒ අය ජීවිත කාලය පුරා උපයා ගත් දැනුම, කුසලතා, අත්දැකීම්, විශේෂඥ දැනුම කියන හැම දෙයක් ගැනම සලකා බලා, සුදුසු තැනට අවශ්‍ය කරන සුදුස්සන් පත් කරලා, ඔවුන් එක්ක තමයි අපි මේ යන්ත්‍රණය ක්‍රියාත්මක කරගෙන යන්නේ; මේ සැලැස්ම එළා ගෙන යන්නේ. ඒ අනුව අරමුදල් ලබා ගන්න, ලංකාවට ආයෝජන ගෙන්වා ගන්න, ඒ වාගේම ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා තරගවලදී ඒවාට සහභාගිවීමට එහා ගිය විශේෂ වාසි රැසක් ලංකාව විධියට අපට ලබාගන්න පුළුවන් බව අපි දන්නවා. අන්න ඒ නිසා, ක්‍රීඩා සාක්ෂරතාව ඇති කරගැනීම වාගේම මේ නීති රීති, ප්‍රමිතීන් කාලයෙන් කාලයට වෙනස් විය යුතුයි කියලා මම හිතනවා. එසේ කාලයෙන් කාලයට නීති වෙනස් කර ගනිමින් අපට මේ ගමන යන්න පුළුවන්. විපක්ෂය බලාපොරොත්තු වෙන බොහෝ කාරණා තිබෙනවා. හැබැයි, මේ පස්අවුරුදු සැලැස්ම තුළ සඳහන් කර තිබෙන දේවල් ඉදිරියට ක්‍රමානුකූලව කරගෙන යන්න අපි බලාපොරොත්තු වෙනවා.

නූතන තාරුණ්‍යය ක්‍රීඩාවෙන් දුරස්වීම තුළ, ඔවුන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම තුළ, ඒ වාගේම සමාජ විරෝධී ක්‍රියාකාරකම්වලට පෙලඹීම තුළ අද අපේ රටේ තාරුණ්‍යය අත් දකින ඛේදයක් තිබෙන බව අපි දන්නවා. ඔවුන්ව ඒකෙන් ගලවා ගැනීම සඳහා තමයි, ඔවුන්ට අහිමි වෙච්ච ඒ නිර්මාණශීලීත්වය, ඒ ක්‍රීඩාශීලීත්වය නැවත ප්‍රවර්ධනය කිරීම සඳහා තමයි මේ රාජ්‍ය ආයතන සියල්ල එකට එකතු කරගෙන අපි වැඩ පිළිවෙළ සකස් කරගෙන යන්නේ. මගේ අතේ තිබෙන මේ ලැයිස්තුව තුළ සඳහන් වන ආකරයට දැනට ලංකාවේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් 67දෙනෙකු තහනම් උත්තේජක භාවිතය නිසා ක්‍රීඩා තරග තහනමට ලක් වෙලා තිබෙනවා. *[බාධා කිරීමක්]* ක්‍රීඩා 9ක්? හොඳයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමා නිවැරදි කිරීමක් කළා. අවුරුදු 6ක තරග තහනමකට ලක් වුණු ක්‍රීඩකයෙක් ඉන්නවා, මගේ දිස්ත්‍රික්කයේ. ඔහු මීටර් 100, මීටර් 200 කෙටි දුර ධාවන ශූරයෙක්. ඔහු තහනම් උත්තේජක භාවිතය නිසා වසර 6ක තරග තහනමකට ලක් වෙලා ඉන්නවා. එතකොට වැරැද්ද කොතැනද කියන එක අපි හොයා බලන්න ඕනෑ. දැනුවත්වද, නොදැනුවත්වද, සැලකිලිමත්වද, නොසැලකිලිමත්වද, මේ දේවල් සිද්ධ වෙන්නට හේතුව මොකක්ද කියා අපි සොයා බලන්නට ඕනෑ. අන්න ඒ හේතුව හොයා බලලා ඔවුන්ට අවශ්‍ය පුහුණුව, ඒ දැනීම, ඔවුන්ගේ ආකල්ප වර්ධනය සඳහා අවශ්‍ය කරන වැඩ පිළිවෙළ සකස් කිරීම කළ යුතුයි. රුපියල් 10,000ක් දීලා අපට ඔලිම්පික් තරගය දිනන්න බැරි වෙයි කියලා මම දන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි, ඒ රුපියල් 10,000 හරි නොදුන්නා නම් විශ්වවිද්‍යාලයක් හැදුවාට වැඩක් නැහැ. ඒ දරුවන්ට අවශ්‍ය මූලා පහසුකම් ටික ලබා දීලා, ඒ දරුවාට හොඳ පෝෂණ මට්ටමක් ලබා දීලා -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) நிலந்தி கொட்டஹச்சி)
(The Hon. (Mrs.) Nilanthi Kottahachchi, Attorney-at-Law)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

රුපියල් 10,000 තියා රුපියල් දාහක්වත් නැති ළමයින් ඉන්නවා. ඒ ළමයින්ට ඒ මූල්‍යාධාරය ඉතා වැදගත්. අපි ක්‍රීඩා විශ්වවිද්‍යාලයක් හදන්නේ නැතුව නොවෙයි. මෙතැන ඉන්න උතුරු, නැඟෙනහිර නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගෙන් විවිධ අදහස් ඉදිරිපත් වුණා. උතුරටත්, නැඟෙනහිරටත් මේ වාගේ ක්‍රීඩා පාසල් ඉදිකරන්න, ක්‍රීඩා සම්බන්ධ යටිතල පහසුකම් දියුණු කරන්න කියලා කිව්වා. අපේ අය වැය ඇතුළේ උතුරට, නැඟෙනහිරට විශාල වශයෙන් මුදල් ප්‍රතිපාදන වෙන් කරලා දකුණේ ඉන්න දරුවන්ට වාගේම උතුරේ ඉන්න දරුවන්ටත්, නැඟෙනහිර ඉන්න දරුවන්ටත් ඒ අවශ්‍ය පහසුකම් ටික ලබා දීම සඳහා වැඩිම මුදල් ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරපු රජය විධියට මේ වසරේදී අපි ඉතිහාසයට එක් වෙලා ඉන්නවා. ඒවා ගොඩනැඟෙමින් තිබෙනවා. අපට කිසිදු වෙනස්කමක් නැහැ. මේ බිම අපි සාධාරණව හදලා තිබෙනවා. මේ ක්‍රීඩා සාක්ෂරතාවත් එක්ක දේශපාලන සාක්ෂරතාවත් ඇති කර ගැනීම ඉතාම වැදගත්.

අපි විපක්ෂයටයි මේ ආරාධනාව කරන්නේ. අපි බිම හරියට හදලා තිබෙනවා. මේක ඇතුළේ නීති රීති උල්ලංඝනය කරන්න එපා. ඔබ තහනම් උත්තේජක පාවිච්චි කරන්න අවශ්‍ය නැහැ. මේ දේශපාලන තරගයේදී ඔබට පුළුවන් ආණ්ඩු පක්ෂයේ අපිත් එක්ක සාධාරණ තරගයකට එන්න. ඒ සාධාරණ තරගයේදී ඔබට පුළුවන්, අපිව අභිභවා යන්න. කිසිදු ප්‍රශ්නයක් නැහැ. ඒක නිසා සාධාරණව තරග කරමු. සාධාරණව තර්ක කරමු. මොකද මේ සාධාරණ බිම ඇතුළේ තමයි මේ රටේ මිනිසුන්ට ප්‍රජාතන්ත්‍රවාදීව ජීවත් වෙන්න අවශ්‍ය කරන වටපිටාව අපට හදන්න පුළුවන්. ඒක නිසා ප්‍රජාතන්ත්‍රවාදයෙන් පැරදිලා, සාධාරණ තරග බිමක් ඇතුළේ අසාධාරණ විධියට තරග කරලා ජයග්‍රහණ බලාපොරොත්තු වෙන්න බැහැ. ඒක නිසා, අපි සම බිමක සාධාරණව තරග කරලා මේ රටේ මහජනතාව බලාපොරොත්තු වෙච්ච ඒ සැප පහසු ජීවිත ටික ගොඩනඟමු කියලා විපක්ෂයට බොහොම සද්භාවයෙන් ආරාධනා කරනවා.

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කාදර් මස්තාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[பி.ப. 2.39]

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் எமது விளையாட்டு வீர, வீராங்கனைகளின் திறமைகளை மேம்படுத்தும் நோக்கிலும், அவர்களுக்கு இருக்கின்ற இடர்பாடுகளை நீக்கும் நோக்கிலும் கொண்டுவரப்பட்டுள்ள விளையாட்டில் ஊக்கு பதார்த்தப் பயன்பாட்டிற்கெதிரான சமவாயம் (திருத்தம்) சட்டமூலம் காலத்துக்குப் பொருத்தமானது. எனவே, இந்தச் சட்டமூலத்தை நிறைவேற்றி, விரைவாக நடைமுறைப்படுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். இந்தத் திருத்தச் சட்டமூலம் தாமதமாகவே கொண்டுவரப்பட்டு இருக்கின்றது. இதைக் கொண்டுவருவதில் காலதாமதம் ஏற்பட்டதனால் பல வீர, வீராங்கனைகள் பாதிப்புகளுக்கு முகங்கொடுத்து இருக்கிறார்கள். இந்தத் திருத்தச் சட்டமூலத்தை இப்போதாவது கொண்டுவந்தமைக்கு நான் அரசாங்கத்துக்கு நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

கடந்த அரசாங்க காலத்தில் குறிப்பாக, நான் மாவட்ட ஒருங்கிணைப்புக் குழுவின் தலைவராக இருந்தபோது 2018ஆம் ஆண்டளவில் ஆரம்பிக்கப்பட்ட பல வேலைகள் இன்று முடிவுறுத்தப்பட்டு இருக்கின்றன. அதிலும் குறிப்பாக, மன்னார் மாவட்டத்துக்குரிய sports complex, வவுனியா மாவட்டத்துக்குரிய sports complex என்பவற்றின் நிர்மாணப் பணிகள் இப்பொழுது முடிவுறுத்தப்பட்டு இருக்கின்றன. எங்களுடைய ஆட்சிக் காலத்தில் இவற்றை அமைக்கும் பணிகள் ஆரம்பிக்கப்பட்டாலும் முடிவுறுத்த முடியவில்லை. இப்பொழுதுதான் அவற்றின் வேலைகள் முடிவுறுத்தப்பட்டுள்ளன. அண்மையில் கௌரவ அமைச்சர் அவர்கள் நறுவிலிக்குளம் sports complexஇலுள்ள நீச்சல் தடாகத்தைத் திறந்து வைத்தார். அதற்கு எங்களுடைய நன்றியைத் தெரிவித்துக் கொள்கின்றோம். பொதுவாக முன்னைய அரசாங்கத்தால் ஆரம்பிக்கப்பட்ட நல்ல வேலைத்திட்டங்களை அதற்குப் பின்னர் வருகின்ற அரசாங்கம் தொடர்வதில்லை. இந்த அரசாங்கம் அப்படிச் செய்யாமல் அந்த வேலைத்திட்டங்களைத் தொடர்ந்து முன்னெடுத்து, பணிகளை முடிவுறுத்தி இருக்கிறது.

அதேபோன்று வவுனியா, ஓமந்தையிலுள்ள sports complexஇன் நிர்மாண வேலைகளும் முடிவடைந்து இருக்கின்றது. அது வீர, வீராங்கனைகளின் பாவனையில் இருந்தாலும், training எடுப்பதற்குரிய வசதிகளோ, தங்குவதற்கான hostel வசதியோ இல்லையென அங்குள்ள விளையாட்டு வீரர்கள் கூறுகின்றார்கள். எனவே, வவுனியா, ஓமந்தையிலுள்ள sports complexஇலும் சரி, மன்னார் மாவட்டத்துக்குரிய sports complexஇலும் சரி, விளையாட்டு வீரர்கள் பயன்பெறும் வகையில் hostel வசதிகளையும் ஏனைய வசதிகளையும் விரைவாகச் செய்து கொடுக்குமாறு கேட்டுக் கொள்கின்றேன். கடந்த காலங்களில் நாங்கள் விளையாட்டு வீரர்களுடைய தேவைகளை விளையாட்டு அதிகாரிகள்மூலம் இனங்கண்டு, அவற்றை மாவட்ட ஒருங்கிணைப்புக் குழு ஊடாக அமைச்சுக்கு அனுப்பியிருந்தோம். இன்று அதற்குரிய ஆரம்ப வேலைகள் நடைபெற்று இருக்கின்றன. அதையிட்டு, உண்மையிலே எங்களுக்கு மிகவும் சந்தோஷமாக இருக்கின்றது.

St. Xavier's Boys' Collegeஇன் விளையாட்டு மைதான அபிவிருத்திக்காக 56 மில்லியன் ரூபாய் ஒதுக்கீடு செய்யப்பட்டு இருக்கிறது. இது உண்மையிலேயே பாராட்டக்கூடிய விடயமாகும். அதேபோல, மன்னார் எருக்கலம்பிட்டி மத்திய மகா வித்தியாலயத்தின் விளையாட்டு மைதான அபிவிருத்திக்காக 60 மில்லியன் ரூபாயை ஒதுக்கீடு செய்வதற்கு நாங்கள் அந்த நேரம் மாவட்ட ஒருங்கிணைப்புக் குழுவால் சிபாரிசு செய்து அனுப்பி, அதற்குரிய ஏற்பாடுகளைச் செய்திருந்தோம். மேற்குறித்த இரண்டு மைதானங்களையும் ஒரே நேரத்தில் அபிவிருத்தி செய்வதற்குத்தான் நாங்கள் நடவடிக்கை எடுத்திருந்தோம். எனினும், அந்தக் காலகட்டத்தில் இருந்த பொருளாதார நெருக்கடியால் எங்களால் அதைச் செய்ய முடியவில்லை. இருந்தாலும், நாங்கள் மீண்டும் 2024ஆம் ஆண்டு அதற்குரிய முயற்சிகளை எடுத்து நிதி ஒதுக்கீடுகளை மேற்கொண்டோம். அந்தக் காலகட்டத்தில் தேர்தல் நடைபெற்றதால் அதனைச் செய்ய

[ගරු කේ. කාදර් මස්තාන් මහතා]

முடியாமல் நிதி திரும்பிச் சென்றது. எனவே, மன்னார் எருக்கலம்பிட்டி மத்திய மகா வித்தியாலயத்தின் மைதான அபிவிருத்திக்கான 60 மில்லியன் ரூபாயையும் ஒதுக்கிக்கொடுத்தால் இரண்டு பாடசாலைகளின் மைதானங்களும் சம காலத்தில் அபிவிருத்தி செய்யப்படும். இந்த இரண்டு பாடசாலைகளுமே பிரதான பாடசாலைகளாகும். இந்த இரண்டு பாடசாலைகளும் தேசிய மட்டத்துக்கு வீரர்களை அனுப்பக்கூடிய பாடசாலைகள் என்பதைக் கருத்திற்கொண்டு இதனைச் செய்துகொடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். சிறு தேவைப்பாடுகள் உடைய பள்ளிமுனை பாடசாலை, வட்டக்கண்டல் பாடசாலை என்பவற்றுக்கு நிதி ஒதுக்கீடு செய்யப்பட்டும் தேர்தல் காலம் என்பதால் கடைசி நேரத்தில் அந்நிதி திரும்பிச் சென்று இருக்கிறது. எனவே, அதற்குரிய ஏற்பாடுகளையும் செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

வவுனியா மாவட்டத்திலுள்ள திருநாவுக்குளம் பொது மைதானமானது, அதிகளவு சனத்தொகையைக் கொண்ட பிரதானமான ஓர் இடத்தில் அமைந்துள்ளது. அதனை அபிவிருத்தி செய்வதற்காக நாங்கள் கிட்டத்தட்ட 15 மில்லியன் ரூபாயை ஏற்பாடு செய்திருந்தோம். அந்த நிதியும் தேர்தல் காலம் என்றுகூறி மீளப் பெறப்பட்டது. எனவே, அதையும் செய்து தருவதற்குரிய ஏற்பாடுகளைச் செய்ய வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். வவுனியா, மன்னார் மாவட்டங்களிலுள்ள விளையாட்டு வீரர்களை ஊக்குவிப்பதற்காகப் பதிவுசெய்யப்பட்ட, activeஆக இருக்கும் விளையாட்டுக் கழகங்களுக்கு - வவுனியா மாவட்டத்திலுள்ள 200 விளையாட்டுக் கழகங்களுக்கும் மன்னார் மாவட்டத்திலுள்ள 150 விளையாட்டுக் கழகங்களுக்கும் - ஓர் இலட்சம் ரூபாயிலிருந்து இரண்டு இலட்சம் ரூபாய் வரை கொடுப்பதற்கு ஏற்பாடு செய்திருந்தோம். அதுவும் நிறுத்தப்பட்டது. கடந்த அரசாங்க காலத்தில் ஆரம்பிக்கப்பட்ட வேலைகளைத் தொடர்வதுபோல, இவ்வாறு நிறுத்தப்பட்டுள்ள வேலைகளையும் செய்துதர வேண்டுமெனவும் கேட்டுக் கொள்கின்றேன். அந்த clubsஐ அடையாளப்படுத்தியது அதிகாரிகள்தான். அதாவது, கச்சேரிக்கு ஊடாக வந்த சிபாரிசின் அடிப்படையில், அந்தத் தேவைக்குரிய நிதியை நாங்கள் ஏற்பாடு செய்து கொடுத்தோம். எங்களுடைய வன்னிப் பகுதி யுத்தத்தால் பாதிக்கப்பட்ட பகுதி என்பது எல்லோருக்கும் தெரியும்! முல்லைத்தீவு மாவட்டத்தில் மட்டும் அந்த விளையாட்டுக் கழகங்களுக்குரிய நிதியை வழங்கக்கூடியதாக இருந்தது. மன்னார், வவுனியா மாவட்டங்களில் அது நிறுத்தப்பட்டு இருக்கிறது. எனவே, அவற்றுக்குரிய நிதியையும் வழங்குவதற்கான ஏற்பாடுகளை கௌரவ அமைச்சர் அவர்கள் செய்துகொடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

வட மாகாணத்தில் கிட்டத்தட்ட 15 வருடங்களாக விளையாட்டு உத்தியோகத்தர் பதவிக்கு ஆட்சேர்ப்பு நடைபெறவில்லை. தற்பொழுதுதான் அதற்குரிய ஏற்பாடுகள் செய்யப்படுகின்றன. என்றாலும், 35 வயதுக்கு உட்பட்டவர்கள்தான் இப்பதவிக்கு விண்ணப்பிக்க முடியுமெனக் குறிப்பிடப்பட்டுள்ளது. இதனால், பலர் பாதிப்புக்கு உள்ளாகின்றார்கள். அதாவது, இப்பதவிக்குரிய தகைமைகளைக் கொண்டுள்ள 35 வயதுக்கு மேற்பட்டவர்கள் விண்ணப்பிக்க முடியாதுள்ளது. எனவே, '35' எனக் குறிப்பிடப்பட்டுள்ள அந்த வயதெல்லையைத் திருத்தியமைத்து, அதனை 40ஆக நீடித்தால் பலர் பிரயோசனம் அடைவார்கள்; விளையாட்டு உத்தியோகத்தர்களாக வரக்கூடிய வாய்ப்பு அவர்களுக்கும் கிடைக்கும். அத்தோடு, அப்பதவிக்கான கல்வித் தகைமைகளில் ஒன்றாக உயர் டிப்ளோமாவை உள்ளடக்க வேண்டுமெனவும் கேட்டுக் கொள்கின்றேன். மேலும், வன்னிப் பிரதேசத்தில் இருக்கின்ற ஒவ்வொரு groundஉம் பாரியளவில் பாதிப்புக்குள்ளாகி இருக்கின்றன. அவற்றையும் விரைவாகப் புனரமைப்புச் செய்துதருமாறு கேட்டு, சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றி கூறி, நிறைவு செய்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අරුන් හේමචන්ද්‍ර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.48]

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ විවාදයට අදාළව අදහස් ප්‍රකාශ කරන්න අවස්ථාවක් ලැබීම ගැන මම සතුටු වෙනවා. අපි දන්නවා, ලෝකය ඉතාම වේගයෙන් ඉස්සරහට යන බව. එලෙස ලෝකය ඉස්සරහට යෑමත් එක්කම නීති සංශෝධන රාශියක් සිද්ධ වෙනවා. ඒ වාගේම මේ පනත් සංශෝධනයත් අපට ඉතාම වැදගත්, කාලීන දෙයක් කියලා අපි හිතනවා. මීට කලින් යම්කිසි උත්තේජක ද්‍රව්‍යයක් පාවිච්චි කරපු කෙනෙකුට විරුද්ධව අපරාධ ගණයට අදාළව දඬුවම් දීලා තිබුණා නම්, දැන් ඒක ක්‍රමානුකූලව ඉවත් කරමින්, ඒකට අදාළවම වෙනම යන්ත්‍රණයක් තුළ ක්‍රියාමාර්ග ගන්න යම්කිසි අවස්ථාවක් ලැබී තිබෙනවා. මේ සංශෝධනයත් එක්ක ලෝකයට සරිලන විධියට යම්කිසි ක්‍රියාමාර්ගයක් සකස් කරන්නට අපට අවස්ථාවක් ලැබී තිබෙනවා. ඒ වාගේම මේකට අදාළව ඇමතිවරයාට යම්කිසි බලයක් පැවරෙනවා. ඒකට අදාළ කරන පාලක මණ්ඩලයක් පත් කරන්න පුළුවන්; ඒ වාගේම අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් පත් කරන්න පුළුවන්. එලෙස පත් කරන කෙනා එම ක්ෂේත්‍රයට අදාළවම යම්කිසි දැනුමක් තිබෙන කෙනෙක් වෙන්නම ඕනෑ. විශේෂයෙන්ම පසුගිය කාල වකවානුව තුළ මේ සම්බන්ධව විවිධ අයට අපරාධ නීතිය යටතේ දඬුවම් ලබා දීලා තිබෙනවා. නමුත්, ඒ තත්ත්වය මේ සංශෝධන පනතින් ඉවත් වෙනවා. ඒ වාගේම ලෝකයේ සියලු රටවල මේ නීතිය ක්‍රියාත්මක වන නිසා අපේ ක්‍රීඩකයෙකුට වෙනත් රටකදී යම්කිසි ප්‍රශ්නයක් සිද්ධ වුණත්, අපේ රට තුළදී ඒ සම්බන්ධව අදාළ ක්‍රියාමාර්ග ගන්න අවස්ථාවක් මේ තුළින් ලැබෙනවා.

ඒ වාගේම මේ පනත දිහා බැලුවාම අපට පෙනෙනවා, මෙහි යම්කිසි සංශෝධන වගයක් සිද්ධ වෙලා තිබෙන බව. ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජිතායතනයට - Sri Lanka Anti-Doping Agency එකට - පුළුවන්, ලංකාවේ අනෙකුත් ආයතනත් එක්ක එකතු වෙලා මේකට අදාළ කරන තීන්දු තීරණ ගන්න. ශ්‍රී ලංකා රේගුව තිබෙනවා; පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය තිබෙනවා. ඒ සියලු ආයතන එක්ක එකතු වෙලා මේ සම්බන්ධව විවිධ දේවල් කරන්නට යම්කිසි අවස්ථාවක්, ඉඩකඩක් නිර්මාණය වෙලා තිබෙනවා.

අපි දන්නවා, මේ දවස්වල විශේෂයෙන්ම තරුණයන් අතර supplements කියලා විවිධ දේවල් - විවිධ කිරි පිටි වර්ග වෙන්න පුළුවන්, tablets වෙන්න පුළුවන් - භාවිත වෙන බව. විශේෂයෙන්ම ක්‍රීඩාවල නිරත වී සිටින තරුණයන් අතර එවැනි දේවල් භාවිතය වැඩි වෙලා තිබෙනවා. ඒකට අදාළවත් පසුගිය කාල වකවානුව තුළ නිසි නියාමනයක් තිබුණේ නැහැ. නමුත් අපි විශ්වාස කරනවා, මේ සංශෝධනයත් එක්ක අපට ඒවා නියාමනය කරන්න අවස්ථාවක් ලැබෙනවා කියලා. මොකද, ඕනෑම තරුණයෙක් ක්‍රීඩාවට සම්බන්ධ වෙන්නේ යම්කිසි නරක ඉරණමක් බලාපොරොත්තුවෙන් නොවෙයි. නමුත් හරියාකාරව රටේ නීති රීති ක්‍රියාත්මක කෙරෙන්නේ නැත්නම් අවාසනාවන්ත විධියට ඒ තරුණයන්ට යම්කිසි නරක ඉරණමකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ඒ නිසා අපට ඇත්තටම අවස්ථාවක් ලැබෙනවා, විශේෂයෙන්ම ශරීරයට අහිතකර දේවල් - එක එක tablets වෙන්න පුළුවන්, කිරි පිටි වර්ග වෙන්න පුළුවන්, supplements කියන අනෙකුත් ජාති වෙන්න පුළුවන් - පිළිබඳව සොයා බලා, ඒවා භාවිතය වැළැක්වීම සඳහා කටයුතු කරන්න. එහෙම නැත්නම් ඒවා වෙළෙඳ පොළට ඇතුළු වුණාට පසුවත් ඒකට අදාළ කරන තීන්දු තීරණ ගන්නට මේ සංශෝධන පනත හරහා යම්කිසි ඉඩක් ලැබෙනවා.

ඒ වාගේම කංසා භාවිතය ගත්තොත්, දැන් සමාජය තුළ ඒ සම්බන්ධයෙන් විවිධ කතිකා පැතිරිලා තිබෙනවා. ඒක සාධාරණීකරණය කිරීමට අදාළවත් යම්කිසි තත්ත්වයක් දැන් නිර්මාණය වෙලා තිබෙනවා. මීට කලින් විෂ මත්ද්‍රව්‍ය මේ රට තුළට ඇවිල්ලා තිබුණාට, මේ කාල වකවානුව තුළ ඒ විෂ මත්ද්‍රව්‍ය ගම්වලට යන එකේ යම්කිසි සීමාවක්, යම් තහනමක් සිදු වෙලා තිබෙන බව අපි දකිනවා. අපි දන්නවා, පසුගිය කාල වකවානුව තුළ ඉතා විශාල ප්‍රමාණයක් අත්අඩංගුවට පත් වීමත්, ඒවාට අදාළ කරන නීතිමය ක්‍රියාමාර්ග ගැනීමත් එක්ක ගම්වල එහි සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබෙන බව. ඒ කියන්නේ, එම විෂ මත්ද්‍රව්‍ය භාවිතය දැන් බින්දුවටම බැහැලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් අවාසනාවන්ත විධියට විවිධ නම්වලින් ඔය කියන කංසා දැන් පාසල් තුළට පවා ඇතුළු වෙන්න පටන් ගෙන තිබෙන බව අපි දන්නවා. එක වර්ගයක් තමයි, මදන මෝදක කියන ද්‍රව්‍ය. ආයුර්වේද පනත යටතේ විවිධ හේතු නිසා රෝගියෙකුට ඒවා ලබා දෙන්න අවස්ථාව ලබා දීලා තිබෙනවා. නමුත්, පසුගිය කාල වකවානුව තුළ ඒක අවභාවිත වෙන තත්ත්වයකට පත් වෙලා තිබෙන බව තමයි අපි දකින්නේ. විශේෂයෙන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කන්තලේ ප්‍රදේශයෙන් විතරක් පසුගිය මාස කිහිපය තුළ මදන මෝදක ගුලි 13,258ක් අත්අඩංගුවට පත් වෙලා තිබෙනවා. නමුත් රටේ නීති රීති සම්බන්ධව යම්කිසි gaps තිබෙන අප දන්නවා. විශේෂයෙන් සමහර දේවල් සමහර නීති රීතිවලට ආවරණය වන තත්ත්වයක් තිබෙනවා. ඒ නිසා ආයුර්වේද පනත යටතේ පොලීසියට ඒවා අත්අඩංගුවට පත් කරන්න බැහැ කියන ප්‍රශ්නය දැන් නිර්මාණය වෙලා තිබෙනවා.

පසුගිය කාල වකවානුව තුළ යම්කිසි අසනීපයක් නිසා යම්කිසි අවශ්‍යතාවක් තිබුණු අය විතරක් මේවා පාවිච්චි කරලා තිබුණා. නමුත් පාසල් ළමයි අතරේ ඒවා භාවිතය ඉතා වේගයෙන් වැඩි වෙලා තිබෙනවා. ඒක නිසා අපට ඉදිරියේදී බරපතළ ප්‍රශ්නයකට මුහුණ දීමේ අනතුර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආයුර්වේද පනත යටතේ මේකට අදාළ කරන නියාමන කිහිපයක් සිදු වෙලා තිබුණත්, ඒවා online හරහා ඇණවුම් කර, කුරියර් සේවා හරහා දැන් ගෙවල්වලටම බෙදන තත්ත්වයකුත් නිර්මාණය වෙලා තිබෙනවා. මමත් ඒ ගැන search කරලා බලද්දී මගේ ෆෝන් එකේ algorithm එක වෙනස් වුණා. මටත් ඔය එක එක advertisements එන්න පටන් ගත්තා; ආකර්ෂණීය advertisements පවා එනවා. ඇත්තටම ගත්තොත්, ඒවා රෝගීන්ව ඉලක්ක කරගෙන බෙදන දේවල්ම නොවෙයි. එතැන යම්කිසි ගැටලු වගයක් තිබෙනවා. ඒ නිසා ඒකට අදාළව අනාගතයේදී මේ පනත හරහා මීට අදාළ කතිකාවක් නිර්මාණය වෙයි කියා අපි හිතනවා. ඒත් එක්කම ආයුර්වේද පනතෙත් යම්කිසි සංශෝධනයක් කරන්නටත් අවශ්‍යතාවක් තිබෙනවා. විශේෂයෙන්ම අපි ක්‍රීඩාව ගැන වාගේම මේ උත්තේජක ගැන කථා කරනකොට වැදගත් නඩු දෙකක් ගැනත් කථා කරන්නට ඕනෑ. එකක් තමයි, මරියා ෂරපෝවාගේ case එක. මරියා ෂරපෝවා කියන්නේ, අපි හැමෝම දන්නා ප්‍රකට ක්‍රීඩිකාවක්. ඒ case එක ගත්තොත්, ඒ පිළිබඳව මෙසේ සඳහන් වෙනවා: "Maria Sharapova was tested positive for Meldonium shortly after it was added to the banned list. CAS ruled that she was responsible for the violation of the rule, but found that there was no intent to cheat and reduced her ban from 24 months to 15 months, establishing the principle of fair and proportionate justice in doping cases." ඒ කියන්නේ, සමහර විට සමහර බෙහෙත් සමහර පුද්ගලයෝ ගන්න පුළුවන්. නමුත්, ඔවුන් ඒවා තහනම් කියලා දැනුවත් නොවීම නිසාත් ඒවා ගන්න පුළුවන්. එම නිසා ඒ intention එක බලලා, ඒකට අදාළ කරන ඒ දේ හිතාමතාමද කළේ කියන එකට අදාළව යම්කිසි තීරණයක් ගන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවා. එතකොට මේ මරියා ෂරපෝවා ක්‍රීඩිකාවගේ තත්ත්වයත් ඇත්තටම ඒ ලබා දීලා තිබුණු තහනම අඩු වෙන්න හේතු වෙච්ච එකක්.

ඒ වාගේම තමයි, ලාන්ස් ආම්ස්ට්‍රෝං කියන ක්‍රීඩකයා. ඔහුත් අපි දන්නා කෙනෙක්. ඔහු ඉතාම ප්‍රකට ක්‍රීඩකයෙක්, විශේෂයෙන්ම බයිසිකල් රේස්වලට අදාළව. ඒ case එක ගත්තොත්, එහි මෙසේ සඳහන් වෙනවා: “Cyclist Lance Armstrong was given a lifetime ban and stripped of his seven Tour de France titles for leading a systemic doping programme, providing that no victory built on deception can endure.” මෙහි තිබෙන තත්ත්වය පොඩ්ඩක් වෙනස්. එතුමාට තිබිච්ච ඒ titles හතක් අහිමි වෙනවා. ඒ, විශේෂයෙන් ඔහු දැනුවත්ව මේ දේ කරපු නිසා. විශේෂයෙන්ම මේ තත්ත්වයන් එක එක cases අනුව වෙනස් වෙනවා.

ඒ වාගේම මෙතැනදී banned substances කියන මේ categories ගත්තොත්, anabolic steroids මේකට අදාළ වන බව අපි දන්නවා. Peptide hormones සම්බන්ධ වෙනවා, stimulants සම්බන්ධ වෙනවා. ඒ වාගේම තමයි, cannabinoids. ඒක තමයි මම මුලින්ම කිව්වේ මදන මෝදක කියන මේ ගුලි වර්ගයේ මේ cannabinoids කියන අඩංගුව තිබෙනවාය කියා. විශේෂයෙන් එහි කංසා අඩංගුව තිබෙනවා. ඒ නිසා ඒකත් අවදානම් සහිත එකක්. මේ විවාදයේ කරුණු එළියට ගියාට පසුව එක එක්කෙනා යූටියුබ් නාළිකා හරහා ඇවිල්ලා කියන්න පුළුවන්, මේක වැරදියි, සියයට 1යි මෙහි තිබෙන්නේ, අරකේ සියයට 150ක් විතර තිබෙනවාය කියලා. එහෙම නොවෙයි. දිගුකාලීනව මේවා පාවිච්චි කරනවා නම් අනිවාර්යයෙන් අපේ ශරීරයට ඒවා එකතු වෙනවා. ඒකෙන් අනිවාර්යයෙන් අපේ ශරීරයට දැවැන්ත හානියක් එල්ල කරන්න පුළුවන්.

ඒ වාගේම තමයි, diuretics. විශේෂයෙන් ඒ අදාළ ක්‍රීඩාවට යන්න කලින් බර අඩු කිරීම සඳහා යම්කිසි බෙහෙත් වර්ගයක් පාවිච්චි කරනවා. විශේෂයෙන් furosemide වාගේ බෙහෙත් ඒ සඳහා පාවිච්චි කරනවා. ඒවාත් තහනම් කරලා තිබෙනවා. ඒ වාගේම beta blockers ඇතුළු විවිධ දේවල් තහනම් කරලා තිබෙනවා. ඒ වාගේම යම්කිසි පුද්ගලයෙක් තමන්ගේ අසනීප තත්ත්වයක් නිසා යම්කිසි බෙහෙතක් පාවිච්චි කරනවා නම්, ඒක පාවිච්චි කරන විධියත් කියා දීලා තිබෙනවා. විශේෂයෙන්ම ඇදුම වාගේ රෝග තිබෙන අය inhalers වාගේ දේවල් පාවිච්චි කරනවා.

[ගරු අරුන් හේමචන්ද්‍ර මහතා]

එතකොට එවැනි inhalers කොහොමද පාවිච්චි කරන්න ඕනෑ, පාවිච්චි කරන්න හොඳ නැත්තේ කොහොමද කියාත් මේ හරහා අපට යම්කිසි දැනුමක් ලබා ගන්න පුළුවන්. විශේෂයෙන් ක්‍රීඩාවේ නිරත වී සිටින පුද්ගලයන්ට ඒ තුළින් යම්කිසි දැනුමක් ලබා ගන්න පුළුවන්. ඒ නිසා මෙය ඉතාම සුවිශේෂී, වැදගත් සංශෝධනයක්. අපි ලෝකයට සරිලන විධියට අපේ ක්‍රීඩා ක්ෂේත්‍රය දියුණු කරන්න ඕනෑ නම්, මෙවැනි දේවල් අපි ඉතාම වේගයෙන් සංශෝධනය කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා.

විශේෂයෙන් ලංකාවේ ක්‍රීඩාව ගැන කථා කරද්දී වසීම් තාජුඩීන් කියන පුද්ගලයා ගැන කථා නොකර අපට මේ කතිකාව ඉස්සරහට අරගෙන යන්න බැහැ. විශේෂයෙන් ඔහු කිසිම controversy එකකට සම්බන්ධ නොවුණු, ඉතාම දක්ෂ, සම්මාන රාශියක් දිනා ගත් ක්‍රීඩකයෙක්. නමුත් අවාසනාවන්ත විධියට ඔහු මරණයට පත් වුණා. ඔහු ඝාතනයට පත් වුණාද කියන සැලකිය යුතු සැකයත් ඒ මරණය පිටුපස තිබෙනවා. විශේෂයෙන් මේ ආණ්ඩුව පත් වෙලා ඉතාම කඩිනමින් මේ විමර්ශන ටික කරගෙන යෑමත් එක්කම බොහෝ දේවල් හෙළිදරව් වෙනවා. එතැනදී, මේ පිටුපස සංවිධානාත්මක ඝාතනයක් සිද්ධ වෙලා තිබෙනවාද කියන ප්‍රශ්නයත් පැන නඟිනවා.

විශේෂයෙන්ම අපි දන්නවා යම්කිසි පුද්ගලයෙක් - කජ්ජා කියන පුද්ගලයා - ඝාතනයට ලක් වුණු බව. අර වසීම් තාජුඩීන් මරණයට පත් වෙච්ච දවසේම CCTV දර්ශනයේදී ඒ පුද්ගලයා එතැන සිටියා කියලා ඔප්පු වෙලා තිබෙනවා. ඒකත් එක්ක විශාල තොරතුරු වැලක් දැන් හෙළිදරව් වෙමින් පවතිනවා. යම්කිසි පුද්ගලයෙක්, Indonesiaවලින් අත්අඩංගුවට පත් වෙච්ච පුද්ගලයා ආයුධ ලබා දී තිබෙනවා. ඒ ආයුධ ගත්ත කෙනා ඝාතනයට සම්බන්ධ වෙලා තිබෙනවා. මේ වාගේ විවිධ දේවල් හෙළිදරව් වෙමින් තිබෙනවා. ඒ වාගේම අපි දන්නවා, රතු කුරුස සංවිධානයෙන් ඩිෆෙන්ඩර් වර්ගයේ වාහන වගයක් සිරිලිය පදනමට ලබා දී තිබුණා කියලා. නමුත්, සිරිලිය පදනම ඒ වාහන පාවිච්චි කරන්න ඕනෑ අරමුණෙන් පිටට ගිහින් වසීම් තාජුඩීන්ව follow කරන්න ඔහුගේ පිටුපසින් යන්නටත් ඒ ඩිෆෙන්ඩර් එක පාවිච්චි කර තිබෙනවා. පාට තුනක් මාරු කරලා තිබෙනවා. එවැනි විවිධ දේවල් හෙළිදරව් වෙමින් පවතිනවා. අපි විශ්වාස කරනවා, ඉතාම වේගයෙන් මේ අවශ්‍ය කරන විමර්ශන කටයුතු ටික සම්පූර්ණ කරන්න පුළුවන් කියලා. ඒ වාගේම මේ සියලු දේ හරහා මේ රටේ ක්‍රීඩකයින්ගේ ආරක්ෂාවත් තහවුරු කරමින්, ක්‍රීඩාවට සුදුසු වටපිටාවක් ඇති කරන්නට අපි උත්සාහ දරනවා. මට මෙම විවාදයට සම්බන්ධ වීමට අවස්ථාව ලබා දීම පිළිබඳ ස්තුතිය පුද කරමින් මා නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.01]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද විශේෂයෙන්ම ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන වෙලාවේ කථා කරන්නට ලැබීම සතුටට කාරණයක්. අපි දන්නවා, උත්තේජක ලබා ගැනීමේදී අංශ දෙකක් තිබෙන බව. එකක් තමයි, මේ උත්තේජක දැනුවත්ව භාවිත කරනවා. එහෙම නැත්නම් නොදැනුවත්ව භාවිත කරනවා. සමහර වෙලාවට උත්තේජකයක් බව නොදැන ඔහුගේ පුහුණුකරු විසින් හෝ මේක විටමින් වාගේ දෙයක් හැටියට දෙන්න පුළුවන්. ඒකයි මම කිව්වේ නොදැනුවත්ව භාවිත කරන අවස්ථා අපි දකිනවා කියලා. දැනුවත්ව භාවිත කිරීම කොහොමටත් වරදක්. ඒ කියන්නේ, වැරදි පාරේ ගිහින් ජයග්‍රහණයක් ලබා ගැනීමට උත්සාහ කිරීම. ඒක කවමදාකවත් කිසිම සමාජයක් අනුමත කරන්නේ නැහැ. හැබැයි, අපි දන්නවා මේ උත්තේජක භාවිත කරන්නේ අර මම ඉස්සරවෙලා කිව්වා වාගේ තරග ජයග්‍රහණය සඳහා අවශ්‍ය ශක්තිය, ජවය ලබා ගන්නට බව. ඒ තුළින් ජයග්‍රහණය ලබා ගන්නටයි.

අද මේ කථා කරන සංශෝධන පනත් කෙටුම්පතට එහා ගිහින් අපි කථා කළොත්, මේ රටේ දරුවන්ට ක්‍රීඩා ජයග්‍රහණ සඳහා බාධක රාශියක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නියෝජනය කරන්නේත් දුෂ්කර පළාතක්. මා නියෝජනය කරන්නේත් දුෂ්කර පළාතක්. අපි දන්නවා, මේ පළාත්වල දරුවන් තරග ජයග්‍රහණය කරනවා. හැබැයි, ඒ දරුවන්ට අවශ්‍ය කරන පෝෂණීය ආහාර වේලක් ඔවුන්ට ලැබෙන්නේ නැහැ. මොකද, ආර්ථික ගැටලුත් එක්ක දරුවන්ට හොඳ කෑම වේලක් ලබා දෙන්නට හැකියාවක් අපේ රටේ දෙමාපියන්ට නැතිකම. ඊළඟට, පුහුණුව සඳහා හොඳ පුහුණුකරුවන් නොමැතිකමත් අපේ රටේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ පසුබෑස්මක් තිබෙනවා නම්, අන්න ඒ පසුබෑස්මට හේතු වන කාරණයක් හැටියට මම දකිනවා. සමහර පාසල් ගත්තොත්, අපි දකිනවා ඒ අයට හොඳ පුහුණුකරුවන් නැහැ කියලා. ඒ වාගේම මේ දේශගුණික, කාලගුණික තත්ත්වයන්ට ගැළපෙන විධියට පුහුණුවීම් ලබා දෙන්නට, ඒවාට ඔරොත්තු දෙන විධියට පුහුණුවීම් ලබා දෙන්නට අවශ්‍ය පුහුණු මධ්‍යස්ථාන අප රටේ නොමැතිකමත් මේ වෙලාවේ මේ රටේ ක්‍රීඩා ජයග්‍රහණයට, ක්‍රීඩාවේ උන්නතියට තිබෙන ගැටලු හැටියට මම දකිනවා. මම මේවා යෝජනා හැටියට තමයි මේ වෙලාවේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ. මොකද, මේ රටේ ක්‍රීඩාව ඉදිරියට ගෙනයන්න නම් මේ උත්තේජක සම්බන්ධයෙන් නීති රීති සකස් කිරීම පමණක් ප්‍රමාණවත් වන්නේ නැහැ කියන එක මම අවධාරණයෙන් කියනවා.

මම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. දුෂ්කර පාසල්වල දරුවන්ට ක්‍රීඩා ගුරුවරයෙක් නොමැතිකම නිසා ඒ තිබුණු අඩුපාඩුව නැති කරන්නට 2015-2019 වාගේ කාලයේදී ක්‍රීඩා පුහුණුකරුවන් සහායකයන් හැටියට පාසල්වලට ලබා දීලා තිබෙනවා, ලංකාවේ හිටපු දක්ෂම ක්‍රීඩකයන් තෝරලා. ඒ අය ගම් මට්ටමින්, කලාප මට්ටමින්, සමස්ත ලංකා මට්ටමින් ජයග්‍රහණ ලබපු දරුවෝ. ඒ අයව ක්‍රීඩා පුහුණුකරුවන් හැටියට පාසල්වලට ගෙනැවිත් තිබෙනවා. නමුත්, අද වෙනකම් ඒ අයව ස්ථිර කරන්න, එහෙම නැත්නම් ඒ අයගේ වෘත්තිය ගැටලු විසඳලා ඒ අයව අවශ්‍ය තැනට ගෙන එන වැඩ පිළිවෙළ සකස් කරන්නට මේ රටට බැරි වෙලා තිබෙනවා. ඒ නිසා මම මේ වෙලාවේදී යෝජනා කරනවා, ඒ ගුරු සහායකවරුන්, නැත්නම් ක්‍රීඩා පුහුණුකරුවන්ගේ තිබෙන වෘත්තීය ගැටලු විසඳා දෙන්න කියලා. මොකද, අද වන විට ඒ අය මානසිකව වැටිලා ඉන්නේ. ඔවුන් මානසිකව වැටීම නිසා එයින් අගතියට පත් වෙන්නේ මේ රටේ දරුවෝ.

තහනම් උත්තේජක ගැනීම ශ්‍රේෂ්ඨාධිකරණයට යා යුතු වරදක් හැටියට තිබුණු බව අපි දන්නවා. දැන් ඒක ඉවත් කරලා, සරල කරලා ආයතනයකට පවරලා තිබෙනවා. හැබැයි, ගුරුවරුන්ට මේකේ අනෙක් පැත්ත වෙලා තිබෙනවා. ඒ මොකක්ද? අද ගුරුවරු තමන්ගේ වෘත්තීය කර ගන්න බැරිව අසරණ වෙන තත්ත්වයකට, අධිකරණයට පමුණුවන තැනකට ගෙනියන්න කටයුතු කර තිබෙනවා. මම ගුරුවරයා ගැන මෙතැනදී ඇඳලා

ගත්තේ, උත්තේජක ගැනීම වරදක් කියන එක පිළිබඳව කථා කරන්නයි. දැන් ඉස්සෙල්ලා කථා කරපු මන්ත්‍රීතුමා කියපු විධියට මදනමෝදක, ගංජා වාගේ දේවල් උත්තේජක තමයි. මේවාත් අද දරුවෝ ගන්නවා. මම පාසලක උගන්වලා තිබෙන නිසා දන්නවා, interval එකෙන් පස්සේ සමහර පාසල්වල පන්තිවල උගන්වන්න බැහැ කියලා. දරුවෝ මේ ලෝකයේ නැහැ. එතකොට මෙන්න මේක වරදක් බව තේරුම් කර දීලා, ආකල්පමය වශයෙන් දරුවන්ව සංවර්ධනය කරන්න ඕනෑ. ඒක කරන්න වෙන්නේ අධ්‍යාපනය ඇතුළේ. ඒක කරනකොට පාසලේ නීති රීති මාලාවක් තිබෙනවා. ඒක ක්‍රියාත්මක කරන්න ඕනෑ. විනය පවත්වාගෙන යන්න ඕනෑ. ඒ වාගේම, ජයග්‍රහණ ලබා ගන්න වැරදි පාරක යන එක වරදක් බව පෙන්වන්නත් පාසලේ ගුරුවරයා තමන් උගන්වන කාලය තුළ දරුවාව දැනුවත් කරන්න ඕනෑ. මම මේ වෙලාවේ එක දෙයක් මතක් කරන්න ඕනෑ. මේ විනය කමිටු පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් විවිධ චක්‍රලේඛ විටින් විට විවිධ කාලවල අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නිකුත් කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එවැනි චක්‍රලේඛයක් මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා. ඒවායේ තිබෙනවා පාසල්වල විනය මාලාව පවත්වාගෙන යන්නේ කොහොමද කියලා.

ඊළඟට, මම තව දෙයක් කියන්න ඕනෑ. මේ මගේ අතේ තිබෙන්නේ ගුරුවරයෙකුට පුහුණුවේදී ලබා දෙන module එකෙහි කොටසක්. දරුවන් ඉගෙනීමට පෙළඹවීමට ක්‍රම ශිල්ප ගණනාවක් මෙහි පැහැදිලි කරනවා. මම එයින් කිහිපයක් පිළිවෙළින් කියන්නම්. ප්‍රශංසාව, දෝෂාරෝපණය, තෑගි ලබා දීම, දඬුවම් කිරීම, තරගය ආදී වශයෙන් එහි සඳහන්ව තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කොටස මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

මම මේ වෙලාවේ මේ කාරණා මතක් කරන්නේ මේ නිසායි. දැන් ගුරු පුහුණුව දෙනවා, දඬුවම සද්භාවයෙන් කිරීම සාධාරණයි කියලා. හැබැයි අපි දන්නවා, සතෙකුට හෝ ශාරීරිකව හෝ මානසිකව; කායිකව හෝ මානසිකව දඬුවම් කිරීම, හිංසනයට ලක් කිරීම වරදක් කියලා. හැබැයි, යහපත් ගුරුවරයෙක් කවදාවත් දරුවෙකුට අගතියක් කරන චේතනාවෙන් ඒ දරුවාට දඬුවම් කරන්නේ නැහැ. නමුත්, පසුගිය දවස්වල ගෙනාපු පනත් කෙටුම්පතින් "සද්භාවය" කියන එක ඉවත් කර තිබෙනවා. එය දඬුවම් ලැබිය හැකි වරදක් හැටියට සඳහන් කර තිබෙනවා. එය කියවනකොට මම දැක්කා, දඬුවමක පරමාර්ථය මොකක්ද කියලා. අපරාධයක් වළක්වා ගන්න, පුනරුත්ථාපනය කරන්න, නැවත වරදක් නොකිරීමට දඬුවමක් කිරීම, එහෙම නැත්නම් අතට අතක්, ඇසට ඇසක් න්‍යාය ක්‍රියාත්මක කරන්න දඬුවම් කිරීම කියන එක තමයි දඬුවම කියන එක විශ්ලේෂණය කරනකොට තිබෙන්නේ. හැබැයි, පිළිගත්, ශිෂ්ට සමාජය පිළිගන්නේ, අනුමත කරන්නේ මම කලින් කියපු පළමුවැනි සහ දෙවැනි කාරණා දෙක වන අපරාධයක් වළක්වා ගැනීමටත්, පුනරුත්ථාපනය කිරීමටත් කියන එක. මේකට හොඳ උදාහරණයක් තමයි, ජාතක කථා පොතේ තිබෙන තිලමුට්ඨි ජාතකය. එහි මේ ගැන පැහැදිලිව තිබෙනවා.

පසුගියදා ලෝක ළමා දිනය යෙදී තිබුණා. මම මේ කියන කාරණය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේදීත් මට ඇහුණා; එළියේදීත් ඇහුණා. ඒ මොකක්ද? ලෝක ළමා දිනය සමරන්න ගංජා, මත්පැන්, මදනමෝදක වැනි මත්ද්‍රව්‍ය අරන් පාසල් ගිය දරුවෝ ගැන කියැවුණා. එතකොට ගුරුවරයා මොකක්ද කරන්න ඕනෑ? විනය පවත්වාගෙන යන්න විනය නීති මාලාව ක්‍රියාත්මක කරනවාද, ඒ තුළ ළමයාට සිත් තැවුලක් ඇති වුණා කියලා අධිකරණයට ගියොත් ගුරුවරයාට එතැනදී තිබෙන ආවරණය මොකක්ද කියන එක පිළිබඳව ගැටලුවක් තිබෙනවා. ඒ නිසා මම කියනවා, මේ කියන සියලු දේවල් කරන්න කලින් ඒ දේවල් වෙනස් කරන්න ඕනෑ කියලා. ගුරුවරයාට පුහුණුවේදී ලබා දෙන දේ නිවැරදිව ලබා දෙන්න ඕනෑ. දඬුවම් කිරීම, දෝෂාරෝපණය සද්භාවයෙන් කරන්න කියලා ගුරු පුහුණුවේදී කියා දීලා පාර්ලිමේන්තුවට පනතක් ගෙනැල්ලා ගුරුවරයා හිරේ දාන්න කථා කරනවා නම් මම දන්නේ නැහැ, මේ රටේ අධ්‍යාපනය කොතැනටද තල්ලු වෙන්නේ කියලා. ඒ නිසා පළමුවෙන්ම අපි ඒවා වෙනස් කරමු. දරුවන් නිවැරදි මඟට යොදවන්න ලෝකය පිළිගත් අලුත් දේවල් මොනවාද, දරුවාට දරුවාගේ වරද අවබෝධ කර දෙන්නට තිබෙන ලෝකය පිළිගත්තු අලුත් ක්‍රම ශිල්ප මොනවාද, දරුවා ඉගෙනීමට පොළඹවන්න ලෝකය හඳුනාගත්තු අලුත් ක්‍රමශිල්ප මොනවාද යනාදිය පිළිබඳව ඉස්සෙල්ලාම ගුරුවරයන් දැනුවත් කරලා ඉන්න. එහෙම කරන්නේ නැතුව, නීති ගෙනැල්ලා ගුරුවරුන් හිරේ දාන්න, අධිකරණයට ගෙන යන්න කටයුතු කරන්න එපා කියන එක මා මෙම ගරු සභාවෙන් ඉල්ලා සිටින්නේ, ගුරුවරියක හැටියට නොවෙයි, මේ පෙරදිග සංස්කෘතියේ අපේ තිබෙන වටිනාකම් රැක ගනිමින් ඉදිරියට යන්න ඕනෑ නිසායි.

අද අප දකින්නේ පෙරදිග සංස්කෘතිය සහ අපරදිග සංස්කෘතිය අතර තිබෙන සට්ටනයක්. එනම්, පෙරදිග සංස්කෘතියේ හරයන් සහ අපරදිග සංස්කෘතියේ හරයන් අතර තිබෙන සට්ටනයක්. අපරදිග සංස්කෘතියේ තිබෙන සියලු දේවල් කෙළින්ම අපේ රටට ගෙනැල්ලා පැළ කරන්න හදන්න එපා. ඒවා අපට ගැළපෙන්නේ නැහැ. මම මේකෙන් කියන්නේ නැහැ, දරුවන්ට දඬුවම් කිරීම සුදුසුයි කියලා. ඒක නොවෙයි කියන්නේ. ඒවා ආපස්සට වෙනස් කරන්න නම් ඊට කලින් කළ යුතු බොහෝ දේවල් තිබෙනවා. ඒ නිසා මම රජයේ අවධානය මේ කෙරෙහි යොමු කරවනවා. මොකද, පාසලක විනය පාලනයක් තිබෙන්න ඕනෑ. දරුවන් තහනම් උත්තේජක පාසලකට ගෙනැල්ලා ඒවා භාවිතයට පටන් ගත්තොත්, මොකක්ද ගන්නා ක්‍රියාමාර්ගය? ඒ සඳහා වන විනය මාලා පාසල තුළ කොහොමද ක්‍රියාත්මක කරන්නේ? පාසලේ විනය මණ්ඩලය ඉදිරියටත් පවත්වාගෙන යනවාද, එහෙම නැත්නම් අයින් කරනවාද? ඒවා ක්‍රියාත්මක කරද්දී ගුරුවරයා අනතුරේ වැටෙනවා නම් ගුරුවරයා ආරක්ෂා කරගන්නේ කොහොමද? ඒ කාරණා පිළිබඳව අපි මීට වඩා පුළුල්ව සාකච්ඡා කරලා ඒ පනත් කෙටුම්පත ගෙනෙන්න ඕනෑ. ගෙනාපු පනත් කෙටුම්පත අකුළාගත්තු එක, reverse කරගත්තු එක වෙනම කථාවක්. නමුත් මම කියනවා, අන්න ඒ වාගේ දේවල් කරන්න ඕනෑ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රට ගත්තාම, දරුවන් සම්බන්ධයෙන්, එහෙම නැත්නම් ක්‍රීඩාව සම්බන්ධයෙන් මොකක්ද වෙන්න ඕනෑ කියන එක මම කලින් කිව්වා. දරුවන් සම්බන්ධයෙන් කරන්න බොහෝ දේවල් තිබෙනවා. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නිවැරදිව ගේන්න ඕනෑ. අපේ සාරධර්ම මොනවාද, පෙරදිග සංස්කෘතිය කොහොම එකක්ද, මේ රට කොහොම රටක්ද, මේ රටේ ජීවත් වෙන්න ඕනෑ කොහොමද යන්න සම්බන්ධයෙන් ආකල්ප සංවර්ධනයක් වන විධියටත්, ඒ සියල්ල එකතුව ලෝකය ජය ගන්න පුළුවන් වන විධියටත් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙන එන්න ඕනෑ. මම දිගින් දිගටම ඒ ගැන කථා කරලා තිබෙනවා. ඒ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අද මොන තත්ත්වයෙන් කෙරෙනවාද කියන එක පිළිබඳව රටට දැනගන්න තිබෙන්න ඕනෑ.

---

** පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට තවත් විනාඩි 2ක කාලයක් තිබෙන්නේ.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මම ඉක්මනින් අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම ප්‍රශ්නයක් තමයි, ළමා මන්දපෝෂණය. මේ රටේත් ළමා මන්දපෝෂණය තිබෙනවා. මම ඉස්සෙල්ලාත් කිව්වා, ක්‍රීඩා කරන්නත් හොඳ පෝෂණයක් තිබෙන්න ඕනෑ කියලා. නමුත්, මේ රටේ දරුවන්ගෙන් තුනෙන් දෙකක් මන්දපෝෂණයෙන් පෙළෙනවා කියලා මේ පාර්ලිමේන්තුවේ කමිටුවකින් ඉදිරිපත් කරපු වාර්තාවකත් සඳහන්ව තිබෙනවා. අපි අන්න ඒවාට ප්‍රමුඛතාව දෙමු. දරුවන්ගෙන් තුනෙන් දෙකකට මන්දපෝෂණය නම්, කොහොමද ක්‍රීඩාව ඉස්සරහට යන්නේ? තහනම් උත්තේජක අයින් කරපු පමණින් ඒක වෙන්නේ නැහැ.

ඒ වාගේම, පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ ඉඳලා, ප්‍රාථමික අධ්‍යාපනයේ ඉඳලා, ද්විතීයක, තෘතීයක අධ්‍යාපනය දක්වාම දරුවන් නිවැරැදිව හඳුනා ගන්නා ක්‍රමවේදයක් ගුරුවරයාට කියා දීලා තිබෙනවාද? අපි දන්නවා දරුවන් අතර ADHD තත්ත්වයේ පසුවන දරුවන් හෙවත් ඌන අවධාන සහ අධික්‍රියාකාරි - hyperactive - දරුවන් ඉන්නවා කියලා. අද දරුවන් සම්බන්ධයෙන් මේ තත්ත්වයන් බොහොම ප්‍රචලිතයි. ඒ වාගේම, bipolar disorder තිබෙන දරුවෝ ඉන්නවා; depression තිබෙන දරුවෝ ඉන්නවා; borderline personality disorder තිබෙන දරුවෝ ඉන්නවා. මේවා හඳුනා ගන්නේ නැතුව දරුවන් ඉදිරියට ගෙන යන්නේ කොහොමද? එහෙම නම්, විශේෂ අවශ්‍යතා සහිත දරුවන් හඳුනා ගන්න සහ ඒ දරුවන් වෙනුවෙන් අවශ්‍ය වෛද්‍ය උපදෙස් හෝ උපදේශනයන් ලබා දෙන්න විධිමත් ක්‍රමවේදයක් සකස් වෙන්න ඕනෑ. මේ රටේ දරුවන්ගේ විතරක් නොවෙයි, ගුරුවරුන්ගේ ප්‍රශ්නත් විසඳන්නේ නැතුව මේ රටේ සමාජ විප්ලවයක් ඇති කරන්න පුළුවන් කියලා මම හිතන්නේ නැහැ. මොකද, ගුරුවරයා තමයි දරුවා මේ ලෝකයට විවර කරන්නේ. එහෙම නම් ඒ ගුරුවරුන්ට තිබෙන ගැටලු විසඳා දිය යුතුයි. අපි දන්නවා, සුබෝධනී කමිටුවේ වාර්තාව අනුව තුනෙන් දෙකක ගුරු විදුහල්පති වැටුප් විෂමතාවක් ඉතුරු වෙලා තිබෙන බව. හැබැයි, අද වන කල් ඒ ගෙවීම් කරලා නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමිය, කාලය අවසන්.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණය කියලා කථාව අවසන් කරන්නම්.

අද සංවර්ධන නිලධාරීන් පාරේ උද්ඝෝෂණය කරනවා. මේ වන කොට ඒ අය වසර ගණනාවක් පාසල්වල සේවය කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර පාසල් පවත්වාගෙන යන්නේ විදුහල්පතිතුමා සහ සංවර්ධන නිලධාරීන් කිහිපදෙනෙක් පමණයි. අද පාසල්වල ගුරු හිඟයක් තිබෙනවා. ඒ ගැටලු විසඳන්නේ නැතුව අද මේ ආණ්ඩුව කරන්නේ මොකක්ද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. අද ගුරුවරයාගේ ප්‍රශ්න විසඳන්නේ නැතුව ගුරුවරයා අධිකරණයට ගෙන යන්න කටයුතු කරනවා. අර මා කලින් කිව්වා වාගේ, ඔබතුමන්ලා කලින් දවසක ගෙන ආ පනත් කෙටුම්පත තුළින්, ගුරුවරයා අධිකරණයට ගෙන යන්න තිබුණු අවස්ථාව සරල කර තිබෙනවා. සද්භාවයෙන් යුතුව දරුවන් යහ මඟට ගෙනෙන්න ගුරුවරුන්ට තිබුණු අවකාශය හිර කරලා, අද ගුරුවරයා අධිකරණයට ගෙන යන්න අවශ්‍ය පාර කපමින් ඔබතුමන්ලා මේ රජය ඉස්සරහට ගෙන යනවා. මේ සම්බන්ධයෙන් මා ගෙන ආ යෝජනා පිළිබඳව ඔබ සියලුදෙනාගේ අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.17]

**ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சந்தருவன் மதரசிங்ஹ)
(The Hon. (Dr.) Sandaruwan Madarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2025.09.04 දින ගැසට් පත්‍රයේ පළ කර ඇති, ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ විවාද කරන මේ මොහොතේ යම් අදහස් කිහිපයක් දැක්වීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අපි දන්නවා, අවුරුදු 76ක් තිස්සේ නිල් පාට, කොළ පාට පක්ෂවල පාලකයන් අපේ රට පාලනය කරලා අවසානයේදී අපේ රටේ තරුණ තරුණියන්ට, ඒ වාගේම පාසල් යන දූවා දරුවන්ට ඉතිරි කළ සංස්කෘතිය මොකක්ද කියලා. ඔවුන් ඒගොල්ලන් අතර අයිස් සංස්කෘතියක් ඇති කළා; ඒගොල්ලන් අතර කුඩු සංස්කෘතියක් ඇති කළා; ඒගොල්ලන් අතර වණ්ඩි, මැර හා පාතාල සංස්කෘතියක් ඇති කළා. ඔවුන් අසමත් වුණා, තරුණ තරුණියන් අතර ක්‍රීඩා සංස්කෘතියක් ඇති කරන්න. ඔවුන් අසමත් වුණා, ක්‍රීඩාව ග්‍රාමීය පාසල් දක්වා ගෙන ගිහින් පාසල් ළමුන් අතර ක්‍රීඩා සංස්කෘතියක් ඇති කරන්න.

අපට මතකයි, අප පුංචි කාලයේ විශේෂයෙන්ම දේශපාලනඥයෙකු ගමට එනවා කිව්වාම අපි ගියා ඔහු බලන්න. ඒ ගියේ මොකද? ඒ ගොල්ලන් ආවේ අප කවදාවත් දැකපු නැති විධියේ අලුත් අලුත් වාහනවල. ඒගොල්ලන්ගේ ඇඳුම්, ඒගොල්ලන්ගේ ස්වරූපය අපට වඩා ටිකක් වෙනස්. ඒගොල්ලන්ගේ වටේ ඉන්න අය වෙනස්; හැසිරෙන විධිය පොඩ්ඩක් වෙනස්. හැබැයි, අපට තිබෙන අත්දැකීම මේකයි. එහෙම ගම්වලට, නගරවලට ආපු ඒ දේශපාලනඥයන් බොහෝ දෙනෙකු සමඟ එක්කෝ ඒ වාහනයෙන්, එහෙම නැත්නම් පිටුපස ආපු වාහනයෙන් එළියට බැස්සේ ගමේ හිටපු වණ්ඩි; නගරයේ හිටපු වණ්ඩි; ඒ ප්‍රදේශවල ජාවාරම් කරපු මිනිස්සු; ඒ ප්‍රදේශවල ජනතාව භය කරගෙන හිටපු මිනිස්සු; ඒ දේශපාලනඥයන්ගේ කොන්ත්‍රාත් කරපු මිනිස්සු. ඉතින් ඔය විධියට තමයි ඒගොල්ලෝ ලංකාව පුරාම ඒ සංස්කෘතිය ඇති කළේ. ඒවායේ අග්‍ර ඵල විධියට විශේෂයෙන්ම මා නියෝජනය කරන හම්බන්තොට දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගෙනත් පසුගිය මාස කිහිපයේ විවිධ සිද්ධීන් වාර්තා වුණා. මිද්දෙනිය ප්‍රදේශයෙන් අයිස් නිෂ්පාදනයට යොදා ගන්නා අමුද්‍රව්‍ය කිලෝ ග්‍රෑම් 50,000කට අධික ප්‍රමාණයක් සොයා ගත්තා. ඒ වාගේම, තංගල්ල ප්‍රදේශයෙන් කුඩු, හෙරොයින් කිලෝග්‍රෑම්

700කට වඩා වැඩි ප්‍රමාණයක් සහිතව පුද්ගලයන් අත්අඩංගුවට ගත්තා. ඒ විතරක් නොවෙයි. හම්බන්තොට ප්‍රදේශයේ අයිස් නිෂ්පාදනාගාරයක් වැටලුවා. ඊළඟට, එම දිස්ත්‍රික්කයේ බිහිසුණු ඝාතන සිදු වෙන්න ගත්තා. කුඩා ළමුන් පවා ඝාතනය වුණා. ඒ වාගේම, අවි ආයුධ විශාල වශයෙන් හමු වුණා. අපි හිතන්නේ නැහැ අපේ දිස්ත්‍රික්කයට කුඩු ගෙනාපු පළමු අවස්ථාව මේකයි කියලා. අපි හිතන්නේ නැහැ අපේ දිස්ත්‍රික්කයේ මැරකම්, චණ්ඩිකම් වෙච්ච පළමු අවස්ථාව මේකයි කියලා. හැබැයි, මේතාක් දුරට අත්අඩංගුවට ගැනීම් සිද්ධ වුණේ, හෙළි කර ගැනීම් සිද්ධ වුණේ අපි දන්න ඉතිහාසයේ පළමු අවස්ථාවට. ඒ කියන්නේ මොකක්ද? මේ හැම එකක් පිටුපස්සේම දිස්ත්‍රික්කයේ හිටපු දේශපාලනඥයන් හිටියා. බැරි වෙලා හෝ මේ කුඩු කිලෝ 700ම බෙදා හැරියා නම්, මේ කිලෝ 5,0000න් අයිස් හැදුවා නම් අපට කථා කරන්න වෙන්නේ ක්‍රීඩා සංස්කෘතියක් ගැන නොවෙයි, "සොම්බි" සංස්කෘතියක් ගැන. ඒතරම් බරපතළයි මේ බේදවාචකය. දැන් ජාතික ජන බලවේගය රජය විධියට අපේ දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරු 5දෙනෙක් ඉන්නවා. අපි පස්දෙනා ඇතුළු සියලුදෙනා මැදිහත්වීම් කරමින් ඉන්නේ අපේ දිස්ත්‍රික්කයෙන් කුඩු, අයිස් සහ මැර සංස්කෘතිය අතුගා දමන්නයි. අපි ඒ වෙනුවෙන් පළමු දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ ඉඳලා අපේ පැත්තෙන් කෙරෙන්න ඕනෑ මැදිහත්වීම කරනවා. අපි එහෙම කරමින් සිටියදී බංකොලොත් වියරු දේශපාලනඥයන් මාධ්‍ය ඉස්සරහා එක එක voice-cuts දෙන්න පටන් අරගෙන තිබෙනවා, ජාතික ජන බලවේගයේ අපිත් මේවා එක්ක සම්බන්ධයි කියලා. අපි කියනවා, අපි කිසිවෙක් මේ ජාවාරම්කාරයන්, මේ අපරාධකරුවන් ආරක්ෂා කරන්න කිසි ලෙසකින් වැඩ කරන්නේ නැහැ, අපි වැඩ කරන්නේ මේවා දිස්ත්‍රික්කයෙන් තුරන් කරන්නයි කියන එක. අපි දැක්කා ඒගොල්ලෝ යම් යම් තොරතුරු මාධ්‍ය ඉස්සරහා කියනවා. අපිටත් සමහර වෙලාවට යම් යම් තොරතුරු ලැබෙනවා. අපි අදාළ ආරක්ෂක අංශවලට ඒ තොරතුරු ලබා දනවා. විමල් වීරවංශ මහත්තයා මාධ්‍ය ඉස්සරහා මහා වීරයෙක් විධියට තොරතුරු විශාල ප්‍රමාණයක් හෙළි කළා. හැබැයි, පොලීසියෙන් ඒ ගැන අහන්න කථා කළාම එන්නේ නැහැ. ඒ කියන්නේ මොකක්ද? කවුරු හරි දෙන ව්‍යාජ ප්‍රවෘත්තියක් තමන්ගේ නැති වෙච්ච ප්‍රතිරූපය ගොඩනඟා ගන්න මාධ්‍ය ඉස්සරහ කියනවා. පස්සේ බය වෙනවා. දැන් අපි හොයමින් ඉන්නවා මිද්දෙණියේ මනම්පේරිලා අත්අඩංගුවට ගන්නකොට, ඒගොල්ලෝ එක්ක සම්බන්ධ කුරුණෑගල මනම්පේරිලා කවුද, මැදමුලන මනම්පේරිලා කවුද කියලා. ඒ වාගේම පුවක්දණ්ඩාවේ සනා අත්අඩංගුවට ගන්නකොට ඒගොල්ලෝ එක්ක සම්බන්ධ අම්බලන්තොට සනාලා කවුද, මාවරමණ්ඩියේ සනාලා කවුද කියන එක අපි හොයනවා. මේවා හෙළි කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ක්‍රීඩාවල ව්‍යාප්තිය ගත්තොත්, නගරයේ විශාල පාසල්වලට ක්‍රීඩාවේ පහසුකම් වැඩිපුර තිබෙනවා. ඒ පාසල්වලට ක්‍රීඩා පහසුකම් ව්‍යාප්ත වෙලා තිබෙනවා. හැබැයි, ගම්වල තිබෙන පාසල්වලට ක්‍රීඩාවේ පහසුකම් ව්‍යාප්ත වෙලා නැහැ. එහෙම ව්‍යාප්ත වෙලා තිබුණා නම් අද මේ ජාතික කණ්ඩායම්වල ඉන්නේ මේ ක්‍රීඩකයෝ නොවෙන්නත් තිබුණා. අද මේ ක්‍රීඩාව ඇතුළට තහනම් උත්තේජක රිංගලා තිබෙනවා. බුකීකරුවන්, ඔට්ටුකරුවන් මේ ක්‍රීඩාවට රිංගලා තිබෙනවා. ඒ වාගේම ක්‍රීඩාවේ විනය පිරිහිච්ච අවස්ථා අපි ඕනෑ තරම් අහලා තිබෙනවා. ඒ වුණත් ක්‍රීඩාව රට පුරා ව්‍යාප්ත කර ගන්න ඕනෑ. එහෙනම් මේ තහනම් උත්තේජක වෙන්න පුළුවන්, බුකීකරුවන් වෙන්න පුළුවන් ඒ දේවල් ඉවත් කර ගන්න ඕනෑ. ඒ සඳහා ලෝකයේ අනෙක් රටවල තිබෙන අණපනත්වලට සමගාමීව යන නීතිරීති පද්ධතියක් ලංකාව තුළත් හැදෙන්න ඕනෑ. අපි ආණ්ඩුවක් විධියට ක්‍රීඩා සංස්කෘතියක් රට ඇතුළේ හදන්න විශාල වශයෙන් මැදිහත් වෙමින් ඉන්නවා. හැබැයි, අපි දන්නවා පසුගිය කාලයේ තිබුණු ආණ්ඩු ක්‍රීඩාවට මොකක්ද කළේ කියලා. ඒගොල්ලන් කැමති කැමති ක්‍රීඩා කළා. කැමති කැමති ක්‍රීඩා promote කළා. ඒගොල්ලන්ට වඩා උඩින් යන්න ගිය ක්‍රීඩකයෝ ඝාතනය කළා. විශේෂයෙන්ම වසීම් තාජුඩීන් කියන ක්‍රීඩකයා ඝාතනය කළා. ඔහු ඝාතනය වුණේ 2012 අවුරුද්දේ. එවකට හිටපු රජය නිවේදනය කළේ, එවකට හිටපු පොලීසිය නිවේදනය කළේ, "මේක ස්වාභාවික මරණයක්. ලේවල alcohol තිබුණා. කාබන් මොනොක්සයිඩ් ආඝ්‍රාණය වෙලා" කියලා. අපි හිතන්නේ නැහැ ඒ කාලයේ මේ පරීක්ෂණ කරපු පොලීසියේ මහත්තුරුන්ට එහෙම කියන්න විශේෂ වුවමනාවක් තිබුණා කියලා. අපි හිතන්නේ නැහැ ඒ මරණ පරීක්ෂණය කරපු අධිකරණ වෛද්‍යවරුන්ට එහෙම බොරු කියන්න වුවමනාවක් තිබුණා කියලා. මේක ඇතුළේ ගැබ් වෙලා තිබෙන්නේම එවකට රට පාලනය කරපු දේශපාලනඥයන්ගේ වුවමනාව කියලා තමයි අපි හිතන්නේ. 2012දී ස්වාභාවික මරණයක් බවට පත් වෙලා තිබුණු තාජුඩීන්ගේ මරණය, 2015, 2016 කාලයේ දී සැලසුම්සහගතව, කෲර ලෙස, වධහිංසා පමුණුවා ඝාතනය කළ එකක් බවට පත් වෙනවා. එකම මරණයක් කොහොමද,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, තව විනාඩි දෙකක කාලයක් පමණයි ඔබතුමාට තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சந்தருவன் மதரசிங்ஹ)
(The Hon. (Dr.) Sandaruwan Madarasinghe)

මම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

2018 වාගේ කාලයේ සොයා ගන්නවා, "සිරිලිය සවිය" පදනමේ ඩිෆෙන්ඩර් එකක් තමයි තාජුඩීන්ගේ වාහනය පිටුපස ගියේ කියලා. වර්තමානයේ අපේ රජය ආවාට පස්සේ සිදුකළ පරීක්ෂණවලදී සොයාගන්නවා, ඒ පිටුපස ආපු වාහනයට නඟින්නේ පසුගිය කාලයේ ඝාතනය වෙච්ච මිද්දෙනියේ කජ්ජා කියලා. මිද්දෙනියේ කජ්ජා පිටුපස තිබෙන වාහනයට නඟින කාලය වෙනකොට, ඔහු එවක රජයේ අමාත්‍යාංශයක ඩ්‍රයිවර් කෙනෙකු විධියට වැඩ කළා කියලා සොයා ගන්නවා. මේ ඝාතනයට මිද්දෙනියේ කජ්ජා සම්බන්ධයි කියලා සොයා ගන්නකොට මැදමුලනේ කජ්ජලා පොඩ්ඩක් කලබල වෙනවා. මම දැක්කා රැස්වීමකදී කියනවා, එයා බලාපොරොත්තු වෙනවා ලු තාජුඩීන්ගේ ආත්මයට සහනයක් ලබා දෙන්න. ඉතින්, ඕනෑ තරම් කාලය තිබුණා නේ ඒක කරන්න. 2012දී තාජුඩීන් ඝාතනය වෙනවා. ඒක ස්වාභාවික මරණයක් කියනවා. 2015දී වෙච්ච ඝාතනයක් කියලා ඔප්පු කරනවා. එවකට ඒගොල්ලන්ගේ ආණ්ඩුව තිබුණේ. එකට කෑවා බිව්වා ලු; ගෙදර ගියා ලු; සෙල්ලම් කළා ලු. දැන් තැන් තැන්වලට ගිහිල්ලා කියනවා, ආත්මයට සහනයක් දෙනවා ලු. මේවා මේගොල්ලන්ගේ දෙබිඩි වැඩ. ඒ නිසා අපි මැදමුලනේ කජ්ජලාගේ ආත්මයට නොවෙයි, ඝාතනය වෙච්ච තාජුඩීන්ගේ ආත්මයට සහනයක් දෙන්න වැඩ කරනවා; පරීක්ෂණ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව ක්‍රියා කරන්නේ රට තුළ ක්‍රීඩා සංස්කෘතියක් ඇති කරන්නයි. මේ ආණ්ඩුව ක්‍රියා කරන්නේ ක්‍රීඩාවෙන් මේ අනීතික දේවල් ඉවත් කරන්නයි. මේ ආණ්ඩුව ක්‍රියා කරන්නේ තරුණ තරුණියන්ට, පාසල් යන දූවා දරුවන්ට මත්ද්‍රව්‍ය සංස්කෘතිය, මැර සංස්කෘතිය, චණ්ඩි සංස්කෘතිය වෙනුවට ක්‍රීඩා සංස්කෘතියක් ගේන්නයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சந்தருவன் மதரசிங்ஹ)
(The Hon. (Dr.) Sandaruwan Madarasinghe)
අපි ඒ සඳහා විශේෂ ක්‍රියාමාර්ග ගනිමින් තිබෙනවා. ඒ සඳහා මෙවැනි අණපනත් සම්මත කරමින් තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, අපේ පාලන කාලය ඇතුළත ක්‍රීඩා සංස්කෘතියක් රට තුළ හදන්න.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුනීර් මුලාෆර් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.27]

**ගරු මුනීර් මුලාෆර් මහතා (ජාතික ඒකාබද්ධතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு முனீர் முலாபர் - தேசிய ஒருமைப்பாட்டு பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of National Integration)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත දෙවන වර කියවීමේ විවාදයට එකතු වෙලා අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. මේ ගැන පසුගිය අප්‍රේල් මාසයේ 22වැනි දා වෛද්‍ය ශිරෝමි පිලපිටිය මහත්මිය හරි ලස්සන කාරණයක් කියා තිබුණා. වර්තමාන ක්‍රීඩාව පිළිබඳව එතුමිය සඳහන් කරපු කාරණාව තමයි, අද වෙනකොට ක්‍රීඩාව ධනය උපයන ප්‍රධාන මෙවලමක් බවට පත් වෙලා තිබෙනවා කියන එක. ඒ නිසා ක්‍රීඩාවේ යෙදෙන ක්‍රීඩකයන් අතර විශාල තරගකාරිත්වයක් ඇති වෙලා තිබෙනවා. ලෝක මට්ටමින් ගත්තාම ඒ ක්‍රීඩකයන්ට විශාල ඉල්ලුමක් ඇති වෙලා තිබෙනවා. සමහර ක්‍රීඩා ගත්තාම, ක්‍රිකට් ක්‍රීඩාව ගත්තාම ඒක අපේ රට පැත්තෙන් තවත් ඉදිරියට ගිහින් තිබෙනවා. එතැනදී තමන්ගේ ඉල්ලුම, අවශ්‍යතාව වැඩි කර ගැනීම සඳහා දක්ෂතාව ඔප් නංවමින් ඉදිරියට යන්න මේ ක්‍රීඩකයන්ට අවශ්‍ය වෙනවා. එවැනි අවස්ථාවලදී සමහර වෙලාවට වැරදි ක්‍රම පාවිච්චි කරමින් හැකියාව දියුණු කරගැනීමට යොමු වීමට ඔවුන් බලාපොරොත්තු වුණා. ඒ හේතු මත තහනම් උත්තේජක ලබා ගන්නා අවස්ථා තිබෙනවා.

ඒ වාගේම එතුමිය සඳහන් කරන තවත් කාරණාවක් තිබෙනවා. ඒ තමයි සමහර අවස්ථාවල සමහර ක්‍රීඩකයන්ට ඇති වන අතුරු ආබාධ, රෝගී තත්ත්ව සඳහා ලබා ගන්නා ඖෂධ. ක්‍රීඩකයන්ගේ නොදැනුවත්කම නිසා ඒ ඖෂධ තහනම් උත්තේජක කාණ්ඩයට අයත් වන අවස්ථා තිබෙනවා. ඕනෑම ක්ෂේත්‍රයක් තුළ -අධ්‍යාපනය වෙන්න පුළුවන්, දේශපාලනය වෙන්න පුළුවන්- සියලු දෙනාට සමබිමක් අවශ්‍යයි කියන කාරණාව අපි හැම කෙනාම දන්නා දෙයක්. ක්‍රීඩාවේ යෙදෙනවිට සියලුදෙනාම සම තත්ත්වයේ ඉඳලා තරග කරලා, නිසි තැනැත්තාට ජයග්‍රහණය ලැබිය යුතුයි කියන කාරණය උත්තේජක තහනම් කිරීමේ ප්‍රධාන අරමුණක් බවට පත් වෙලා තිබෙනවා.

විශේෂයෙන් අද දිනය පුරාම මෙම විවාදයට එක්වෙමින් විපක්ෂයේ සමහර පිරිස් විවිධ කරුණු කාරණා මතක් කළා. අද අපි ක්‍රීඩාවේ තහනම් උත්තේජක භාවිතාව පිළිබඳව කථා කරනවා. අපි විදේශගත වුණු අවස්ථාවල ශ්‍රී ලාංකිකයන් අපේ අත අල්ලාගෙන අපව අගය කරමින් කථා කරනවා, වර්තමාන රජයේ වැඩ පිළිවෙළ පිළිබඳව. විශේෂයෙන් මත්ද්‍රව්‍යයට එරෙහිව ක්‍රියාවට නංවා තිබෙන වැඩ පිළිවෙළ පිළිබඳව සියලුදෙනාම අගය කරමින් කථා කරන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. සමහරු මේ සභාවට ඇවිල්ලා ක්‍රීඩාවේ ජීව ගුණය වාගේම ක්‍රීඩාවට අදාළ විවිධ කරුණු කාරණාත් පැහැදිලි කරන්න උත්සාහ කළා. ක්‍රීඩාවේ ජීව ගුණය පිළිබඳව යම් යම් උදවිය කථා කරනකොට විශේෂයෙන් මතක් කළ යුතුම කාරණයක් තමයි, පසුගිය කාලයේ පැවැති රග්බි තරගවලදී සමහර පුහුණුකරුවන්ට අත්වෙච්ච ඉරණම; ක්‍රීඩා පිටිය තුළ ක්‍රීඩකයන්ට අත්වෙච්ච ඉරණම. ඒ වාගේම මේ මොහොතේ මතක් කළ යුතු, මාධ්‍ය තුළත් විශාල කතිකාවකට බඳුන් වන පුද්ගලයෙක් තමයි, අපේ රටේ හිටපු ඉතා දක්ෂ රග්බි ක්‍රීඩකයෙක් වෙච්ච වසීම් තාජුඩීන්. ඔහු පිළිබඳවත් අපි මතක් කළ යුතුයි. ක්‍රීඩාවේ ජීව ගුණය ගැන කථා කරන, ක්‍රීඩාවේ උන්නතිය පිළිබඳව කථා කරන, ක්‍රීඩකයන්ට අවස්ථාව ලබා දිය යුතුයි, ගමෙන් ක්‍රීඩාවට අවශ්‍ය පහසුකම් සලසා දිය යුතුයි කියන උදවිය තමයි ඒ දක්ෂ ක්‍රීඩකයාව ඉතාම කැත විධියට, ඉතාම කෲර විධියට ඝාතනය කළේ. ඒක අපි මතක තබා ගත යුතු වැදගත්ම කාරණාවක්.

පසුගිය මැතිවරණ සමය තුළ සමහර නායකයන් උතුරට ගිහිල්ලා උතුරේ නැති ජාත්‍යන්තර ක්‍රීඩාංගණ සොයපු ආකාරය අපි මාධ්‍ය තුළින් දැක්කා. උතුරට ගිහිල්ලා, උතුරේ හදපු නැති ක්‍රීඩාංගණ ගැන හෙව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාත් දන්නවා, අනුරාධපුරයේ නොවෙයි දඹුල්ලෙන් එහාත් ජාත්‍යන්තර ක්‍රීඩාංගණයක් නැහැ කියලා. හැබැයි, සමහර නායකයන් යාපනයට ගිහිල්ලා ජාත්‍යන්තර ක්‍රීඩාංගණ හෙව්වා. අපේ ආණ්ඩුව යටතේ අපේ ජනාධිපතිතුමා විසින් යාපනයේ ජාත්‍යන්තර ක්‍රීඩාංගණයක් ඉදි කිරීම සඳහා අවශ්‍ය පියවර ගනිමින් ඉන්නවා. ඒ වාගේම අපේ ක්‍රීඩා ඇමතිතුමාත් පසුගිය සතියේ මන්නාරමට ගියා. ඒ ප්‍රදේශයේත් ක්‍රීඩාව නඟා සිටුවීම සඳහා අවශ්‍ය පියවර ගනිමින් සිටිනවා.

අපි පැහැදිලිව මෙතැනදී මතක් කළා වගේම, තහනම් උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහිව සංශෝධනයක් ගෙන ආ පමණින් රටේ ක්‍රීඩාව නඟා සිටුවන්න බැහැ. රට තුළ ක්‍රීඩාව නඟා සිටුවන්න නම්, ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ග්‍රාමීය මට්ටමින්වත් සම්පූර්ණ කළ යුතුයි. එය අපි තරයේ විශ්වාස කරනවා. ඒ විතරක් නොවෙයි, වර්තමාන ක්‍රීඩා ඇමතිතුමා වාගේම වර්තමාන ක්‍රීඩා නියෝජ්‍ය ඇමතිතුමාත් ඒ වෙනුවෙන් ඇප කැප වී කටයුතු කරමින් සිටිනවා. ඒ වගේම ක්‍රීඩාවේ උන්නතිය සහ ක්‍රීඩකයන්ගේ අවශ්‍යතාව මත වර්තමාන රජය විසින් රුපියල් 10,000ක් ලබා දීම පිළිබඳ කාරණාව මෙතැනදී මතු වුණා. ක්‍රීඩාවේ යෙදෙන ක්‍රීඩකයන් ළඟට ගිහිල්ලා බලන්න, ඔවුන් මූල්‍යමය වශයෙන් කොතරම් අපහසුතාවට පත් වෙලා තිබෙනවාද කියලා. සමහරු ක්‍රීඩාව අතහැර කුලී වෘත්තීන්ට යන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. එවැනි තත්ත්වයක් තුළදී මෙවැනි ආධාර හරහා ඒ ක්‍රීඩකයන්ව ක්ෂේත්‍රය තුළ රඳවා ගනිමින්, ඒ සඳහා අවකාශ ලබා දෙමින් ඔවුන්ට වැඩ කටයුතු කරන්න පහසුකම් ලබා දීම තමයි කරන්න ඕනෑ. හැබැයි, විපක්ෂයේ අය ඒ රුපියල් 10,0000 ලබා දීම අවශ්‍ය නැති කාරණාවක් ලෙස හුවා දක්වන්න හදනවා. විශේෂයෙන් ක්‍රීඩා ක්ෂේත්‍රය තුළ විවිධ අංශ ඔස්සේ අපි වැඩකටයුතු කරමින් ඉන්නවා. අපේ රටේ ක්‍රීඩාව අභිමානවත් ක්‍රීඩාවක් බවට පත් කළ යුතු වග අපි තරයේ විශ්වාස කරනවා.

ජනාධිපතිතුමා පසුගිය මාසයේ -විශේෂයෙන් අවුරුද්දක් සම්පූර්ණ වීම නිමිත්තෙන්- යාපනයේ පැවති උත්සව අවස්ථාවකදී පැහැදිලිව කියපු කාරණාවක් තමයි ක්‍රීඩාව, ජාතික සමගිය පිළිබිඹු වීමේ අත්‍යවශ්‍ය සාධකයක් කියන එක. ශ්‍රී ලාංකික අනන්‍යතාවක් තිබෙන ඉතාම දක්ෂ ක්‍රීඩකයන් පිරිසක් ගොඩ නැඟීම අත්‍යවශ්‍ය කාරණාවක් වග අපි ඉතා පැහැදිලිව පිළිගන්නා කාරණාවක්.

இந்தச் சந்தர்ப்பத்தில் குறிப்பாக ஒரு விடயத்தைச் சொல்ல விரும்புகின்றேன். கடந்த வாரம் நான் சவூதி அரேபிய நாட்டுக்கான ஒரு பயணத்தை மேற்கொண்டிருந்தேன். எமது அரசாங்கம் இந்த நாட்டைப் பொறுப்பேற்றதன் பின்னர் குறிப்பாக இருமுறை சவூதி அரேபியாவின் ஜித்தா நகருக்குச் செல்லக்கூடிய வாய்ப்பு எனக்குக் கிட்டியது. அங்கு என்னைச் சந்தித்த இலங்கையர்கள், 30 வருடங்களுக்கும் மேலாக நிறுத்தப்பட்டிருக்கின்ற கொழும்பு - ஜித்தா விமான சேவையை மீண்டும் ஆரம்பித்துத் தருமாறு என்னிடம் மிகவும் பணிவாக வேண்டிக் கொண்டார்கள். குறிப்பாக, எமது அமைச்சர் அவர்கள் அண்மையிலே சவூதி அரேபியாவுக்குப் பயணம் மேற்கொண்டபோது அங்குள்ள பொறுப்பதிகாரிகளிடம் இது சம்பந்தமான விடயங்களைக் கதைத்திருந்தார். எமது நாட்டிலுள்ள சவூதி அரேபியத் தூதரகத்துடனும் நாங்கள் இது சம்பந்தமான விடயங்களைக் கதைத்திருக்கின்றோம். உண்மையிலே அந்தச் சேவையினைப் பெற்றுக்கொள்வதன் ஊடாக அந்த நாட்டிலே வாழுகின்ற இலங்கையர்கள் பல நன்மைகளை அடையக்கூடியதாக இருக்கும் என நான் நம்புகின்றேன். குறிப்பாக ஹஜ், உம்ரா போன்ற கிரியைகளுக்காகப் பயணம் மேற்கொள்பவர்களுக்கு இந்த நேரடி விமான சேவை இலகுவாக அமையும். குறித்த விடயம் சம்பந்தமாக பொறுப்பான அதிகாரிகளுடன் கலந்துரையாடி கண்டிப்பாக நாம் அதற்கான ஏற்பாடுகளை மேற்கொள்வோம் என்பதைக் கூறிக்கொள்ள விரும்புகின்றேன். ஏனெனில், அது கடந்த 30 வருடங்களுக்கு முன்னரே காணப்பட்ட ஒரு விமான சேவை.

எமது நாட்டில் வருடா வருடம் 'ஹஜ்' பயணத்தை மேற்கொள்பவர்களும் ஒவ்வொரு மாதமும் 'உம்ரா' பயணத்தை மேற்கொள்கின்றவர்களும் இருக்கிறார்கள். அந்த வகையில், இந்த விடயம் தொடர்பாகச் சம்பந்தப்பட்டவர்களுடன் கலந்துரையாடியிருக்கின்றோம். 'ஸ்ரீலங்கன் எயர்லைன்ஸ்' நிறுவனத்தைப் பொறுத்தவரையிலே, வங்குரோத்து நிலையை அடைந்து இலாபமீட்ட முடியாத ஒன்றாக மாறியிருந்த அதனை நாங்கள் மீண்டும் கட்டியெழுப்பி வருகின்ற இந்தச் சந்தர்ப்பத்திலே 'ஸ்ரீலங்கன் எயர்லைன்ஸ்' மூலம் இந்த விமான சேவையை ஆரம்பிக்க முடியுமா என்பது பற்றி கலந்தாலோசித்து வருகின்றோம். நான் முதலில் குறிப்பிட்டது போன்று சவூதி அரேபிய அரசாங்கத்துடனும் இதுபற்றி கலந்துரையாடி மிக விரைவில் அந்த மக்கள் குறித்த சேவையைப் பெற்றுக்கொள்வதற்கான வசதி வாய்ப்புகளை ஏற்படுத்திக்கொடுக்க நாங்கள் முயற்சித்து வருகின்றோம்.

உண்மையிலே அங்குள்ள மக்களோடு கலந்துரையாடிய போது, அவர்கள் இந்த நாட்டுக்கு தமது உறவினர்களைக் காண வருகின்றபோது, குறிப்பாக நோயாளிகளைப் பார்வையிடுவதற்காக அல்லது உறவினர்களின் மரண நிகழ்வுகளில் கலந்துகொள்ள வருகின்ற சந்தர்ப்பங்களில் தாம் படுகின்ற அவதிகள் பற்றி தெளிவுபடுத்தினார்கள். எனவே, வெளிநாட்டில் வாழ்கின்ற இலங்கை மக்களுடைய ஆதரவையும் பெற்று வெற்றி பெற்ற அரசாங்கம் என்ற அடிப்படையில், அவர்களுடைய உணர்வுகள், அவர்களுடைய பிரச்சினைகள் தொடர்பாகவும் நிச்சயமாகக் கலந்துரையாடிச் சிறந்ததொரு தீர்வைப் பெற்றுத் தருவதற்கான முயற்சிகளை மேற்கொள்வோம் என்பதை இந்தச் சந்தர்ப்பத்தில் குறிப்பிட்டுக்கொள்கின்றேன். நான் நாடு திரும்பியதன் பின்னர் கடந்த வாரம் குறித்த அமைச்சருடன் இது சம்பந்தமாகக் கலந்துரையாடியிருந்தேன். எனவே, இதற்காக மேற்கொள்ளக் கூடிய அத்தகைய ஏற்பாடுகளையும் நாம் நிச்சயமாகச் செய்வோம் என்ற விடயத்தை இந்தச் சந்தர்ப்பத்தில் கூறிக்கொள்கின்றேன்.நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.39]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් වාගේම, තවත් විනාඩි දෙකක කාලයක් වැඩිපුර ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මම දැක්කා, තහනම් උත්තේජක ගැන කථා කරද්දි ගොඩක්දෙනෙක් කථා කරන්න යෙදුණේ, හැම මොහොතකම අපි මාධ්‍ය තුළින් දකින අයිස් ගැන, කුඩු ගැන, ගංජා ගැන කියලා. ක්‍රීඩාවේදී තහනම් උත්තේජක හැටියට හඳුන්වන්නේ ඒවාද කියන එක පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. මාතෘකාව ගැන කථා කරනවා, හැබැයි තහනම් උත්තේජක ගැන කථා කරද්දි මම කලින් කියපු ඒවා ගැන කථා කරන්න ගත්තා. ඔබතුමන්ලාට පැහැදිලිව මම යමක් කියන්න ඕනෑ.

මේ පාර්ලිමේන්තුවට "උත්තරීතර පාර්ලිමේන්තුව" කියලා තමයි අපි කියන්නේ. අතීතයේ තිබුණු ආණ්ඩු යටතේ මේ පාර්ලිමේන්තුව බරපතළ විධියට සමාජය තුළ හෑල්ලුවට ලක් වුණා. ඒකට හේතු පාදක වුණේ, ජනතාවට වැඩදායී, සැලසුම් සහගත, නිර්මාණශීලී සාකච්ඡා වෙනුවට හැම මොහොතකම එකිනෙකාට ඇඟිල්ල දිගු කරගෙන, මඩ ගහ ගන්නා සාකච්ඡා සිද්ධවීමයි. ඒක අපි අතීතයේදීත් ඇඟිල්ල දිගු කරලා හැම කෙනෙකුටම පෙන්වා දුන්නා, මෙහෙම ගියොත් පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය විතරක් නොවෙයි, පාර්ලිමේන්තුවත් හෑල්ලුවට ලක් වෙනවා කියලා. හැබැයි, ඒක අපි එදා කිව්ව හා සමානව අදත් සිද්ධ වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අදත් උත්තරීතරයි කියන මේ පාර්ලිමේන්තුව ඉතා පහත් විධියට ක්‍රියාත්මකවීම ගැන අපි කනගාටු වෙනවා. සමස්ත රටේ ජනතාවට වැඩ ගොඩක් කරන්න තිබියදී, අලුත් සැලසුම් හදන්න තිබියදී, අලුත් නිර්මාණ බිහි කරන්න තිබියදී, ඒවා ගැන කථා කරනවා වෙනුවට අදටත් කරන්නේ එකිනෙකාට ඇඟිල්ල දිගු කරමින්, එකිනෙකාට මඩ ගහමින්, එකිනෙකාගේ පෞද්ගලික දේවල් කියන එක. මාධ්‍ය දිහා බලන්න. උදේ පාන්දර පටන් ගත්තාම සවස් වරුවේ මාධ්‍යයේ කටයුතු අවසන් වනතුරු, මාධ්‍ය තුළින් ප්‍රචාරය වන්නේ එක්කෝ පාතාලය ගැන, එක්කෝ අයිස් ගැන, එක්කෝ ගංජා ගැන, එක්කෝ කුඩු කන්ටේනර් ගැන, එක්කෝ මිනීමැරුම් ගැන, එක්කෝ එක එක තැන්වල වෙඩි තියපු ඒවා ගැන, කාගේ හරි බෙල්ල කැපුවා කියන එකක් ගැන. මෙන්න මේවා තමයි මාධ්‍ය මඟින් හැම තිස්සේම ප්‍රචාරය වෙන්නේ. දැන් මේ රටේ පුංචි දරුවාගේ ඉඳලා ජනතාවට අහන්න දකින්න ලැබෙන්නේ මොනවාද? මේක රටේ සිද්ධ වන බරපතළ වැරැද්දක්. සමාජය නොමඟ යන්නේ මෙන්න මේ කාරණා නිසායි. ඒ නිසා අඩුම තරමින් ආණ්ඩුවක් හැටියට ඔබතුමන්ලා නීතිමය කටයුතු කිරීම

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

නීතියට භාර දෙන්න. පොලීසියේ රාජකාරි ඔබතුමන්ලා කරන්න යන්න එපා. අධිකරණයේ රාජකාරි ඔබතුමන්ලා කරන්න යන්න එපා. අමාත්‍යාංශවල නිලධාරින්ට තිබෙන රාජකාරි ඔබතුමන්ලා කරන්න යන්න එපා. ඒක ඒගොල්ලන්ට කරන්න දෙන්න. ඔබතුමන්ලා දේශපාලනඥයෝ විධියට, මේ රටේ නීති හදන කණ්ඩායම හැටියට, මේ රටේ කටයුතුවලට මුදල් වෙන් කරන කණ්ඩායම හැටියට, ඒ සඳහා මුදල් හොයන කණ්ඩායම හැටියට, ජාත්‍යන්තරය එක්ක සම්බන්ධීකරණය ඇති කරගෙන අලුත් සැලසුම් නිලධාරින්ගේ අතට දීලා ක්‍රියාත්මක කරවන කණ්ඩායම හැටියට කටයුතු කරන්න. අන්න ඒ කොටස ඔබතුමන්ලා කරන්න. හැබැයි, ඒක නොවෙයි ඔබතුමන්ලා කරන්නේ. ඔබතුමන්ලාට විපක්ෂයෙන් හෝ කවුරු හරි ඇඟිල්ල දිගුකරපු ගමන්, ඔබතුමන්ලා එකවරම සරම පොඩ්ඩක් උස්සාගෙන කෑගහනවා වාගේ ඉතාම පහත් විධියට කථා කරනවා, පහත් විධියට ඒකේ එල්ලීගෙන යනවා.

මේ තහනම් උත්තේජක ගැන කථා කරද්දී ක්‍රීඩාව ගැන කොච්චර කථා කරන්න තිබෙනවාද? පාසල ගැන කොච්චර කථා කරන්න තිබෙනවාද? අද පාසල ගැන ඔබතුමන්ලාට කථා කරන්න තිබෙන්නේ මොනවාද? බලන්න, අද මේ ජන සමාජය තුළ ඔබතුමන්ලා කොණ්ඩම් බෙදන ආණ්ඩුවක් බවට පත් වෙලා තිබෙනවා නේ. අවුරුදු 16ක් ගියාට පස්සේ ළමයෙකුට රුපියල් 5,000ක් අතට දීලා ඕනෑම තැනක යමු කියන තත්ත්වයට පත් කරන කථාව ඔබතුමන්ලාට හැදිලා තිබෙනවා. මේ නිසා අද ගුරුවරුන්, දෙමව්පියන් අතර බරපතළ ප්‍රශ්නකාරී තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා.

අද "සමලිංගික" කියලා ඔබතුමන්ලාට ගහලා තිබෙන ලේබල් එක අරගෙන බලන්න. එක එක්කෙනාට එහෙම ඕනෑකම් තිබෙන්න පුළුවන්, ඒ අය ඒවා කරනවා වෙන්නත් පුළුවන්. ඒක ඒගොල්ලන්ගේ ආශාව වෙන්න පුළුවන්. හැබැයි, ඒ ආශාවට ඔබතුමන්ලා නීතියෙන් එක එක දේවල් හදලා දෙන්න සූදානම් වෙන්න එපා. ඒවා මෙච්චර කාලයක් මේ රටවල සිද්ධ වුණා, ඒක ඒ විධියට වෙන්න අරින්න. ඒ දේවල් කරන්න අයිතිය තිබෙන අයට ඒක කරන්න දෙන්න. හැබැයි, ඒකේ අයිතිය තිබෙන අයත් කෙලෙසමින් යන විධියට තමයි මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙන්නේ. ඒ නිසා මේ තුළින් දෙපැත්තටම පහර වදිනවා. තහනම් උත්තේජක ගැහුවාට කමක් නැහැ කියන මතයකට ඇවිල්ලා ද මන්දා ඔබතුමන්ලා මේ සංශෝධන ගෙනෙන්නේ.

ක්‍රීඩාව නඟාසිටුවන්න කොච්චර දේවල් කරන්න තිබෙනවාද? යාපනය පැත්තේ මන්ත්‍රීතුමෙකු අද කිව්වා, යාපනයේ හදන ජාත්‍යන්තර ක්‍රීඩාංගණය ගැන. සජිත් ප්‍රේමදාස මැතිතුමා තමයි එම ක්‍රීඩාංගණය හදන්න ඕනෑය කියන යෝජනාව ගෙනාවේ. එතුමා ගිහිල්ලා තමයි ඒක කළේ. අද ඒක ඔබතුමන්ලා ක්‍රියාත්මක කර තිබෙනවා. ඒක හොඳයි, ඒක වැදගත් දෙයක්. ඒක තමයි කළ යුත්තේ. කවුරු යෝජනා කළත්, කරන්න හැකියාව ලැබුණාම ඒක කිරීම සුදුසු නම් ඒ දේ කළ යුතුයි. ඒකට අපි එකඟයි. හැබැයි මතක තබාගන්න, ඒක පාවිච්චි කරලා හැම මොහොතකම තමුන්නාන්සේලා වෙනත් දේවල් කරන්න යන එක නුසුදුසුයි. අද වනකොට බලන්න, ආණ්ඩුව කොතැනද තිබෙන්නේ කියලා. මේ ආණ්ඩුවට කරන්න තිබුණු දේද මේ කරන්නේ? මේ ආණ්ඩුවට කරන්න තිබුණු දේ තමයි, එදා තිබුණු ආණ්ඩු වැරදි කළා නම් ඒ කරපු වැරදි නිවැරදි කිරීම. ඒ වෙනුවෙන් මේ ආණ්ඩුවේ ඉන්න බලධාරින්ට හිටගන්න තිබුණා. "අපි දැන් රට හදමු" කියන තේමාව ඉස්සරහට අරගෙන විපක්ෂයේ ඉන්න දක්ෂයෝත් ඒක රාශි කරගෙන රට හදන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න තිබුණා.

වැරදි නිවැරදිව හඳුනා ගන්න එක පැත්තකින් තියන්න. අපි රට හදන න්‍යාය ගැන බලමු. මේ රටේ යම් ව්‍යාපාරිකයෙකුට ව්‍යාපාරයක් ආරම්භ කරන්න අවශ්‍ය සහතික ටික ගන්න, reports ටික ගන්න එදා මාසයක් ගියා නම් අද මාස 6ක් යනවා. අද ආයතන ක්‍රියාත්මක වෙන්නේ නැහැ. එදා වාගේ නොවෙයි, ආයතනවල නිලධාරින් මේ දේවල් සඳහා බොහෝ කාලයක් ගන්නවා. ඒගොල්ලන් නීතියක් පෙන්වා දීලා, ඒකට කාලය ගන්නවා. ඒ විධියට නිදහසට කාරණා ඒගොල්ලන් හදාගෙන තිබෙනවා. අද හැම තැනම ඒකයි වෙන්නේ. ව්‍යාපාරයක් පටන් අරගෙන ලාභයක් ලබන්න උත්සාහ කරන කෙනා, නැත්නම් ඒ සම්බන්ධීකරණය කරන කෙනා, ආයෝජනය කරන්න ආපු කෙනා අද ඒ ආයෝජනය දාලා යනවා. ඇයි ඒ? කරන්න බැහැ. කාලය අපරාදේ නිසා. අන්න ඒවා ටික තමුන්නාන්සේලා නිදහස් කරන්න.

පාස්කු ඉරු දින ප්‍රහාරය සම්බන්ධව තමුන්නාන්සේලා එදා කළ කථා ටික බලන්න. තමුන්නාන්සේලා බලයට පත් වෙලා අවුරුද්දක් ගත වුණා. පාස්කු ඉරු දින ප්‍රහාරය සම්බන්ධව ජනතාවට කොච්චර පට්ටපල් බොරුවක්ද කළේ කියලා බලන්න. ඒවාට අවශ්‍ය විසඳුම් ගැන කථා කරන්න. ඒවා තමයි ඔබතුමන්ලා කළ යුතු දේවල්.

ඊළඟට අපි බලමු, විදේශ රටවල් එක්ක කටයුතු කරන්නේ කොහොමද කියලා. මමත් ගියා, එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ තිබුණු සැසිවාරයට. මම ඒකට ගියේ ආණ්ඩුවේ සල්ලි අරගෙනවත්, මේ කාගෙන්වත් සල්ලි අරගෙනවත් නොවෙයි. ආපදා කළමනාකරණය හා සම්බන්ධ අවස්ථාවට සහභාගි වෙන්නයි මම ගියේ. මම ගිය අවස්ථාවේ ජනාධිපතිතුමාත් එහා පැත්තෙන් හිටියා. මම මෙහා පැත්තේ කාමරයක හිටියා. රටවල් 74ක් එක්ක ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නියෝජනය කරමින් මම වාඩිවුණා. වාඩිවෙලා, මේ රටට මොනවාද කරන්න යන්නේ, අපට අවශ්‍ය දේවල් මොනවාද, ලෝකයේ රටවල් එක්ක සම්බන්ධීකරණය ගොඩනඟා ගන්නේ කොහොමද, අලුත් තාක්ෂණය සම්බන්ධව, අපි වාගේ රටකට ආපදා තත්ත්වයකදී මොනවාද අවශ්‍ය වෙන්නේ, මේ රට ස්වාභාවික වශයෙන් වෙනස් වෙලා තිබෙන ආකාරය සම්බන්ධව, වෙනස් වෙන ආකාරය සම්බන්ධව, විපත් සම්බන්ධව, එම කටයුතු කළමනාකරණය කරන්නේ කොහොමද කියන එක සම්බන්ධව තිබුණු විශේෂ සාකච්ඡාවට ලංකාව වෙනුවෙන් මමත් සහභාගි වුණා.

ඊළඟට, මේ මාසයේ 2වැනි දා මම ඉතාලියට ගියා. ඉතාලි පාර්ලිමේන්තුවේ විදේශිකයන් සඳහා තිබෙන විශේෂ කමිටුවට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හැටියට මම සහභාගි වුණා. ඒ සැසිවාරයට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙනුවෙන් මම සහභාගි වුණා. සහභාගි වෙලා ශ්‍රී ලංකාව ගැන මම කථා කළා. එතැනදී කථා කරන්න තිබෙන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රශ්න ගැන. අපේ රටේ කෙනෙක් තමයි ඒ කමිටුව නියෝජනය කරමින් සභාපති ධුරය දරන්නේ. ඒ සභාපති ධුරය දරන රවීන්ද්‍ර ජෙගනේෂන් මැතිතුමා නාපෝලි නගර සභාවේ මන්ත්‍රී කෙනෙක්. එතුමා නගර සභා මන්ත්‍රීවරයෙකු වෙන්නේ ලංකාවට විතරක් නොවෙයි, ශ්‍රී ලාංකිකයෙකු හැටියට විතරක් නොවෙයි, ඉතාලියෙන් පිට තිබෙන අනෙක් රටවල් සියල්ලම නියෝජනය කරමින් තමයි එතුමා එතැන නාගරික මන්ත්‍රීවරයෙකු හැටියට කටයුතු කරන්නේ. එතුමාට ඒ සෙනෙට් එකේ, විශේෂයෙන්ම ඉතාලි පාර්ලිමේන්තුවේ පහළ මන්ත්‍රී මණ්ඩලයේ කාරක සභාවක අවස්ථාවකුත් ලබා දීලා තිබෙනවා, සභාපතිවරයෙකු හැටියට.

තානාපතිවරු, පක්ෂ-විපක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 59දෙනෙක්, විශේෂයෙන් මේ රටත් එක්ක වැඩ කරන්න කැමැති ආයෝජකයෝ සියලුදෙනාම ඇවිල්ලා වාඩි වෙලා සාකච්ඡා කළා.

එතැනදී අපට කථා කරන්න ගොඩක් දේවල් තිබුණා. ලෝකයේ රටවල් එක්ක බැලුවාම විශේෂයෙන් ඉතාලියෙන් ශ්‍රී ලංකාවට ගන්න ගොඩක් දේවල් තිබෙනවා. ඉතා දක්ෂ ශ්‍රී ලාංකිකයින් ඉන්නවා, ඉතාලියේ වැඩ කරන. ඔවුන් එම රජයත් එක්ක වැඩ කටයුතු කරන, ඒ රජයත් එක්ක ඕනෑ දෙයක් කර ගන්න පුළුවන් අය. තමුන්නාන්සේලා බලයට ඇවිල්ලා අද වෙනකොට අවුරුද්දක කාලයක් ගත වෙලා තිබෙනවා. එදා තමුන්නාන්සේලා අපට - විශේෂයෙන් මට - ඇඟිල්ල දිගු කරලා මඩ ගැහුවා.

ශ්‍රී ලාංකිකයෝ ඉතාලි රටට ගියාට පසුව පළමුවෙනි අවුරුදු පහ තුළ ශ්‍රී ලංකා driving licence එක පෙන්වලා ඉතාලි driving licence එක විභාගයකින් තොරව ලබා ගන්න තිබුණු අවස්ථාව, MoU එක 2022දී නැති වුණා. ඒ අවස්ථාව නැති වුණේ එදා හිටපු තානාපතිවරයාගේ වැරැද්දෙන්. අපි අත්සන් කරලා තිබුණු එකඟතාව අවසන් වුණා. ඒක අලුත් කරන්න බැරි වුණා. හැබැයි, ඒක නැවත අලුත් කරන්න යනකොට අලුත් MoU එකක් විධියට යන්න සිද්ධ වුණා. ඒ කටයුත්ත කර ගන්න බැරි වුණු නිසා මම ඉතාලියට ගිහිල්ලා, ඒ වෙනුවෙන් කාලයක් තිස්සේ විශාල සටනක් කළා. මම ඒ හැම කෙනාවම හමු වුණා. මෙතැනදීත් මම විශේෂයෙන් ඉතාලි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කළා, අපට මේක ඉක්මනට අවශ්‍යයි කියලා. මොකද, ඉතාලියේ ජීවත් වන අපේ ශ්‍රී ලාංකිකයන්ට ඒක අත්‍යවශ්‍ය දෙයක්. හැබැයි, තමුන්නාන්සේලාගේ ආණ්ඩුවට අවුරුද්දක් ගත වෙලාත් තවම ඒ driving licence එක පිළිබඳව පවතින ප්‍රශ්නය විසඳන්න බැරි වුණා. තමුන්නාන්සේලා ඉතාලියේ හැම තැනකටම ගිහිල්ලා, රැස්වීම් තියලා මොනවාද කථා කළේ, මොනවාද කිව්වේ? ඔබතුමන්ලා ඒ අයගෙන් සල්ලි කොච්චර එකතු කරගෙන ආවාද? හැබැයි, අදටත් ඒ සේවය ලබා දීලා නැහැ. ඉතාලි තානාපති කාර්යාලයෙන් ඒ සේවාව දැන් හරියට ලබා දෙනවාද? ඉතාලි තානාපති කාර්යාලය තිබෙන තැනින් අයින් කරන්න ඕනෑ. රෝමයේ තමයි ප්‍රධාන කාර්යාලය තිබෙන්නේ. හරි නම් ඉතාලිය වාගේ තැනකින් අලුතෙන් ගොඩනැඟිල්ලක් මිලදී ගන්න ඕනෑ. ශ්‍රී ලාංකිකයෝ විශාල ප්‍රමාණයක් ඉතාලියේ වැඩ කරනවා. ඒ අයගේ අවශ්‍යතා ඉතා බරපතළ විධියට කඩා වැටිලා තිබෙනවා. ඒ සේවය ඔවුන්ට ලැබිලා නැහැ. ඒ අය කොච්චර මුදලක් මේ රටට එවනවාද? ඉතාලියට ගිහිල්ලා ඕනෑ කෙනෙකුට වීසා එකක් නැතුව වැඩ කරන්න පුළුවන්. හැබැයි, වීසා එකක් නැතුව වැඩ කරන කෙනා ඉතාලියේ හොරෙක් විධියට සලකන්න බැහැ. ඒ පුද්ගලයා වැඩ කරලා මේ රටට සල්ලි එවනවා. මම ඉතාලියට ගිහිල්ලා, ඔවුන් සල්ලි දමන එක තැනක වාඩි වෙලා හිටියා. අමාරුවෙන් වැඩ කරලා ඇවිල්ලා කීදෙනෙක් ගෙදරට සල්ලි එවනවාද කියලා මම ඒ අවස්ථාවේදී දැක්කා. සමහර අය කඳුළු හලමින් සල්ලි එවන්නේ. මොකද, ඔවුන් ණය වෙලා තමයි ඉතාලියට ගිහින් තිබෙන්නේ. ඒ ණය ටික ගෙවන්න සල්ලි එවනවා. ඒ සල්ලි එන්නේ අපේ රටට. විදේශ විනිමය හැටියට තමුන්නාන්සේලා පෙන්වන්නේ ඒවා. එහෙම නම් ඒ අයට අවශ්‍ය කරන ඒ සේවාව ලබා දෙන්න ඕනෑ.

මම කියන්නේ මේ ගරු සභාව තුළ ගරු කථානායකතුමාගේ වැඩ කොටස, ගරු කථානායකතුමාට පැවරී තිබෙන වගකීම අද වනකොට හරියට ඉෂ්ට වෙන්නේ නැහැ කියන එකයි. ගරු කථානායකතුමා තමයි, මුළු ලෝකයේම පාර්ලිමේන්තු එක්ක අපේ පාර්ලිමේන්තුව සම්බන්ධීකරණය කරන්න පුළුවන් කෙනා. එතුමා තමයි ඒ වගකීම භාර ගත්ත කෙනා. ඒ විතරක් නොවෙයි. එතුමා තමයි ඒ වගකීම අයිති කෙනා. මතක තියා ගන්න, එහිදී කථානායක නිල නිවස අත්‍යවශ්‍ය තැනක් කියන එක. ඒ නිල නිවසේ තමයි තානාපතිවරු, වෙනත් රටවල පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, වෙනත් සංවිධානවල අය ගෙනැල්ලා වාඩි කරලා, සාකච්ඡා කරලා, ඒ අයට සංග්‍රහ කරන්නේ. එතැන තමයි ඒ බෙදා හදා ගැනීම කරන්නේ. මේ පාර්ලිමේන්තුවේ ඔබතුමන්ලාට මන්ත්‍රීවරු 159දෙනෙක් ඉන්නවා. මේ අයව විදේශ රටවලට ගෙනියන එකේ වගකීම පැවරිලා තිබෙන්නේ, ඒ අයත් එක්ක මේ බෙදා හදා ගැනීම, ඒ අයව හඳුනා ගැනීම කළ යුත්තේ ගරු කථානායකතුමා. ඒක ගරු කථානායකතුමාගේ රාජකාරිය. ඒක මේ රටේ කළ යුතුයි. විදේශ රටවල් එක්ක ඒ සම්බන්ධීකරණය ඇති කර ගන්නේ නැතුව ලංකාවට ඉස්සරහට යන්න බැහැ. මෙන්න මේවා ටික තමුන්නාන්සේලා කරන්න; මේවා හදන්න. මේවා හදන්නේ නැතුව එක එක්කෙනාගේ ඕපදූප ටික ගෙනැල්ලා, එක එක්කෙනාට බණිමින්, අයිස් ගැනයි, කුඩු ගැනයි, ගංජා ගැනයි කියමින්, සමලිංගිකත්වය ගැන කථා කරමින්, ළමයින්වයි, දෙමාපියන්වයි, ගුරුවරුන්වයි එකට හප්පමින්, මේ රටේ හැමදෙනාවම බෙදා බින්න කරලා මේ රට විනාශ කරන තත්ත්වයට ගේන්න එපා කියන ඉල්ලීමයි මම විශේෂයෙන් කරන්නේ. අපි ඔක්කෝම එකතු වෙලා රට හදන කාර්යය කරමු. අන්න ඒ වැඩේට බහින්න කියලා තමුන්නාන්සේලාගෙන් මම ඉල්ලීමක් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් මට විනාඩි දෙකක් වැඩිපුර ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.53]

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත තමයි සාකච්ඡාවට ගන්නේ. මම හිතන විධියට, උදේ ඉඳන් සැහෙන වේලාවක් මේ පනත් කෙටුම්පත ගැන, එහි පසුබිම සහ මෙහි කාලීන අවශ්‍යතාව ගැන සාකච්ඡා ඇති වුණා.

අපි දන්නවා, විශේෂයෙන්ම මේ වෙද්දී ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජිතායතනය, ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ නීති හා රෙගුලාසිවලට අනුවයි කටයුතු කරන්නේ කියන එක. අද උදේ ගරු ඇමතිතුමාගේ කථාවේදීත් කියැවුණා, මේ වෙද්දී කාලීනව ඒ අදාළ යාවත්කාලීනකම් කිරීම නැත්නම් ලෝකයේ යාවත්කාලීන - update - කිරීම්වලට අනුගතව අපේ නීති හා රෙගුලාසි යාවත්කාලීන කිරීම නොකළ නිසා මේ වෙද්දී ශ්‍රී ලංකාවේ උත්තේජක මර්දන නීතිය, ලෝක උත්තේජක මර්දන නීතිය සමඟ අනුකූල නොවන බව දන්වා තිබෙනවාය කියලා. එම නිසා බොහොම පැහැදිලියි, මේක කාලීන අවශ්‍යතාවක් බව. ඒ නිසා තමයි අද දවසේ අපි මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් විවාද කරන්නේ.

අද උදේ ඉඳලා මේ ගරු සභාවේදී ආණ්ඩු පාර්ශ්වය පැත්තෙන් කථා කළා, උත්තේජක මර්දන නීතියට අමතරව තහනම් උත්තේජක වෙනුවෙන් යොමු වුණු අඩු අවධානය නිසා මේ රටේ ක්‍රීඩාව කොතැනටද ඇවිල්ලා තිබෙන්නේ කියන එක ගැන. එම නිසා ඒ ගැන යළි යළිත් අදහස් දක්වන්න මම බලාපොරොත්තු වෙන්නේ නැහැ, ගරු ඇමතිතුමාත් කථා කරන්න සිටින නිසා. ඒ වාගේම මට කලින් කථා කරපු ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදී කියැවුණා, තහනම් උත්තේජක ගැන කථා කරන්න තිබෙන දවසේ තහනම් උත්තේජක ගැන නැතුව මත්ද්‍රව්‍ය ගැන කථා කරනවාය කියලා. ඒ මන්ත්‍රීතුමා කිව්වා, ඒ හැසිරීම නිසා පාර්ලිමේන්තුව හැල්ලුවට ලක් වෙනවාය කියලා. අපිත්

[ගරු නජිත් ඉන්දික මහතා]

අවුරුද්දකට ආසන්න කාලයක් මේ පාර්ලිමේන්තුවේ හිටියා නේ. දවසේ මාතෘකාව මේක තමයි. පාර්ලිමේන්තුවේ සාකච්ඡා, කථා, විවාද යන විධියක් තිබෙනවා. මාතෘකාව ගැන ඇමතිවරු අදහස් දක්වලා තිබෙනවා. ඒ අදහස් දැක්වීම් තුළ,-

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
Sir, I rise to a point of Order.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මම එතුමාගේ නම සඳහන් කළේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ අදහස් දැක්වීම තුළ එතුමා දිගටම මේ මාතෘකාවට පිටින් අදහසක් ගොඩනැඟුවා. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ, ඔබතුමා ඒ ගැන කිව්වා. මගේ කථාව ඉවර වුණාම ඔබතුමා ඒ ගැන කියන්න. ඔබතුමා නිශ්චිතව කිව්වා, මේක ඇතුළේ මඩ ගහගන්නවා, කුඩු, හෙරොයින්, අයිස් ගැන කියනවා, මාතෘකාවට අදාළව කථා කරන්නේ නැහැ, ඒ නිසා පාර්ලිමේන්තුව හැල්ලුවට ලක් වෙනවාය කියලා. එවැනි අදහසක් ඔබතුමා කිව්වා. *[බාධා කිරීමක්]* ඔබතුමා ඒ ගැන කිව්වා. *[බාධා කිරීමක්]* හරි, හරි. ඔබතුමා එහෙම කිව්වා. තහනම් උත්තේජක ගැන කථා කරන්න තමයි අපට මෙතැනදී තිබෙන්නේ. හැබැයි, මේක ඕපදූපයක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේක ඕපදූපයක්වත්, මඩ ගසා ගැනීමක්වත් නොවෙයි. මඩ ගසා ගැනීමක් ඕනෑ නම්, අද උදේ ඉඳලා කරපු කථාවලදී මඩ ගහපු තැන් අරගෙන පෙන්වන්නම්. මේ රටේ මෙච්චර ලොකු ප්‍රශ්නයක් ඇතිවෙලා තිබියදී, මෙච්චර ආන්දෝලනයක් ඇතිවෙලා තිබියදී, එවැනි දේවල් සිදු වෙද්දී, මෙතැනට ඇවිල්ලා ඒ ගැන කථා කරන්නේ නැතුව අපට ගෙදර ගිහිල්ලා ඒ ගැන කථා කරන්න බැහැ නේ. ඒ ගැන කථා කරන්න තිබෙන තැන තමයි, මේ පාර්ලිමේන්තුව. මේ රටේ පාර්ලිමේන්තුව තිබෙන්නේ මේ රටේ ජාතික ප්‍රශ්න ගැන කථා කරන්න. මාතෘකාවට අදාළව විවාද කරනවා, පනත් කෙටුම්පත් සම්මත කර ගන්නවා. ඒවා ඔක්කෝම හරි. හැබැයි, එහෙමයි කියලා රටේ මෙච්චර ආන්දෝලනයක් වෙච්ච දෙයක්, මෙච්චර විනාශකාරී දෙයක් සම්බන්ධයෙන් වැඩකටයුතු කරගෙන යනකොට, ඒක ඕපදූපයක්, මඩ ගැහිල්ලක්, එහෙම නැත්නම් පාර්ලිමේන්තුව හැල්ලු කිරීමක් කියලා ගන්නවා නම්, මේ ගැන හිතන්නේ කොහොමද කියලා මට තේරෙන්නේ නැහැ.

ඇත්තටම මෙතැන මඩ ගැහිලි තිබුණා. ඒ වාගේම ඕනෑ තරම් විකෘති කිරීම් තිබුණා. රුපියල් 5,000ක් දීලා ළමයි හතර අතේ යවනවාය කියනවා. ඊට පස්සේ ලෝක ළමා දිනයේදී ළමයි ගංජා අරගෙන පාට් දැම්මාය කිව්වා. මේ ප්‍රශ්නයවත් තේරුම් ගන්නේ නැතුව, මේක ළමයින්ගේ පිටින් යවන්න එපා. දැන් මේ ප්‍රශ්නය වුණත් ළමයින්ගේ පිටින් යවන්න එපා. මේ රටේ ළමයි මොනයම් හෝ ආකාරයකට මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවෙලා ඉන්නවා නම්, අපි ඒවා සජීව ලෙස දකිනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ නගරයේ වැඩ කරන මන්ත්‍රීවරු. අවුරුදු 13, 14 වයසේ ළමයි මේවාට ඇබ්බැහිවෙලා තිබෙන්නේ කොහොමද, ඒ ජීවිත විනාශවෙලා තිබෙන්නේ කොහොමද කියලා අපි දිනපතා දකිනවා. හැබැයි, ඒක ඒ ළමයාගේ පිටින් දමන්න එපා. මේ රට තුළ ඒවා කරපු විධියක් තිබුණා. මේ රටේ මත්ද්‍රව්‍ය පිළිබඳ ප්‍රශ්නය අද තිබෙන තැනට ගෙනාපු විධියක් තිබුණා. ඒවාට අනුග්‍රහය දක්වපු, ඒ වෙනුවෙන් වැඩ කරපු දේශපාලනඥයෝ හිටියා. මේ ජාලය එකිනෙකට සම්බන්ධ වෙලා තිබුණේ. එහෙම නැතුව කොහේවත් ගිහිල්ලා අපට මත්ද්‍රව්‍ය කන්ටේනර් පිටින් අල්ලන්න හම්බ වෙන්නේ නැහැ. ඒ වාගේම මත්ද්‍රව්‍ය ෆැක්ටරි පිටින් අහු වෙන්න විධියක් නැහැ. මේ රටේ කුඩු ව්‍යාපාර, අයිස් ව්‍යාපාර කොහොමද කළේ කියන එක හැමෝම දන්නා කාරණයක්. ඒ මිනිස්සු ගැන කථා කරනකොට ඒක ඕපදූපයක් විධියට පෙන්වන්නයි, ළමයින්ගේ පිටින් වැරැදි දමන්නයි හදන ඒ සෙල්ලම මෙතැන කරන්න එපා. මේකේ ඇත්ත ප්‍රශ්නය තේරුම් ගන්න ඕනෑ; ඇත්ත ප්‍රශ්නය කථා කරන්න ඕනෑ. එම නිසා මේ රටේ දරු පරපුර නැත්නම් විනාශයට ලක් කරපු දරු පරපුර පිටින් වැරැදි පටවන්න එපා. මේකේ තිබෙන ඇත්ත ප්‍රශ්නය පිළිබඳව කථා කරමු. ඒක ඕපදූප කථා කිරීමක් නොවෙයි. එම නිසා මේ ගැන කථා කළ යුතුයි; යළි යළිත් කථා කළ යුතුයි; හෙටත් කථා කළ යුතුයි; මේක අවසන් වෙනකල් කථා කළ යුතුයි. "ඒක අමතක කරලා මේ වැඩේ කරලා යන්න" කියලා අපට කියන්න බැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලයට අමතරව තව විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම, "මේ ආණ්ඩුව කරන්න තිබෙන දේ නොවෙයි කරන්නේ, විපක්ෂයේ සහාය අරන් හොඳ දේ කරන්න තිබුණා" වාගේ දේවල් කිව්වා. ඇත්තටම කරන්න තිබෙන දේ නොවෙයිද අපි කරන්නේ? මොකක්ද, මේ ආණ්ඩුවට කරන්න තිබුණේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනාධිපතිතුමා මීට අවුරුද්දකට කලින් පත් වෙද්දී මේ රටේ ජනතාව අපෙන් බලාපොරොත්තු වුණේ මොකක්ද? ප්‍රධාන කාරණා දෙකයි නේ, මේ රටේ ජනතාව අපෙන් බලාපොරොත්තු වුණේ. අපි මේක හැමදාම කියනවා. ප්‍රතිපත්ති ප්‍රකාශනය ඇතුළේ ලොකුවට ඒ ගැන විස්තර කරලා තිබෙනවා තමයි. හැබැයි, මේ රටේ බංකොලොත් කරපු, කඩා වට්ටපු ආර්ථිකය නැවත ස්ථායීකරණය කරලා, ඔසවා තබාවි කියන බලාපොරොත්තුව ජනතාව තුළ තිබුණා. අනෙක් පැත්තෙන්, ඒකට හේතු වුණු මේ රටේ දේශපාලන සංස්කෘතිය වෙනස් කරලා, නීතියේ විධානය ස්ථාපිත කරන්න මේ ආණ්ඩුව මැදිහත් වෙයි කියලා ජනතාවට බලාපොරොත්තුවක් තිබුණා. ඔය දෙක යටතේ තමයි ඔක්කෝම දේවල් තිබෙන්නේ. මොකක්ද අපි කරන්නේ? පසුගිය කාලයේ වාගේ අදත් අවුරුද්ද අවසානයේ වාද, විවාද, සංවාද ඔස්සේ අදහස් දැක්වූවා, මේ රටේ ආර්ථික ස්ථායීකරණය අපි මොන මට්ටමට කරලා තිබෙනවාද, මේ රටේ ආයෝජකයන් පිළිබඳ විශ්වාසය මොන මට්ටමකට හදලා තිබෙනවාද කියන එක ගැන. ආදායම් කොහොම වැඩි කරගෙන තිබෙනවාද, බදු ආදායම් කොහොම වැඩි කරගෙන තිබෙනවාද, විදෙස් ආයෝජන කොච්චර ගෙනැවිත් තිබෙනවාද, අනෙක් හැම ක්ෂේත්‍රයකම මොන ආකාරයේ වර්ධනයක් කරගෙන තිබෙනවාද කියන එක ගැන මෙතැනදී අපි ඇති වෙන්න කථා කර තිබෙනවා.

අනෙක් පැත්තෙන්, දේශපාලන සංස්කෘතිය වෙනස් කරලා, මේ රටේ නීතියේ විධානය ස්ථාපිත කරන්න කියන එක තමයි අපට පැවරුණු දේ. මේ කරන්නේ ඒක. මේ කථා කරන්නේ ඒක ගැන. එතකොට මේක අහඹු දෙයක් නොවෙයි, නැත්නම් පොලීසියේ වැඩේ, උසාවියේ වැඩේ අපි මෙතැනට ඇවිල්ලා කරනවා නොවෙයි. මම දන්නේ නැහැ, මේගොල්ලන් ආසද කියලා පොලීසියෙන් අල්ලලා, newsවලත් ඒ ගැන පොඩ්ඩක් ගිහිල්ලා, ඊට පසුව වැඩි සාකච්ඡාවක් නැතුව ඒක යට යනවාට. එහෙම බැහැ. මේක ගැන හරියට කථා කරන්න ඕනෑ. මේ රටේ මිනිස්සු මේවා දැන ගන්න ඕනෑ. මේ රටේ මිනිස්සු දැන ගන්න

ඕනෑ, තමන්ගේ ළමයා කුඩු ගහන්නේ කාගේ වරදින්ද කියලා; මේ රටේ මිනිස්සු දැන ගන්න ඕනෑ, තමන්ගේ ළමයා අයිස් ගහන්නේ මොන වරදින්ද කියලා; මේ රටේ මිනිස්සු දැන ගන්න ඕනෑ, සංවිධානාත්මක අපරාධ වුණේ කොහොමද කියලා. ඒවා දැන ගන්න ඕනෑ. අපි ඒ ගැන කථා කරන්න ඕනෑ. ඒවා හෙළිදරව් වෙනවා නම්, ඒවා ගැන ආයෙත් ආයෙත් මෙතැනදී අපි කථා කරන්න ඕනෑ. ඒක අපේ වගකීම. ඒක අපි කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක තමයි අපිට මේ පාර්ලිමේන්තුවේ කරන්න තිබෙන වැඩේ. ඒ නිසා ඒ කථා එහෙම යට යන්න දෙන්න බැහැ; යට යන්න දෙන්නේත් නැහැ.

මත්ද්‍රව්‍ය මේ රටේ සාමාන්‍යකරණය කිරීමේ ක්‍රියාවලියක් තිබුණා. ඒක දැන් නේ, අපට තේරුම් යන්නේ. මත්ද්‍රව්‍ය මේ රටේ සාමාන්‍යකරණය කිරීමේ ක්‍රියාවලියක් සිදු වෙලා තිබෙනවා. අපි දන්නවා, කොළඹ ආශ්‍රිතව විතරක් නොවෙයි, පරිබාහිර ප්‍රදේශ ගත්තත් ළමයි මත්ද්‍රව්‍යවලට යොමු වෙලා. ඉස්කෝලවලත් ප්‍රශ්න තිබෙනවා. ඉස්කෝල ගැන කථා කරනකොට මේක සරලව ගන්න එපා. සමහර ඉස්කෝලවල විදුහල්පතිවරුන්, ගුරුවරුන් අපි හමු වුණාම කියන්නේ මොකක්ද? මත්ද්‍රව්‍ය පාවිච්චි කරන ළමයි ගැන ඒ අය දන්නවා. ඒවා එනවා කියලාත් දන්නවා. හැබැයි, කට අරින්න බයයි. මොකද, එළියේ සංවිධානාත්මක අපරාධ කල්ලිත් එක්ක දරුවන් සම්බන්ධ කර තිබෙන්නේ. සමහර තැන්වල එහෙම තිබෙනවා. එහෙම තමයි මේ කටයුත්ත කරගෙන ඇවිත් තිබෙන්නේ. ඉස්කෝලවලට ගියාම කියන ඒ කථා ඇහුණාම ඇඟ හිරි වැටෙනවා. එහෙම තත්ත්වයක තිබුණු රටක් තමයි මේ මෙහෙයුම හරහා ශුද්ධ කරගෙන යන්නේ. ඒ නිසා කන්ටේනර් පිටින්, ලොරි පිටින් මේවා හසු වෙද්දී, මේ කාරණය ගැන තවත් සැහැල්ලුවෙන් හිතන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉලක්කම් වශයෙන් ගත්තොත්, 2025 ජනවාරි 01වැනි දා සිට පසුගිය මාසයේ 24වැනි දා දක්වා ගත වෙච්ච කාලය ඇතුළත හෙරොයින් කිලෝග්‍රෑම් 1,243ක් හසු වෙලා තිබෙනවා. අයිස් කිලෝග්‍රෑම් 1,845ක්, ගංජා සහ කේජී කිලෝග්‍රෑම් 14,057ක්, කොකේන් කිලෝ 29ක් සහ හෂීස් කිලෝ 472ක් හසු වෙලා තිබෙනවා. මේ, පසුගිය මාස 9 ඇතුළත හසු වෙච්ච ඒවා. මේවා මේ රටේ දරුවෝ තමයි පාවිච්චි කරන්න නියමිතව තිබුණේ. වෙනදා හසු වුණේ නැති තැන්වලින් මේවා හසු වුණේ. අපි කරගෙන යන්නේ ඒ කටයුත්තයි. ඊට අමතරව අවි ආයුධ. මේවා හසු වෙද්දී මේ දැලේ ප්‍රමාණය, මේ ජාලයේ ප්‍රමාණය මොකක්ද කියන එක අපි තේරුම් ගන්න ඕනෑ. මේක බිඳ දමන එක සරල වැඩක් නොවෙයි. මේක අදාළ පොලීසියේ OIC මහත්තයාට විතරක් කරන්න පුළුවන් වැඩක් නොවෙයි. මේක අදාළ තැන ඉන්නා ආරක්ෂක නිලධාරියාට විතරක් කරන්න පුළුවන් වැඩක් නොවෙයි. මේක ඉස්කෝලේ ප්‍රින්සිපල්ට විතරක් කරන්න පුළුවන් වැඩක් නොවෙයි. මේ ගැන රටේ හැම අංශයකම අවධානය යොමු වෙලා, ඒවා වැළැක්වීමට අදාළ හැම අනුග්‍රහයක්ම ලබා දෙන්න ඕනෑ. එසේ ලබා දෙනවා කියන විශ්වාසය අපි හදන්න ඕනෑ. මෙසේ කථා කිරීමේ වැදගත්කමක් තිබෙන්නේ ඒ නිසායි.

මේ රටේ අවංක නිලධාරින් මේ ක්‍රියාවලියට ඇතුළු වෙලා තිබෙන වෙලාවේ, ඔවුන් තුළ ඒ විශ්වාසය හදන එක තමයි අපේ කටයුත්ත විය යුත්තේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි ඔවුන්ට ඒ විශ්වාසය යළි යළිත්, යළි යළිත් ලබා දෙන්න ඕනෑ. මොකද, මේ රටේ පැවැති "ආණ්ඩු පක්ෂ" කියන්නේ විශ්වාසය බිඳපු ආණ්ඩු පක්ෂ. පැවැති හැම ආණ්ඩුවම සම්බන්ධතාවක් ඇතුව තමයි මෙච්චර කල් මේ මත්ද්‍රව්‍ය ජාවාරම කර තිබෙන්නේ. අපි එහෙම නැහැ. "ඔබ වැඩේ කරන්න, අපි ඔබත් එක්ක ඉන්නවා" කියන පණිවුඩය අපි දිනපතා ලබා දුන්නේ නැත්නම්, එම නිලධාරින් අධෛර්යවත් වෙන්න පුළුවන්. ඒ නිසා අපි ඒ කටයුත්ත කරනවා. මේක ආණ්ඩුවක වැඩක් නොවෙයි. මේක මේ ජාතික ජන බලවේගයේ වැඩක් නොවෙයි. මේක මහජන ආරක්ෂක ඇමතිතුමාගේ වැඩක් නොවෙයි. මේක මේ රටේ ප්‍රශ්නයක්. මේක මේ රටේ දරුවන්ගේ ප්‍රශ්නයක්. මේ රටේ දරුවෝ හෙට දවසේ යන්නේ කොතැනටද කියන එක සම්බන්ධ ප්‍රශ්නයක්, මේක. මෙය මගේ දරුවාගේ, ඔබේ දරුවාගේ -ඔක්කෝගේම- ප්‍රශ්නයක්. මේක අන්න ඒ අර්ථයෙන් ගන්න. අනෙක් දේශපාලන කාරණා ගැන අපට ඕනෑ තරම් වාද විවාද කරන්න පුළුවන්. එහෙම නේ, අපි කරන්නේ. අණ පනත් ගෙනෙනවා; ඒවා හරිද, වැරදිද කියා බලනවා; මොනවාද සංශෝධනය වෙන්න ඕනෑ කියා බලනවා. ඒවා විවෘතයි. ඒක නේ, පාර්ලිමේන්තුව තුළ ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය යනුවෙන් දෙපිලක් හදා තිබෙන්නේ. අපි එවැනි දේවල් ගැන කථා කරමු, ඇති තරම්. හැබැයි, මේ කාරණයේදී අපි සෙල්ලම් කරන්නේ නැතුව ඉඳිමු.

මේ කාරණය සම්බන්ධයෙන් කාටවත් විවාදයක් තිබෙන්න විධියක් නැහැ. නමුත් කනගාටුවෙන් වුණත් කිව යුතු කාරණයක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම උදාහරණයක් කියන්නම්. තංගල්ලේ, මිද්දෙනියෙන් මත්ද්‍රව්‍ය කිලෝ ගණන් හසු වෙද්දී, සමහර පක්ෂ කඩිමුඩියේ මාධ්‍ය සාකච්ඡා පවත්වනවා. එසේ පවත්වා, "මේවා ආණ්ඩුවේ කන්ටේනර්, ආණ්ඩුවේ කන්ටේනර්" යනුවෙන් කියන්න හදනවා. නමුත් පොලිස් මාධ්‍ය ප්‍රකාශක නිල වශයෙන් වාඩි වෙලා කියනවා, අර පරීක්ෂණයක් පවත්වන කන්ටේනර් සිදුවීමක් තිබෙනවා නේ, ඒකට අදාළ කන්ටේනර් නොවෙයි, මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් හසු වී තිබෙන්නේ කියලා. හැබැයි, අරගොල්ලන් ආයෙත් ආයෙත් ඒකම කියනවා. ඊට පසුව කන්ටේනර් කථාවකුත් කියනවා. මම හිතන විධියට අදත් පාර්ලිමේන්තුවේදී හතර පස්දෙනෙකුම ඒ ගැන කිව්වා. කන්ටේනර් 323ක් සම්බන්ධ සාකච්ඡාවක් ආවා, ගැටලුවක් ආවා. ඒ සම්බන්ධයෙන් ජනාධිපතිතුමා විසින් ජනාධිපති කොමිසමක් පත් කළා. ඒ කොමිසමේ වාර්තාවක් ආවා. එම වාර්තාවට අදාළව මේ වනවිට සීඅයිඩී එකේ පරීක්ෂණ පැවැත්වෙනවා. ඉතින් ඔයිට වඩා මොකක්ද කරන්නේ? ඔයිට වඩා මට කරන්න දෙයක් තිබෙනවාද, මූලසුනේ සිටින ඔබතුමාට කරන්න දෙයක් තිබෙනවාද? මේ රටේ ඉහළම තැනින් ඉහළම ආකාරයට එම කටයුතු කරනවා. ප්‍රශ්නයක් තිබෙනවා නම්, හෙළිදරව් වෙයි. එතකොට ඊට අදාළ දේවල් වෙයි. එහෙම වෙනවා කියන පණිවුඩය අපි ලබා දීලා තිබෙනවා; එම විශ්වාසය මේ ආණ්ඩුව හදා තිබෙනවා. නමුත් මේ අය මොකක්ද මේ කරන්නේ? නැවත වතාවක් මේක බොඳ කරනවා, මේකේ තිබෙන කථාව බොඳ කරනවා, මේකේ අපරාධකරුවන් බොඳ කරනවා. ඒක තමයි මේ කරමින් තිබෙන්නේ.

"මීගස්ආරේ කජ්ජා" කියන පුද්ගලයා සම්බන්ධව ඔහුගේ බිරිඳ පසුගිය දවස්වල කටඋත්තරයක් දුන්නා.

ඒ කටඋත්තරයෙන් කියනවා, තාජුඩීන් ඝාතනය සිදුවන වෙලාවේ ලුහුබැඳ ගිය වාහනයක ඔහු සිටියා කියලා ඔහුගේ බිරිඳ හඳුනා ගන්නවා කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)

ඒ කටඋත්තරය දෙන්නේ කජ්ජාගේ බිරිඳ. ඒ කියන්නේ කජ්ජා ගැන. පරීක්ෂණය තාජුඩීන් ගැන. හැබැයි, පැය කිහිපයක් ඇතුළත මාධ්‍ය කැඳවලා මාධ්‍ය සාකච්ඡාවක් තියන්නේ කවුද?

[ගරු නජිත් ඉන්දික මහතා]

නාමල් රාජපක්ෂ. මොකක්ද ඒ වෙන්නේ? ඉස්සර කියමනක් තිබුණා නේ, "මලිත්ට ගහද්දී වංචලා අඬනවා" කියලා. අපට තේරෙන්නේ නැහැ, ඇයි එහෙම අඬන්නේ කියලා. එයා ගැන කියන්නේ නැහැ. එයා ගැන කථා වෙන්නේ නැහැ. පොහොට්ටුවේ වංචලාලා අඬන එක අපට තේරුම් ගන්න පුළුවන්. හැබැයි සමගි ජන බලවේගයේ නිසංසලාලා අඬන්නේ මොකටද, ඒ ගොල්ලන්ගේ ප්‍රශ්නයක් නැත්නම්? ඒ ඔක්කෝම අඬනවා නේ. ඔක්කෝම අඬනවා, ඔක්කෝම දේවල් ආණ්ඩුව පැත්තට දානවා. හරි වැඩක් වෙලා තිබෙන්නේ දැන්. මේ සෙල්ලම කරන්න එපා.

මේ කියන පුද්ගලයා ජනාධිපතිවරණයේදී පොහොට්ටුවට විතරක් නොවෙයි අනෙක් පක්ෂවලටත් සහයෝගය දීලා තිබෙනවා. ඒ හින්දාද ඔවුනුත් අඬන්නේ කියලා කියන්න අපි දන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යළි යළිත් අප කියන්නේ මෙයයි. මේක කථා නොකර යන්න හෝ ඒ ගැන කථා කළාම පාර්ලිමේන්තුව හැල්ලු වෙන කාරණාවක් හෝ නොවෙයි. මේ ගැන කථා කිරීම ජාතික අවශ්‍යතාවක්. මේ යුගයේ මේක කථා කරලා ඒකට අදාළ විශ්වාසය හදලා ඒ අදාළ ක්‍රියාවලිය ඉස්සරහට ගෙන යන්න ඕනෑ. ඒ ගැන කියවා කියවා ඉන්නවා විතරක් නොවෙයි නේ. සංවර්ධන වැඩ කෙරෙනවා. ආර්ථිකයට අදාළ මැදිහත් වීම කෙරෙනවා. අනෙකුත් සියලු දේ කෙරෙනවා. හැබැයි මේක ජාතික අවශ්‍යතාවක්. අනාගතය ගැන ප්‍රශ්නයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගැන කථා නොකර හිටියොත් තමයි පාර්ලිමේන්තුව හැල්ලු වෙන්නේ. ඒ ගැන කථා නොකර කයිවාරු, ඕපාදූප කියවා කියවා ඉඳලා වැඩක් නැහැ. රටේ ප්‍රශ්නය ගැන කථා කරන්න ඕනෑ. දරුවන්ගේ ප්‍රශ්නය ගැන කථා කරන්න ඕනෑ. ඒක නිසා මම නැවතත් කියන්නේ මෙයයි. මේක මගේ දරුවා ගැන ප්‍රශ්නයක්; මගේ දරුවාගේ අනාගතය ගැන ප්‍රශ්නයක්. මේක ඔබේ දරුවාගේ අනාගතය ගැන ප්‍රශ්නයක්. ඒක නිසා අපට ඕනෑ තරම් කරුණු කාරණා තියේවි, අණපනත් තියේවි, වාද විවාද කරන්න; සංවාද කරන්න; හැපෙන්න. ගැටලුවක් නැහැ. අපි ඒක කරමු. ඒකට තමයි මේ ආයතනය තිබෙන්නේ. ඒකට තමයි ආණ්ඩු පක්ෂයක්, විපක්ෂයක් ඉන්නේ. හැබැයි, මේ ප්‍රශ්නය එතැනට ගෙන යන්නේ නැතුව ඉඳිමු. මේකේදි අපට එවැනි විවාදයක් තිබෙන්න බැහැ. මේ ප්‍රශ්නයේදී අපට එවැනි බෙදීමක් තිබෙන්න බැහැ. මේ ප්‍රශ්නයේදී මිනිස්සු විධියට අපට තිබෙන්න පුළුවන් එක තැනයි. ඒ තැන තමයි අපි මේකෙදි මොකක්ද කරන්නේ, නැත්නම් මේ රටේ අපි ඉස්සරහට-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
මට තව තත්පර 30ක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේක, ඉස්සරහට අපේ දරුවෝ සොම්බියෙක්ද කරන්නේ, නැත්නම් මනුස්සයෙක්ද කරන්නේ කියන එක තීරණය කරන්න පුළුවන් වෙලාවක්. මේ ප්‍රශ්නය මුලිනුපුටා දාන්න ඕනෑ. ඒකට අදාළ මැදිහත් වීම කරන්න ඕනෑ. ඒ අපරාධ රාජ්‍යයට, එහෙම නැත්නම් ඒගොල්ලන් නඩත්තු කරපු මත්ද්‍රව්‍ය රාජ්‍යයට මේක යට වෙන්න දෙන්න බැහැ. ඒක නිදහස් කර ගැනීමේ ව්‍යාපෘතිය පටන් අරගෙන තිබෙනවා. ඒක කරනවා. අධිකරණයේ කාර්යය මෙතැන කරන්නේ නැහැ. පොලීසියේ කාර්යය මෙතැන කරන්නේ නැහැ. මෙතැන කරන්නේ මේ රටේ නීති, අණපනත් හදන නැත්නම් මේ රටේ දේශපාලනඥයාගේ කාර්යය. මම යෝජනා කරනවා, දේශපාලනඥයන් විධියට පක්ෂ විපක්ෂ සියලු දෙනා මේ ගැන කෙළින් හිටගෙන කථා කරලා, මේවා ගැන පරීක්ෂණ කරන, මේවා සම්බන්ධයෙන් දිවි පරදුවට තියලා කටයුතු කරන නිලධාරීන්ට ධෛර්ය දිය යුතුයි කියලා. මේක චූටි වැඩක් විධියට හැල්ලු නොකළ යුතුයි. ඒ නිසා අනෙක් සියලු දේවල් පැත්තකින් තියලා අඩු තරමින් ඒ සම්බන්ධයෙන්වත් -වෙන කිසිම දෙයක් එපා- කෙළින් හිටගෙන මැදිහත් වෙන්න කියලා විපක්ෂයටත් ආරාධනා කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ෆයිසර් මුස්තාපා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[4.07 p.m.]

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
Hon. Presiding Member, I am thankful that I have been given this opportunity to speak with regard to the Bill to amend the Convention against Doping in Sport (Amendment) Act.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩාව රටේ සහජීවනය ඇති කරගන්නා ආයුධයක් හැටියට තමයි මම දකින්නේ. කුරිරු ත්‍රස්තවාදයෙන් මේ රටේ ජනතාව වෙන් වුණා. ඒ නිසා මම විශ්වාස කරනවා, උතුර, දකුණ, නැඟෙනහිර සහ අනෙකුත් පළාත්වල ජනතාව එක්සේසත් කිරීමේ හොඳම ක්‍රියාදාමය ක්‍රීඩාවයි කියලා. හේතුව, it promotes unity through diversity. අපි සංස්කෘතික වශයෙන් හෝ ජාතීන් වශයෙන් වෙන් වුවත් අපට ක්‍රීඩාව තුළින් අපේ සංස්කෘතීන්, අපේ හැඟීම්, අපේ ප්‍රශ්න සුහදව සාකච්ඡා කිරීමේ අවස්ථාවක් තිබෙනවා. අපේ උතුරේ දරුවෝ දකුණට ඇවිල්ලා ක්‍රීඩා කරපු අවස්ථාවකදී සහජීවනයක් ඇති වෙනවා. ඒ වාගේම අපේ දකුණේ දරුවෝ උතුරට ගියා නම් සහජීවනයක් ඇති වෙනවා. හේතුව, අවුරුදු 30ක කුරිරු යුද්ධය නිසා හුඟාක් අයගේ මනස ජාතිවාදයෙන් විකෘති වෙලා තිබෙනවා. ඒ ජාතිවාදයෙන් ඇත් වෙන්න පුළුවන් වෙන්නේ ක්‍රීඩාවෙන් කියලා මා විශ්වාස කරනවා. ක්‍රීඩා ඇමතිතුමා මේ වෙලාවේ සභාවේ ඉන්නවා. ක්‍රීඩාව තුළින් අපට සම අවස්ථාවක් දිය යුතුයි. අපි දකිනවා, සමහර පළාත්වල ක්‍රීඩා පිට්ටනි, ක්‍රීඩාවලට අදාළ සම්පත්වල විශේෂ ඌනතාවක් තිබෙන බව. සම අවස්ථා දුන්නේ නැත්නම් ක්‍රීඩාව ගොඩ නඟන්න අපට බැහැ. මම හොඳ උදාහරණයක් දෙන්නම්. අතීතය දිහා බලන කොට, අපේ රටේ ක්‍රිකට් කණ්ඩායම කොළඹට සහ අවට පාසල්වලට සීමා වුණා. ඒ අවස්ථාවේදී අපි ගමට ක්‍රිකට් ගෙන ගියා. ඒ අවස්ථාවේ අපේ ගම්වල හිටපු දක්ෂ තරුණයෝ ක්‍රිකට් ක්‍රීඩාව ඉහළ තැනකට ගෙන ගියා.

අපි ක්‍රීඩාව දේශපාලනීකරණය කරන්න හොඳ නැහැ. අපි සියලුදෙනාම එකතු වෙලා අපේ දරුවන්ට සම අවස්ථා දීලා, ක්‍රීඩාව තුළින් රටේ සහජීවනය ඇති කරන්න ඕනෑ. ඒ සියලුදෙනාටම ක්‍රීඩාව තුළින් සම අවස්ථා ලබා දීමේ වගකීම පාර්ලිමේන්තුවේ අපේ මන්ත්‍රීවරුන් සියලුදෙනාට තිබෙනවා කියලා මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න කැමැතියි.

මම ළඟදී කියෙව්වා, the Report of the United Nations Partnership on the Rights of Persons with Disabilities. එය කියවද්දී මා පුදුම වුණු කාරණයක් තිබෙනවා. ඒ වාර්තාවට අනුව, ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් සියයට 8.7ක් ආබාධිත අයයි. අපි දන්නවා අපේ රටේ ආබාධිත අය සමාජයෙන් කොන් වෙලා ඉන්න බව. ඒ නිසා මම ගරු ක්‍රීඩා ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න බලාපොරොත්තු වෙනවා. අද ආබාධිත අයට සහභාගි වීමට හැකි ජාත්‍යන්තර ක්‍රීඩා තරග තිබෙනවා. ගරු ක්‍රීඩා ඇමතිතුමනි, ඔබතුමාට පුළුවන් නම් ආබාධිත ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙනුවෙන් විශේෂ අරමුදලක් ඇති කරන්න. මට මතකයි, මා ක්‍රීඩා ඇමතිව සිටි කාලයේ අන්ධ තැනැත්තන්ගේ ක්‍රිකට් කණ්ඩායමට ජාත්‍යන්තර තරගවලට සහභාගි වීමට සම්පත් ලබා ගැනීම සම්බන්ධව විශාල ප්‍රශ්නයක් ඇති වුණා. අන්තිමට මම ක්‍රිකට් පාලක මණ්ඩලයෙන් ඉල්ලීමක් කරලා තමයි ඒ කට්ටිය ජාත්‍යන්තර තරගවලට යැව්වේ.

අපි දන්නවා, ක්‍රිකට් පාලක මණ්ඩලයට විශාල මුදලක් තිබෙන බව. විශේෂයෙන්ම ආබාධිත ක්‍රිකට් ක්‍රීඩකයන් වෙනුවෙන් එම ක්‍රිකට් පාලක මණ්ඩලයේ සම්පත්වලින් සියයට 10ක මුදලක් වෙන් කරලා වෙනම අරමුදලක් පිහිටුවන්න කියලා මම ඉල්ලා සිටිනවා. මම හිතන විධියට, ඉන්දියාවේ එවැනි ක්‍රියාදාමයක් කළා. අපේ රටේ අනෙකුත් ක්‍රීඩාවලත් සම්පත් අඩුවීමක් අපි දකිනවා. ඒ අඩුව පුරවන්නත් අපට ක්‍රිකට් පාලක මණ්ඩලයේ තිබෙන විශාල සම්පත් ප්‍රමාණය ප්‍රයෝජනයට ගන්න පුළුවන් කියා මම විශ්වාස කරනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, එවැනි ක්‍රියා දාමයකට යන්න කියලා.

ඒ වාගේම, අපේ ආබාධිත රණ විරුවන්ට හුඟක් ප්‍රශ්න තිබෙන බව අපි දන්නවා. ඒ උදවියට ජාත්‍යන්තරයට ගිහිල්ලා ක්‍රීඩා තරගවලට සහභාගි වෙන්න පුළුවන් වන විධියට ඔවුන් වෙනුවෙන් වෙනම අරමුදලක් හදලා ඒ උදවියට ලෝකය දකින්න අවස්ථාවක් ලබා දෙන්න කියා මම ඉල්ලා සිටිනවා. මා ක්‍රීඩා ඇමතිවරයාව සිටි කාලයේ ලංකාව තුළ ජාත්‍යන්තර cricket matches තිබුණු අවස්ථාවේ වෙනම රණවිරු stand එකක් ඇති කළා. ඒ නිසා ලංකාව ජාත්‍යන්තර වශයෙන් තරගවලට සහභාගි වන අවස්ථාවලදී රණවිරු stand එකක් ඇති කරලා, අපේ ආබාධිත රණවිරුවන්ට අවස්ථාවක් ලබා දෙන්න කියලා මම ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

අපේ රටේ ක්‍රීඩා නීතිය සම්බන්ධයෙන් මා දකින දෙයක් තිබෙනවා. අපේ රටේ ක්‍රීඩා නීතිය තමයි, Sports Law, No. 25 of 1973. එය ඉතා යල් පැනපු නීතියක් හැටියට තමයි මම දකින්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ පනතේ හැටියට ක්‍රීඩා කණ්ඩායම අනුමත කළ යුත්තේ ඇමතිතුමා; පුහුණුකරු අනුමත කළ යුත්තේ ඇමතිතුමා; කණ්ඩායමක් පිට රට යවනවා නම්, එයත් අනුමත කළ යුත්තේ ඇමතිතුමා. හැබැයි මම විශ්වාස කරනවා, ක්‍රීඩා කණ්ඩායම, පුහුණුකරුවන් සම්බන්ධයෙන් ඇමතිතුමාට බලය දීම තුළින් ක්‍රීඩාව දේශපාලනීකරණය වෙනවා කියලා. මම ක්‍රීඩා ඇමතිවරයා වශයෙන් සිටි කාලයේදී උත්සාහයක් දැරුවා, එම නීතිය වෙනස් කරන්න, නීතිඥ මණ්ඩලයක් පත් කරලා. අපේ ක්‍රීඩා පනත දිහා බලන කොට, ඒ තුළ ක්‍රීඩාව දේශපාලනීකරණය වෙනවා. සාමාන්‍යයෙන් ඇමති කෙනෙකුගේ වගකීම ප්‍රතිපත්ති සම්බන්ධයෙන් තීන්දු තීරණ ගැනීමයි. නමුත්, අපේ ක්‍රීඩා පනත යටතේ ක්‍රීඩා ඇමතිතුමාට ඕනෑම ක්‍රීඩා සංගමයක් තහනම් කරන්න පුළුවන්; අතුරු කමිටුවක් පත් කරන්න පුළුවන්. මා හිතන විධියට, ඒ තුළින් විශාල දේශපාලනීකරණයක් ඇති වෙනවා. NOC එකත් කලින් කියා තිබෙනවා, ක්‍රීඩාවෙන් දේශපාලනය ඈත් කරන්න ඕනෑ කියලා. ගරු ඇමතිතුමනි, ඔබතුමාට ඒක කරන්න පුළුවන්. හේතුව, දේශපාලනීකරණය වෙන්නේ ඔබතුමා හෝ ඉදිරියට ඉන්න ක්‍රීඩා ඇමතිවරු නොවෙයි, ඒ පනතෙහි තිබෙන බලතලයි.

ඒ වාගේම අපි දන්නවා, ක්‍රීඩා සංගම්වල නිලවරණ සම්බන්ධයෙන් ලොකු ප්‍රශ්න තිබෙන බව. ඒ නිලවරණවලදී ප්‍රජාතන්ත්‍රවාදී ලෙස නිලධාරින් පත් කිරීම සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබුණා. මා කටයුතු කළ වකවානුවේදී මම ඡන්ද කමිටුවක් ඇති කළා. ඒ කමිටුවට විශ්‍රාමලත් විනිශ්චයකාරවරුන් පත් කළා. ඒ නිසා ඒ තුළින් යම් ස්වාධීනත්වයක් ලැබුණා. ඒ මඟින් අභියාචනා ක්‍රියාදාමයක් වෙන්නේ ඇමතිතුමාට. ගරු ඇමතිතුමනි, ක්‍රීඩා සංගම්වල ව්‍යුහය සහ ඒ ක්‍රීඩා සංගම්වල ඡන්ද පැවැත්වීම ගැන ඔබතුමා විශේෂ උනන්දුවක් දක්වා, නව නීතියක් ගෙනැල්ලා කටයුතු කළ යුතු වෙනවා. ඒ වාගේම එම සංගම්වල ස්වාධීනත්වය, නිසි පරිපාලනය වෙනුවෙන් ද කටයුතු කළ යුතුයි. විශේෂයෙන් මම මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා, එම සංගම්වල මූල්‍ය පරිපාලනයේදී ඔබතුමාගේ අමාත්‍යාංශයේ හෝ වෙනත් ආකාරයක හෝ audit එකකට යටත් කරන්න කියා. මොකද, ක්‍රීඩා සංගම්වලට විශාල මුදල් ප්‍රමාණ යනවා අපි දකිනවා. මූල්‍ය පරිපාලනයේදී ඒ සම්බන්ධයෙන් මැදිහත් වීමට අමාත්‍යාංශයට වගකීමක් තිබෙනවා. නමුත්, එය දේශපාලනීකරණයට ලක් නොවිය යුතුයි කියලා මා විශ්වාස කරනවා.

විශේෂයෙන් ක්‍රීඩාවට දේශපාලනයක් නැහැ, ජාතියක් නැහැ, ආගමක් නැහැ. හැබැයි, ලංකාවේ ක්‍රීඩා දිහා බලන කොට අපි ක්‍රිකට්වලින් යම් දියුණුවක් ලබා තිබෙනවා. පාපන්දු කියන්නේ දුප්පතාගේ ක්‍රීඩාව. හැම ගමකම ක්‍රිකට් ක්‍රීඩා භාණ්ඩ සැපයීමට යම් වියදමක් දරනවා. හැබැයි, මා දකින විධියට මේ රටේ පාපන්දු ක්‍රීඩාවට දිගින් දිගටම කුඩම්මාගේ සැලකිල්ලක් තමයි ලැබී තිබෙන්නේ. එය, ලෝකයේ තිබෙන දුප්පතාගේ ක්‍රීඩාවක්. නමුත්, එය ලෝකයේ ජනප්‍රියම ක්‍රීඩාව. ඒ නිසා ඔබතුමා පාපන්දු ක්‍රීඩාව සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කළ යුතුයි, ගරු ඇමතිතුමනි. ඇයි, අපි පාපන්දු ක්‍රීඩාවේදී මේ පසු බැස්මට ලක් වෙලා තිබෙන්නේ?

ඒ වාගේම අද අපි දකිනවා, ක්‍රීඩා සංගම් හුඟක් උසාවිවල ක්‍රීඩා කරනවා වාගේ තත්ත්වයක්. ඒ නිසා මෙම ව්‍යුහාත්මක ප්‍රශ්න සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කළ යුතුයි. ඒ හුඟක් ප්‍රශ්න ඔබතුමාගේ කාල පරිච්ඡේදයේ ඇති වූ ඒවා නොවෙයි. එක්කෙනෙකු පත් වෙනකොට තව කෙනෙක් ගිහිල්ලා නඩුවක් දානවා. අතුරු කමිටුවක් දැම්මා නම්, ඒ කමිටුවට විරුද්ධව නඩු දානවා. ඒ නිසා මා දකිනවා, ක්‍රීඩාව සම්බන්ධයෙන් කටයුතු කරද්දී අපි සියලු දෙනාගේම අදහස් ලබාගත යුතුයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, interim committees දිගින් දිගටම පත් කරලා තිබෙනවා. ඒ interim committees තුළින් වෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදී ලෙස පත් වුණු සංගම් අමාත්‍යාංශයේ අධීක්ෂණයට ලක් වෙන එකයි. මා හිතන විධියට, එවැනි බලයක් අමාත්‍යවරයාට දීම තුළින් ඒ සංගම් ඇමතිතුමාගේ ආධිපත්‍යයට ලක් වෙනවා. ඒ නිසා මා ඉල්ලා සිටිනවා, ඔබතුමා මෙම ක්‍රීඩා පනතේ නීති රාමුව සංශෝධනය කරන්න කියලා. මොකද, එය 1973 එකක්. නමුත් අද අපි ඉන්නේ 2025 වර්ෂයේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
ගරු ඇමතිතුමනි, ජනාධිපති නීතිඥවරයෙකු හැටියට මම ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා, මේ යල් පැනපු නීති සංශෝධනය කිරීමට විශේෂ අවධානයක් යොමු කරලා, එම නීති

[ගරු ෆයිසර් මුස්තාපා මහතා]

රාමුව වෙනස් කරලා සියලු දෙනාට සාධාරණයක් ඉෂ්ට වන සහ දේශපාලනීකරණයට ලක් නොවුණු පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන්න කියලා. එසේ ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා**

(மாண்புமிகு சுனில் குமார கமகே)

(The Hon. Sunil Kumara Gamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

***අනතුරුව ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. (PROF.) SENA NANAYAKKARA left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.*

[අ.භා. 4.18]

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)

(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත අද දවසේ විවාදයට ගන්නවා. මේ Convention against Doping in Sport (Amendment) Bill එක සම්මත කර ගන්නයි අප අද සූදානම් වෙන්නේ. තහනම් උත්තේජක ගත්තොත්, තරග තහනම් කරනවා; ක්‍රීඩාවේ යෙදීම තහනම් කරනවා. ඒ විතරක් නොවෙයි, ජයග්‍රහණ ලැබුවොත් ඒ ජයග්‍රහණත් තහනම් කරනවා.

අද මේ විවාදය දෙස බලාගෙන සිටියාම මට හිතෙනවා විපක්ෂයේ සමහර මහත්වරු තහනම් උත්තේජක ගහලාද කියලා. ඒ ගැන හරියට හොයලා බලන්න ඕනෑ. ඒගොල්ලන් පසුගිය මැතිවරණයට තරග කළා, ජයග්‍රහණ ලැබුවා. තහනම් උත්තේජක ගහලා නම් ඒවා ගැනත් තීන්දුවක් ගන්න වෙනවා. මොකද, මේ කථා කරන විලාසයට අපට හිතෙනවා එහෙමද කියලා. අයිස් ගැන කථා වෙනකොට, කාජුඩීන් ගැන කථා වෙනකොට, පසුගිය කාලයේ අපේ මුළු රටම මත්ද්‍රව්‍ය වසංගතයක් බවට පත් කර තිබීම ගැන කථා වෙනකොට තහනම් උත්තේජක ගහපු විපක්ෂයේ සමහරුන්ට ඒවා ඇලජික් වෙලා තිබෙනවා. ඒවා ගැන කථා කරන්න එපා ලු, ඒවා මඩ ලු, ඒවා අවලාද ලු. අපි හිතුවේ අයිස් ගැන, තාජුඩීන් ගැන, රටේ වෙච්ච අපරාධ ගැන කථා කරනකොට කලබල වෙන්නේ රාජපක්ෂවරු සහ පොහොට්ටුව විතරයි කියලා. දැන් බලාගෙන ගියාම එහෙම නොවෙයි. ගරු සජිත් මහත්මයාගේ - විපක්ෂ නායකතුමාගේ - සමහර ගෝල බාලයිනුත් මේකෙන් කලබලයට පත් වෙලා තිබෙනවා. අපි දන්නේ නැහැ ඒ ඇයි කියලා. මා දැක්කා ප්‍රවෘත්තියක්, පසුගිය දවස්වල හොරොව්පතාන ප්‍රදේශයේදී සජබ අපේක්ෂකයෙකුත් මත්ද්‍රව්‍ය සමඟ අහුවෙලා තිබුණා කියලා. ඒ නිසා කලබල වෙනවාද කියලා අපි දන්නේ නැහැ. කොහොම වුණත්, මේ කාරණය අපි ඉතාම පැහැදිලිව රටට අවධාරණය කරන්න ඕනෑ. ගිය අවුරුද්දේ සැප්තැම්බර් 21වන දාත්, ඒ වාගේම නොවැම්බර් 14වන දාත් මේ රටේ ජනතාව අපේ දෙවුර මත පටවපු වගකීමක් තිබෙනවා. ඒ තමයි, අපේ රටේ දරු පරපුරට වඩාත් සුරක්ෂිත හෙට දවසක් නිර්මාණය කර දෙන එක. ඒ නිසා මොන අවලාද නැඟුවත් අපට පවරපු වගකීම අත් හරින්න අපි සූදානම් නැහැ කියන එක අපි විපක්ෂයේ කාට කාටත් කියනවා.

විශේෂයෙන්ම විපක්ෂයේ මහත්වරුන්ට අද මේ කාරණය අමතකයි. 2015 ජනවාරි 8වන දා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති කරනකොට, එදා ඒ මැතිවරණ වේදිකාවේ තිබුණු ප්‍රධානම මාතෘකාවක් තමයි තාජුඩීන් ඝාතනයට යුක්තිය ඉටු කරනවා කියන එක; 2012 මැයි මාසයේ 17වන දා තිරශ්චීන විධියට කරපු තාජුඩීන්ගේ ඝාතනයට යුක්තිය ඉටු කරනවා කියන එක. එහෙම තමයි බලයට ආවේ. හැබැයි, අවුරුදු 5ක් තෙපර බෑවා, මෛත්‍රී-රනිල්-සජිත් ආණ්ඩුව. අද ඒ ගැන සොයාගන්න පුළුවන් කරුණු ඔස්සේ විමර්ශන සිදු වෙනකොට රාජපක්ෂලා කලබල වෙන එක ගැන අහන්න දෙයක් නැහැ. ඒ ගැන අපට පුදුම වෙන්න දෙයක් නැහැ. ඒගොල්ලනුත් කලබල වෙන්න දෙයක් නැහැ, ඒගොල්ලන්ගේ මොකක්වත් මෙතැන නැත්නම්. පොහොට්ටුවේ මහත්වරු එක පිට එක මාධ්‍ය සාකච්ඡා තිය තියා කලබල වෙන එක ගැන අපට පුදුම වෙන්න දෙයක් නැහැ. හැබැයි, දැන් විපක්ෂයත් කලබල වෙලා. විපක්ෂය කියන්නේ, මේ සජබයත් කලබල වෙලා. 2012 මැයි 17වන දා සිදු වුණු තාජුඩීන්ගේ මරණය ගැන එදා කලබල වුණු රාජපක්ෂලාගේ වුවමනාවට නියෝජ්‍ය පොලිස්පතිවරයා සැහෙන දැඟලුවා ඒක accident එකක් කියලා ඔප්පු කරන්න. ඒ වාගේම, අපේ රටේ වෛද්‍ය වෘත්තියටත් නිගා දෙමින් හිටපු අධිකරණ වෛද්‍ය නිලධාරිතුමා - අද ඔහු ජීවතුන් අතර නැහැ - වැරදි වෛද්‍ය වාර්තා දුන්නා. හැබැයි, ඊට පසු 2015-2016 වකවානුවේ මේ ගැන කරපු විමර්ශනවලදී ඒක ඝාතනයක් බව තහවුරු වෙලා තිබෙනවා; ඉල ඇට කඩලා, ඒ වාගේම ඔහුගේ තවත් අභ්‍යන්තර ඉන්ද්‍රියයන් විශාල ප්‍රමාණයකට හානි කරලා සිදු කළ ඝාතනයක් බව අද වෙනකොට තහවුරු වෙලා තිබෙනවා.

මම හිතන විධියට, දැන් ඒගොල්ලන් එකටද කොහේද ඉන්නේ. සජබයේ මහත්වරුන්ට අද පුළුවන්කම තිබෙනවා, අද ඔවුන් සමඟ අත්වැල් බැඳගෙන ඉන්න නාමල් රාජපක්ෂ ඇතුළු කණ්ඩායමට පුළුවන්කම තිබෙනවා, අද ඒ අයත් එක්ක අත්වැල් බැඳගෙන ඉන්න රාජිත සේනාරත්න එදා කියපු දේවල් ගැන නැවත කල්පනා කරලා බලන්න. රාජිත සේනාරත්න එදා මොකක්ද කිව්වේ? "තාජුඩීන්ගේ ඝාතනයේදී පැරණි රජ කාලයේ දඬුවම් දෙන විධියට තමයි දඬුවම් දීලා තිබෙන්නේ. දත් ගලවලා තිබෙනවා; ඉල ඇට 7ක් කඩලා තිබෙනවා; කකුල් කඩලා තිබෙනවා" කියලා ඔහු කියනවා. මෙහෙම කියන්නේ රාජිත සේනාරත්න. ඒ වාගේම, මේ ඝාතනය කරනකොට ජනාධිපති මන්දිරයේ ඉඳගෙන ජනාධිපති ආර්යාව දුරකථන ඇමතුම් 42ක් දුන්නා කියලා රාජිත සේනාරත්න කියනවා. ඒවා හෙළිදරව් වෙනකොට අද පොහොට්ටුව, රාජපක්ෂලා කලබල වෙනවා. හැබැයි, අපි දන්නේ නැහැ, ඇයි සජබය කලබල වෙන්නේ කියලා.

ඒ විතරක් නොවෙයි, මම දැක්කා පසුගිය දවස්වල නාමල් රාජපක්ෂ කියනවා,- නාමල් රාජපක්ෂ මේ වෙලාවේ සභාවේ හිටියා නම් හොඳයි. එතුමා අද මේ සභාව ඇතුළේ නැහැ. එතුමා හිටියා නම් හොඳයි- "තාජුඩීන්ගේ ඝාතනයට සාධාරණය ඉටු කරන්න ඕනෑ" කියලා. සාධාරණය ඉටු කරන්න ඕනෑ ලු. ඒ කොහොමද? ඒගොල්ලෝ කොහොමද සාධාරණය ඉටු කළේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? සාක්ෂි අතුරුදන් කරලා, සාක්ෂි මකලා. මේ ඝාතන ගැන අදටත් හෙළිදරව් කරන්න මෙතරම් අපහසු වෙලා තිබෙන්නේ, මේ ඝාතකයෝ අදටත් හෙළිදරව් කර ගන්න මෙතරම් අපහසු වෙලා තිබෙන්නේ මොකද? එදා සාක්ෂි සියල්ල මැකුවා. සාක්ෂි සියල්ල වැහුවා. සාක්ෂි වළ දැම්මා. හැබැයි, සාක්ෂි වළ දැම්මාට අන්න කජ්ජලා හරහා නැවත සාක්ෂි මතු වෙනවා. අද ඇතුළේ ඉන්න සංවිධානාත්මක අපරාධකරුවන් හරහා, මේගොල්ලන්ගේ ඥාතියෝ හරහා අද ඒවා එකින් එක එකින් එක එළියට එමින් තිබෙනවා. ඒ නිසා වෙනදාටත් වඩා වැඩියෙන් අද මේ අය කලබල වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, සමහරුන්ට සමහර වචන ඇහෙනකොට ඇඟ කිලිපොළා යනවා; හිරිගඩු පිපෙනවා; කකුල් වෙව්ලනවා; හීන් දාඩිය දානවා; වෙන්න ඕනෑ ඔක්කෝම සෙල්ලම් වෙනවා. දැන් තාජුඩීන්ගේ නම ඇහෙනකොට මගේ අම්මේ මේ ඔක්කෝටම එහෙමයි.

දැන් පොලිස් මාධ්‍ය ප්‍රකාශකතුමා ගැන කියනවා. ඉතින් එතුමා පොලිස් මාධ්‍ය ප්‍රකාශක නේ. ඒ නමේ ම තිබෙනවා නේ ඒකේ අරුත. එතුමා පොලිස් මාධ්‍ය ප්‍රකාශක. එතුමාගේ වගකීම තමයි මාධ්‍යවලට අවශ්‍ය, අත්‍යවශ්‍ය, එහෙම නැත්නම් රටේ ජනතාව දැනගත යුතු තොරතුරු කියන එක. තාජුඩීන් ඝාතනය කරපු වෙලාවේ ඔහුගේ වාහනයේ පිටුපසින් කජ්ජා ගමන් කළාය කියලා කජ්ජාගේ බිරිඳ හඳුනාගෙන තිබෙනවා කියලා පොලිස් මාධ්‍ය ප්‍රකාශක කියනකොට, මේගොල්ලන් ඒකට විවිධ දේවල් කියනවා. කජ්ජාගේ නෝනා හිටියේ කොහේද, හිටියේ කා එක්කද කියන ඒ වාගේ වෙන වෙන දේවල් ඒ අය අහන්නේ. යන්නේ කොහේද, මල්ලේ පොල් උත්තර නේ දෙන්නේ. වැල් බයිලා ගහනවා. එහෙම වෙන එක ගැනත් අහන්න දෙයක් නැහැ. ඔළුව කොලොප්පම් වුණාම, ඔළුව කලබල වුණාම ඒ ජාතියේ ඒවා කියන එක ගැනත් අපට අහන්න දෙයක් නැහැ, පුදුම වෙන්න දෙයක් නැහැ. ඒ නිසා තාජුඩීන්ගේ නම ඇහෙනකොට වෙවුලන මහත්වරුන්ට අපි කියන්න ඕනෑ, ඔයගොල්ලන් සම්බන්ධ නැත්නම් කලබල නැතිව ඉන්න කියලා.

අයිස් ගැන කියනකොට මේ මහත්වරු උපරිම උත්සාහ කරනවා, අර කන්ටේනර් 323 ඇතුළේ මේ අයිස් තිබුණා කියලා කියන්න. අපි දන්නේ නැහැ, ඒක ඔළුවෙන් හිටගෙන ද කියන්නේ කියලා. පොලිස් මාධ්‍ය ප්‍රකාශක ඇතුළු හැමෝම ඇති වෙනකම් කියලා තිබෙනවා, නාමල්ගේ ගෝලයන්ගේ, පොහොට්ටුවේ මන්ත්‍රී සම්පත් මනම්පේරිගේ ඉඩමක තිබිලා ඒ අහුවෙච්ච කන්ටේනර් දෙක මේ කියන කන්ටේනර් 323 අතර තිබුණේ නැහැ කියලා. හැබැයි, පොහොට්ටුවයි, මේ සජබයේ මහත්වරුයි තවම ඒ කන්ටේනර් කරේ තියාගෙන යනවා. කන්ටේනර් ගැන පරීක්ෂණය කළේ අපේ ජනාධිපතිතුමා විසින් පත් කරන ලද කමිටුවක් තුළින්. ඒ පරීක්ෂණ වාර්තාව අද වන විට CID එකට බාර දීලා තිබෙනවා. එහෙම තිබියදී අද ඒ කන්ටේනර් ගැන නැවත නැවත කියනවා. කමක් නැහැ, අපේ මේ අවුරුදු 5 පුරාම කන්ටේනර් ටික ඔළුවේ තියාගෙන යන්න. කන්ටේනර් ඔළුවේ තියාගෙන යන්න. හැබැයි, දැන් ජනතාව ඔයගොල්ලන් ඔළුවෙන් බිමට බස්සලා ගොඩක් කල්. මේ ඉතිරි අවුරුදු 4 යනකොට ඉතිරි ටිකත් බිමටම බස්සනවා කියලා අපි දන්නවා. ඒ නිසා ඔයගොල්ලන්ට පුළුවන් ඒ ගැන නැවත නැවත කිය කියා යන්න.

ඒ වාගේම විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන් සඳහන් කරනවා අපි දැක්කා, මාලිමාවේ - NPP - මන්ත්‍රීවරු ගුරුවරු හිරේ දමන්න හදනවා කියලා. පසුගිය මැතිවරණ දෙකේදීම අපි බලයට ගෙන එද්දී සුවිශේෂීම කාර්යභාරයක් ඉටු කරපු බලවේගය තමයි මේ රටේ ගුරු-විදුහල්පතිවරු. ඒ සඳහා ඔවුන්ට කරන්න පුළුවන් උපරිම මැදිහත්වීම කළා. අදටත් අපිට ඒවා අමතක නැහැ. ඒ නිසා අපි මේ රටේ ජනතාවට; අපිව බලයට පත් කරපු හෝ නොකරපු කිසිවෙකුට එරෙහිව කිසිදු තීන්දුවක් මේ පාර්ලිමේන්තුව අතුළේ සම්මත කරන්නේ නැහැ කියන සහතිකය අපි දෙනවා. ඒ විතරක් නොවෙයි. අපි මේ පාර්ලිමේන්තුව ඇතුළේ මෙතෙක් ගෙනාපු හැම අණපනතක්ම, මෙතෙක් ගත්ත හැම තීන්දුවක්ම මේ රටේ ජනතාව වෙනුවෙන් ගත්ත තීන්දු තීරණ. සමහර නෝනා මහත්වරු, සමහර නීතිඥ මහත්වරු දැන් ගුරුවරු හිරේ දමලාත් ඉවරයි කියලා අපි දැක්කා. ඒ පනත් කෙටුම්පත තවම සම්මත වෙලා නැහැ. පළමුවැනි දවසේ මේ ගැන සාකච්ඡා කළා. "අපිට අවශ්‍ය නම් මේ පනත් කෙටුම්පත සංශෝධන සහිතව සම්මත කරගන්න පුළුවන්. කවුරුහරි හිතනවා නම් මේ පනත අවශ්‍ය නැහැ කියලා, අපිට මේක සම්මත නොකර ඉන්නත් පුළුවන්" කියලා ජනාධිපති අනුර දිසානායක සහෝදරයා පසුගිය දවස්වල පැහැදිලිව කිව්වා. එහෙම කියද්දිත් නැවත නැවත මේ රටේ ගුරු විදුහල්පතිවරුන්ව අපෙන් බිඳවන්න උත්සාහ කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)

I am winding up, Sir.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ගුරුවරු, විදුහල්පතිවරු වෙනුවෙන් විතරක් නොවෙයි, සමස්ත ජනතාව වෙනුවෙන් අපේ දෙවුර මත පැටවුණු වගකීම අපි නොපිරිහෙලා ඉටු කරනවා කියන කාරණය අපි අවධාරණය කරනවා.

මට තව විනාඩියක්, දෙකක් දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. "ගංජා, අරක්කු අරගෙන ගියා, ඒ වාගේ වෙලාවලදී මොකද කරන්නේ?" කියලා ළමා දිනය දවසේ කියනවා අපි දැක්කා. ඒ වාගේ වෙලාවලදී කලින් කරපු දේම තමයි කරන්න ඕනෑ. මොකද, තවම ඒ පනත් කෙටුම්පත සම්මත වෙලා නැහැ. පසුගිය පළමුවැනි දා මොනරාගල පැත්තේ පාසල් සිසුවෙක් ගුරුවරයෙකුට පහර දීලා තිබුණා. ඒකත් ඒ පනත පිටින් දාන්න හදනවා. එහෙම දෙයක් නැහැ. ඒ පනත් කෙටුම්පත තවම සම්මත වෙලා නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගුරුවරයෙක් ලෙස ඔබතුමාත් මේක දන්නවා. අවසානයට අධ්‍යාපන අමාත්‍යාංශයේ හිටපු ලේකම් බන්දුසේන මහතා නිකුත් කළ චක්‍රලේඛය තමයි 12/2016 කියන චක්‍රලේඛය. ඒ අනුව පැහැදිලිව දරුවන්ට ශාරීරික දඬුවම් දෙන එක ගුරුවරුන්ට තහනම් කරලා තිබෙනවා. 1907දී තමයි ඒ සම්බන්ධව පළමුවැනි චක්‍රලේඛය නිකුත් කළේ. පාසල් තුළ දරුවන්ට ශාරීරික දඬුවම් කරන්න ගුරුවරුන්ට තහනම් කරමින් එතැන් සිට චක්‍රලේඛ ගණනාවක් ගහලා තිබෙනවා. එසේ තිබියදී බොරු මත හදමින් රටේ ජනතාව නොමඟ යවන්න හදනවා.

ඒ වාගේම මම මේ කාරණයත් කියන්න ඕනෑ. රුපියල් කෝටි 8ට, 10ට මන්ත්‍රීකම් විකුණපු සමහර මහත්වරු අපෙන් අහනවා, ලජ්ජා නැද්ද කියලා; මන්ත්‍රීකම විකුණද්දි ලජ්ජා නැති වුණු

[ගරු මහින්ද ජයසිංහ මහතා]

මහත්වරු අපෙන් අහනවා, ලජ්ජා නැද්ද කියලා. ඒ නිසා අපිට අවසාන වශයෙන් කියන්න තිබෙන්නේ මේකයි. තහනම් උත්තේජක සම්බන්ධයෙන් වන පනත් කෙටුම්පත ගැන සාකච්ඡා කරන අද දවසේ විපක්ෂයේ ගොඩක් අය තහනම් උත්තේජක අරගෙන වාගේ තත්ත්වයක් තමයි අපිට පෙනෙන්න තිබෙන්නේ. ඒගොල්ලන්ට තහනම් උත්තේජකවලින් මුළු කාලයම දිගටම ජීවත් වෙන්න පුළුවන්කම තිබෙනවා. ඒ බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. මට වැඩිපුර කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අජිත් ගිහාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 2ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.31]

**ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා මීට සුළු මොහොතකට පෙර මේ සභාවේ මහා විලාපයක් තියලා ගියා මම දැක්කා. එතුමාත් පුත්තලම දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක්. ඉතාලි රාජ්‍යයේ සේවය කරන ශ්‍රී ලාංකීය ජනතාවගේ රියැදුරු බලපත්‍රය සම්බන්ධයෙන් මහා විලාපයක් තිබුණා කියලා පුත්තලම දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයකු විධියට මම දන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු ගණනක් ගත වුණත් පසුගිය ආණ්ඩු විසින් මේ රියැදුරු බලපත්‍රය අලුත් කරගන්න වැඩ පිළිවෙළක් හදලා තිබුණේ නැහැ. හැබැයි හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා එවකට මේ පාර්ලිමේන්තුවේ හිටියා. ඒ නිසා එතුමා පසුගිය ආණ්ඩුවට මේ චෝදනාව කළාද කියලා අපි අහනවා. එතුමා දැන දැන තමයි බොරු ප්‍රකාශයක් කළේ. නවක මන්ත්‍රීවරයකු විධියට මම මේ පාර්ලිමේන්තුවට ඒ ප්‍රශ්නය යොමු කළා. අපේ විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යවරයා ඒකට උත්තර දුන්නා. ඒ අවස්ථාවේ එතුමා පැහැදිලිව කිව්වා, ඒ රියැදුරු බලපත්‍ර ලබා දෙන්න කටයුතු කරනවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය දිනවල ඉතාලි විදේශ නියෝජිතයෝ මේ රටට ආපු බව ඔබතුමා දන්නවා. අපි ඔවුන් සමඟ සාකච්ඡා කළා. සාකච්ඡා කරලා අවශ්‍ය මැදිහත්වීම් කරලා තිබෙනවා. ඒ බව එතුමා දන්නවා. ඒ දැන දැනත් එතුමා මෙතැනදි බොරු කිව්වා. අපි තව මාස දෙකක් යද්දි ඉතාලියේ වෙසෙන ශ්‍රී ලාංකීය ජනතාවගේ රියැදුරු බලපත්‍ර අලුත් කිරීම සඳහා වැඩ පිළිවෙළක් හදනවා. එතුමා දන්නේ නැතුව නොවෙයි කථා කළේ. මේක තමයි විපක්ෂයේ වර්තමාන ක්‍රියාකලාපය. විපක්ෂයට එල්ලෙන්න වැලක් නැතුව මොනවා හරි බොරුවක් කියලා මෙතැනින් පැනලා දුවනවා. අද එතුමා මොකක්ද කළේ? උත්තරයක් ගන්නවත් හිටියේ නැතුව පැනලා දිව්වා. මම ඇත්තටම ඒ ගැන ලජ්ජා වෙනවා. පුත්තලම දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයකු විධියට, ඉතාලියේ වෙසෙන ශ්‍රී ලාංකීය ජනතාවට අවශ්‍ය කටයුතු දන්න කෙනෙක් විධියට මම කියනවා, මේ වෙනුවෙන් අපි අපේ මැදිහත්වීම කර තිබෙන බව. එතුමා දැන දැනත් බොරුවක් කිව්වා. ඒ නිසා ලජ්ජයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීවරයා අද කළේ ඉතාලියේ වෙසෙන ශ්‍රී ලාංකීය ජනතාව වෙනුවෙන් හඬක් නැඟීම නොවෙයි, ඉතාලියේ වෙසෙන ශ්‍රී ලාංකීය ජනතාවට අවමන් කිරීමක්. මොකද, අපි ඒ මැදිහත්වීම ඉතා ඉක්මනින් කරලා තිබෙනවා. "අවුරුද්දක් ගියා, මැදිහත් වුණේ නැහැ" කියලා එතුමා කිව්වා. අපි අවුරුද්දක් යද්දි අවශ්‍ය මැදිහත්වීම කරලා; අවශ්‍ය කටයුතු කරලා ඒක ලබා දෙන්නත් කටයුතු කර තිබෙනවා. ඒ නිසා ඔබතුමන්ලාට වැඩිය හුඟක් ඉදිරියෙනුයි අපි ඉන්නේ. ඔබතුමන්ලා හිතනකොට, අපි ඊට ඉදිරියෙන් වැඩ කටයුතු කරන ආණ්ඩුවක්. අපි ඒක කියන්න ඕනෑ. ඔබතුමන්ලා දැනගන්න. ඔබතුමන්ලා දන්නේ නැත්නම් අද අහගන්න. ඔබතුමන්ලා හැරෙද්දි අපි ගව්ගණනක් ඉදිරියෙන් වැඩ කරලා තිබෙනවා. මේ ආණ්ඩුව විදේශ රටවල සිටින ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් අවශ්‍ය මැදිහත් වීම ඒ ආකාරයෙන්ම සිදු කරලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.34]

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ் அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)

*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, விளையாட்டில் ஊக்கு பதார்த்தப் பயன்பாட்டிற்கெதிரான சமவாயத் திருத்தச் சட்டமூலம் தொடர்பான இன்றைய விவாதத்தில் உரையாற்ற எனக்குச் சந்தர்ப்பமளித்தமைக்காக நன்றி தெரிவித்துக் கொள்கின்றேன். அம்பாறை மாவட்டத்தின் பல பிரதேச செயலாளர் பிரிவுகளில் உள்ள விளையாட்டு மைதானங்கள் பல்வேறுபட்ட குறைபாடுகளுடன் காணப்படுவதை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். அதிலும் குறிப்பாக, பின்தங்கிய பல இடங்களில் நவீன ரக விளையாட்டு மைதானமோ, விளையாடக்கூடிய போதுமான அளவு இட வசதியுடன்கூடிய மைதானமோ இல்லாமல் இருப்பது மிகவும் வேதனையாக இருக்கின்றது. நாவிதன்வெளி பிரதேச செயலகப் பிரிவில் சிறந்த தரத்திலான ஒரு மைதானம் இல்லை என்பதுவும் அங்கு ஒரு மைதானத்தை அமைப்பதற்கு வசதியாக அரசாங்க நிலம் இல்லை என்ற விடயமும் பிரதேச ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்திலே பிரஸ்தாபிக்கப்பட்டதை இந்த இடத்திலே நான் ஞாபகமூட்ட விரும்புகின்றேன்.

மேலும், நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற பொத்துவில் பிரதேசத்திலே ஒரு பொது மைதானத்தைப் பெற்றுக்கொள்ள முடியாமல் கடந்த 15 வருட காலமாக அங்குள்ள விளையாட்டு வீரர்கள் போராடி வருகின்றார்கள். பதிவுசெய்யப்பட்ட 40 விளையாட்டுக் கழகங்களும், பதிவுசெய்யப்பட்ட 30க்கும் அதிகமான இளைஞர் கழகங்களும் இருக்கின்ற அந்தப் பிரதேச செயலகப் பிரிவிலே தடகள வீரர் ஏ.எல்.எம். அஸ்ரப் என்பவர் தேசிய மற்றும் சர்வதேச ரீதியில் சிறந்த விளையாட்டு வீரராகத் திகழ்ந்து வருகின்றார். ஒரு நவீன ரக விளையாட்டு மைதானத்தில் விளையாட்டுப் பயிற்சியைப் பெறக்கூடிய வசதியற்றிருக்கின்ற அவர் இவ்வாறு தேசிய மற்றும் சர்வதேச ரீதியிலே பதக்கங்களைப் பெற்றிருப்பதை மிகவும் பாராட்டத்தக்க ஒரு விடயமாகவே நாங்கள் பார்க்கின்றோம். அது மட்டுமல்ல, நவீன ரக சிறந்த தரத்திலான விளையாட்டு மைதானம் ஒன்று இல்லாதபோதிலும், தேசியப் பாடசாலைகளில் ஒன்றான எங்களுடைய பொத்துவில் மத்திய

கல்லூரி அண்மையிலே நடைபெற்ற 'கிரிக்கெட்' போட்டியிலே தேசிய ரீதியிலே வெற்றிபெற்ற சம்பவத்தையும் நான் குறிப்பிட்டுக் கூற விரும்புகின்றேன். அந்த வகையில், எமது ஊருக்கான ஒரு பொது மைதானத்தை வட்டிவெளிப் பிரதேசம் அல்லது களப்புக்காட்டுப் பிரதேசம் அல்லது சர்வோதயபுரப் பிரதேசத்திலே பெற்றுத் தருவதற்கு இந்த அரசாங்கம் நடவடிக்கை எடுக்க வேண்டுமென மிகவும் அன்புடன் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

மேலும், ஊறணை சரஸ்வதி வித்தியாலயத்திற்கு ஒரு மைதானத்தைப் பெற்றுக்கொள்ள வேண்டுமென்று அந்தப் பாடசாலை ஆசிரியர்கள், மாணவர்கள் மற்றும் அந்தப் பகுதியினுடைய பிரதேச சபை உறுப்பினர் ரீ.ஜெயராம் உட்படப் பலரும் முயற்சித்துக்கொண்டு இருக்கின்றார்கள். ஆனால், பொத்துவில் பிரதேச செயலகப் பிரிவிலே அந்தப் பாடசாலைக்காக ஒரு பொது மைதானத்தை அமைத்துக்கொள்வதற்கான அரச நிலம் இல்லை என்று குறிப்பிடப்படுவது மிகவும் கவலையளிக்கின்றது. அந்தப் பாடசாலை மிகவும் பின்தங்கிய நிலையிலே இருக்கின்றது. அந்தப் பாடசாலைக்கு ஓர் அரச நிலத்தினை ஒதுக்குவதன்மூலமாக அங்கு ஒரு மைதானத்தை அமைப்பதற்கு ஆவன செய்யவேண்டும் என்று இந்தச் சபையில் நான் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எமது பிரதேசத்திலுள்ள பசறிச்சேனை அல்-இஷாக் வித்தியாலயம், அல்-அக்ஸா வித்தியாலயம், செங்காமம் மினா வித்தியாலயம், நூரானியா வித்தியாலயம், முனவ்வரா வித்தியாலயம், ஹிஜ்ரா வித்தியாலயம், மனாருல் உலூம் வித்தியாலயம், தாறுல் பலாஹ் வித்தியாலயம் போன்ற பாடசாலைகள் மிகவும் வசதிகளற்று, மைதானமே இல்லாத நிலையிலும் மாணவர்களின் விளையாட்டுத் திறனை ஊக்குவித்து வருகின்றன. இவ்வாறான நிலைமையில் அங்கு ஒரு பொது மைதானத்தை அமைத்துத் தந்தால்கூட இந்தப் பாடசாலை மாணவர்கள் தங்களுடைய விளையாட்டுத் திறனை மிகவும் ஊக்குவித்துக் கொள்ள முடியும் என்ற நம்பிக்கை எங்களுக்கு இருக்கின்றது.

அது மாத்திரமல்ல, நான் ஏற்கெனவே குறிப்பிட்டதுபோன்று பொத்துவில் பிரதேச சபையில் பதிவு செய்யப்பட்டிருக்கின்ற 40 விளையாட்டுக் கழகங்கள் மற்றும் 30க்கும் அதிகமான இளைஞர் கழகங்களைச் சேர்ந்தவர்கள் அங்கு அடிப்படை வசதிகள் எதுவுமில்லாமல் வெறும் மணல் தரையாகவுள்ள கோமாரி விளையாட்டு மைதானம், பசறிச்சேனை ஜலால்டீன் சதுக்க விளையாட்டு மைதானம் ஆகியவற்றில் விளையாடிக்கொண்டிருக்கின்ற நிலைமை மிகவும் கவலையளிக்கின்றது. அந்த மைதானங்களையாவது சீரமைத்துத் தருவதன் மூலமாக எமது பிரதேசத்திலுள்ள விளையாட்டு வீரர்கள் தேசிய ரீதியிலும் சர்வதேச ரீதியிலும் பிரகாசிக்க முடியும் என்ற நம்பிக்கை எங்களுக்கு இருக்கின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ஏனைய மாவட்டங்களில் விளையாட்டு வீரர்கள் நவீன கடினப்பந்து 'கிரிக்கெட்'இனை விளையாடிக்கொண்டு வருகின்றார்கள். ஆனால், எமது மாவட்டத்தில் அதற்குரிய நிலைமை இல்லை என்பது மிகவும் கவலையளிக்கின்றது. விளையாட்டுத்துறை அமைச்சர் அவர்கள் எங்களுடைய கிழக்கு மாகாணத்தின் அம்பாறை மாவட்டத்தில் விளையாட்டுத் துறையை ஊக்குவிக்கும் வகையில் நவீன ரக விளையாட்டு உபகரணங்களை வழங்குவதற்கு நடவடிக்கை எடுக்கவேண்டுமென மிகவும் அன்பாகக் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

அதுமட்டுமன்றி, எமது பொத்துவில் பிரிவுக்கு நிரந்தரமான ஒரு விளையாட்டு உத்தியோகத்தர் இல்லாதிருப்பதை மிகவும் துரதிருஷ்டவசமான நிலைமையாகவே நாங்கள் பார்க்கின்றோம். விளையாட்டுப் போட்டிகளை நடாத்துவதற்காக மாத்திரம் ஒரு விளையாட்டு உத்தியோகத்தர் நியமிக்கப்பட்டுள்ளார். ஏனைய காலங்களில் அந்த உத்தியோகத்தர் அலுவலகத்துக்குச் சமுகமளிப்பதில்லை. தடகள வீரர் ஏ.எல்.எம். அஷ்ரப் போன்று பல வீரர்களை எமது மாவட்டத்தில் உருவாக்கி தேசிய ரீதியில் விளையாட்டுப் போட்டிகளில் கலந்துகொள்ள வைப்பதற்கு நாங்கள் உத்தேசமாக இருக்கின்ற நிலையில், எங்களுக்கு ஒரு நிரந்தரமான விளையாட்டு உத்தியோகத்தரை நியமித்துத்தர வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். கௌரவ அமைச்சரவர்கள் மேற்படி விடயங்களைக் கவனத்திற்கொண்டு, முடியுமாகவிருந்தால் மிகவும் விரைவாக பொத்துவிலுக்கான நவீன விளையாட்டு மைதானத்தை அமைத்துத் தருவதன்மூலம் அந்தப் பிரதேசத்தில் விளையாட்டுத் துறையை ஊக்குவிக்க முடியும் என்ற நம்பிக்கையுடன் விடை பெற்றுக்கொள்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

ගරු සුනිල් කුමාර ගමගේ අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.39]

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**

(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)

(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත පිළිබඳ සාකච්ඡාව තමයි අපි අද දවස පුරා කරමින් සිටින්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත සංශෝධනය කිරීම සම්බන්ධයෙන් විශේෂයෙන්ම WADA - World Anti-Doping Agency - එකේ නියෝජිතයන් එක්ක අපි සාකච්ඡා වට ගණනාවක් කළා. එම සාකච්ඡාවලදී විටින් විට මේ සංශෝධන වෙනස් වුණා. එම නිසාම අපට කැබිනට් පත්‍රිකා කිහිපයක්ම මේ වෙනුවෙන් ඉදිරිපත් කරන්න සිදු වුණා. පාර්ලිමේන්තුවේදී මීට පෙරත් මෙම පනත් කෙටුම්පත සම්බන්ධව අපි සාකච්ඡා කළා. මොකද, මේ වාගේ පනත් කෙටුම්පතක් සම්මත කිරීමට අදාළ නෛතික ක්‍රමවේදයක් අපේ රටේ තිබෙනවා. එම ක්‍රමවේදය ඇතුළේ තමයි අපි මෙම පනත් කෙටුම්පතේ කටයුතු සම්පූර්ණයෙන් ඉවර කළේ. මෙම පනත් කෙටුම්පත සකස් කිරීමේදී කිසිම delay එකක්, අකාර්යක්ෂමතාවක් වාගේ දෙයක් සිද්ධ වුණේ නැහැ. මේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් කටයුතු කළ සියලු දින වකවානු අපි ළඟ තිබෙනවා.

අද උදේ මේ විවාදය පටන් ගන්නකොටම විපක්ෂය මොකක් හෝ කියන්න ඕනෑ නිසා මේ ගැන විවිධ අර්ථ නිරූපණ කරමින් තමයි මේ සාකච්ඡාව ගෙන ගියේ. අපි ඒ ගැන කලබල වෙන්නේ නැහැ. අපට දැන් දිගටම කරන්න වෙලා තිබෙන්නේ අනුකම්පාව නේ. අපි එහෙම කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම පනත සංශෝධනය කිරීමේදී අපි ප්‍රධාන වශයෙන් සලකා බලන ලද කාරණා දෙකක් තිබුණා. එකක් තමයි, එහි අධ්‍යක්ෂ මණ්ඩලයට අමාත්‍යවරයා පත්

[ගරු සුනිල් කුමාර ගමගේ මහතා]

කරන සංඛ්‍යාව පිළිබඳ සාකච්ඡාව. එම සංඛ්‍යාව වැඩියි, අඩු කරන්න කියලා තමයි WADA එකෙන් යෝජනාව තිබුණේ. කලින් තිබුණු සංඛ්‍යාව අඩු කරලා ඔවුන් එක්ක අපි එකඟ වුණු ගණනට අධ්‍යක්ෂ මණ්ඩලය ගෙනාවා, අමාත්‍යවරයාගේ බලතල අඩු කර ගනිමින්. මොකද අපේ කිසිම ආශාවක් නැහැ, අපට කිසිම තණ්හාවක් නැහැ, මේ වාගේ ආයතනවලට දේශපාලන අතපෙවීම් කරලා, ඒවාට මැදිහත් වෙලා, ඒවායේ බලය තහවුරු කරගෙන, තමන්ගේ වැඩ කර ගන්න. අපට එහෙම අදහසක් නැති නිසා ඒ ජාත්‍යන්තර සංවිධානවල සමහර කොන්දේසිත් එක්ක අපි බොහොම එකඟයි. එම නිසා අපි ඔවුන්ගේ යෝජනා අනුව කටයුතු කළා.

තහනම් උත්තේජක භාවිත කිරීම සම්බන්ධව වැරදිකරුවෙකු වන අවස්ථාවලදී ලබා දෙන්න තිබෙන දඬුවම් සම්බන්ධයෙනුත් අපට විශේෂයෙන්ම නීතිපති දෙපාර්තමේන්තුව එක්ක, නීති විශාරදයන් එක්ක සාකච්ඡා කරන්න සිද්ධ වුණා. අපි ඒකටත් එකඟ වෙලායි මේ ක්‍රියාවලියට මැදිහත් වුණේ. එම නිසා අපට මේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් කිසිම ගැටලුවක් හෝ අපේ පැත්තෙන් දුර්වලකමක්, අතපසු වීමක් වුණේ නැහැ. අපි මේ කටයුත්ත ඉටු කරලා පාර්ලිමේන්තුවට අද ඉදිරිපත් කරලා තිබෙනවා. අද තමයි එහි අවසාන දවස. මෙම පනත් කෙටුම්පත අද පාර්ලිමේන්තුවේ සම්මත වනවා. මෙතැනින් පස්සේ මම හිතන විධියට මේ පනතට අදාළ කටයුතු සිද්ධ වෙනවා, World Anti-Doping Agency එකට අදාළ විධියට, ඒ අනුකූලතාවන්ට අනුව.

ලංකාවේ anti-doping පිළිබඳ පනත සම්බන්ධයෙන් අපි කථා කළොත්, ලංකාවේ මේ උත්තේජක භාවිත කරන තරගකරුවන්ගේ, එහෙම නැත්නම් ක්‍රීඩකයින්ගේ පැත්තෙන් ගත්තොත්, 2023 වර්ෂයේදී ක්‍රීඩකයින් 150ක් අපේ Anti-Doping Agency එක මඟින් test කරලා තිබෙනවා, ඉන් ක්‍රීඩකයෝ 4දෙනෙක් තමයි මේ තහනම් උත්තේජක පාවිච්චි කළා කියලා වාර්තා වෙලා තිබෙන්නේ. විශේෂයෙන්ම මේ තහනම් උත්තේජක භාවිත කරන ක්‍රීඩා ගත්තොත්, ලංකාවේ වැඩිපුරම වාර්තා වෙලා තිබෙන්නේ, cycling -පාපැදි ක්‍රීඩාව-, powerlifting ක්‍රීඩාව, body building ක්‍රීඩාව ආදියයි. මෙම ක්‍රීඩාවලදී වර්ෂ කිහිපයකදීම මේ තහනම් උත්තේජක භාවිත කිරීම සිද්ධ වෙලා ක්‍රීඩකයන් අහුවෙලා තිබෙනවා. ඒ නිසා මෙන්න මේ උත්තේජක ද්‍රව්‍ය පාවිච්චි කිරීම සම්බන්ධයෙන් අද දවසේ මේ සංශෝධන සියල්ල කරලා අපේ ආයතනය නීතිමය වශයෙන් ශක්තිමත් කරලා ක්‍රීඩකයන්ට ක්‍රීඩා කිරීමේ දී තහනම් උත්තේජක පාවිච්චි කිරීමට යොමු නොවී ක්‍රීඩාව නිසි පරිදි කරන්න අවශ්‍ය මාර්ගෝපදේශනය ලබා දීම මේ ආයතනය මඟින් සිද්ධ කරනවා. ඒ වාගේම අදාළ පරීක්ෂණත් මේ ආයතනය තුළින් කරනවා. විශේෂයෙන්ම ඒ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවා අපේ Anti-Doping Agency එක හරහා සිද්ධ කරනවා, විශේෂයෙන්ම පාසල් ක්‍රීඩකයින් මේවාට සම්බන්ධ නොවී ක්‍රීඩා කරන්න. නමුත් අපි දන්නවා, සමහර ක්‍රීඩා පුහුණුකරුවන් සහ සමහර ක්‍රීඩකයන් කැමැතියි, මොනවා හෝ කරලා එවෙලේ ජයග්‍රහණ ලබා ගන්න. පුහුණුකරුවන්ගේ පැත්තෙන් සමහර තහනම් උත්තේජක පාවිච්චි කිරීම් සිද්ධ කරනවා, සමහර විට ක්‍රීඩකයා දැනුවත්ව හෝ නොදැනුවත්ව. ඒ නිසා තමයි අපට නීතියේ තිබෙන දඬුවම් පවා සලකා බලන්න සිද්ධ වුණේ. මොකද, සමහර ක්‍රීඩකයින් නොදැනුවත්ව මේ අසාධාරණයට ලක් වන වෙලාවල් තිබෙන නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත ගැන කෙරෙන විපක්ෂයේ සාකච්ඡා අහගෙන ඉන්නකොට අපට පෙනෙනවා, සමහරු මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිසිම ලජ්ජාවක් නැතිව බොරු කියන බව. ඒක තමයි අපට තිබෙන කනගාටුව. ඒ වාගේම සන්ධානගත වෙලා බොරු කියන්නත් දැන් හුරු වෙලා තිබෙනවා. එක්කෙනෙක් බොරුවක් කිව්වාම දිගටම පොදු සන්ධානයක් හදාගෙන ඒක ඇතුළේ ඒ බොරුව කිය කියා යනවා. අද කියපු ඒ වාගේ බොරුවක් තමයි, මේ පනත නිසා අපට ක්‍රීඩා කරන්න බැරි වෙලා, ක්‍රීඩා තරග තහනම් කරලා තිබෙනවා, අපේ ජාතික කොඩිය යටතේ තරග කරන්න බැරි වෙලා තිබෙනවා, අරමුදල් නැති වෙලා තිබෙනවා වාගේ දේවල්. මම දන්නේ නැහැ, මේක නිසා වෙච්ච දේවල් තොගය ගත්තොත් විපක්ෂයට අනුව අපි දැන් කිසිම ක්‍රීඩාවක් කරන්නේ නැහැ වාගේයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේවා දැන් කියන්නේ කාටද? අපේ රටේ තාක්ෂණය දියුණුයි. ඕනෑම කෙනෙකුට හොයා බලන්න පුළුවන්, අපි දැන් ක්‍රීඩාව නතර කරලාද, දැන් ජාත්‍යන්තර තරගවලට අපේ ක්‍රීඩකයෝ යන්නේ නැද්ද කියලා. මේ නිසා මේ පාර්ලිමේන්තුව වැනි උත්තරීතර ආයතනයේදී වැදගත් පනත් කෙටුම්පතක් ගැන සාකච්ඡා කරනකොටවත් විපක්ෂයට වගකීමක් තිබෙනවා, පට්ටපල් බොරු නොකියා ඉන්න.

මම උදාහරණ දෙකක් කියන්නම්, මේ පනත නිසා අපේ ක්‍රීඩකයින්ට තරග තහනම් කළා කියපු එකට. World Para Athletics Championships තරගාවලිය තවම පැවැත්වෙනවා. අපේ ක්‍රීඩකයෙක් එහිදී ජයග්‍රහණයක් ලබාගෙනත් තිබෙනවා. මේ 22වෙනි දා අපි බහරේන්වල තිබෙන Asian Youth Gamesවලට යනවා. අපේ ක්‍රීඩකයින්ට ඊට සහභාගි වන්න අවශ්‍ය කටයුතු සියල්ල මේ වෙනකොට සූදානම් කරලා තිබෙන්නේ. ඒ වාගේම World Athletics Championships පසුගිය දවස්වල ජපානයේදී අවසන් වුණා. කවුරුත් දන්නවා, සැප්තැම්බර් 18වන දා පැවති හෙල්ල විසි කිරීමේ තරගාවලියට රුමේෂ් තරංග කියන ක්‍රීඩකයා තමයි ලංකාවේ ජාතික කොඩිය යටතේ සහභාගි වුණේ කියලා. එහිදී ඒ ක්‍රීඩකයා විශේෂ ජයග්‍රහණයකුත් අත්පත් කර ගත්තා. මේවා අපට පෙනෙන්න තිබෙන දේවල්.

කොහේද අද තරග තහනම් වෙලා තිබෙන්නේ? මොන තරගයද අපට නැති වෙලා තිබෙන්නේ? මේ සභාවට ඇවිත් එහෙම කියනකොට අඩු ගණනේ වගකීමක්, සදාචාරයක් තිබෙන්න ඕනෑ. නොදන්න දෙයක් කියනවා නම් කමක් නැහැ. මොකක්ද තරගයක් තහනම් කළාය කිව්වා. ඒ ක්‍රීඩාවේ නම කියන්න දන්නේත් නැහැ. හැබැයි, ඉතුරු ටික ඔක්කොම දන්නවා. ඒ නිසා මම විපක්ෂයෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකරලා මෙවැනි සාකච්ඡාවලදී පෙනෙන්න තිබෙන දේවල් ගැන මේ විධියට කියන්න එපා කියලා. දන්නේ නැති දේවල් තිබෙනවා නම්, හොයලා බලන්න ඕනෑ දේවල් තිබෙනවා නම්, ඒ වාගේ එකක් හරහා බොරුවක් කිව්වත් පොඩි චාන්ස් එකක් ගන්න පුළුවන්. අපි කථාවට කියනවා නේ, අතේ පැළවෙන බොරු කියනවා කියලා. ඒ වාගේ අතේ පැළවෙන බොරු මෙවැනි තැන්වලට ඇවිත් කියන එක හොඳ නැහැ කියායි මම හිතන්නේ. මොකද, මේක පාර්ලිමේන්තුව නිසා.

මට මතක විධියට, අරමුදල් ගැන සාකච්ඡාවකුත් මේ ගරු සභාවේදී මතු වුණා. අපට දැන් අරමුදල් නැහැ, සල්ලි නැහැ, වියදම් කරන්නේ නැහැ වාගේ සාකච්ඡාවක් මතු වුණා. අපි මේ කාරණය කිහිප විටක් මතු කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි ලංකාවේ පළමුවැනි වතාවට පටන් ගත්තා, Mission Olympics කියලා වැඩසටහනක්. අපේ රටේ ඊළඟ ඔලිම්පික් සිහිනය වෙනුවෙන්, ආසියානු තරගාවලි, Commonwealth තරගාවලි වෙනුවෙන් වාගේම ලෝක ශූරතා තරගාවලි වෙනුවෙන් ක්‍රීඩකයන් සූදානම් කරන වැඩසටහනක් අපි ආරම්භ කළා. ලංකාවේ පළමුවැනි වතාවට ක්‍රීඩකයෙකුට රුපියල් 210,000ක් දෙනවා කිව්වාම ඒ ක්‍රීඩකයන් පුදුම වුණා. අපි ඒ රුපියල් 210,000 දෙන්නේ මෙහෙමයි. රුපියල් 150,000ක් ඒ ක්‍රීඩකයාගේ දීමනාව හැටියට දෙනවා. රුපියල් 60,000ක් මාසික පෝෂණ දීමනාව හැටියට දෙනවා. Tier-1, Tier-2, Tier-3, Tier-4 කියලා

ක්‍රීඩකයන් කාණ්ඩ හතරකට වෙන් කරලා, පළමුවැනි කාණ්ඩයේ ක්‍රීඩකයෙකුට රුපියල් 210,000ක දීමනාවක් අපි ලබා දීලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ පළමුවැනි වතාවට පුහුණුකරුවන්ටත් දීමනාවක් ගෙවන්න අපේ ආණ්ඩුවෙන් වැඩ කටයුතු හදලා දැන් එය ගෙවමින් යනවා. අපි රුපියල් 100,000න් පටන් ගත්තේ. Tier -1 පුහුණුකරුවෙකුට අපි රුපියල් 100,000ක් දෙනවා. අපි දන්නවා, පුහුණුකරුවන් අමාරුකම් මධ්‍යයේ තමයි ක්‍රීඩකයන් පුහුණු කරන්නේ කියලා. සමහර පුහුණුකරුවන් තමන්ගේ මෝටර් බයිසිකලයට පෙට්‍රල් ටික ගහගෙන, ක්‍රීඩකයාටත් කෑම එකක් අරගෙන දීලා, ඔවුන් පුහුණු කරලා එනවා. ඒ අය බොහොම අමාරුවෙන් මේ වැඩේ කරන්නේ. අපි ඒ අය ගැනත් සලකා බලා ලංකාවේ පළමුවැනි වතාවට Tier-1 පුහුණුකරුවෙකුට රුපියල් 100,000ක්, Tier-2 පුහුණුකරුවෙකුට රුපියල් 65,000ක්, Tier-3 පුහුණුකරුවෙකුට රුපියල් 50,000ක්, Tier-4 පුහුණුකරුවෙකුට රුපියල් 35,000ක් විධියට පුහුණුකරුවන්ට අරමුදල් වෙන් කළා. ක්‍රීඩකයන්ට රුපියල් 210,000ක්, රුපියල් 160,000ක්, රුපියල් 135,000ක්, රුපියල් 110,000ක් විධියට මුදල් වෙන් කළා. ඒ කියන්නේ, හතරවැනි කාණ්ඩයේ ක්‍රීඩකයෙකුටත් අපි රුපියල් 110,000ක් දෙනවා. මේ සඳහා අපට සල්ලි තිබෙනවා. අපට සල්ලි ලැබෙන්නේ කොහොමද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ආණ්ඩුවේ හොරු නැහැ. අපි ටෙන්ඩර්වලින් ගහන්නේ නැහැ. අපි නාස්තිකාර වියදම් කරන්නේ නැහැ. මේ මුදල් ඉතුරු කරගත්තාම අවශ්‍ය බරින් මේවාට වියදම් කරන්න අපට පුළුවන්. අපි ඒ වැඩේ කරමින් ඉන්නවා. එහෙම නොකර තමන්ගේ සුඛ විහරණය ගැනම හිතලා, තමන් වෙනුවෙන්ම මන්ත්‍රීකම්, ඇමතිකම් දරපු, ආණ්ඩු කරපු මිනිස්සු දැන් ඇවිල්ලා මේවාට වෙනම සාකච්ඡා ගොඩ නඟනවා, වියදම් කරන්නේ නැහැ, මේ ආණ්ඩුව දැන් සල්ලි වියදම් කරන්න භයයි වාගේ කථා කියලා. ඒ නිසායි මම මේ කාරණා ටික කියන්න කල්පනා කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දිස්ත්‍රික්ක ගණනාවක වැඩ කරමින් යනවා. අපි අලුතින් වැඩ පටන් ගත්තා. අපි පසුගිය සතියේ මන්නාරම දිස්ත්‍රික්කයේ swimming pool එකක් විවෘත කළා. ඒක අපි හදපු එකක්. මා එහෙම කියන්නේ, අපි බලයට පත් වුණාට පසුව මම මන්නාරමට ගිහිල්ලා බලලා එහි වැඩ කටයුතු පටන් ගත්ත නිසායි. මෙය අත්හැර දමා තිබුණු ව්‍යාපෘතියක්. ඒ වාගේම මන්නාරමේ ශාන්ත සේවියර් විද්‍යාලයට indoor stadium එකක් හදන්න අපි මුල්ගල් තැබුවා. මන්නාරම දිස්ත්‍රික්කය කරවලවලට ප්‍රසිද්ධයි නේ. ඒ වාගේම මන්නාරම දිස්ත්‍රික්කය ක්‍රීඩාවටත් ප්‍රසිද්ධ කරවන්න අපි උත්සාහ කරනවා. අපේ අරමුණු එහෙමයි තිබෙන්නේ. අපි ඒ ප්‍රදේශ අත්හැර දමන්නේ නැහැ. ඒ ප්‍රදේශ අත්හැරපු, ඒ ප්‍රදේශවලට ක්‍රීඩාවක් යොමු නොකරපු ආණ්ඩුවල හිටපු අය තමයි දැන් අපට ඒ ප්‍රදේශ පෙන්වන්නේ, අන්න අරගේ දුර්වලයි කියලා. ඉතින්, ඒ ගැන අපි අවධානයෙන් ඉන්නවා. අපි ලංකාවේ කිසිම ප්‍රදේශයක් -උතුරද, නැඟෙනහිරද, බටහිරද- අත්හරින්නේ නැහැ. ඒ හැම තැනම ඉන්නේ අපේ රටේ මිනිස්සු. අපි ඒ මිනිසුන් වෙනුවෙන් මැදිහත් වෙනවා, මහන්සි වෙනවා. ඒ නිසා අපට ආපසු ඇඟිල්ල දික් කරලා පෙන්වන්න එපා, මඩකලපුවේ මෙහෙමයි, ත්‍රිකුණාමලයේ මෙහෙමයි, යාපනයේ මෙහෙමයි කියලා. අපි දන්නවා, ඒවා එහෙම තමයි කියලා. ඒ, ඔයගොල්ලන්ගේ ආණ්ඩු කරපු ඒවා. නමුත්, අපි එහෙම කරන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩාව ගැන කථා කළොත්, ලංකාවේ ක්‍රීඩා සංගම් 74ක් ලියාපදිංචි වෙලා ඉන්නවා. මේ ක්‍රීඩා සංගම් එක්ක ගනුදෙනු කරන එක ලේසි වැඩක් නොවෙයි. මොකද, ඒගොල්ලන් බාහිර පාර්ශ්වයන්. ස්වාධීන ආයතන විධියට වැඩ කරන්නේ. විවිධ ගැටලු තිබෙනවා; හැම තැනම විවිධ ගැටලු තිබෙනවා. මොකද, අපේ රට අපි හිතන විධියට සුන්දර, හොඳම තත්ත්වයේ තිබුණු රටක් නොවෙයි. පාලකයාගේ ඉඳලා පහළට යනකම් වංචා, දූෂණ හුරු කරපු සමාජයක තමයි අපි ජීවත් වුණේ. එහෙම සමාජයක ක්‍රීඩා සංගම්වලින් විතරක් පාරිශුද්ධභාවයක් බලාපොරොත්තු වෙන්න බැහැ. පැරණි පාලකයන්ගේ ආදර්ශය තමයි අපේ රට පුරාවටම තිබෙන්නේ. ඒ ආයතන අපට දැන් clean කරන්න වෙලා තිබෙනවා. ඒ ආයතන අපි දැන් නියමිත track එකට දාලා වැඩ කරගෙන යනවා. ඒ ආයතන හරහා තමයි අපේ රටේ ක්‍රීඩාව සංවර්ධනය කරන්න පුළුවන් කියන එක අපි ආණ්ඩුවක් විධියටත්, අමාත්‍යාංශයක් විධියටත් තීරණය කර තිබෙනවා. මොකද, ක්‍රීඩා සංගම් ශක්තිමත් කිරීම හරහා වාගේම ක්‍රීඩා සංගම්වල පරිපාලනය ශක්තිමත් කිරීම හරහා තමයි අපට මේ වැඩේ කරගන්න වෙන්නේ.

අද උදේ සමහර වාර්තා ගැන කරුණු මතු වුණා. බොහොම හොඳයි. මෙතෙක් ඉදිරිපත් වෙච්ච ඒ සියලුම වාර්තා පිළිබඳව අපි සලකා බලමින් ඉන්නවා; ඒවා අධ්‍යයනය කරමින් ඉන්නවා. අපි පොරොන්දු වෙච්ච විධියටම ඒ සියල්ල එකතු කරලා, ඒ ගැන අධ්‍යයනය කරලා ලංකාවේ ක්‍රීඩා සංගම්වලට හරියන නව ක්‍රීඩා පනතක් ගේන්න කටයුතු කරමින් ඉන්නවා. අපි දැනටමත් ක්‍රීඩා පනතට අවශ්‍ය කරන නව රෙගුලාසි ගණනාවක් ගෙනැල්ලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒවා හරහා අපි බලාපොරොත්තු වන නව කළමනාකරණය යටතේ ඒ පනත් කෙටුම්පත ගැසට් කරන්න දැනටමත් කටයුතු ආරම්භ කරලා තිබෙන්නේ. මෙතෙක් කල් පැවතුණු සංගම්වල අඩුපාඩු, දුර්වලතා, වංචා කියන සියල්ලම තිබෙනවා. හැබැයි, ඒ ආයතනවල හිටපු පරිපාලකයින්ගේ තිබුණු වංචා, දූෂණවලට ඒ ක්‍රීඩාව සහ ඒ ක්‍රීඩකයෝ පළි නැහැ. දැන් සමහර අය බලාපොරොත්තු වෙනවා, ක්‍රීඩාව නවත්වලා, සංගම් තහනම් කරලා, ක්‍රීඩකයන්ට ක්‍රීඩා කරන්න නොදී තරගාවලි තහනම් කරන තැනට අපව තල්ලු කරන්න. එතකොට මේක බොහොම ලෙහෙසියි නේ. හැබැයි, අපි එතැනට තල්ලු වෙන්නේ නැහැ. අපි මේ හැම සංගමයකම, හැම ක්‍රීඩාවකම පරිපාලනය නිවැරදි කරන්නේ ක්‍රීඩාව පවත්වාගෙන යන ගමන්; ක්‍රීඩාව කරන ගමන්. තරගාවලි තිබෙන ගමන් තමයි අපේ ප්‍රතිපත්තිය විධියට අපි මේ කටයුත්ත කරගෙන යන්නේ. මේ ගැසට්, මේ පනත් ගැන වාගේම පරිපාලන අවුල් ගැන අපි දන්නවා. අපි ඒවා හඳාරලා තිබෙනවා. අපි ඒ වෙනුවෙන් වැඩ කටයුතු කරගෙන යනවා. ඒ නිසා කවුරුවත් කලබල වෙන්න ඕනෑ නැහැ. අපි ඒ කටයුතු කරගෙන යනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! අද දින විවාදයේ වැඩ කටයුතු අවසන් වනතෙක් අවශ්‍ය කාලය ලබා ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා**
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)

ක්‍රීඩකයින් තෝරා ගැනීමේදී ගොඩක් වෙලාවට අපට ගැටලු මතු වෙනවා. බොහෝ අය හිතන්නේ අමාත්‍යාංශයෙන්, එහෙම නැත්නම් ඇමතිතුමා විසින් ක්‍රීඩකයන් තෝරනවා කියායි. ක්‍රීඩකයන් තෝරන ක්‍රියාවලියේදීත් ඒ සම්පූර්ණ වගකීම තිබෙන්නේ අදාළ ක්‍රීඩා සංගම්වල තේරීම් කමිටුවලට. ඒ තේරීම් කමිටු හරහා තමයි අදාළ තරගාවලිවලට trial ගහලා, ක්‍රීඩකයන් තෝරලා, නම් lists හදලා අපට එවන්නේ. එහෙම නැතුව අපි ක්‍රීඩකයන් තෝරන්න යන්නේ නැහැ.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ක්‍රීඩකයන් පිටරට යැවීමේ කටයුතු, ඒ ක්‍රීඩකයන්ට වීසා ගැනීමේ කටයුතු, ඒ ක්‍රීඩකයන්ට ගුවන් ටිකට්පත් ගැනීමේ කටයුතු ආදී සියල්ල කරන්නේ සහ ඒවායේ වගකීම තිබෙන්නේ අදාළ ක්‍රීඩා සංගම්වලට. අපි ගුවන් ටිකට්පත් දෙනවා නම්, අපි වීසා ගන්නවා නම්, අපි ඒවාට මුදල් දෙනවා සහ අපි ඒවා ගන්නවා. හැබැයි, ඒ ක්‍රියාවලියේ සම්පූර්ණ වගකීම තිබෙන්නේ ඒගොල්ලන්ට තමයි. ඒ කියන්නේ, ක්‍රීඩකයින් තෝරා ගැනීම, ලියකියවිලි භාරදීම වාගේ දේවල්. නමුත්, සමහර වෙලාවට ඒවා අපේ අමාත්‍යාංශයේ ගැටලු විධියට මතු වෙනවා. ඒ නිසා මම ඒ කාරණයත් මේ වෙලාවේදී සඳහන් කරනවා.

ඒ වාගේම ආබාධිත අයට ක්‍රීඩා කරන්න, තරගාවලි සඳහා යන්න අපි අවස්ථාව හදලා දීලා තිබෙනවා. ඒ වාගේම අපි ඉන්දියාවේ දෘශ්‍යාබාධිත ක්‍රිකට් කණ්ඩායමක් එක්ක කථා කරලා, ළඟදී ලෝක ශූරතා තරගාවලියක් පවත්වන්න පවා කටයුතු කරමින් ඉන්නවා. අපි ආබාධිත ක්‍රීඩකයන් ගැන පවා අවබෝධයකින්, අදහසකින්, ඒ අයට විශේෂ ප්‍රතිපූරණ ලබා දෙමින්, මුදල් යොදවමින්, ක්‍රීඩාව නඟා සිටුවන්න උත්සාහ ගන්නවා. මේ වන විටත් අපි පැරා ඔලිම්පික් කණ්ඩායමක් පිටරට යවලා තිබෙනවා. මම හිතන විධියට මේ අවුරුද්ද තමයි, පැරා ඔලිම්පික් ක්‍රීඩකයන් වැඩිම විදෙස් සංචාර ප්‍රමාණයකට සම්බන්ධ කරපු අවුරුද්ද බවට පත් වෙන්නේ. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ක්‍රීඩාවේ ප්‍රතිපත්තිය විධියට අපි සලකන්නේ, හැම ක්‍රීඩකයෙකුටම ක්‍රීඩා කරන්න සාධාරණ අවස්ථාවක් ලබා දිය යුතුයි කියන එක. ඒ ක්‍රීඩකයන්ට සහ ක්‍රීඩාවට අවශ්‍ය කරන උපකරණ හා ඒගොල්ලන්ට අවශ්‍ය කරන යටිතල පහසුකම් ලබා දීම අපේ අමාත්‍යාංශයේ අරමුණක් විධියට අපි සලකනවා. ඒ නිසා අපි කිසිම ක්‍රීඩකයෙකු discriminate කරන්නේ නැහැ. ඒගොල්ලන් විෂමතාවකට ලක් වන විධියට අපි වැඩ කරන්නේ නැහැ. හැම ක්‍රීඩාවකම හැම ක්‍රීඩකයෙකුම අපිට අදාළයි, අවශ්‍යයි. ඒක තමයි අපේ ප්‍රතිපත්තිය. ඒක නිසා අපි මේ අවුරුද්දේ ක්‍රීඩාවේ යටිතල පහසුකම් ගොඩනැඟීමට ප්‍රාග්ධන වියදම් විධියට විශාල මුදලක් ආයෝජනය කරලා තිබෙනවා.

අවසාන වශයෙන් මම කියන්න ඕනෑ, අපි මේ රටේ තිබුණු ක්‍රීඩා සංගම්, සංවිධාන එක්ක පොර බදමින්, ක්‍රීඩාව ඉස්සරහට ගෙනියන්න වැඩ කටයුතු කරමින් සිටින බව. නඩු විශාල ප්‍රමාණයක් අපි මැදිහත් වෙලා බේරලා තිබෙනවා. ක්‍රීඩා සංගම් අපිත් එක්ක නඩු කියන්න බොහොම සැදී පැහැදී ඉන්නවා. අපි ඒකට කිසිම භයක් නැහැ, අපි ඒ වෙනුවෙන් එකඟයි. මම හිතන විධියට, ගිය සතියේ සහ අද වන විට ක්‍රීඩා සංගම් සම්බන්ධයෙන් තිබුණු නඩු තුනක් අපි දිනලා තිබෙනවා. ඒ නිසා අපි අදාළ ක්‍රීඩා සංගම්වලට ඒ බරින්, ඒ නීත්‍යානුකූල පියවර ගනිමින් තිබෙනවා. දැනටමත් ක්‍රීඩා සංගම් 11ක් අපේ අමාත්‍යාංශය යටතට අරගෙන, අදාළ පරීක්ෂණ කරමින්, ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් කටයුතු කරනවා. මේ Convention against Doping in Sport (Amendment) Bill එකත් ඒ වාගේ එකක්. මේ පනත් කෙටුම්පත අද පාර්ලිමේන්තුවේදී සම්මත වීමෙන් පස්සේ, ඒ සම්බන්ධයෙන් තිබෙන ගැටලුවත් නිරාකරණය වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.*
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

*මතු පළවන යෝජනාව සභා සම්මත විය:*
*"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු සුනිල් කුමාර ගමගේ මහතා]*
*தீர்மானிக்கப்பட்டது:*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு சுனில் குமார கமகே]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Sunil Kumara Gamage]*

*කාරක සභාවෙහිදී සලකා බලන ලදී.*
*[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]*
*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[THE HON. PRESIDING MEMBER in the Chair.]*

*1 සිට 28 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.*
*1ஆம் வாசகத்திலிருந்து 28ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 1 to 28 ordered to stand part of the Bill.*

*ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.*
*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*
*Enacting Clause and Title ordered to stand part of the Bill.*
*Bill reported without Amendment.*

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා**
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.*
*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் மூன்றாம் முறை மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read the Third time, and passed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

න්‍යාය පත්‍රයේ විෂය අංක 2, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 137 ප්‍රකාරව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම සඳහා වූ යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු අරවින්ද සෙනරත් මන්ත්‍රීතුමා.

## පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම
## பாராளுமன்ற நிலையியற் கட்டளைகளைத் திருத்துதல்
## AMENDMENTS TO THE STANDING ORDERS OF THE PARLIAMENT

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 137 ප්‍රකාරව දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම සඳහා වන මතු දැක්වෙන සංශෝධනය පිළිගත යුතු ය:
>
> **දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) පළමුවැනි ඡේදයට ඉක්බිතිවම මතු සඳහන් නව ඡේදය ඇතුළත් කිරීමට :-**
>
> රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා පරීක්ෂා කිරීමේ දී බරපතළ මූල්‍ය වංචා හෝ දූෂණ ක්‍රියාවන් සිදුව ඇති බවට කාරක සභාව නිගමනය කළහොත් ඒ සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීම සඳහා එකී සිද්ධීන් සෘජුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට හෝ පොලිස්පතිවරයාට කාරක සභාව විසින් යොමු කරනු ලැබිය හැකි ය."

**ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஜனக சேனாரத்ன)
(The Hon. (Dr.) Janaka Senarathna)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඊට අනුකූලව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 137 ප්‍රකාරව, ස්ථාවර නියෝග සංශෝධනය කිරීම පිළිබඳ යෝජනාව ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවට යොමු කරනු ලැබේ.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள், துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways, Ports and Civil Aviation and Leader of the House of Parliament)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න, ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මන්ත්‍රීතුමා.

## කල්තැබීමේ ප්‍රශ්න
## ஒத்திவைப்பு வினாக்கள்
## ADJOURNMENT QUESTIONS

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ் அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, சபை ஒத்திவைப்பு வேளையில் கௌரவ கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர் அவர்களிடம் கேள்வி கேட்பதற்கு அனுமதித்ததற்கு நன்றி!

கௌரவ அமைச்சர் அவர்களே, அம்பாறை மற்றும் மொனராகலை மாவட்ட மக்களுக்கு மிகவும் முக்கியமாகவுள்ள ஹெட ஓயா நீர்ப்பாசனத் திட்டம் தொடர்பாக பின்வரும் கேள்விகளை முன்வைக்கின்றேன். இத்திட்டம் நீண்ட காலமாக அரச அங்கீகாரத்தையும் நிதி ஒதுக்கீட்டையும் பெற்றிருந்தபோதிலும், இதுவரை நடைமுறைக்கு வராதது மிகவும் வருந்தத்தக்கது. பின்வரும் வரலாற்றுப் பின்னணியைக் கருத்திற்கொண்டு, இத்திட்டத்தை நடைமுறைப்படுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

1. ஹெட ஓயா நீர்ப்பாசனத் திட்டம் முதன்முதலில் 1922ஆம் ஆண்டில் நீர்ப்பாசனத் துறையால் விவசாய மற்றும் குடிநீர் தேவைகளுக்கான திறனுள்ள நீர்மூலமாக அடையாளப்படுத்தப்பட்டது.
2. இத்திட்டத்தின் விரிவான வடிவமைப்புகள் 1956ஆம் ஆண்டிலேயே முடிக்கப்பட்டன.
3. 2006 முதல் 2008 வரை விரிவான சாத்தியக்கூறு ஆய்வுகள் மேற்கொள்ளப்பட்டன.
4. 2016 முதல் 2020 வரை பல அரசுகளின்கீழ் அமைச்சரவை அங்கீகாரமும் தேசிய Budgetஇல் நிதி ஒதுக்கீடும் வழங்கப்பட்டன.
5. இதுவரை திட்டப்பணிகள் ஆரம்பிக்கப்படாத நிலையில் உள்ளது.
6. இத்திட்டம் பல சமூக, பொருளாதார நன்மைகளை வழங்கக் கூடியது.

அவையாவன:

- 6,270 ஹெக்டெயாருக்கும் மேற்பட்ட விவசாய நிலங்களுக்கு நீர்ப்பாசன வசதி
- 5,000க்கும் மேற்பட்ட விவசாயக் குடும்பங்களுக்கு நன்மை
- மொனராகலை மாவட்டத்தின் மடுல்லா, சியம்பலாண்டுவ மற்றும் அம்பாறை மாவட்டத்தின் லகுகல, பாணம, பொத்துவில், கோமாரி போன்ற பகுதிகளில் - நான்கு பிரதேச செயலாளர் பிரிவுகளில் - குடிநீர் பற்றாக்குறைக்கு நிரந்தரத் தீர்வு
- ஆண்டு முழுவதும் நம்பகமான நீர் வழங்கல்மூலம் விளைச்சல் உயர்வு, உணவுப் பாதுகாப்பு, கிராமப்புற மக்களுக்கான வாழ்வாதார மேம்பாடு

[ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා]

- உள்ளூர் நீர்வள மீன்பிடி, சிறு அளவிலான மின்சார உற்பத்தி மற்றும் தொடர்புடைய மூலவள மேம்பாட்டின் வாயிலாக பொருளாதார வளர்ச்சி

2002ஆம் ஆண்டு இத்திட்டம் சம்பந்தமாக பொது மக்களுக்கு விழிப்புணர்வு அளிக்கப்பட்டது. 2005.11.25இல் அப்போதைய சனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்கள் பாராளுமன்றத்தில் ஆற்றிய கொள்கைப் பிரகடன உரையில் இந்தத் திட்டம் சம்பந்தமாக தெளிவாகக் குறிப்பிட்டிருந்தார். 2006ஆம் ஆண்டில் 'மஹிந்த சிந்தனை' வேலைத்திட்டத்தில் குடிநீருக்கும் விவசாயத்துக்குமாக இத்திட்டத்தை ஆரம்பிக்க வேண்டுமெனக் குறிப்பிடப்பட்டு இருந்தது. 2006 -2008 காலப்பகுதியில், நீர்ப்பாசன அமைச்சராக இருந்த மர்ஹூம் அன்வர் இஸ்மாயில் அவர்கள் இத்திட்டம் தொடர்பாகப் பாராளுமன்றத்தில் எடுக்கவேண்டிய அனைத்து நடவடிக்கைகளையும் மேற்கொண்டிருந்தார். வரைபடம் உள்ளிட்ட சாத்தியவள அறிக்கைகளையும் அவர் தயாரித்திருந்தார். அதில், இத்திட்டத்தைச் செயற்படுத்தும் காலம் 2007 - 2012ஆம் ஆண்டு வரை என்றும், மதிப்பீட்டுத் தொகை 4,250 மில்லியன் ரூபாய் என்றும், 6,270 ஹெக்டெயார் நிலப்பரப்பு நன்மையடையும் என்றும், 5,000 விவசாயக் குடும்பங்கள் நன்மையடையும் என்றும், 2008இன் இறுதியில் 1.67 மில்லியன் செலவு செய்யப்படும் என்றும், 2009ஆம் ஆண்டின் இறுதியில் நிதிசார் முன்னேற்றம் 0.04 சதவீதம் என்றும் குறிப்பிடப்பட்டு இருந்தது. 30.04.2016இல் நிதி அமைச்சு இந்தத் திட்டத்தைத் தொடர முடியுமெனக் கூறியதோடு, அதற்கான சம்மதத்தையும் தெரிவித்திருந்தது. அது மாத்திரமன்றி,தேசிய திட்டமிடல் திணைக்களம்மூலம் இதற்கான அனுமதியையும் கோரியிருந்தது. 2016.05.03இல் முதலாவது அமைச்சரவைத் தீர்மானத்தினூடாக அமைச்சரவை அமைச்சர்கள் ஹெட ஓயா திட்டத்தைத் தொடர வேண்டுமென முடிவெடுத்தனர். ஹெட ஓயா திட்டம் நடைமுறைப்படுத்தப்பட வேண்டுமென 2019.04.30 மற்றும் 2019.05.07ஆம் திகதிகளில் நடைபெற்ற அமைச்சரவைக் கூட்டங்களில் முடிவுகள் எடுக்கப்பட்டன. இது சம்பந்தமான ஆவணங்களை நான் சபைக்குச் *சமர்ப்பிக்கின்றேன்.

அதுமாத்திரமல்ல, முன்னாள் சனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்களின் 2019.04.08ஆம் திகதிய கண்காணிப்பு சிபாரிசு கடிதம், நிதி அமைச்சரின் 2019.04.19ஆம் திகதிய பரிசீலனை அறிக்கை, காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரின் 2019.04.08ஆம் திகதிய கடிதம், நகரத் திட்டமிடல், நீர் வழங்கல் மற்றும் உயர் கல்வி அமைச்சரின் 2019.03.25ஆம் திகதிய சிபாரிசு கடிதம், மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் அமைச்சரின் கண்காணிப்பு அறிக்கை என்பன பெறப்பட்டுள்ள நிலையிலும், இரண்டு அரசாங்கங்கள் மாறியிருக்கின்ற நிலையிலும், இன்றுவரை இந்தத் திட்டத்தை நடைமுறைப்படுத்துவதற்கு நடவடிக்கை எடுக்கப்படவில்லை. ஆகையால், பின்வரும் வினாக்களை கௌரவ அமைச்சர் அவர்களிடம் கேட்கின்றேன்.

1. ஹெட ஓயா நீர்ப்பாசனத் திட்டத்துக்குப் பல ஆண்டுகளாக ஆய்வு அறிக்கைகளும் அமைச்சரவை அனுமதிகளும் நிதி ஒதுக்கீடுகளும் கிடைக்கப்பெற்று இருந்தபோதிலும், அதை நடைமுறைப்படுத்தாமைக்கான குறிப்பிட்ட காரணங்கள் எவை?

2. எதிர்வரும் 2026ஆம் ஆண்டுக்கான தேசிய Budgetஇல் இத்திட்டத்தை கட்டங்கட்டமாக ஆரம்பிப்பதற்குப் போதுமான நிதி ஒதுக்கீடு செய்வதற்குத் திட்டமிடப்பட்டுள்ளதா? அவ்வாறாயின், பணிகள் ஆரம்பிக்கப்படும் நிறைவுபெறும் காலப்பகுதியைக் குறிப்பிட முடியுமா?

3. இத்திட்டத்தின் செயற்றிறன், ஒருங்கிணைப்பு மற்றும் நேர்த்தியான முன்னேற்றத்தை உறுதிசெய்ய தனித்துவமான திட்ட அமுலாக்க/ மேற்பார்வைக் குழு அமைக்கப்படுமா? அமைக்கப்பட்டால், அதன் அமைப்பு மற்றும் அதிகாரம் என்ன?

4. இத்திட்டத்தின் அனைத்து நிலைகளிலும் மக்கள் பங்கேற்பு, பங்குதாரர் ஆலோசனை மற்றும் வெளிப்படைத் தன்மையை உறுதிப்படுத்த என்ன நடவடிக்கைகள் எடுக்கப்படும்?

5. உணவுப் பாதுகாப்பு, நீர் கிடைக்கும் நிலை, கிராமப்புற வேலைவாய்ப்பு, காலநிலை மாற்றத்துக்கான தாங்கும்திறன் போன்ற சமூக, சூழல் மற்றும் பொருளாதார நன்மைகள் தொடர்பாக அமைச்சு ஆய்வு மேற்கொண்டுள்ளதா? மேற்கொண்டிருந்தால், அதன் விபரங்களைச் சுருக்கமாக வழங்க முடியுமா?

6. இத்திட்டம், கிராமப்புற நீர் வழங்கல், விவசாய நவீனமயமாக்கல், பிராந்திய நீர்ப்பாசன வலையமைப்புகள் போன்ற பிற தேசிய அல்லது பிராந்திய அபிவிருத்தித் திட்டங்களுடன் ஒருங்கிணைக்கப்படுகின்றதா?

இத்திட்டம் வெறும் நீர்ப்பாசனத் திட்டம் அல்ல. இது நூற்றாண்டுக்கும் மேல் காத்திருக்கும் ஆயிரக்கணக்கான விவசாயக் குடும்பங்களின் வாழ்வாதார நம்பிக்கை! ஆகையால், கௌரவ அமைச்சரிடம் மேற்கண்ட கேள்விகளுக்கு விரிவான பதில்களை எதிர்பார்ப்பதுடன், இத்திட்டத்தை இந்த நாட்டின் சனாதிபதி மாண்புமிகு அநுர குமார திஸாநாயக்க அவர்கள்மூலம் மேற்கொள்வதற்கு நடவடிக்கை எடுக்குமாறும் அன்பாகக் கேட்டுக் கொள்கின்றேன்.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුසිල් රණසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - காணி மற்றும் நீர்ப்பாசனப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Deputy Minister of Land and Irrigation)

Hon. Presiding Member, on behalf of the Minister of Agriculture, Livestock, Land and Irrigation, I answer the Adjournment Question raised by the Hon. Member.

1. Feasibility studies of the Heda Oya Reservoir Project had been carried out in 1956 and subsequently updated in 2006 and 2017 for different reservoir capacities by the Irrigation Department. The proposed Heda Oya Reservoir inundates an area of 6,000 acres, whereas the proposed downsized reservoir inundates an area of 4,000 acres. Also within the inundation area of the reservoir, there were more than 250 houses located, as per the survey conducted in 2018. The inundation of 6,000 acres of cultivable lands in the Monaragala District as well as the displacement of more than 250 permanent houses created a social and political issue, which is the main reason for the delay in the implementation of the project.

2. No funds will be allocated in the upcoming Budget, 2026.

3. There are no immediate plans for implementing the Heda Oya Reservoir Project.

4. Detailed socioeconomic and environmental impact assessment studies will be carried out from planning to implementation.

5. During the feasibility stage, the following socioeconomic and environmental benefits have been identified and quantified:

   5.1 Providing reliable irrigation facilities to cultivate 6,500 acres for the Maha Season and 13,000 acres for the Yala Season.

   5.2 Providing 13 MCM - Million Cubic Meters - of raw water annually for domestic water supply.

   5.3 Providing rural employment in the project area during the construction period.

   5.4 Improvements to infrastructure in other sectors in the project area such as transport, education and health.

   5.5 Providing resilience to climate change

   5.6 Curtailing rural poverty.

6. There are no such plans at present.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැඩඔය ව්‍යාපෘතිය සම්බන්ධයෙන් එතුමා ප්‍රශ්නය අහන්නේ. ඒ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මුලින්ම අදහස් පළ වෙලා තිබෙන්නේ 1956දී. ඊට පස්සේ ශක්‍යතා අධ්‍යයනයක් කර තිබෙනවා. නමුත්, 2006 සහ 2017 වර්ෂවල තමයි නැවත වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ඒ සාකච්ඡාව අරගෙන තිබෙන්නේ. මා හිතන විධියට, එතුමා ඒක ප්‍රකාශ කළා. ඊට පස්සේ ඒ සම්බන්ධයෙන් මැනුම් කටයුතු කර තිබෙනවා, 2018දී. ඒ යටතේ ඉදි කිරීමට යෝජනා වූ ජලාශ දෙකට වගා කළ හැකි භූමිය අක්කර 6,000ක් සහ තවත් අක්කර 4,000ක් යට වෙනවා කියලා සොයාගෙන තිබෙනවා. ඒ වාගේම, ඒ යට වන areasවල දැනට ස්ථිර පදිංචි පවුල් 250ක් ඉන්නවා. එතැන තිබෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි, ඒක. 2016 පටන් ගත්තු ඒ සාකච්ඡාව අතරමග නතර වෙලා තිබුණේ මේ සම්බන්ධයෙන් ආපු විරෝධතා නිසාමයි. දැනට ඒ ආශ්‍රිතව ස්ථිර පදිංචි පවුල් 250ක් සිටීම සහ එම ජලාශ ඉදිකිරීමේදී වගා කරන ඉඩම් යට වීම නිසා තමයි ප්‍රධාන වශයෙන් විරෝධතා ඇවිල්ලා තිබෙන්නේ.

කෙසේ වෙතත්, මේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අපේ රජයේ ස්ථාවරය මේකයි. අපි ඒක ප්‍රතික්ෂේප කරලා නැහැ; අපි ඒක පැත්තකට දාලා නැහැ. නමුත් ගරු මන්ත්‍රීතුමනි, මේ වාගේ වාරිමාර්ග ව්‍යාපෘති කිහිපයක්ම තිබෙනවා, ලංකාව පුරා. ඒවා මුදල් වියදම් කරලා ආරම්භ කරලා, යම් යම් වැඩ කොටස් කරලා, අතරමඟ නතර වෙලා තිබෙන ඒවායි. උදාහරණයක් විධියට, මන්නාරම දිස්ත්‍රික්කයේ අක්කර 30,000කට වතුර සපයන්න බලාපොරොත්තු වන පහළ මල්වතුඔය ජලාශ ව්‍යාපෘතිය ආරම්භ කරලා, bund එකෙන් සියයට 60ක් විතර හදලා අතර මඟ නතර කර තිබුණා. රජයක් හැටියට අපි ඒ වාගේ ව්‍යාපෘති නැවත ආරම්භ කරන්න ඕනෑ. ඒ වාගේම තමයි මඩකලපු දිස්ත්‍රික්කයට ජලය සපයන මුන්දෙනි ආරු ජලාශය. එය මේ කියන ව්‍යාපෘතියට සාපේක්ෂව ගත්තාම, මීටත් වඩා ප්‍රතිලාභ ලැබෙන ව්‍යාපෘතියක්. මුන්දෙනි ආරු ව්‍යාපෘතියට ඉඩම් පවා අත්පත් කරගෙන තිබෙනවා; එහි යම් යම් වැඩ කොටස් ආරම්භ කරලා තිබෙනවා; ඒ වෙනුවෙන් ව්‍යාපෘති කාර්යාල ද ආරම්භ කරලා තිබෙනවා. පසුගිය වසර තිස්සේම කෘෂිකර්ම අමාත්‍යාංශයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ මේ වෙනුවෙන් යම් යම් මුදල් ප්‍රමාණ වෙන් කරලා තිබෙනවා, budget line item එකෙන්. ඒ වාගේ ආරම්භ කළ ව්‍යාපෘති තිබෙනවා.

වාරිමාර්ග ක්ෂේත්‍රය ගත්තාම, අප මුහුණ දෙන ලොකුම ප්‍රශ්නය තමයි අපේ රටේ ආර්ථික අර්බුදය ආවාට පසුව සහ විවිධ අකාර්යක්ෂමතා නිසා මහා පරිමාණ වාරිමාර්ග ව්‍යාපෘති ගණනාවක් අතරමඟ අත් හැර දමා තිබීම. ඒවාට රුපියල් බිලියන ගණන් යට කරලා තිබෙනවා; ප්‍රතිලාභ ලැබීමට නියමිත ජනතාව අතරමං වෙලා තිබෙනවා. ඒ නිසා අපේ ආණ්ඩුවේ ප්‍රධාන කාර්යභාරය තමයි අතරමඟ නතර කරලා දමපු, බිලියන ගණන් වියදම් කරපු ඒ ව්‍යාපෘති ටික අවසන් කරන එක. මේ අවුරුද්දේ අප ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර තිබෙන්නේ මෙන්න මේ වාගේ ව්‍යාපෘති සඳහා මුදල් වෙන් කරන්නයි. මම උදාහරණයක් කියන්නම්. මේ වන විට පහළ යාන්ඔය ජලාශය ඉදි කරලා තිබෙනවා, ඇළ වේලි හදලා තිබෙනවා. නමුත්, එතැන ප්‍රශ්න ගොඩක් තිබෙනවා. ඉඩකඩම් හරියාකාරව ගොවි ජනතාවට බාර දීලා නැහැ, සමහර ඒවාට අදාළව ඇළ වේලි සංවර්ධනය කරලා නැහැ, සමහර ඒවාට වන්දි ගෙවලා නැහැ. ඔන්න ඔය වාගේ ප්‍රශ්න ගොඩක් තිබෙනවා. ඒ නිසා අපට සිද්ධ වුණා රුපියල් මිලියන 2,350ක් වෙන් කරන්න, ඒ ව්‍යාපෘතිය සඳහා. ඔබතුමන්ලා දන්නවා මොනරාගල දිස්ත්‍රික්කයේ පහළ උමා ඔය සංවර්ධන ව්‍යාපෘතියත් එහෙමයි කියලා. එහිත් ඉදි කිරීම් අතරමඟ නතර කර දමලා. සමහර ඇළ වේලි උඩින් -මීටර් 20ක් විතර උඩින්- යන්නේ. ඒවා හදන එක අතරමඟ නතර කරලායි තිබෙන්නේ. මා හිතන විධියට, අක්කර 10,000කට විතර වතුර දෙන්න පුළුවන් ව්‍යාපෘතියක්, ඒක. මට ඒ ප්‍රමාණය නිශ්චිතව මතක නැහැ. ඒ නිසා අපට සිද්ධ වුණා, එහි වැඩ කටයුතු අවසන් කරන්න ඒ ව්‍යාපෘතිය සඳහා නැවත රුපියල් මිලියන 2,500ක් විතර වෙන් කරන්න. ඒ වාගේ අතරමඟ නතර වුණු ව්‍යාපෘති

[ගරු සුසිල් රණසිංහ මහතා]

ගොඩක් තිබෙනවා. පහළ මල්වතුඔය ජලාශය ඉදිකරන එකට අපට සිද්ධ වුණා, රුපියල් මිලියන 3,000ක් වෙන් කරන්න. අතරමඟ නතර වුණු, සල්ලි කාබාසිනියා වුණු ව්‍යාපෘති නැවත ආරම්භ කිරීම අප කැමැති වුණත් නැති වුණත් කරන්න වෙනවා. ඒ නිසා අපි ඒවා ආරම්භ කළ යුතුව තිබෙනවා. අපට තිබෙන වගකීම තමයි ඒවා නිශ්චිතව අවසන් කරලා ඒවායෙහි ප්‍රතිලාභ ජනතාවට ලබා දෙන එක.

ඊළඟ අවුරුදුවලට යද්දී අපට මුන්දෙනි ආරු ජලාශ ව්‍යාපෘතිය ආදි ඒවා ආරම්භ කරන්න වෙනවා. මා කලිනුත් කිව්වා වාගේ ඒවාට මුදල් වෙන් කරලා ඉඩම් පවා අත්පත් කරගෙනයි තිබෙන්නේ. ඒ වාගේම තමයි වවුනියාව සහ මුලතිව් දිස්ත්‍රික්කවලට ජලය සපයන්න කිවුල් ඔය ජලාශ ව්‍යාපෘතිය ආරම්භ කරලා තිබෙනවා. එතැනත් ඉඩම් අත්පත් කරගෙන තිබෙනවා; යම් යම් ඉදිකිරීම් කරලා තිබෙනවා. ඒ නිසා අපේ ප්‍රමුඛතා ලේඛනය -priority list- ගත්තාම, ඒවාට තමයි මුල් තැන දිය යුත්තේ. අපි හැඩ ඔය, කුඹුක්කන් ඔය වැනි ව්‍යාපෘති අත් හැරලා නැහැ. ඒ ගැන වාරිමාර්ග දෙපාර්තමේන්තුව දන්නවා. ඒවා feasible. ඔබතුමා කිව්වා වාගේ ඒ ඒ ප්‍රදේශවල ගොවි ජනතාවට ඒවායින් සෙතක් සැලසෙනවා. කෘෂි කර්මාන්තය වෙනුවෙන් අපි ඒවා කරන්න ඕනෑ. අපි ඒක පිළිගන්නවා. නමුත් මේ වෙලාව ආර්ථිකය බංකොලොත් වෙලා රට නැඟිටින වෙලාවක්. මේ වෙලාවේ ව්‍යාපෘති ගණනාවක් අතරමඟ නතර වෙලා තිබෙනවා. ඒවා සඳහා තමයි අප මූලිකත්වය දෙන්න ඕනෑ. ඉදිරි කාලයේදී මේ කියන ව්‍යාපෘති සඳහාත් අවධානය යොමු කරන්න අපි කැමැතියි. අවාසනාවකට, 2026 වසර සඳහා අපට හැඩඔය ව්‍යාපෘතිය වෙනුවෙන් මුදල් වෙන් කරන්න ලැබෙන්නේ නැහැ. නමුත් මා නැවත කියනවා, මෙයින් කියන්නේ අප ඒ ව්‍යාපෘති අත් හැර දමලා තිබෙනවා කියන එක නොවන බව. ඒ වෙනුවෙන් අපට අවධානය යොමු කරන්න පුළුවන් වෙයි, යම් කාලයක් ගියාම.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරද්දී ඔබතුමා කිව්වා 2020 වර්ෂයේදී ඒ සඳහා මුදල් වෙන් කළා කියලා. නමුත්, මට වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ලැබුණු තොරතුරු අනුව, 2020 වර්ෂයේදී මුදල් වෙන් කරලා නැහැ. හැබැයි, ඒ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අධ්‍යයනය කරලා NPD approval එක ගැනීම ආදි වශයෙන් ඒ සඳහා වුණු අවසර ගන්න ඒවා, අනුමත කර ගන්න ඒවා කරගෙන තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අප ඉදිරියට යනවා නම් එහි පාරිසරික අධ්‍යයන වාර්තා ආදියට අදාළ කටයුතු නැවත සම්පූර්ණ කරන්න වෙයි. මා නැවත ඔබතුමාට කියනවා, අපි මේවා පැත්තකට දාලා නැති බව. නමුත්, තිබෙන ආර්ථික තත්ත්වය අනුව අතරමඟ නතර වූ අනෙකුත් ව්‍යාපෘති සම්පූර්ණ කරලා, ඊට පසුව තමයි මේවාට යන්න වෙන්නේ. රජයක් විධියට ඉදිරියේදී අනිවාර්යයෙන්ම මෙම ව්‍යාපෘති සම්පූර්ණ කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ දෙවන ප්‍රශ්නය, ගරු අශෝක ගුණසේන මන්ත්‍රීතුමා.

**ගරු අශෝක ගුණසේන මහතා**
(மாண்புமிகு அசோக குணசேன)
(The Hon. Ashoka Gunasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ ප්‍රශ්නය යොමු කරන්නේ, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාටයි.

පසුගිය ඔක්තෝබර් 01 දිනට ලෝක ළමා සහ වැඩිහිටි දිනය යෙදී තිබුණා. ලෝක වැඩිහිටි දින සැමරුම් අවස්ථාවේ ලංකාවේ වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්තියක් එළිදැක්වූවා. එතැනදී "දේශීය හා ගෝලීය ක්‍රියාකාරකම් මෙහෙයවන වැඩිහිටි පුද්ගලයන්, අපගේ අභිලාෂයන්, අපගේ යහපැවැත්ම සහ අපගේ අයිතිවාසිකම්" යන්න තේමාව හැටියට තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමාජ සුබසාධනය පැත්තෙන් ගත්තාම අපේ සමාජය ඇතුළේ වැරදි මත හැදිලා තිබෙනවා, සමාජ සුබසාධනයේදී වැඩි කොටසක් අත් පත් කර ගන්නේ වැඩිහිටියන් කියලා. ඒක මේ සමාජය තුළ තිබෙන වැරදි මතයක්. ඒ වාගේම වැඩිහිටියන් සම්බන්ධයෙන් ගත්තාම, ඔවුන් අපේ සමාජය ඇතුළේ අනුකම්පාව ලැබිය යුතු පිරිසක් ලෙස දකින්න පටන් ගත්ත කණ්ඩායම් ඉන්නවා. ඒත් එක්කම, ලෝක ළමා දිනයත්, ලෝක වැඩිහිටි දිනයත් එකම දිනයක් වීම නිසා, වැඩිහිටියන් ළමයින් වාගේ කියලා වැරදි මතයක්, වැරදි විධියේ දැක්මක් සමාජය ඇතුළේ නිර්මාණය වෙලා තිබෙනවා. එහෙත් ක්‍රියාකාරී බලවේගයක් ලෙස වැඩිහිටියන් සතුව තිබෙන දැනුම, ආකල්ප, හැකියාව අවබෝධ කරගෙන ඒවා ඊළඟ පරම්පරාවට ගෙන යන්න අපි කටයුතු කළ යුතුයි. වෙනස් විධියකින් කියනවා නම්, සංස්කෘතික උරුමයන් සම්ප්‍රේෂණය කරන කණ්ඩායමක් ලෙස වුණත් ඔවුන් අපේ සමාජ සංවර්ධනයට දායක කරගත හැකියි. ඒ වාගේම, වැඩිහිටියන් කියන්නේ ලේඛන කලාව සඳහා යොදාගත හැකි, ඒ සඳහා හැකියාව සහ දැනුම් සම්භාරයක් තිබෙන පිරිසක්. එවැනි වැදගත් අංශයකට මේ රටේ සමාජ සංවර්ධනයේ ඉලක්කවලට මේ පිරිස මෙහෙයවන්න පුළුවන්. එම නිසා අපි ඒ වැඩිහිටියන් විවෘත මනසකින් දැකලා, දූර දක්නා වැඩ පිළිවෙළක් සහිතව ඒ මානව සම්පත කළමනාකරණය කිරීමෙන් රටේ සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට යොදාගත හැකියි. ඒ අතර ඔවුන් මුහුණ දෙන අභියෝග සහ ප්‍රශ්න හඳුනා ගැනීමද අප විසින් කළ යුතුයි. ඒවා පදනම් කරගෙන තමයි මම මේ ප්‍රශ්නය යොමු කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම වැඩිහිටියන්ගේ පැත්තෙන් ගත්තාම අපට වඩාත් දෘශ්‍යමාන වන ගැටලුවක් තමයි ඔවුන්ගේ සෞඛ්‍ය ප්‍රශ්න. ඔවුන් බහුවිධ රෝගාබාධවලට, ඒ කියන්නේ දියවැඩියාව, අධික රුධිර පීඩනය, පිළිකා වැනි රෝගවලට ලක්වෙලා තිබෙනවා. එම නිසා ඔවුන් සෞඛ්‍යමය ප්‍රශ්න ගණනාවකින් පෙළෙමින් ඉන්නවා. ඒ වාගේම ආර්ථිකමය වශයෙන් පීඩිත ජීවිතයක් ගතකරන නිසා, අනාරක්ෂිත ලෙස ආදායම් මාර්ගවලට යොමු වෙනවා. සෞඛ්‍ය තත්ත්වය නොසලකා ඔවුන් එම ආදායම් මාර්ගවලට යොමු වෙන්න පටන් අරගෙන තිබෙනවා.

අපේ රට ගත්තාම, වැඩිහිටියන් සීමිත පිරිසක් විශ්‍රාම වැටුප් ලැබුවද, විශාල පිරිසකට ආර්ථික ආරක්ෂාවක් නැති තත්ත්වයක් තමයි තිබෙන්නේ. තීන්දු තීරණ ගැනීමේදී වැඩිහිටියන්ගේ අදහස් ලබා ගැනීම, නවීන සමාජයට ගැළපෙන ලෙස ඔවුන් සතුව තිබෙන දැනුම වැඩිදියුණු කිරීම -ඒ කියන්නේ ඩිජිටල් සාක්ෂරතාව වැඩිදියුණු කිරීම වැනි කටයුතු- තුළින් ඔවුන්ගේ හුදෙකලාභාවය අවම කිරීම වැනි අපට කරන්න පුළුවන් දේවල් ප්‍රමාණයක් තිබෙනවා. එවැනි අදහසකුත් එක්ක තමයි මම මේ ප්‍රශ්න ටික ගරු අමාත්‍යතුමාට ඉදිරිපත් කරන්නේ.

ගරු අමාත්‍යතුමනි, මම ඔබතුමාට ප්‍රශ්න කිහිපයක් යොමු කරනවා.

01. වැඩිහිටි ජනතාව ලෙස සලකන්නේ කුමන වයසින් පසු ජන කොටසද?

02. එම ජන කොටසෙහි මුළු සංඛ්‍යාව සහ එය මුළු ජනගහනයෙහි ප්‍රතිශතයක් ලෙස කොපමණද?

03. ශ්‍රී ලංකාවේ වැඩිහිටි තැනැත්තන් සඳහා එළි දක්වන ලද ජාතික ප්‍රතිපත්තියෙහි අරමුණු මොනවාද?

04. වැඩිහිටි ජනතාව ඉලක්ක කර ගනිමින් වර්තමාන රජය විසින් සිදු කරනු ලබන වැඩ පිළිවෙළ කුමක්ද?

05. වැඩිහිටියන් උදෙසා ඉදිරියේදී රජය විසින් සිදු කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් මොනවාද?

මෙම ප්‍රශ්නවලට පිළිතුරු මේ ගරු සභාවට ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**

(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)

(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අශෝක ගුණසේන මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

01. මේ සම්බන්ධයෙන් විවිධ රටවල විවිධ වයස් සීමා සලකනු ලබනවා. කෙසේ වෙතත්, අද වෙනකොට ලංකාවේ බලාත්මක නීතිය වන්නේ 2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත. ඒ පනතට අනුව "වැඩිහිටි තැනැත්තා" යන්නෙන් අවුරුදු 60 ඉක්මවූ යම් තැනැත්තෙක් අදහස් වෙනවා. ඒ අනුව ලංකාවේ දැනට පවත්නා නීතිය අනුව වයස අවුරුදු 60 ඉක්ම වූ සියලුදෙනා වැඩිහිටි තැනැත්තන් ලෙස සලකනු ලබනවා.

02. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන අනුව 1981 වෙනකොට අපේ රටේ සමස්ත ජනගහනයෙන් සියයට 6.6ක් අවුරුදු 60ට වැඩි, වැඩිහිටි ජනගහනය විධියට ඇස්තමේන්තුගත කර තිබුණා. 2012 වර්ෂය වනවිට එම ප්‍රමාණය දෙගුණයකට ආසන්න වෙලා සියයට 12.3ක් වෙලා තිබුණා. මේ වනවිට නිල සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කර නැති වුණත්, 2024 වර්ෂයේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුගත සංඛ්‍යාව අනුව සමස්ත ජනගහනයෙන් සියයට 18ක් අවුරුදු 60ට වැඩි, වැඩිහිටි ජනගහනය ලෙස හඳුනා ගෙන තිබෙනවා. ඒ අනුව සංඛ්‍යාත්මකව අපේ රටේ වැඩිහිටි ජනගහනය ලෙස සලකන ප්‍රමාණය මිලියන 3.9ක පමණ අගයක් ගන්නවා.

03. අපි මේ වර්ෂයේ ඔක්තෝබර් 01වැනි දා විශේෂයෙන්ම ජාත්‍යන්තර වැඩිහිටි දිනයට සමගාමීව වැඩිහිටියන් සම්බන්ධයෙන් වූ ප්‍රතිපත්තියක් එළිදක්වනු ලැබුවා. වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව විශේෂඥ කමිටුවක් පත් කර එම ප්‍රතිපත්ති සකස් කරනු ලැබුවා. එම විද්වත් මණ්ඩලයට විශේෂයෙන්ම මේ රටේ වැඩිහිටියන් සම්බන්ධයෙන් කටයුතු කරන අධ්‍යාපනඥයන්ගේ, ස්වේච්ඡා සංවිධානවල, සිවිල් සංවිධානවල, පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය අංශයේ දායකත්වය ලබා ගෙන, ඔවුන්ගේ අදහස් ලබා ගෙන තමයි එම ප්‍රතිපත්තිය සකස් කරනු ලැබුවේ. එම ප්‍රතිපත්ති මාලාව අපි ඔක්තෝබර් 01වැනි දින එළිදක්වනු ලැබුවා.

එහි අරමුණු ගණනාවක් තිබෙනවා. ඒ තුළ තිබෙන ප්‍රධාන අරමුණු 8 පමණක් මම මෙතැනදී සාරාංශ වශයෙන් සඳහන් කරන්න කැමැතියි.

01වැනි අරමුණ - වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම.

02වැනි අරමුණ - වැඩිහිටි හිතකාමී සහ ප්‍රවේශ්‍යතා පහසුකම් සහිත පරිසරයක් ප්‍රවර්ධනය කිරීම.

03වැනි අරමුණ - සෞඛ්‍ය රැකවරණ සහ යහපැවැත්ම වැඩිදියුණු කිරීම.

04වැනි අරමුණ - ආර්ථික සුරක්ෂිතතාව සහ ජීවනෝපාය සඳහා සහාය වීම.

05වැනි අරමුණ - සමාජ අන්තර්කරණය සහ සහභාගිත්වය සහතික කිරීම.

06වැනි අරමුණ - දිගුකාලීන, අතරමැදි, සහන සහ විවේක සත්කාර සේවා ශක්තිමත් කිරීම.

07වැනි අරමුණ - ජීවන ප්‍රගමන ප්‍රවේශය තුළින් සම්බන්ධීකරණය හා ඒකාබද්ධතාව වර්ධනය කිරීම.

08වැනි අරමුණ - සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීම සවිමත් කිරීම සහ වගවීම.

මෙන්න මේවා තමයි ප්‍රධාන අරමුණු. තව අරමුණු ගණනාවක් තිබෙනවා. කාලය ගතවන නිසා ප්‍රධාන අරමුණු පමණයි, ගරු මන්ත්‍රීතුමාගේ පැනයට පිළිතුරු වශයෙන් මම සඳහන් කළේ.

04. වැඩිහිටි ජනතාව ඉලක්ක කර ගනිමින් වර්තමාන රජය විසින් වැඩ පිළිවෙළ ගණනාවක් ක්‍රියාත්මක කරමින් පවතිනවා. විශේෂයෙන්ම අපි අඩු ආදායම්ලාභී වැඩිහිටි තැනැත්තන් සඳහා ජීවනාධාර මුදලක් මාසිකව ලබා දෙනවා. අපි බලයට පත් වනවිට අවුරුදු 70ට වැඩි අඩු ආදායම්ලාභී පුද්ගලයන් සඳහා රුපියල් 3,000ක මාසික ආධාරයක් ලබා දෙමින් තිබුණා. නමුත් අපේ රජය බලයට පත් වුණාට පසු රුපියල් 3,000 ජීවනාධාර මුදල රුපියල් 5,000 දක්වා වැඩි කර 2025 අප්‍රේල් මස සිට ලබා දෙනවා.

ප්‍රමාණාත්මකව ගත්තොත්, මේ වන විට අඩු ආදායම්ලාභී වැඩිහිටියන් ලක්ෂ අටහමාරක වාගේ පිරිසකට තමයි ජීවනාධාර මුදල ලබා දී තිබුණේ. නමුත් 2025 අප්‍රේල් මාසයේ සිට එම ප්‍රමාණය ලක්ෂ 10ක් දක්වා අපි වැඩි කරලා තිබෙනවා.

ඒ වාගේම අවුරුදු 60ට වැඩි අඩු ආදායම්ලාභී වැඩිහිටියන් සඳහා සහනාධාර ක්‍රම ගණනාවක් ක්‍රියාත්මක වෙනවා. උදාහරණයක් හැටියට, "ආරෝග්‍යා" නමින් වැඩසටහනක් අපි ක්‍රියාත්මක කරනවා. ඒ යටතේ විශේෂයෙන් වැඩිහිටි රෝගාධාර වැඩසටහනක් තමයි ක්‍රියාත්මක වෙන්නේ. මෙහිදී බෝනොවන රෝගවලට ගොදුරු වන අය සඳහා අපි රුපියල් 25,000 බැගින් මූල්‍යාධාර ලබා දෙනවා. ඒ වාගේම වැඩිහිටියන් සඳහා අවශ්‍ය ශ්‍රවණ උපකරණ, අක්ෂි කාච වාගේ දේවල් ලබා දීම කරනවා. ඒ වාගේම "සුවපහසු" නමින් මූල්‍යාධාර වැඩසටහනක් ද අපි ක්‍රියාත්මක කරනවා. පවුල්වල ජීවත්වන වැඩිහිටියන්ගේ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම සඳහා අවශ්‍යතා තිබෙනවා නම් රුපියල් ලක්ෂයක ආධාර මුදලක් ලබා දෙනවා. ඒ වාගේම ජ්‍යෙෂ්ඨ පුරවැසියන් යම් ආර්ථික කටයුත්තකට යොමු කිරීම සඳහා ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා අපි රුපියල් 50,000ක උපරිමයකට යටත්ව ආධාර මුදල් ලබා දෙනවා. ඒ වාගේම අඩු ආදායම්ලාභී පවුල්වල වැඩිහිටියන්ට තමන්ගේ නිවාස ප්‍රතිසංස්කරණය කර ගැනීම සඳහා රුපියල් ලක්ෂ හත දක්වා ආධාර මුදල් ලබා දෙනවා. එවැනි ආධාර වැඩසටහන් ගණනාවක් අපි ක්‍රියාත්මක කරමින් තිබෙනවා.

ඒ විධියට සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කරන ගමන් අපි වැඩිහිටියන්ට අවශ්‍ය සමාජ පරිසරය නිර්මාණය කිරීම සඳහා වැඩිහිටි සමිති පිහිටුවීම, ඒවා ශක්තිමත් කිරීම සහ

[ගරු උපාලි පන්නිලගේ මහතා]

ඔවුන්ගේ සමාජ කටයුතුවලට අවශ්‍ය පහසුකම් සැලසීම මේ යටතේම ක්‍රියාත්මක කරමින් තිබෙනවා. අද වනකොට ලංකාවේ වැඩිහිටියන් රැක බලාගන්නා මධ්‍යස්ථාන 452ක් වාර්තා වෙලා තිබෙනවා. ඒ 452 තුළ 11,000කට ආසන්න වැඩිහිටියන් ප්‍රමාණයක් ආයතනගතව රැකවරණය ලබනවා. මෙම ආයතනගතව රැකවරණය ලබන වැඩිහිටියන්ගේ සුබසාධන කටයුතු වර්ධනය කිරීම සඳහා ඒ ආයතනවලට අපි රුපියල් මිලියන දෙකක උපරිමයකට යටත්ව ඒ ආයතනයේ අවශ්‍ය ගුණාත්මක තත්ත්වය වර්ධනය කිරීම සඳහා මූල්‍යාධාර ලබා දෙනවා. ඒ වාගේම දිවා සුරැකුම් මධ්‍යස්ථාන ආරම්භ කිරීම සඳහා රුපියල් මිලියන 3.5ක උපරිමයකට යටත්ව ආධාර ලබා දීමේ වැඩසටහනකුත් අපේ රජය මඟින් මේ වන කොට ක්‍රියාත්මක කරමින් තිබෙනවා.

05. මේ යටතේ එතුමා අහන ප්‍රශ්නය වන්නේ වැඩිහිටියන් උදෙසා ඉදිරියේදී රජය විසින් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් මොනවාද කියන එකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ වැඩිහිටියන් සම්බන්ධයෙන් අපේ රජය මැදිහත් වෙලා ප්‍රතිපත්තියක් සකස් කරලා තිබෙනවා. එම ප්‍රතිපත්තිය මේ වෙනකොට පාර්ලිමේන්තුවේ සෞඛ්‍ය, ජනමාධ්‍ය හා කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ විමර්ශනයට ලක් කරලා අපට ඒ සම්බන්ධයෙන් නිර්දේශ ලබා දීලා තිබෙනවා. එම නිර්දේශ මත පදනම් වෙලා මේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මක් හදලා, ඒ ක්‍රියාකාරි සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අපි මේ වෙනකොට කටයුතු කරමින් ඉන්නවා.

ඒ වාගේම දැනට ලංකාවේ බලාත්මක වන නීතිය වන 2000 අංක 9 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත සංශෝධනය කිරීමේ කටයුතු අපි ආරම්භ කරලා තිබෙනවා. ඒ සංශෝධනය මූලික කෙටුම්පත අපි මේ වෙනකොට නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කරලා තිබෙනවා. ඒ අනුව වැඩිහිටි තැනැත්තන් සම්බන්ධයෙන් අලුත් පනත් කෙටුම්පතක් ඉතාම කෙටි කාලයක් තුළ ගෙන ඒමට අපි බලාපොරෙත්තු වෙනවා. ඒ වාගේම වැඩිහිටියන් සම්බන්ධයෙන් පූර්ණ නඩත්තු මණ්ඩලයක් ක්‍රියාත්මක වෙනවා. එම නඩත්තු මණ්ඩලය මේ වනවිට මාර්ගගත - online - ක්‍රමයක් ඔස්සේ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර තිබෙනවා. එම කටයුතු තවදුරටත් පුළුල් කිරීම සඳහා අපි ක්‍රියා කරමින් ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ සමාජ ආරක්ෂණය සම්බන්ධවත් අපේ අවධානය යොමු කරන්න ඕනෑ. අපි දන්නවා, රජයේ රැකියාවක් කරන කොට තමයි විශ්‍රාම වැටුපක් වාගේ එකක් ලැබෙන්නේ කියලා. ඒ නිසා ජාතික සමාජ ආරක්ෂණ මණ්ඩලය මඟින් මේ වෙනකොට අපි වැඩසටහනක් හදලා තිබෙනවා, අපේ රටේ සියලු ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබා ගැනීම සඳහා. විශේෂයෙන්ම අවිධිමත් ක්ෂේත්‍රවල රැකියා කරන අයට. ඔවුන්, කුලී වැඩ කරන අය වෙන්න පුළුවන්; ත්‍රීවිල් රැකියා කරන අය වෙන්න පුළුවන්; වඩු වැඩ කරන අය වෙන්න පුළුවන්; මේසන් වැඩ කරන අය වෙන්න පුළුවන්. මේ විධියට අවිධිමත් ක්ෂේත්‍රයේ රැකියා කරන සියලු දෙනාටම තමන් වයසට ගියාට පසුව -වැඩිහිටි වියට පැමිණියාට පසුව- ඒ සමාජ රැකවරණය ලබා දීම සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් අපි මේ වෙනකොට සකස් කරලා තිබෙනවා. ඒ වැඩසටහන තවදුරටත් පුළුල් කිරීමට රජය විධියට අපි කටයුතු කරමින් ඉන්නවා.

මම කලින් කිව්වා වාගේ, අපේ රටේ ක්‍රියාත්මක වන වැඩිහිටියන් රැක බලාගැනීමේ මධ්‍යස්ථානවල ගුණාත්මක තත්ත්වය වර්ධනය කිරීම සඳහාත් අපි මේ වනකොට වෙනම මාර්ගෝපදේශ සකස් කරලා තිබෙනවා. ඒ සියලු ආයතනවල ගුණාත්මකභාවය නියාමනයට ලක් කරලා, වැඩිහිටි පුද්ගලයන්ට; අපේ රටේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට හොඳ ගුණාත්මක සේවයක් ලබා දීම සඳහා අපි කටයුතු කරමින් ඉන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මූලික වශයෙන් සහනාධාර ලබා දෙන අතරතුර, සහනාධාර මත යැපෙනවා වෙනුවට ඔවුන්ට සමාජශීලී ජීවිතයක් ඇතිකර දීම සඳහාත්, ඒ වාගේම ආයතනගතව ඉන්නවා නම්, ඒ ආයතනගතව සිටින අයගේ පහසුකම් වැඩි දියුණු කිරීම සඳහාත් අවශ්‍ය කටයුතු ඉදිරි වර්ෂ කිහිපය තුළ ඉටු කිරීමට අපි බලාපොරොත්තු වන බව මා සඳහන් කරන්න කැමැතියි.

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

***එකල්හි වේලාව අ. භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ. භා. 5.37ට, 2025 ඔක්තෝබර් 08 වන බදාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால், மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 5.37க்கு, பாராளுமன்றம் 2025 ஒக்ரோபர் 08, புதன்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 5.37 p.m. until 9.30 a.m. on Wednesday, 08th October, 2025.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.